**සීතාවක ප්‍රාදේශීය සභාවේ 2018 අප්‍රේල් මස 17 වන දින පෙ.ව.10.00 ට ප්‍රාදේශීය සභා සභා ශාලාවේදී පවත්වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව.**

සහභාගී වූ : -

1. ගරු සභාපති — ජී. ජයන්ත රෝහණ මැතිතුමා
2. ගරු උප සභාපති — එස්.ඩී. මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — චන්දන ප්‍රේමනාත් මුදුන්කොටුව මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — කේ.ඒ.විමල් ප්‍රසන්න මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — එම්.ඒ. මේරි මාග්‍රට් මැතිතුමිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — එම්.ආර්. ගයාන් දුමින්ද චන්ද්‍රසිරි මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — ලියනගේ චන්දන කුමාර මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — ආර්.පී. යසරු දෙවන්මිණ රාජපක්ෂ මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — ආර්.ඒ.ඩී. එස්. ජයන්ත රණවක මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — ඩබ්.ඒ. මංජුල ධම්මික වීරරත්න මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — කේ.ඒ.ඩී. පිලිෂියා ඇනට් ඔල්ගා මැතිතුමිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — එස්.ඒ. ප්‍රේමරත්න මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — බී. සනී හෙක්ටර් පීරිස් මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — ඩී. කෝකිල සම්පත් වර්ණසිරි මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — එල්. නන්ද කුමාරසිංහ මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — ආර්.ඒ. උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — ඩී. ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — පී.කේ. උපුල් ජිනේන්ද්‍ර කුලතිලක මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — සුසන්ත සිසිර කුමාර රූපසිංහ මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — ඩබ්.ඒ.ඩී. ගීතාමනි ස්වර්ණලතා මැතිතුමිය
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — දනුෂ්කි ප්‍රභානි අල්මේදා මැතිතුමිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — ඒ. සුසන්ත මැතිතුමා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — එම්.ඩී. සමන්ත කුමාර මැතිතුමා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — එච්. වරුණ දිලිප් කුමාර මැතිතුමා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — එච්.පී. උපුල් ප්‍රසන්න මැතිතුමා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — ඩබ්.ඩී. චින්තක දේවින්ද සමරවීර මැතිතුමා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — කේ. නිමල් යසසිරි කළුපහන මැතිතුමා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — අයෝම මධු ප්‍රසාද් දේවගේ මැතිතුමා
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — ඩබ්. අසෝක වැලිකල මැතිතුමා
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — පුස්සැල්ලගේ අමල් නිශාන්ත සිල්වා මැතිතුමා
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — එස්. චන්ද්‍රකුමාර් මැතිතුමා
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — ජී. කුමුදිනී ජයවර්ධන මැතිතුමිය
35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — ශෂිණි ශ්‍රීමාලි හෙට්ටිආරච්චි මැතිතුමිය
36. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — ඊ.ජී.ඩී.ඉන්ද්‍රානි සෙනෙහෙලතා පද්මසීලි මැතිතුමිය
37. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — එම්.ඩී. මාලනී චන්ද්‍රලතා මැතිතුමිය
38. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී — ආර්.ඒ.ඩි.සාගරිකා කුමාරි රූපසිංහ මැතිතුමිය

39. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඥාණ ප්‍රකාසම් ෆැන්සිස් මැතිතුමා
40. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්දන සූරියආරච්චි මැතිතුමා
41. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්. සුනිල් රණසිංහ මැතිතුමා
42. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.පී.කේ. සමන්ති චන්ද්‍රිකා දමයන්ති මැතිතුමිය
43. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඒ.ප්‍රදිප් කුමාර් මැතිතුමා

<u>ගරු සභාපතිතුමා</u>

ඔබ සියළුදෙනාටම සුභ අළුත් අවුරුද්දක් වේවා. සීතාවක ප්‍රාදේශීය සභාවේ 06 වන මන්ත්‍රී මණ්ඩලයේ ප්‍රථම සභා වාරය අපි ආරම්භ කිරිමට සූදානම් වන වෙලාවේ මේ අවස්ථාවට එකතු වන අපේ ප්‍රාදේශීය සභාවේ අභිනව උප සභාපතිතුමන් මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමන් ප්‍රධාන මේ සභාවට එකතු වන මහජන නියෝජිතයන් විදිහට අපිත් සමග එකතු වුණු පක්ෂ විපක්ෂ අපේ සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා ඉතාමත් සාදරයෙන් ගෞරවයෙන් මේ සභාවට පිළි ගනු ලබනවා. ඒ වගේම ලේකම්තුමා ප්‍රධාන කාර්යමණ්ඩලයත්, ජනමාධ්‍යවේදී මහත්වරුන් සියළුදෙනාත්, මහජන ගැලරියේ අසුන් ගෙන සිටින හිටපු මන්ත්‍රීවරුන් ඇතුළු ඔබ සියලුදෙනාම ඉතාමත් ගෞරවයෙන් පිළි ගනු ලබනවා.

න්‍යායපත්‍රානුකූලව පළමුවෙන්ම පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවෙන් ඉල්ලා සිටින ලදී.

**<u>01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කර ගැනීම.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයන්ත රණවක මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, 2015.04.22 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**<u>2015.04.22 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව පිළි ගත යුතු සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයන්ත රණවක මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.</u>**

**<u>02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.</u>**

01. සීතාවක ප්‍රාදේශීය සභාව සඳහා තෝරා පත් කර ගත් සභිකයින්, සභාපති හා උප සභාපතිගේ නම් ප්‍රසිද්ධියට පත් කල පිළිවෙලින් 2018.03.09 දින හා 2018.03.22 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍ර.

i. 2018.03.09 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව සීතාවක ප්‍රාදේශීය සභාව සඳහා

තෝරා පත් කර ගත් සභිකයින්,

01. කොස්ගම - සමන්ත උදය කුමාර ගමගේ
02. ඇස්වත්ත - කළු ආරච්චිගේ විමල් ප්‍රසන්න
03. හිගුරල - බුලත්සිංහලගේ සනී හෙක්ටර් පීරිස්
04 .කඩුගොඩ - චන්දන ප්‍රේමනාත් මුදුන්කොටුව
05. සාලාව - දූවගේ කෝකිල සම්පත් වර්ණසිරි
06. කළුඅග්ගල - ලෙල්ලපිටියගේ නන්ද කුමාරසිංහ
07. සුදුවැල්ල - රූපසිංහ ආරච්චිගේ උපුල් මනෝජ් රූපසිංහ
08. වේරගොල්ල - දිවිගල්ලගේ ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න
09. ඉඹුක්ඕවිට - පල්ලෙ කන්දගේ උපුල් ජිනේන්ද්‍ර කුලතිලක
10. වැලිකන්න - සුසන්ත සිසිර කුමාර රූපසිංහ
11. කහහේන - ගමලජ්ජගේ ජයන්ත රෝහණ
12. දිද්දෙණිය - වනසිංහ ආරච්චිගේ දෝන ගීතාමනි ස්වර්ණලතා
13. හංවැල්ල - දනුෂ්කි ප්‍රභානි අල්මේදා
14. ජයවීරගොඩ - අබද්දස්සයලාගේ සුසන්ත
15. තුන්නාන - මහරන්සිලිගේ ගයාන් දුමින්ද චන්ද්‍රසිරි
16. මාවතගම - ලියනගේ චන්දන කුමාර
17 .පිටුම්පෙ - මනන දේවගේ සමන්ත කුමාර
18 .උග්ගල්ල - හල්පගේ වරුණ දිලිප් කුමාර
19. පින්නවල - සෙන්දනායක ආරච්චිගේ ප්‍රේමරත්න
20. වග - හේනාදීර පතිරණගේ උපුල් ප්‍රසන්න
21. බෝපේ - සෝදිගේ දොන් මංජුල ප්‍රදීප් කුමාර්
22. වේරගල - වැලිකලගේ දොන් චින්තක දේවින්ද සමරවීර
23. අරුක්වත්ත - කළුපහනගේ නිමල් යසසිරි කළුපහන
24 .ගලගෙදර - ගමගේ චන්ද්‍රසිරි
25. පාදුක්ක - අයෝම මධු ප්‍රසාද් දේවගේ
26 .උඩුමුල්ල - විතානගේ අශෝක වැලිකල

තෝරා එවා ඇති සභිකයින්

- පුස්සැල්ලගේ අමල් නිශාන්ත සිල්වා
- වෛකුන්ට ආචාරිගේ මංජුල ධම්මික වීරරත්න
- රණවක අච්චිගේ දොන් සෝමසිරි ජයන්ත රණවක
- සන්දනම් චන්ද්‍රකුමාර්
- කාරියවසම් අතුකෝරලගේ දෝන පිලිෂියා ඈනට් ඔල්ගා
- මල්ලිකා ආරච්චිගේ මේරි මාග්‍රට්
- ගමගේ කුමුදිනී ජයවර්ධන
- ශෂිණි ශ්‍රීමාලි හෙට්ටිආරච්චි
- ඇඹුල්ගමගේ ඩයස් ඉන්ද්‍රානි සෙනෙහෙලතා පද්මසීලි
- මිරිහානගේ දෝන මාලනී චන්ද්‍රලතා
- රාජපක්ෂ පතිරගේ යසරු දෙවන්මිණ රාජපක්ෂ
- රූපසිංහ ආරච්චිගේ දෝන සාගරිකා කුමාරි රූපසිංහ ගුණවර්ධන
- ඥාණ ප්‍රකාසම් ෆැන්සිස්
- සමන් චන්දන සූරියආරච්චි
- හේවාසිංහලාගේ සුනිල් රණසිංහ
- නානායක්කාර පෙරමුණ කංකානමගේ සමන්ති චන්දිකා දමයන්ති
- පනාගොඩ ආචාරිගේ ප්‍රදීප් කුමාර්

2018.03.22 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව සීතාවක ප්‍රාදේශීය සභාවේ සභාපති හා උප සභාපති නම් කිරීම.

සභාපති - ගමලජ්ජගේ ජයන්ත රෝහණ

උප සභාපති - සෝදිගේ දොන් මංජුල ප්‍රදීප් කුමාර්

**03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරිම. – ඉදිරිපත්ව නැත.**

**04.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න. - ඉදිරිපත්ව නැත.**

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**05 - (01) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.**

2011.04.25 වන දින පැවති මහා සභාවේ 04 - (01) සභා සම්මුතිය පරිදි සීතාවක ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ලෙස කටයුතු කරන ලද කේ.ඒ. චන්දන පද්මසිරි මහතා 2018.03.29 වන දින සිට නැවතත් සීතාවක ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ලෙස පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.**

**05 – (02) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.**

පාදුක්ක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ සේවය කරනු ලබන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය හා හංවැල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ සේවය කරනු ලබන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය සීතාවක ප්‍රාදේශීය සභාවේ සමස්ත කාර්ය මණ්ඩලයේම කොටසක් වශයෙන් පිළිගත යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන සූරියආරච්චි මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, දෙවන යෝජනාව සම්බන්ධයෙන් තියෙනවා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ කාර්යමණ්ඩලය සීතාවක ප්‍රාදේශීය සභාවේ සමස්ත කාර්යමණ්ඩලයේ කොටසක් වශයෙන් පිළි ගත යුතුයි කියන කාරණාව පිළිබඳව ගැටලුවක් මතු වෙනවා. 13 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් සභා ලැයිස්තුව යටතේ තමයි සෞඛ්‍ය පිළිබඳ විෂය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වෙලා තියෙන්නේ. අපේ ප්‍රාදේශීය සභා පනත අනුව මහජන සෞඛ්‍ය පිළිබඳ බලතල හා කාර්යයන් වලදී ප්‍රාදේශීය සභාවට තියෙන්නේ උපදෙස් දීම් එවැනි මහජන සෞඛ්‍ය පිළිබඳ සියලු බලතල පවරා තියෙන්නේ

ප්‍රාදේශිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට හා එහි කාර්ය මණ්ඩලයට. එතකොට ගැටලුවක් මතු වෙනවා ප්‍රාදේශීය සභාවේ යටතේ ප්‍රාදේශීය සභාවට පුළුවන්කම තියෙන්නේ අවශ්‍ය කරන මහජන සෞඛ්‍ය කටයුතු වලට අවශ්‍ය වන යටිතල පහසුකම් සැපයීම, ඒ අදාල කරන ඉඩකඩ සපයා දීම, ආදි වශයෙන් පහසුකම් සැපයීමේ කාර්යභාරය. 13 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ තියෙන විෂයානුබද්ධතාවයත්, එහි තියෙන නෛතික බැඳීමත් කෙසේද ප්‍රාදේශීය සභාවේ කාර්යමණ්ඩලයක් සේ ප්‍රාදේශිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරුන් ඇතුළු කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර ගන්නේ කියන කාරණය පිළිබඳ නෛතික ප්‍රශ්නයක් මතු වෙනවා. ඒ පිළිබඳව පැහැදිලි කිරිමක් හා අපිට අදහසක් විදිහට තියෙනවා මේ සම්බන්ධයෙන් පවතින නිතිරිති අනුව මෙය කළ හැක්කක් නොවන බවයි අපේ අදහස ඒනිසා මේ යෝජනාව පිළිබඳව අපේ එකගතාවයක් නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වගන්ති හා ප්‍රාදේශීය සභාවේ බලතල සීමාව යටතේ මෙය කල හැක්කක් නොවන බැවින් මේ පිළිබඳව අපේ එකගතාවයක් නැහැ.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු චන්ද්‍රන සුරියආරච්චි මන්ත්‍රිතුමා කිව්ව අදහසට මම එකතු කරන්නම්. අපේ පළාත් පාලන ආයතන ප්‍රාදේශීය සභා යටතේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මහ නගර සභා හා නගර සභා වල එවැනි පිරිස් කණ්ඩායම් එම සභා වල සේවකයින් ලෙස කටයුතු කරනවා. සෞඛ්‍ය පිළිබඳ වගකීම ඔබ හැමදෙනාම දන්නවා ඩෙංගු වගේ රෝග කාරක එනවා එතකොට සභාවට තමයි ඒ වගකීම දරන්න වෙන්නේ. නෛතිකව කටයුතු කරනකොට බලයලත් නිලධාරින් හැටියට කවුරුහරි පත් වෙන්න ඕන. අපි ඒ සඳහා සැමදාම කටයුතු කරලා තියෙනවා. වෛද්‍ය නිලධාරින් අපේ නිත්‍යානුකූල භාවය ආරක්ෂා කර ගැනිම සඳහා මෙලෙස අපේ සේවකයින් හැටියට අපි කටයුතු කරන්නේ. ඒ අනුව සභාවට බඳවා ගැනිම සඳහා අපි කටයුතු කරන්නේ පළාත් පාලන කොමසාරිස්තුමියගේ 2012.03.27 වන දිනැති ලිපිය අනුවයි. මම ඔබතුමාලාගේ දැන ගැනීම සඳහා එම ලිපිය ඉදිරිපත් කරන්නම්.

බස්නාහිර පළාතේ සියලුම ආයතන ප්‍රධානින් වෙත.

පළාත් පාලන ආයතන වල සෞඛ්‍ය අධිකාරි බලතල ක්‍රියාත්මක කිරිම.

පළාත් පාලන ආයතන වෙත පැවරි ඇති බලතල ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි මෙන්ම මහජන සෞඛ්‍ය පරික්ෂකවරුන්ගේ ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය නෛතික බලතල විධිමත්ව පවරා දීමේ අවශ්‍යතාවය පිළිබඳ වරින් වර ඔබ ආයතන දැනුවත් කිරිම් කළද මේ තාක් එය ඉටු නොවුණු අවස්ථා සම්බන්ධයෙන් වාර්තා වී ඇත.

02. විශේෂයෙන් ප්‍රාදේශීය සභාවකට අදාලව සෞඛ්‍ය අධිකාරි බලතල ක්‍රියාත්මක කිරිමේදී 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 72 (2) උප වගන්තියෙහි විධිවිධාන කෙරෙහි අවධානය යොමු කළ යුතුව ඇත.

03.ඒ අනුව මහජන සෞඛ්‍ය සම්බන්ධයෙන් සෞඛ්‍ය අධිකාරි බලතල ක්‍රියාත්මක කිරිමට අදාලව ඔබ පළාත් පාලන ආයතනය ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ මේ තාක් ලබා දී ඇති උපදෙස් කෙරෙහිද අවධානය යොමු කරන ලෙසත් මගේ අංක LGD/05/08/පොදු v වෙළුම හා 2011.08.23 දිනැති ලිපිය මගින් දී ඇති උපදෙස්ද සැලකිල්ලට ගනිමින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි සහ ඔහු යටතේ සෞඛ්‍ය පරික්ෂක නිලධාරිවරුන්, ඔබ පළාත් පාලන ආයතනයෙහි කාර්ය මණ්ඩල වශයෙන් පිළි ගැනීම මේ තාක් සභා සම්මුතියක් යටතේ සිදු වී නොමැති නම් ඊට අදාල සභා සම්මුතිය 2012 අප්‍රේල් මස අවසන් වීමට පෙරාතුව ලබා ගත යුතු බවටත් එසේම 2012 මැයි මස අවසන් වීමට පෙරාතුව ඒ යටතේ බලතල පැවරීමට අදාල කටයුතු සිදු වී අවසන් විය යුතු බවටත් අවධාරණය කරමි.

චන්ද්‍රානි සමරකොන්

පළාත් පාලන කොමසාරිස් (බ.ප)මේ අනුව තමයි 2012 වසරේදි මේ සඳහා අදාල බලතල පැවරීම අපි ඉෂ්ට කළේ. මෙය නිත්‍යානුකූල කටයුත්තක්. මේ පිළිබඳව පැහැදිලි කර ගැනීම ගැන චන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා එතුමා ඒ කාලයේ සභාවේ හිටියේ නැති නිසා. ගරු මන්ත්‍රීතුමනි, නිත්‍යානුකූල කර ගැනීමක් හැටියටයි අපි මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. විරෝධතාවයක් නොමැති නම් අපිට මේ යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන්න පුළුවන්.

<u>**ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.**</u>

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් දුමින්ද මැතිතුමා.**</u>

ගරු සභාපතිතුමනි, මම 2011 – 2012 පරිසර කමිටුව නියෝජනය කළා.

<u>**ගරු සභාපතිතුමා**</u>

ගරු මන්ත්‍රීතුමා, මේ යෝජනාව සම්බන්ධයෙන්ද. අපි යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ යෝජනාවක් විදිහට ප්‍රකාශයට පත් කළා. ඒ නිසා වෙන අවස්ථාවක කරුණු පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්.

<u>**05 - (03) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.**</u>

2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන විශේෂ විධිවිධාන පනතේ 16 වන වගන්තිය ප්‍රකාර සීතාවක ප්‍රාදේශීය සභා අරමුදලින් කරනු ලබන සියලු ගෙවීම් සඳහා වූ චෙක්පත් හෝ අණකර අත්සන් කිරීම සඳහා පළමු අත්සන්කරු ලෙස සීතාවක ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කළමනාකරණ සහකාර කේ.ඩී. සන්ධ්‍යා මාලනී මිය / ගිණුම් කළමනාකරණ සහකාර එස්.ඩී සිරෝෂිණී මිය හා දෙවන අත්සන්කරු ලෙස සීතාවක ප්‍රාදේශීය සභාවේ ලේකම් කේ.ඒ චන්දන පද්මසිරි මහතා වෙත බලය පැවරිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමා.**</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>**ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.**</u>

<u>**05 - (04) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.**</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 වගන්තිය හා 1989 අප්‍රේල් 17 අංක 554/5 දරණ අති විශේෂ ගැසට් නිවේදනයේ සඳහන් 1988 ප්‍රාදේශීය සභා රීති (මූල්‍ය හා පරිපාලන) වලට අනුකූලව සීතාවක ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයට අදාලව පහත සඳහන් කාරක සභා පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

01. මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව

02.නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව

03.කාර්මික සේවා කාරක සභාව

04.පරිසර හා පහසුකම් කාරක සභාව

05. ටෙන්ඩර් මණ්ඩලය

<u>**ගරු උප සභාපති මංජුල ප්රදීප් කුමාර් මැතිතුමා.**</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>**ගරු සභාපතිතුමා**</u>

පළමුවෙන්ම මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව සඳහා මන්ත්‍රීවරුන් 15 කින් සමන්විත කමිටුවක් පත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

මේ පිළිබඳව සාකච්ඡා කරන්න අවශ්‍ය නම් කාරක සභා අවස්ථාවක් බවට පත් කරලා කථා කරන්න පුළුවන්.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යසරු රාජපක්ෂ මැතිතුමා.**</u>

ගරු සභාපතිතුමනි, මෙම මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් දුමින්ද මැතිතුමා.**</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වන්දන මුදුන්කොටුව මැතිතුමා.**</u>

ගරු සභාපතිතුමනි, මෙම කාරක සභා අවස්ථාව මහා සභාවක් බවට පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා.**</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>**ගරු උප සභාපති මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා**</u>

ගරු සභාපතිතුමනි, අපි තේ පානය සඳහා සභාවේ කටයුතු අත්හිටුවලා පක්ෂ නායක රැස්වීමක් පවත්වලා තිරණයක් ගනිමු කියලා මම ප්‍රකාශ කර සිටිනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.**</u>

ගරු සභාපතිතුමනි, පක්ෂ නායකයෝ කියන්නේ පොදු ජන පෙරමුණ හා විපක්ෂය. පොදු ජන පෙරමුණ ඇතුළේ තියෙන පක්ෂ අපට අදාල නැහැ. ඡන්දේ ඉල්ලුවේ එක පක්ෂයකින්නේ.

<u>**ගරු සභාපතිතුමා**</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ පක්ෂයේ නායකතුමාත් ඇතුළුව තමයි සාකච්ඡාව පවත්වන්නේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලියනගේ චන්දන කුමාර මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, අපි යෝජනා කළේ ආණ්ඩු පක්ෂයෙන් මන්ත්‍රීවරු 10 ක් හා විපක්ෂයෙන් මන්ත්‍රීවරු 05 ක් විදිහට.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කලින් සභා වල හිටියානේ. එතකොට කොහොමද කළේ. දැන් අමතකයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, අමතක නැහැ. එතකොට මෙහෙම තිබුණේ නැහැ., 23 ට 20 අනුපාතයට බෙදෙන්න ඕන.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන සූරියආරච්චි මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, 10 ට 5 කියන්නේ එතකොට 2/3 ක බලයක් තියෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, අපට 06 ක් දෙන්න ඕන. මට පේන්නේ සභාපතිතුමාට තීරණයක් ගන්න බැහැ වාගේ.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු මන්ත්‍රීතුමා, අපි තීරණයක් අරන් ආවේ. අරන් ආපු තීරණ තනිවම වෙනස් කරන්න බැහැ.

**<u>පෙ.ව. 10.35 ට තේ පානය හා පක්ෂ නායක රැස්වීමක් සඳහා සභාවේ වැඩ කටයුතු අත්හිටුවන ලදී. පෙ.ව. 11.25 ට නැවතත් මහා සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.</u>**

<u>ගරු සභාපතිතුමා</u>

අපි නැවතත් 05 - (04) යෝජනාව සඳහා ගමන් කරනවා. මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව සඳහා පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ අදහස් සැලකිල්ලට අරගෙන 17 ක් දක්වා මන්ත්‍රීවරු ප්‍රමාණය ඉහළ දානවා. ආණ්ඩු පක්ෂයට මන්ත්‍රීවරු 11 ක් හා විපක්ෂයට මන්ත්‍රීවරු 06 ක් විදිහට අපි එකගතාවයකට පැමිණියා. ඒ එකගතාවයට අනුව මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාවට මන්ත්‍රීවරුන්ගේ නම් යෝජනා කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයෝමි මධු ප්‍රසාද් දේවගේ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව සඳහා ආණ්ඩු පක්ෂයෙන් ජයන්ත රෝහණ මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුතුව එස්.ඩී. මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා, චන්දන ප්‍රේමනාත් මුදුන්කොටුව මැතිතුමා, කේ.ඒ.විමල් ප්‍රසන්න මැතිතුමා, ලියනගේ චන්දන කුමාර මැතිතුමා, එස්.ඒ. ප්‍රේමරත්න මැතිතුමා, සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා, ඩී.

ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා, ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා, ආර්.ඒ. උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා ගේ නම් මම මෙම ගරු සභා සභාවට යෝජනා කර සිටිනවා.

**ගරු ප්රාදේශීය සභා මන්ත්රී චින්තක දේවින්ද සමරවීර මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමෙන් හා විපක්ෂයෙන් මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව සඳහා ජයන්ත රණවක මැතිතුමා, මංජුල ධම්මික වීරරත්න මැතිතුමා, ගයාන් දුමින්ද මැතිතුමා, පුස්සැල්ලගේ අමල් නිශාන්ත සිල්වා මැතිතුමා සහ පී.ඒ. ප්‍රදිප් මන්ත්‍රිතුමාගේ නම් මම මෙම ගරු සභා සභාවට යෝජනා කර සිටිනවා.

**ගරු ප්රාදේශීය සභා මන්ත්රී උපුල් ජිනේන්ද්‍ර මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**ගරු ප්රාදේශීය සභා මන්ත්රී සුනිල් රණසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව සඳහා චන්දන සූරියආරච්චි මැතිතුමා මා විසින් යෝජනා කර සිටිනවා.

**ගරු ප්රාදේශීය සභා මන්ත්රී සමන්ති චන්ද්‍රිකා දමයන්ති මැතිතුමිය.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**ගරු ප්රාදේශීය සභා මන්ත්රී සාගරිකා කුමාරි රූපසිංහ මැතිතුමිය.**

ගරු සභාපතිතුමනි, එක්සත් ජනතා නිදහස් සන්ධානය වෙනුවෙන් මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව සඳහා යසරු දෙවන්මිණ රාජපක්ෂ මැතිතුමා මා විසින් යෝජනා කර සිටිනවා.

**ගරු ප්රාදේශීය සභා මන්ත්රී ඥාණ ප්‍රකාසම් ෆ්‍රැන්සිස් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**ගරු සභාපතිතුමා**

මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව සඳහා මන්ත්‍රීවරුන් යෝජනා වුණා. ඒ සම්බන්ධයෙන් විරෝධතාවයක් නැහැ. මීළගට නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව සඳහා ආණ්ඩු පක්ෂයෙන් 07 ක් හා විපක්ෂයෙන් 04 ක් විදිහට

මන්ත්‍රීවරුන් 11 කගේ නම් යෝජනා කරන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව සඳහා ආණ්ඩු පක්ෂයෙන් විමල් ප්‍රසන්න මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුතුව එස්.ඒ. ප්‍රේමරත්න මැතිතුමා, කෝකිල සම්පත් වර්ණසිරි මැතිතුමා, ඩී. ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා, චින්තක දේවින්ද සමරවීර මැතිතුමා, අයෝම මධු ප්‍රසාද් දේවගේ මැතිතුමා, දනුෂ්කි ප්‍රභානි අල්මේදා මැතිතුමියගේ නම් මම යෝජනා කර සිටිනවා.

**<u>ගරු ප්රාදේශීය සභා මන්ත්රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යසරු දෙවන්මිණ රාජපක්ෂ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එක්සත් ජනතා නිදහස් සන්ධානය වෙනුවෙන් නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව සඳහා ඥාණ ප්‍රකාසම් ෆ්‍රැන්සිස් මැතිතුමා මා විසින් යෝජනා කර සිටිනවා.

**<u>ගරු ප්රාදේශීය සභා මන්ත්රී සාගරිකා කුමාරි රූපසිංහ මැතිතුමිය.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමෙන් නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව සඳහා එම්.ඒ. මේරි මාග්‍රට් මැතිතුමිය, ඊ.ජී. ඩී. ඉන්ද්‍රානි සෙනෙහෙලතා මැතිතුමිය, එස්. චන්ද්‍රකුමාර් මැතිතුමාගේ නම් යෝජනා කර සිටිනවා.

**<u>ගරු ප්රාදේශීය සභා මන්ත්රී ඔල්ගා අතුකෝරළ මැතිතුමිය.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඒ.ප්‍රදීප් කුමාර් මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, එහි සංයුතිය 07 යි 04 යි. එතකොට හැම පක්ෂයකම නියෝජනයක් එනවාද. ඒ කමිටුව අපි අත්හැරලා යනවාද. ඒ පක්ෂ වල නියෝජනයක් වෙන්නේ නැහැ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, හැම කමිටුවකම නියෝජනයක් දෙන්න බැහැ ¾ ක් අපි ගන්නවා.

**<u>ගරු සභාපතිතුමා</u>**

මේ සභාව පක්ෂ 06 ක් නියෝජනය කරනවා. ආණ්ඩු පක්ෂයට 07 ක් විපක්ෂයට 04 ක් විදිහට තමයි යෝජනා කරන්නේ . විපක්ෂයේ පක්ෂ එය කථා කරගන්නට ඕන මන්ත්‍රීවරුන් පත් කිරිමේදී.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, අපි කලින් කිව්වා පැහැදිලිව. සියලු මන්ත්‍රිවරු කමිටුවක් නියෝජනය වෙන්න ඕන කියලා. අපේ මන්ත්‍රීවරු 04 ක් ඉන්නවා මුදල් කමිටුවට. තව 09 ක් ඉන්නවා. අපේ මන්ත්‍රීවරු 13 දෙනාම නියෝජනවා වෙනවා. ප්‍රශ්නයක් වෙන්නේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රිවරු 03 ක් සිටින නිසා. අපේ මන්ත්‍රිවරු එක කමිටුවකට පමණයි අපි යෝජනා කරන්නේ. යෝජනා කරන්නේ තමුන්නාන්සේලා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඒ.ප්‍රදිප් කුමාර් මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, කමිටු පත් කිරිමේදී සුළු පක්ෂ පිළිබඳවත් මීට වඩා ටිකක් මානුෂිකව සිතිය යුතුයි. මන්ත්‍රිවරු එක්කෙනාද දෙන්නාද නෙමෙයි ඔවුන් නියෝජනය කරන්නේ පක්ෂයක්. කමිටුවක් සඳහා එක් පක්ෂයකින් එක් මන්ත්‍රිවරයෙක් හෝ නියෝජනය විය යුතුයි. ඒ ආකාරයට සංයුතිය සකස් කළ යුතුයි.

**<u>ගරු සභාපතිතුමා</u>**

විපක්ෂය පැත්තෙන් ප්‍රදීප් මන්ත්‍රිතුමාගේ නම යෝජනා වෙනවාද.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයන්ත රණවක මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, නිතිය අනුව හැම මන්ත්‍රිවරයෙක්ම කමිටුවක් නියෝජනය කළ යුතුයි. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු තුන්දෙනයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රිවරු තුන්දෙනයි, ප්‍රදිප් මන්ත්‍රිතුමායි අපේ මන්ත්‍රිවරු දහතුන් දෙනයි අපේ 20 දෙනාම කමිටුවක් නියෝජනය කළ යුතුයි. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රිවරු වැඩි කර ගැනීම තමයි මේ ප්‍රශ්නේ වෙලා තියෙන්නේ. ජනතා විමුක්ති පෙරමුණ, ශ්‍රිලංකා නිදහස් පක්ෂය, ප්‍රදීප් මන්ත්‍රිතුමාට අවස්ථාවක් තියෙන්න ඕන. මෙය ඔබතුමාලායි නිවැරදි කරන්න ඕන. අපි නෙමෙයි. සභා රීති වල තියෙනවා හැම මන්ත්‍රිවරයෙක්ම කමිටුවක් නියෝජනය කරන්න ඕන කියලා. ඔබතුමාලා පාලක පක්ෂයෙන් ඔක්කොම පිරෙව්වාම ඒක හරියන්නේ නැහැ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා.</u>**

ගරු මන්ත්‍රිතුමා ඔබ කියන දේ හරි. එක මන්ත්‍රිවරයෙකුට කමිටු 04 ම නියෝජනය කරන්න බැහැ. එක කමිටුවක නියෝජනයක් පමණයි තියෙන්න ඕන.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.</u>**

එහෙම තමයි අපි කියන්නේ මන්ත්‍රීතුමා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගීතාමණී ස්වර්ණලතා මැතිතුමිය.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, කාර්මික සේවා කාරක සභාව සඳහා එක්සත් ජාතික පක්ෂයෙන් උපුල් ජිනේන්ද්‍ර මැතිතුමා, කුමුදිණී ජයවර්ධන මැතිතුමිය, මාලනී චන්ද්‍රලතා මැතිතුමිය මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයන්ත රණවක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**ගරු ප්රාදේශීය සභා මන්ත්රී චන්දන සූරියආරච්චි මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් කාර්මික සේවා කාරක සභාව සඳහා සමන්ති චන්ද්‍රිකා දමයන්ති මැතිතුමිය මා විසින් යෝජනා කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුනිල් රණසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**ගරු සභාපතිතුමා.**

පරිසර හා පහසුකම් කාරක සභාව සඳහා මන්ත්‍රීවරුන්ගේ නම් යෝජනා කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, පරිසර හා පහසුකම් කාරක සභාව සඳහා ආණ්ඩු පක්ෂයෙන් චන්දන ප්‍රේමනාත් මුදුන්කොටුව මැතිතුමාගේ සභාපතිත්වයෙන් සනී හෙක්ටර් පිරිස් මැතිතුමා, උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා, ගීතාමනි ස්වර්ණලතා මැතිතුමිය, ඒ. සුසන්ත මැතිතුමා, සමන්ත කුමාර මැතිතුමා සහ අරුණ පී දිවිගල්ල මන්ත්‍රීතුමා මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලියනගේ චන්දන කුමාර මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, පරිසර හා පහසුකම් කාරක සභාව සඳහා එක්සත් ජාතික පක්ෂයෙන් හා විපක්ෂයෙන් ඔල්ගා අතුකෝරළ මැතිතුමිය, සුසන්ත රූපසිංහ මැතිතුමා, ශෂිණි ශ්‍රීමාලි හෙට්ටිආරච්චි මැතිතුමිය සහ මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කුමුදිනි ජයවර්ධන මැතිතුමිය.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යසරූ දෙවන්මිණ රාජපක්ෂ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එක්සත් ජනතා නිදහස් සන්ධානය වෙනුවෙන් පරිසර හා පහසුකම් කාරක සභාව සඳහා සාගරිකා කුමාරි රූපසිංහ මැතිතුමිය මා විසින් යෝජනා කර සිටිනවා.

**ගරු ප්රාදේශීය සභා මන්ත්රී ඥාණ ප්‍රකාසම් ෆැන්සිස් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**ගරු ප්රාදේශීය සභා මන්ත්රී චන්දන සූරියආරච්චි මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් පරිසර හා පහසුකම් කාරක සභාව සඳහා සුනිල් රණසිංහ මැතිතුමා මා විසින් යෝජනා කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ති චන්ද්‍රිකා දමයන්ති මැතිතුමිය.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් දුමින්ද මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මෙම මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යසරු රාජපක්ෂ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් දුමින්ද මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මෙම කාරක සභා අවස්ථාව මහා සභාවක් බවට පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, පරිත්‍යාගය උතුම් දෙයක් කියලා විශ්වාස කරනවා. මුලින්ම පරිත්‍යාගය කරන්න ලැබීම පිළිබඳව සතුටු වෙනවා. මම පරිසර හා පහසුකම් කමිටුවෙන් ඉල්ලා අස් වෙනවා. සමගිය ඉදිරියට යනවා නම් තමයි පරිත්‍යාගය කරන්න වෙන්නේ.

**ගරු සභාපතිතුමා.**

මේ ප්‍රශ්නය විසඳා ගන්නා තෙක් පරිසර කමිටුවෙන් දිවිගල්ල මන්ත්‍රීතුමා ඉවත් වෙනවා.
මීළගට ටෙන්ඩර් මණ්ඩලය. මුදල් කමිටුවම තමයි ටෙන්ඩර් මණ්ඩලය වෙන්නේ. ඒ සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මේරි මාග්‍රට් මැතිතුමිය.**

ගරු සභාපතිතුමනි, මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව ටෙන්ඩර් මණ්ඩලය ලෙස පිළිගත යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනී හෙක්ටර් පිරිස් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ඒ අනුව පහත සඳහන් පරිදි කාරක සභා පත් කිරීමට තීරණය කරන ලදී.

<u>**මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව.**</u>

1. ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා (කාරක සභා සභාපති)
2. ගරු උප සභාපති එස්.ඩී. මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන ප්‍රේමනාත් මුදුන්කොටුව මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.විමල් ප්‍රසන්න මැතිතුමා
5. ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ගයාන් දුමින්ද චන්ද්‍රසිරි මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලියනගේ චන්දන කුමාර මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. යසරු දෙවන්මිණ රාජපක්ෂ මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.ඩී. සෝමසිරි ජයන්ත රණවක මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මංජුල ධම්මික වීරරත්න මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. ප්‍රේමරත්න මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා
12. ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ. උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඒ. ප්‍රදීප් කුමාර් මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුස්සැල්ලගේ අමල් නිශාන්ත සිල්වා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන් චන්දන සූරියආරච්චි මැතිතුමා

**<u>නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව</u>**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.විමල් ප්‍රසන්න මැතිතුමා (කාරක සභා සභාපති)
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. මේරි මාග්‍රට් මැතිතුමිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. ප්‍රේමරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. කෝකිල සම්පත් වර්ණසිරි මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩී. චින්තක දේවින්ද සමරවීර මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩී. අයෝම මධු ප්‍රසාද් දේවගේ මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ජී. ඩී. ඉන්ද්‍රානි සෙනෙහෙලතා පද්මසිලි මැතිතුමිය
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඥාණ ප්‍රකාසම් ෆ්‍රැන්සිස් මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දනුෂ්කි ප්‍රභානි අල්මේදා මැතිතුමිය

**<u>කාර්මික සේවා කාරක සභාව</u>**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලියනගේ චන්දන කුමාර මැතිතුමා (කමිටු සභාපති)
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්. නන්ද කුමාරසිංහ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.කේ. උපුල් ජිනේන්ද්‍ර කුලතිලක මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්. වරුණ දිලිප් කුමාර මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. උපුල් ප්‍රසන්න මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. නිමල් යසසිරි කළුපහන මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. අසෝක වැලිකල මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. කුමුදිණී ජයවර්ධන මැතිතුමිය
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩී. මාලනී චන්ද්‍රලතා මැතිතුමිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.පී.කේ. සමන්ති චන්ද්‍රිකා දමයන්ති මැතිතුමිය

**<u>පරිසර හා පහසුකම් කාරක සභාව</u>**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන ප්‍රේමනාත් මුදුන්කොටුව මැතිතුමා (කමිටු සභාපති)

2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ඩී. පිලිෂියා ඇනට් ඔල්ගා අතුකෝරළ මැතිතුමිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී. සනී හෙක්ටර් පිරිස් මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ. උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත සිසිර කුමාර රූපසිංහ මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ඩී. ගීතාමනි ස්වර්ණලතා මැතිතුමිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුසන්ත මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩී. සමන්ත කුමාර මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂිණි ශ්‍රිමාලි හෙට්ටිආරච්චි මැතිතුමිය
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.ඩි.සාගරිකා කුමාරි රූපසිංහ මැතිතුමිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්. සුනිල් රණසිංහ මැතිතුමා

**<u>ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු උප සභාපති මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.</u>**

<u>ගරු සභාපතිතුමා</u>

මේ අවස්ථාවේදී බස්නාහිර පළාත් සභා මන්ත්‍රී ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයෙක් වන මහේෂ් අල්මේදා මැතිතුමා මහජන ගැලරියේ අසුන් ගෙන සිටින බව දැනුම් දෙනවා. එතුමාවත් මේ අවස්ථාවට පිළි ගනු ලබනවා.

**<u>05 – (05) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

එක් වරකට රුපියල් ලක්ෂ පහක උපරිමයක් දක්වා මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව සීතාවක ප්‍රාදේශීය සභා අරමුදලින් මුදල් වියදම් කිරීමට සීතාවක ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මහතාට බලය පැවරිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මේ යෝජනාවේ වරදක් තියෙනවා. මේ මුදලේ ප්‍රමාණයත් වැඩියි. ඒ නිසා මම මෙම යෝජනාවට සංශෝධන යෝජනාවක් ඉදිරිපත් කළා.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු මන්ත්‍රීතුමා, අපි මේ පිළිබඳව කාරක සභාවක් බවට පත් කරලා සාකච්ඡා කරමු. මොකද්ද ඔබතුමාගේ කාරණය කියලා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මගේ යෝජනාව ඉදිරිපත් කරලා ස්ථිර කරලා අපි පස්සේ_ ගැන කථා කරමු. මගේ අවස්ථාව දෙන්න.

**<u>05 (05) යෝජනාවට සංශෝධන යෝජනාව</u>**

**<u>05 – (05) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

2018 අප්‍රේල් මහා සභාවේ 05 – (05) යෝජනාව පහත පරිදි සංශෝධනය විය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

එක් වරකට රුපියල් ලක්ෂ 2.5 ක උපරිමයක් දක්වා මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කාරක සභාවේ හෝ මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව සීතාවක ප්‍රාදේශීය සභා අරමුදලින් ගෙවීම් කිරීමේ බලය සීතාවක ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මහතාට බලය පැවරිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි. ( මුදල් රෙගුලාසි 136 ප්‍රකාරව)

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මට මේ ගැන අදහස් දක්වන්න අවශ්‍යයයි. මෙහි මම ඔබතුමාට විරුද්ධව කියනවා නෙමෙයි. බලය පවරන හැම යෝජනාවක්ම ආරම්භක සභාවේ වෙනවා. නමුත් මේ යෝජනාව වැරදියි. මුදල් වියදම් කිරිමට බලය පවරන්න බැහැ. ගෙවිම සඳහා තමයි බලය පවරන්නේ. මුදල් රෙගුලාසි 136 ප්‍රකාරව ගෙවීම් සඳහා බලය පවරන්න පුළුවන්. ලක්ෂ 05 ක් කියන්නේ ලොකු ප්‍රමාණයක්. අද සාමාන්‍ය යෙන් අවම ව්‍යාපෘතියක වටිනාකම වෙන්නෙත් ලක්ෂ 05 ක්. අපි ව්‍යාපෘතියක් දුන්නාම කාරක සභාවකට හෝ මහා සභාවට ඉදිරිපත් කරන්නේ නැතිව ඔබතුමාට ලක්ෂ 05 ම ගෙවන්න පුළුවන්. මෙතන ඉන්නවා නවක මන්ත්‍රිවරු 29 දෙනෙක්. ඔබතුමා මුදල් ගෙව්වාට පස්සේ අපි කාටවත් කථා කරන්න බැහැ. ඒ නිසා කරුණාකරලා මෙය ලක්ෂ 2 ½ ක් දක්වා අඩු කරන්න. අපි විපක්ෂයේ ඉන්න නිසා ඔබතුමාලාට පුළුවන් ඒ ප්‍රමාණය අනුමත කර ගන්න. සියලු මන්ත්‍රිවරු කල්පනා කරන්න. සභාපතිතුමා ලක්ෂ 05 ම ගෙවයි. මේ මන්ත්‍රිවරු හැමදෙනාටම අධිහාර වෙයි. අපි කලින් ඔබතුමාට ලක්ෂ 02 ක ආවරණ අනුමැතියක් දුන්නා. රු.250,000.00 ක උපරිමයක් දක්වා මුදල් ගෙවිමේ බලය මේ යෝජනාව ලියනකොට ලොකු වරදක් තියෙනවා. 05 (06) යෝජනාව හරි. එහි තියෙනවා ගෙවීම සඳහා කියලා. මේ යෝජනාවේ තියෙන්නේ වියදම් කිරිමට කියලා. මේ යෝජනාව මෙතන්ට ප්‍රින්ට් වෙලා එන්න කලින් හතර පස් දෙනෙක් දකිනවා. යෝජනාව ප්‍රසන්න මන්ත්‍රිතුමා ලියන්න ඕන. පස්සේ කවුරුහරි ටයිප් කරනවා. ඊට පස්සේ කළමනාකරණ සහකාර බලනවා. පස්සේ ලේකම්තුමා බලලා අත්සන් කරනවා. මේක වැරදියි. වියදම් කරන්න බලය දෙන්න බැහැ. සෑම ගෙවිමක් සඳහාම කාරණා 04 ක් සම්පුර්ණ වෙන්න ඕන. බලය දීලා තියෙන්න ඕන. අනුමත කරන්න ඕන. සහතික කරන්න ඕන. ගෙවන්න ඕන. මුදල් රෙගුලාසි 136 ඉඳන් 139. එහි බලය පැවරිම අපි ගෙවිම සඳහා බලය දෙනවා. වියදම් කිරිම සඳහා බලය දෙන්න බැහැ. මේ යෝජනාව ලක්ෂ 2.5 දක්වා සංශෝධනය කරන්න කියලා කාරුණිකව ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු මන්ත්‍රිතුමනි, අපි කාරක සභාවක් බවට පත් කරලා මේ ගැන කථා කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි පී.ඒ ප්‍රදීප් කුමාර් මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මහා සභාවක් අපි මාසයක් ගාණේ රැස් වෙනවානේ. අතරමැදදි මෙවැනි දේවල් ගෙවන්න වෙන්නේ කලාතුරකින් අත්‍යවශ්‍ය හදිසි කාරණා සඳහානේ. ඒ මොන මොන කාරණාද කියලා නවක මන්ත්‍රිවරු හැටියට දැනගන්න කැමතියි. මොන හදිසි කාරණා සඳහා ද කියලා මේ යෝජනාවේ ඇතුලත් කළා නම් හොඳයි කියලා හිතෙනවා.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු මංජුල මන්ත්‍රිතුමා, ගිය වරක් මේ යෝජනාව මේ විදිහටම තමයි ආවේ. කවුරුත් දැකලා නැහැ .ගියවරත් ඔබතුමාත් එය දැකලා නැහැ. ඒ කොහොම වුණත් ලක්ෂ 2.5 හා ලක්ෂ 05 මීට අවුරුදු 2011 හා 2018 ඔබතුමාලා අරගෙන බැලුවොත් මුදලේ වටිනාකමේ ප්‍රමාණය කොච්චර කියලා ලක්ෂ 05 කියන්නේ ඒතරම් ලොකු මුදලක් නෙමෙයි. පස්සේ ඔබතුමාලාටම මාසයක් දෙකක් යනකොට තේරෙයි මේ මොකකද්ද අපි කර ගත්තේ කියලා එහෙම අත්‍යවශ්‍ය වියදමක් ආවොත්. ලක්ෂ 05 ක ව්‍යාපෘතියකට මංජුල මන්ත්‍රිතුමා කිව්ව විදිහට අපි එකවර කවදාවත් මුදල් ගෙවන්නේ නැහැ. කොටස් 03 කට විතර තමයි ගෙවන්නේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා</u>

නැහැ නැහැ. රැදවුම් මුදල් තියාගෙන මුදල් ගෙවනවා. ලක්ෂ 4 ½ ක් විතර ගෙවනවා. ගෙව්වාට පස්සේ ඒ ගනුදෙනුව අවසන්. පස්සේ සභාවේ කථා කරලා වැඩක් නැහැ. කාරක සභාවක් අවශ්‍ය නම් අරගෙන කථා කරන්න.

<u>ගරු සභාපතිතුමා</u>

මේ ලක්ෂ 05 ක යෝජනාවක් කියන්නේ පොඩි යෝජනාවක්. අපි ලක්ෂ 05 ගනිමු. හැමදාම මහා සභා හා මුදල් කමිටු කැඳවන්න බැරි නිසා මේ යෝජනාව සම්මත කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, අපි ඔබතුමා සමග තරහාට නෙමෙයි. මේ සභාවේ මන්ත්‍රීවරු 29 දෙනෙක් අළුත්. පරණ මන්ත්‍රීවරු තේරුම් කරලා දෙන්න ඕන. අපි මේ දන්න නිසා කියනවා නෙමෙයි. අපි පැහැදිලි කරලා දෙන්න ඕන. ඔබතුමා වරදකට ගෙවනවා කියනවා නෙමෙයි. වැරදිලා ගෙවුණොත් ලක්ෂ 4 ½ ක් ගෙවලා තිබුණොත් අපි කියනවා මේ ව්‍යාපෘතිය නවත්වන්න කියලා . එතකොට නවත්ත ගන්න බැරි වෙනවා. ඔබතුමා ගෙව්වාට මේ 43 දෙනාම ඒක වරදක් නම් අධිහාර ගෙවන්න ඕන.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, අපි හතරදෙනෙක් ඉන්නවා තාම අධිහාර ගෙවනවා. රණවක මහතාත්, ගමගේ මහත්තයාත්, ඔල්ගා මන්ත්‍රීතුමියත්, මමත් තාම අධිහාර ගෙවනවා. තවත් අයින් කළේ නැහැ. ඔබතුමා ගැන අපට ප්‍රශ්නයක් නැහැ. යම් පාරක් හදලා එය අබලන් තත්වේ තිබුණොත් ඔබතුමා ගෙවලා තිබුණොත් අපි කොහොමද එය ආපසු අය කර ගන්නේ. එහෙ නම් ඔබතුමා යෝජනාවක් කරන්න මොන කාරණා සඳහාද භාවිතා කරන්නේ කියලා. එතකොට අපි දන්නවා මොකද්ද ඒ නිර්නායක කියලා. ඔබතුමා අපහසුතාවයට පත් කරන්න නෙමෙයි මේ කියන්නේ.

<u>ගරු සභාපතිතුමා</u>

අපි ඡන්ද විමසීමකට යන්නේ නැතිව මේ ගැන කථා කරලා විසඳා ගනිමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා</u>

ඡන්ද විමසීමකට ගියොත් ඔබතුමාට මෙය ජයග්‍රහණය කර ගන්න පුළුවන්. එහෙම නෙමෙයි අපි කියන්නේ. 29 දෙනෙක් අළුත් අය ඉන්නේ. ඔවුනුත් මේ සභාවේ තත්වය තේරුම් ගත යුතුයි. අපිම කථා කරන එක සාධාරණ නැහැ. තර්කානුකූලව විසඳුමකට එමු. එහි ගැටලුවක් නැහැ. අපිට අධිහාර ගෙවන්න බැහැ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඒ ප්‍රදිප් කුමාර් මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාරයේදී මෙය අනුමත වුණාද. ඒ ගෙවීම් සම්බන්ධයෙන් ප්‍රශ්න මතු වුණාද.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු මන්ත්‍රීතුමා ලක්ෂ 02 ක් අනුමත වුණා. එහෙම ප්‍රශ්න ඇති වුණේ නැහැ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, දැන් චෙක් අත්සන් කරන්නේ ලේකම්තුමා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා</u>

ප්‍රසන්න මන්ත්‍රීතුමා, සභාපතිතුමා ගෙවන්න කියලා දැම්මාමනේ ලේකම්තුමා ගෙවන්නේ. ඔබතුමා මුදල් රෙගුලාසි දන්නේ නැහැ. එහෙම කථා කරන්න එපා.

<u>ගරු සභාපතිතුමා</u>

මේ සභාවට අධිභාර තියෙන්නේ එකයි. ඒ ඇරෙන්න 1991 ඉදන් සභාපතිවරු කාටවත් අධිභාර ගෙවන්න වෙලා නැහැ. මන්ත්‍රීවරු බොහොම වගකීමෙන් සභාවේ හැසිරිලා තියෙනවා. අදත් හිටපු සභාපතිවරු දෙන්නෙක් ඉන්නවා. එකම එක අවස්ථාවක විතරයි එහෙම වෙලා තියෙන්නේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මංජුල මන්ත්‍රීතුමා කිව්ව කාරණය ප්‍රාදේශීය සභා අරමුදලින් මුදල් වියදම් කිරිමට කියන එකට මම එකග නැහැ. ගෙවිම් කිරිමට කියන කාරණය ඇතුලත් කරලා මේ යෝජනාව සම්මත කිරිම වඩාත් සුදුසු කියලා මම ප්‍රකාශ කර සිටිනවා. මුදල් ගෙවිමේදී ව්‍යාපෘතියක් සුදුසුද නැද්ද කියලා අපිට කථා කරන්න පුළුවන්. ගෙවිමේදි යම් ප්‍රමාදයක් වෙනවා නම් ඔබතුමාට අපි ඒ අවසරය ලබා දෙනවා.

<u>ගරු සභාපතිතුමා</u>

අපි මේ ගැන විවාදකට යන්න ඕන නැහැ. එහෙම විශේෂ ප්‍රශ්නයක් නැහැ. ප්‍රශ්නයක් ආවොත් සභාවට ඉදිරියට මුහුණ දෙන්න වෙන දේවල් තමයි යෝජනාව ඇතුළත් කළේ. වෙන ප්‍රශ්නයක් නැහැ. හොරෙන් ගන්න බැහැ. මුදල් කමිටුවට යන්න ඕන. මහා සභාවට එන්න ඕන. සංශෝධන යෝජනාව සඳහා මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නැහැ.

<u>**ඉහත සංශෝධන යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.**</u>

<u>**05 – (06)** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා විසින් යෝජනා කරයි.</u>

සීතාවක ප්‍රාදේශීය සභා අරමුදලින් ගෙවීම් කිරීමේදී රුපියල් ලක්ෂ පහළොවක සීමාව තුල සියළු ගෙවීම් අනුමත කිරීමේ බලය මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව වෙත පවරා දිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>ගරු ප්රාදේශීය සභා මන්ත්රී සුසන්ත රූපසිංහ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, මම හිතනවා මේ ගැන අපි කරුණු පැහැදිලි කර ගැනීම අවශ්‍යයයි. මෙයින් කියන්නේ මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව වෙත බලය දෙන්න කියලා. කමිටුවෙන් ගෙවීම අනුමත කලාට පස්සේ උදාහරණයක් හැටියට යම් ගෙවීමක් මහා සභාවට එන්න කලින් මුදල් කමිටුවෙන් ගෙවලා තිබුණොත් මුදල් කමිටුවේ මන්ත්‍රීවරු අනුමත කළායින් පස්සේ යම් ගැටලුවක් ඇති වුණොත් යම් පරීක්ෂණයකට ගියොත් ඒ වගකීම සභාවේ සියලු මන්ත්‍රීවරුන්ට බැර වෙනවාද. අපි මේ යෝජනාවට බලය දීම තුල අපිත් මේ වගකීමට බැදෙනවාද. කාරක සභාවක් බවට පත් කරලා ලේකම්තුමාත් පැහැදිලි කරන්න. අපේ කිසි විරුද්ධත්වයක් නැහැ මේ යෝජනාවට. මේ ගෙවීම් කරන්න ඕන. අපි මන්ත්රිවරු 43 දෙනාගේ බලය මේ මුදල් කමිටුවේ මන්ත්රිවරුන් 17 දෙනාට දෙනවාද. ඒ ගන්න තීන්දුව අපි පිළි ගන්නවාද. ඔබතුමා විතරක් නෙමෙයි 17 දෙනාම ගන්න තීරණයට අනෙක් මන්ත්‍රීවරුත් වගකියනවාද. ඔබතුමාට කොහොමත් ආවරණ අනුමැතිය යටතේ ගෙවන්න පුළුවන්. මම හිතනවා මේ ගැන අපිට පැහැදිලි කරලා දුන්නොත් වඩාත් යහපත් කියලා.

<u>ගරු ප්රාදේශීය සභා මන්ත්රී වන්දන සූරියආරච්චි මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, අපිටත් මේ පිළිබඳව ගැටලුවක් තියෙනවා. අපිටත් පැහැදිලි කරන්න අවශ්‍යයයි. මහා සභාව තමයි සභාවේ උපරිම බලය හා සියලුදෙනාගේ බලය කේන්ද්‍ර කර ගත් තැන. මේ යෝජනාව අනුව මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාවට එවැනි වටිනාකමක ගෙවීම් අනුමත කිරීමේ බලය පැවරුවාට පස්සේ මහා සභාවේ බලය පිළිබඳව ප්‍රශ්නයක් මතු වෙනවා කියලා මම විශ්වාස කරනවා. වැඩිදුර පැහැදිලි කිරීමක් ඔබතුමාලාගේ පැත්තෙන් ලැබෙනවා නම් හොඳයි. කාරක සභා පත් කිරීමේ පනතේ විධි විධාන අනුව එවැනි අනුකමිටුවකට බලය පවරන්න පුළුවන්ද කියන එක ගැන ගැටලුවක් තියෙනවා. මහා සභාවේ බලතල අතික්‍රමණය කරමින් අනු කමිටුවකට එවැනි බලයක් පැවරීම තුල මහා සභා සාමාජිකයින් විදිහට සියලු මන්ත්‍රීවරුන් ඒ සඳහා බැදීම් තියෙනවා. ඒ පිළිබඳව මන්ත්‍රීවරුන්ට තියෙන නිදොස් භාවය හා වැරදි ක්‍රියාමාර්ග වලින් වෙන් වීමේ අයිතිය කුමක්ද කියන එක ගැන ප්‍රශ්නයක් තියෙනවා. අපිට හැගී යනවා මහා සභාව සතු බලය අනියම් ආකාරයකින් අනු කමිටුවකට පවරා ගැනීමේ උත්සාහයක් මේ යෝජනාව තුල තියෙනවා කියලා. ඒ නිසා මේ පිළිබඳව අපිට පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. මේ ආකාරයට යෝජනා වෙනවා නම් අපේ ඉදිරියේදී අපේ ස්ථාවරය ඉදිරිපත් කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වන්දන මුදුන්කොටුව මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, මෙම මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යසරු රාජපක්ෂ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, මෙම කාරක සභා අවස්ථාව මහා සභාවක් බවට පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලියනගේ චන්දන කුමාර මැතිතුමා.**</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>**ගරු සභාපතිතුමා**</u>

සාකච්ඡා කරගත් ආකාරයට මේ යෝජනාව පිළිබඳව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නැහැ.

<u>**ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු උප සභාපති මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.**</u>

<u>**06. කාරක සභා වාර්තා. - සලකා බැලීමක් නැත.**</u>

<u>**07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ.**</u>

<u>**ගරු සභාපතිතුමා**</u>

ඔබතුමාලාට 2018 ජනවාරි මස ලැබීම් හා ගෙවීම් පිළිබඳ වාර්තාව ලබා දීලා තියෙනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා**</u>

ගරු සභාපතිතුමා අපිට විශේෂයෙන් දැනගන්න අවශ්‍යයි 2018.01.31 දිනට මුදල් ශේෂය තියෙනවා. මේ සභාව පටන් ගත් දිනය 2018.03.20 දිනට මුදල් ශේෂය අපිට දැන ගන්න අවශ්‍යයයි. සභාව ආරම්භක දිනයේ සිට මේ සභාව යන්නේ කොහොමද කියලා දැන ගන්න අවශ්‍යයයි අපිට.

<u>**ගරු සභාපතිතුමා**</u>

ඊළග සභාවේදි තමයි ඒ ශේෂය ගන්න වෙන්නේ ගරු මන්ත්‍රීතුමා.

<u>**ගරු ප්රාදේශීය සභා මන්ත්රි මංජුල වීරරත්න මැතිතුමා**</u>

මේ මංගල සභාවේ අපිට ඒ ශේෂය දෙන්න බැරිද.

<u>**ගරු සභාපතිතුමා**</u>

මුදල් කමිටුව පැවැත්වෙන දිනට ඒ මුදල් ශේෂය ඉදිරිපත් කරන්නම්.

<u>**2018 වර්ෂයේ ජනවාරි මස ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශය මහා සභාව විසින් සලකා බලන ලදී.**</u>

<u>**08. වෙනත් කරුණු.**</u>

<u>ගරු සභාපතිතුමා</u>

බස්නාහිර පළාත් සභාව විසින් පැවැත්වීමට නියමිතව තිබූ ප්‍රාදේශිය සභා ධූරධාරින් සඳහා පුහුණු වැඩමුළුව 2018.04.22 වන දින සිට 2018.04.27 වන දින දක්වා නේවාසික වැඩමුළුවක් ලෙස පැවැත්වීමට නියමිතව තිබුණත් මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම මත ප්‍රධාන අමාත්‍යතුමා විසින් ලබන මස මැද දක්වා පුහුණු වැඩමුළුව කල් දමා ඇති බව දැනුම් දෙනවා.

ගරු මන්ත්‍රීතුමන්ලාට අපි අවස්ථාව ලබා දෙනවා මේ අවස්ථාවේදි වසර 03 කට ආසන්න කාලයකට පස්සේ හිටපු මන්ත්‍රීවරු 12 ක් පමණ සභාවට පත් වෙලා ඉන්නවා. අනෙක් අය අළුත් මන්ත්‍රීවරු. ඒ නිසා තමන්ට ඡන්දය ප්‍රකාශ කරපු ජනතාව මතක් කරන්න සුභ පතන්න අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාවක් ලබා දිය යුතුයි. එම නිසා ඒ අවස්ථාව දැන් ලබා දෙනවා.

<u>ගරු උප සභාපති මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා</u>

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමා ඇතුළු කාර්යමණ්ඩලයෙන් අවසරයි. අපි සීතාවක ප්‍රාදේශීය සභාවේ අළුත් මැතිවරණ ක්‍රමය යටතේ කොට්ඨාශ මැතිවරණ ක්‍රමය යටතේ පත් වුණු පළමුවෙනි මහා සභාව අද පවත්වන දිනයේ ඔබ සියලුදෙනාටම ලැබුවා වූ නව වසර සුභ අළුත් අවුරුද්දක් වේවා යැයි ප්‍රාර්ථනා කරනවා. පසුගිය මැතිවරණයෙන් පොදු ජන පෙරමුණ අවිස්සාවේල්ල ආසනයේ විශාල ජයග්‍රහණයක් ලබලා සීතාවක ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු 23 කගේ නියෝජනයක් ලබලා තියෙනවා. එවන් අවස්ථාවක අපේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් ජයන්ත රෝහණ මැතිතුමා පත් වුණා. කාලයක් මන්ත්‍රීවරයෙක් විදිහට පත් වෙලා ඉදලා අද එතුමා සභාපතිවරයා විදිහට පත් වෙලා තියෙනවා. අපි උප සභාපතිවරයා ලෙස පත් වෙලා තියෙනවා. අපිව ජනතාව මේ ස්ථානයට එව්වේ නිවැරදි දේ නිවැරදි විදිහට කථා කරලා අපේ සේවය ජනතාවට ලබා ගන්න. ඒ අවස්ථාවට අපට සහයෝගය ලබා දුන්න බෝපේ ප්‍රදේශයේ මගේ කොට්ඨාසයේ ජනතාව, මෙතුවක් කල් සීතාවක ප්‍රාදේශිය සභාවේ මන්ත්‍රීවරයෙක් විදිහට කටයුතු කරන්න අවස්ථාව ලබලා දුන්නා. ඔවුන්ට පළමුව මම මගේ ස්තූතිය පුද කරනවා. අපිට මෙතන්ට පැමිණීමට අපේ දේශපාලන ගමනට අවිස්සාවේල්ල ආසනය නියෝජනය කරන අපේ පක්ෂයේ නායකයා විදිහට කටයුතු කරන නිතිඥ රවින්ද්‍ර ජයසිංහ මැතිතුමාත්, ඒවගේම කොමියුනිස්ට් පක්ෂයේ මහේෂ් අල්මේදා මැතිතුමා, මහජන එක්සත් පෙරමුණේ දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, ගීතාංජන ගුණවර්ධන මැතිතුමා ඇතුළු ඒ සියලු පක්ෂ නායකයන්, පිවිතුරු හෙළ උරුමයේ, ජාතික නිදහස් පෙරමුණේ ඒ සියලු නායකයින්ගේ සහයෝගය අපිට මේ ජයග්‍රහණය සඳහා ලබා දුන්නා. ඒ සියලුදෙනාටම සීතාවක ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා විදිහට මාගේ ස්තූතිය පුද කරනවා. අපි කලින් ප්‍රාදේශීය සභාවේ කටයුතු කළේ මන්ත්‍රීවරු 22 යි. අද 43 ක් දක්වා ඉහල ගිහින් තියෙනවා. ඉතින් විශාල කාර්යභාරයක්. අපි දන්නවා කථා කරන්න ගියත් විශාල ප්‍රමාණයකට යන්න වෙයි. ඒ නිසා අපි ආදර්ශයක් විදිහට සභාව ආරම්භ කිරිමේදීම යම් ක්‍රමවේදයකට සභාව ගෙනියන්න ක්‍රමයක් හදා ගනිමු කියන ඉල්ලීමත් මම කරනවා. නැත්නම් සභාව අවසන් වෙන්න රෑ වෙයි. අපේ කාලය ඉතිරි කරගෙන සභාවෙන් ජනතාවට සේවයක් කරන්න අවස්ථාවක් කර ගනිමු. කාරක සභා සඳහා මන්ත්‍රීවරු පත් වුණා. මම ඉල්ලීමක් කරනවා හිටපු මන්ත්‍රීවරු දන්නවා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු දන්නවා කාරක සභාවේ නියෝජනය ගත්තා වගේම කාරක සභාවකින් ඉටු විය යුතු කාරණා මොනවාද කියලා. මන්ත්‍රීවරු බොහොමයක් කාරක සභා වලට පැමිණෙන්නේ නැහැ. එවිට කාරක සභා පවත්වාගෙන යන්න නොහැකි තත්වයකට පත් වෙනවා. මුදල් හා ප්‍රතිපත්ති සැකසිමේ කාරක සභාව අනෙක් කාරක සභා ඉතා වැදගත්. කාරක සභා වලට අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු හා අළුත් මන්ත්‍රීවරු වගකිමක් විදිහට අරගෙන කාරක සභා වලටත් සහයෝගය ලබලා දෙන්න. ඒවගේම සභාපතිතුමාට

කියන්න ඕන අපේ කණ්ඩායමේ මන්ත්‍රීවරු 23 දෙනෙක් ඉන්නවා. මන්ත්‍රීවරු 43 දෙනාටම ඔබතුමාට ඒ අවශ්‍ය කරන සහයෝගය ලබලා දෙයි. ශ්‍රීලංකා පොදු ජන පෙරමුණේ අපේ අපේ මන්ත්‍රීවරු 11 දෙනෙක් ඉන්නවා. ඒ අයගේ සහයෝගයත්, අපි 23 දෙනාගේත් සහයෝගය ලැබෙයි. අපිටත් අවශ්‍ය කරන සහයෝගය ලබා දෙයි කියලා අපි විශ්වාස කරනවා. ඔබතුමාගේ නිවැරදි තින්දු තීරණ වලට මේ සීතාවක ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු විදිහට සීතාවක ප්‍රා ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරවා විදිහට මගේත් අපේ කණ්ඩායමේත් සහයෝගය ලබලා දෙනවා කියලා මම පොරොන්දු වෙනවා. ඒවගේම අපේ වැඩ භාර ගැනීමේ උත්සවය පසුගිය 09 වෙනිදා සීතාවක ප්‍රාදේශීය සභා උත්සව ශාලාවේදි පැවැත්වුවා. ඒ සදහා දායතක්වය හා සහයෝගය දැක්වූ හා සහභාගි වූ සියලුදෙනාටම මගේ ස්තුතිය පුද කරනවා. ඉදිරියේදි සීතාවක ප්‍රාදේශීය සභාවේ සංවර්ධන කටයුතු වලට අවශ්‍ය සහයෝගය හා දායකත්වය අපිට හැකි පමණින් සීතාවක ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා ලෙස ලබා දෙන බවත් පොරොන්දු වෙමින් සියළුදෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් මම නිහඩ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු ප්රාදේශීය සභා මන්ත්රි චන්දන මුදුන්කොටුව මැතිතුමා

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමා ඇතුළු කාර්යමණ්ඩලයෙන් අවසරයි. ඔබ සියලුදෙනාටම ලැබුවා වූ නව වසර සුභ අළුත් අවුරුද්දක් වේවා යැයි ප්‍රාර්ථනා කරනවා. 2015 ජනවාරි 08 වෙනිදායින් පස්සේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ බලය ගිලිහිලා ගියාට පස්සේ එතුමාගේ පරාජයක් සමග ඉන් පසු මාස කිහිපයකින් ප්‍රාදේශීය සභා බහුතරයත් තිබුණේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ඒ සියල්ල විසුරවලා වසර 2 ½ කට අධික කාලයක් තිස්සේ ජනතාව මැතිවරණයක් බලාපොරොත්තුවෙන් හිටියා. ඒ වසර 2 ½ තුල අපිට කියන්න සතුටුයි අපේ ප්‍රාදේශීය සභාව නම් කොමසාරිස් පාලනය යටතේ තිබුණත් අපේ ලේකම්වරයා ඇතුළු නිලධාරි මණ්ඩලය විශාල කැපකිරිමක් කරලා අපේ ප්‍රාදේශීය සභාවෙන් ඉටු විය සියලු දේ ජනතාවට නිසියාකාරව ඉටු කළා කියන දේ ගැන අපි තුල පැහැදීමක් තියෙනවා. ඒ සදහා ලේකම්තුමා ඇතුළු නිලධාරි මණ්ඩලයට ස්තුතිවන්ත වෙනවා. වසර 2 1/2 ක් යනකම් මැතිවරණක් ලබා ගන්න අපි විශාල සටනක් කළා. අපි වීදී බැහැලා පා ගමන් ඇවිල්ලා වසර 2 1/2 කට පස්සේ මැතිවරණයක් ලබා ගත්තා. නමුත් ඒ මැතිවරණයේ විශාල විකෘතිභාවයක් තියෙනවා කියලා ජනාධිපතිතුමාම කියලා තිබුණා. අපි හැමදෙනාම ඒ දෙය අත් විදිනවා. අපි දන්නෙත් නැහැ. මැතිවරණය ඉවර වුණාම තමයි දන්නේ මෙවැනි මැතිවරණයකටයි ආවේ කියලා. එය අපේ ප්‍රාදේශීය සභාවට වගේම ලංකාවේ අනෙක් ප්‍රාදේශීය සභා වලටත් විශාල බරක් දරන්න වෙලා තියෙනවා. ජනවාරි 08 වෙනිදායින් පස්සේ එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කල අපේ නායකයින්ට අපේ පාක්ෂිකයින්ට වුණ යම් යම් අසාධාරණකම් නිසා අපි විශාල වශයෙන් පිඩාවට පත් වෙලා හිටියා දේශපාලනමය වශයෙන්. පස්සේ අපේ හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ අපිව කැදවලා තමුන්නාන්සේලා බය වෙන්න එපා කියලා අපේ සාමාජිකත්වයත් ශ්‍රීලංකා නිදහස් පක්ෂයෙන් ගිලිහුනාට පස්සේ එතුමා තමුන්නාන්සේලාට යන්න තැනක් හදනවා කියන පොරොන්දුව මත එතුමාගේ ආශිර්වාදයෙන් බිහි වුණු මේ නෙළුම් පොහොට්ටුව කියන පක්ෂය ලංකා ඉතිහාසයේ දේශපාලන වංශ කතාව වෙනස් කරමින් අති විශිෂ්ට ජයග්‍රහණයක් 2018 පෙබරවාරි 10 දින වන විට ලබා ගත්තා. ප්‍රාදේශීය සභා බහුතරයක් අපිට දිනා ගන්න හැකි වුණා. නෙළුම් පොහොට්ටුව ප්‍රාදේශීය සභා නගර සභාද ඇතුළුව 215 ක බලය දැනට පිහිටුවලා තියෙනවා. අපි ඒ ගැන සන්තෝෂ වෙමින් අපේ මේ කොට්ඨාසය තුල මේ විශාල ජයග්‍රහණය සදහා අපට විශාල වශයෙන් සහයෝගය දැක්වුවා දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, ගීතාංජන ගුණවර්ධන මැතිතුමා, නිරන්තරයෙන්ම මේ ආසනයේ රැදී සිටිමින් මේ ජයග්‍රහණය විජයග්‍රහණයක් බවට පත් කිරිමට පොදුවේ සියළුම අපේ අපේක්ෂකයෝ ළගට ගිහින් මහේෂ්

අල්මේදා මැතිතුමා, ශ්‍රීලංකා පොදුජන පෙරමුණේ සංවිධායක අපේ හිටපු සභාපතිවරයෙකු වන අපේ නිතිඥ රවින්ද්‍ර ජයසිංහ මැතිතුමන් අපි එතුමන්ලාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕන. අපිව දැනුවත් කරමින් මේ මැතිවරණ ජයග්‍රහණය ලබා ගන්න ගුරු හරුකම් දුන්න බැසිල් රාජපක්ෂ මැතිතුමා. එතුමන්ටත් අපි මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙන්න ඕන. අපේ පොදුජන පෙරමුණේ මන්ත්‍රිවරු 23 දෙනෙක් පත් වුණා. එක්සත් ජාතික පක්ෂයෙන් මන්ත්‍රිවරු නියෝජනය කරමින් ජයග්‍රහණය කරන්න පුළුවන් හැකි වුණේ 03 දෙනාටයි. අනෙක් අය ලැයිස්තු ගත මන්ත්‍රිවරු. එක්සත් ජාතික පක්ෂයෙනුත් ඒ නායකයින් කල්පනා කරලා ජේ්යෂ්ඨ මන්ත්‍රිවරු පත් කරලා තියෙනවා. සභාව නිසි මගට ගෙනියන්න පුළුවන් මන්ත්‍රිවරු ජේ්යෂ්ඨ මන්ත්‍රිවරු පත් කල එක ගැනත් එතුමන්ලාටත් ස්තුතිවන්ත වෙන්න ඕන. අපේ ප්‍රාදේශීය සභාව ඉදිරියට ගෙනියන්න ඒ අයත් විශාල ශක්තියක්. සභාපතිතුමාට ශ්‍රීලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රිවරු 11 වගේම පොහොට්ටුව ලකුණින් තරග කරලා ආපු මේ මන්ත්‍රිවරු 23 දෙනාම ඔබතුමාට ප්‍රාදේශීය සභාව ඉදිරියට ගෙනියන්න අපේ නිරන්තර සහයෝගය ලැබෙනවා. ඔබතුමා දෙවැනි වතාවටත් සභාපති බවට පත් වෙලා ඔබතුමාටත් සෑහෙන පල පුරුද්දක් තියෙනවා. ඔබතුමාත් කාටවත් වෙනස් කමක් නොකර කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා. මාගේ ආදරණීය ප්‍රාදේශීය සභාවේ මීට පෙරත් මැතිවරණ වලදී මනාප ක්‍රමයට ඡන්දයට ඉදිරිපත් වෙලා මෙවර ප්‍රාදේශීය සභාවට 04 වන වරටත් පත් වුණා. සියළුම දෙනාට ස්තුතිවන්ත වෙනවා. මෙවර කොට්ඨාස ක්‍රමයට මැතිවරණය තියද්දී මෙවර මා නියෝජනය කළේ කඩුගොඩ කොට්ඨාසය. සීතාවක ප්‍රාදේශීය සභාවේ ඉතාම දුෂ්කර ප්‍රදේශයක් කඩුගොඩ කොට්ඨාසය කියන්නේ. එම කොට්ඨාසයට අයත් ග්‍රාම සේවක වසම් 04 හි ඉන්න ජනතාවට මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. ඉහළ කොස්ගම දකුණ ග්‍රාම සේවක වසමේ ජනතාවත්, පහළ කොස්ගම නැගෙනහිර මා නියෝජනය කරන ග්‍රාම සේවක වසමේ ජනතාවටත්, කඩුගොඩ දකුණ හා කඩුගොඩ උතුර ග්‍රාම සේවක වසම් 02 හි ජනතාවටත් විශේෂයෙන්ම මෙතන්ට එන්නට මග පාදපු ඒ ජනතාවට විශේෂ ස්තුතියක් කරමින් තමුන්නාන්සේ ඇතුළු මේ මන්තිවරුන්ට මේ වසර 04 තුල හොඳ ප්‍රාදේශිය සභාවක් හැටියට පත් කරන්න ලේකම්තුමා පළමු ස්ථාන රාශියක් අපේ සභාවට අරන් තියෙනවා වගේම අපේ සභාවට දිගින් දිගටම ජයග්‍රහණ රාශියක් ලබාගෙන තියෙනවා. කොළඹ දිස්ත්‍රික්කයේ වගේම ලංකාවෙන්ම ඒ ජයග්‍රහණ ලබා ගන්නට හැකි වේවා යැයි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි විමල් ප්‍රසන්න මැතිතුමා</u>

ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු මගේ සහෝදර මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. විපක්ෂ නායකතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙනුත් , මාධ්‍ය වේදි මහත්වරුන්ගෙන්ද අවසරයි. අපි මන්ත්‍රිවරු වශයෙන් පසුගිය කාලේ කටයුතු කළා. බොහොමයක් දේවල් වලට දායකත්වය දැක්වුවා. අපි නෙළුම් පොහොට්ටුව යටතේ විශාල ජයග්‍රහණයක් ලබා ගත්තා. මටත් ඇස්වත්ත කොට්ඨාසයෙන් ජයග්‍රහණය කරන්න අවස්ථාව ලැබුණා. මම පළමුවෙන්ම මගේ අම්මා තාත්තා සහෝදර සහෝදරියන්ටත් නෑදෑ හිතවතුන්ටත් මගේ ඇස්වත්ත උතුර කොට්ඨාසයේ ජනතාවටත් ස්තුතිවන්ත වෙනවා. මානකඩ හා කනම්පැල්ල කොට්ඨාසයේ මා වෙනුවෙන් කැප වුණු සියළුම දෙනාට ස්තුති කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා. මම විශේෂයෙන් මතක් කරන්න ඕන මගේ කොට්ඨාසයේ ද්‍රවිඩ ජනතාවත් හිටියා. ඒ ජනතාවත් මා සමග එකතු වෙලා ඉතා ඉහළින් මා ජයග්‍රහණය කළා. ඒ සියලුදෙනාම මතක් කරනවා. මගේ ජයග්‍රහණය වෙනුවෙන් අපි කණ්ඩායමක් ලෙස එකතු වෙලා ඉන්න කොට අපේ කණ්ඩායමේ නායකයා වශයෙන් කටයුතු කළ රවින්ද්‍ර ජයසිංහ මැතිතුමා එතුමා විශාල ලෙස කැපවුණා අපේ හිටපු සභාපතිතුමා. වසර 1 ½ ක් පමණ කාලයක් තුල ගොඩ නගා ගත් පක්ෂයක් ඉදිරියට ගෙනියන්න දවස ගාණේ කැප වුණා. මෙය අපිට ලේසියෙන් ලැබුණු දෙයක් නෙමෙයි. මම එක ගෙදරට තුන්වතාවක්

ගියා. ගිහිල්ලා ලබා ගත් ජයග්‍රහණයක්. ඒ තුළින් අපිට විශාල ජයග්‍රහණයක් ලබා ගන්නට හැකි වුණා. සීතාවක ප්‍රාදේශීය බලය ලබා ගත්තා වගේ ඉදිරි වසර 04 තුල අපිට අභියෝග රාශියක් තියෙනවා. ඒ අභියෝග ජයගන්නට අපි ගරු සභාපතිතුමාත් සමග එකතු වෙලා වැඩ කටයුතු කරනවා. පළාත් සභාවේ මහා ආණ්ඩුවේ බලය ලබා ගැනීමේ පෙර නිමිත්තක් හැටියට තමයි අපි මේ කටයුතු කරගෙන යන්නේ. අපි අතරේ ගැටලු ඇති නොවුණා නෙමේ නමුත් අපි එකතු වෙලා සමගියෙන් කටයුතු කරගෙන යනවා. මම විශේෂයෙන් මතක් කරන්න ඕන ලේකම්තුමා එතුමා තමයි පසුගිය වසර 2 ½ තුල එතුමා තමයි අපේ බලධාරියා වශයෙන් කටයුතු කළේ. සභා බල ප්‍රදේශයට මහ ඇමතිතුමා සමග මට විශාල සංවර්ධන කටයුතු කරගෙන යාමට හැකියාව ලැබුණා. මගේ බල ප්‍ර දේශයට විශාල සේවයක් කරන්නට හැකියාව ලැබුණා. ලක්ෂ 45 ක විතර වැඩ කළා. ලේකම්තුමාට මම කිසි විටක බලපෑම් කළේ නැහැ. එතුමා ඒ සහයෝගය දැක්වුවා. මම එතුමාටත් එතුමාගේ කාර්ය මණ්ඩලයටත් විශේෂ ස්තුතියක් කරනවා. පසුගිය වසර 2 ½ තුල අපි පෞද්ගලික දේවල් කරගත්තේ නැහැ. මහ ඇමතිතුමා හරහා විශාල වැඩ කොටසක් සභා බල ප්‍ර දේශයට කර ගත්තා. ප්‍රධාන ඇමතිතුමා මට සහයෝගය දැක්වුවා. ඒ වෙනුවෙන් මම එතුමාට මේ අවස්ථාවේදි ස්තුතිවන්ත වෙනවා. මහේෂ් අල්මේදා මැතිතුමා එතුමා අපිත් සමග සියලු කොට්ඨාස වලට ගිහින් සහයෝගය දැක්වුවා. දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, ගීතංජන ගුණවර්ධන මැතිතුමා මේ සියළුදෙනාම අපිට සහයෝගය දැක්වුවා. අපේ මතය ගොඩ නගලා තමයි ජයග්‍රහණය ලබා ගත්තේ . ඒ සියළුදෙනාටත් ස්තුතිවන්ත වෙනවා. නවක මන්ත්‍රිවරු ඉන්නවා එතුමාලා අපෙන් තමයි ඉගෙන ගන්නේ. අපි විනයක් ඇතිව අපි ජ්‍යොෂ්ඨ මන්ත්‍රිවරු වශයෙන් සභාපතිතුමා සමග ගැටුමක් නැතිව ඉන්න ඕන. ආදර්ශමත් වෙන්න ඕන. ඒවගේම ගොට්ටෝ කියලා කථාවක් කිව්වා. ගොට්ටෝ වෙන්නේ නැහැ මේ සැරේ. නිවැරදි දේට තමයි එකග වෙන්නේ. හරි දේට එකග වෙනවා. පක්ෂයක් විදිහට කටයුතු කරනවා. ගොට්ටෝ වෙන වෙලාවලුත් තියෙනවා. හරි දේ හරි විදිහටත් වැරදි දේ වැරදි විදිහටත් අපි දකිනවා. ඔබතුමාගේ කාලය අපි ඉතාමත් අගය කොට සලකනවා. තව විශාල පිරිසක් අදහස් ප්‍රකාශ කිරිමට ඉන්නවා. ඒ අයටත් අවස්ථාව ලබා දෙමින් මගේ ජයග්‍රහණය සදහා සහයෝගය දැක්වූ සැමට ස්තුති වන්ත වෙමින් මම නිහඩ වෙනවා. බොහොම ස්තුතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මේරි මාග්‍රට් මල්ලිකාරච්චි මැතිතුමිය.</u>**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි. මාධ්‍ය වේදී මහත්වරුන්ගෙන් අවසරයි. කොට්ඨාසය අංක 13 හංවැල්ල. ඡන්ද දුන් සියළුම ජනතාවට මේ අවස්ථාවේදි ස්තුතිවන්ත වෙනවා. අපේ නායකතුමාට හා ලෙනාඩ් කරුණාරත්න මැතිතුමාට මගේ ස්තුතිය පුද කර සිටිනවා. 2018 වසර සුභ අළුත් අවුරුද්දක් වේවා යැයි ප්‍රාර්ථනා කරමින් මම නිහඩ වෙනවා. බොහොම ස්තුතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් දුමින්ද මැතිතුමා</u>**

ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු පක්ෂ විපක්ෂ සියළුම මන්ත්‍රීවරුන්ට සුභ නව වසරක් වේවා යැයි ප්‍රාර්ථනා කරනවා. ලේකම් තුමා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයට ගැලරියේ අසුන් ගෙන සිටින මහේෂ් අල්මේදා මැතිතුමා ඇතුළු සියලුම දෙනාට සුභ නව වසරක් වේවා යැයි ප්‍රාර්ථනා කරනවා. ගරු සභාපතිතුමනි, 2011 වසරේදි නවක මන්ත්‍රීවරයෙක් විදිහට ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්න මට අවස්ථාව ලැබුණා. මම සිහිපත් කරනවා දුමින්ද සිල්වා මැතිතුමා. ඒවගේම මට අපේක්ෂකත්වය ලබා දුන් සුමිත් සොයිසා මැතිතුමා මතක් කරන්න ඕන. මට පුළුවන් වුණා 2011 වසරේදී පක්ෂයෙන් මන්ත්‍රීවරු 17 ක් පත් වෙන කොට මට මේ ප්‍රාදේශීය සභාවේ හය වන ස්ථානයට මන්ත්‍රී අසුනක් ලබා ගන්නට හැකි වුණා. ඒ මන්ත්‍රිකමේ නියමිත ගුණාත්මකභාවය වටිනාකම මම හිතනවා මම ගම්

ප්‍රදේශයට පමණක් නෙවෙයි රීට එහාට ගිය වැඩ කොටක් කළ මන්ත්‍රීවරයෙක් විදිහට නිහතමානි ආඩම්බරයක් හා සන්තෝෂයක් විදින්න පුළුවන්. මොකද මම මගේ ජීවිතයේ වැඩි කාලයක් කැප කළේ ගෙදරට නෙවෙයි. සමාජ සේවයට කැප කළා. මගේ මුදල්, කාලය, ශ්‍රමය සියළු දේ මම කැප කළා. නමුත් දිගින් දිගටම මේ පක්ෂය තුළ වුණු අර්බුද කෙනහිලිකම් නිසා පක්ෂයේ රැදි සිටින්න හැකියාවක් තිබුණේ නැහැ. 2012 පළාත් පාලන කොට්ඨාස මායිම් නිර්ණය එනකොට ඔබතුමා දන්නවා දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා තමයි එහි මූලිකත්වය දැරුවේ. තුන්නාන කියන ගම අවිස්සාවේල්ල ආසනයේ විශාලම ගම ග්‍රාම සේවක වසම් 04 කින් යුක්ත ඡන්ද 5000 ක අධික ප්‍රමාණයක් තියෙනවා. ඒ ගමේ කොට්ඨාස මායිම් නිර්ණය කල විදිහ සියලුදෙනා දන්නවා. ගම කොටස් 03 කට බෙදුවා ගමේ නියෝජිතයින් පත් කර ගත නොහැකි විදිහට. අපේක්ෂකයෙක් දාන්න බැරි විදිහට තමයි බෙදුවේ. තුන්නාන බටහිර කොට්ඨාසය, මාවතගම බටහිර හා නැගෙනහිර කියලා බෙදුවා. එතකොට වසම් 02 ක් එහේ තියෙද්දි අපේක්ෂකයා දාන්නේ මාවතගමින්. මම පදිංචි වෙලා ඉන්න කුඩාකන්ද වසමත්, මහකන්ද වසමත් දිද්දෙණිය උතුර හා දකුණ ලෙස බෙදුවා. එතකොට දිද්දෙණියෙන් තමයි අපේක්ෂකයා දාන්නේ. කූඩළුවිල වසම ජයවීරගොඩත්, පහත්ගමත් එක්ක බෙදා වෙන් කළා. එතකොට අපේක්ෂකයා දාන්නේ ජයවීරගොඩ හා පහත්ගමින්. තුන්නාන කියන විශාලම ගමට අපේක්ෂකයෙක් නායකත්වයක් නැති කරන්න ගම අසරණ කරන්න අපේක්ෂකයෙක් දාන්න බැරි විදිහට තමයි එදා ඒ මායිම් නිර්ණයේදී ක්‍රියා කළේ. එය මම පැහැදිලි කියනවා.

ඒ සඳහා සභාවට එව්ව ලියුම්, පක්ෂයේ හිටිය කිසිකෙනෙක්ගෙන් එදා ඒ මායිම් නිර්ණ ගැටලු පිළිබඳව කථා කරන්න කැඳවපු කිසි දෙයකට අපිට ඒ සඳහා අවස්ථාවක් ලබා දුන්නේ නැහැ. මම හැකි පමණින් බැසිල් ඇමතිතුමා, මහින්දානන්ද අළුත්ගමගේ ඇමතිතුමා, ඒ සියලුදෙනාට මේ ප්‍රශ්නය මේ සියළුදෙනාට යොමු කළා. සභාවේදි මේ ගැන කථා කළා. සභා වාර්තා වල තියෙනවා. යෝජනා සභා සම්මත කරලා යැව්වා. නමුත් ඒවාට ඇහුම්කන් දෙන නායකයෝ හිටියේ නැහැ. ගම බේරගන්න සටනට මම බැලුවා විකල්පයක් අවශ්‍ය වෙලා තියෙනවා. මම 2015 දී අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පොදු අපේක්ෂකයා විදිහට ඉදිරිපත් වෙනකොට මම එතුමාට සහයෝගය දැක්වුවා. අපි ස්ටේජ් එක උඩට ඇවිත් චන්දන බැලසූරිය මන්ත්‍රීතුමා, යසරු රාජපක්ෂ මන්ත්‍රීතුමා, දුන්කලහේනේ හාමුදුරුවෝ, අපේ උප සභාපති ආනන්ද රූපසිංහ මැතිතුමා අපි ඒ අභියෝග වලට මුහුණ දුන්නා. මුහුණ දීලා ඡන්දේ දවසේ මගේ වාහනය හප්පලා එවකට හිටිය ආරක්ෂක ලේකම්තුමා පවා පැමිණියා. යසරු මන්ත්‍රීතුමා හිටියා. අස්ගිරිය හෝටලය ළඟදි. පොලිසියට කථා කළාම පැමිණිල්ල ලිව්ව නැති යුගයක් තිබුණා. අපිට යන්න තැනක් නැතිව අපි හැංගිලා හිටියා. නමුත් ඒවා දන්නේ නැති අය ඉන්නවා. ඒත් අපි අපිට අවශ්‍ය දේ කළා. ගෙවල් වලට බියවැද්දීම් කළත් අපි අපේ තීරණය හරියට ක්‍රියාත්මක කළා. අප් ස්ටේජ් නැගලා කථා කළා. තිබුණ අඩුපාඩුකම් පෙන්නුවා. ගම හා ආසනය වෙනුවෙන් පෙනී සිටියා. එම දේශපාලනය අපි පුද්ගලික වාසි තකා ගියේ නැහැ. අපි අංගම්පිටිය එම්.ජී. ප්‍රේමරත්න මන්ත්‍රීතුමාලාගේ රැස්වීමක ඉන්න කොට අපිව මුදල් වලට ගෙනියන්න තැරැව්කාරයෝ ආවා. අපේ රණවක මහත්තයලා ඒ සියළුදෙනා ඇහුම්කන් දුන්නා. ඒ සියලු දෙනා දන්නවා. අපේ ගෙවල් වලට ආවා. 26 වෙනිදා පැවති හංවැල්ල රැස්වීමට අපිව නග්ගන්න උත්සාහ කලා. අපි මුදලට අපේ ආත්මය පාවලා දුන්න මන්ත්‍රීවරු නෙවෙයි. සමහර අය බැරිම තැන වචන කියන්නත් ගත්තා. ඒවා මිනිස්සු පිළි ගන්නේ නැහැ. මිනිස්සු දන්නවා අපිට මුදල් පිළිබඳව ගැටලුවක් නැති බව. අපි සමාජයට යමක් කරනවා මිසක් සමාජයෙන් යමක් ගන්න මිනිස්සු නෙවෙයි. අපිට ඒ දවස් වල තිබුණු හැල හැප්පීම් නිසා මම එක්සත් ජාතික පක්ෂයෙන් අපේක්ෂකත්වය ඉල්ලන කොට ගරු අවිස්සාවේල්ල ආසන සංවිධායකතුමාට විශාල අභියෝගයක් වුණා. එතුමා පක්ෂ නායකත්වය සමගත් සුදුස්සාට සුදුසු තැන දෙන්න ඕන කියන තීරණයේ ඉදලා මට එක්සත් ජාතික පක්ෂයෙන් අපේක්ෂකත්වය දුන්නා. පවතින රජයට අනුව ප්‍රාදේශීය සභා ජයග්‍රහණය කරන බව අපි මෑත ඉතිහාසයේ දැක්කා. නමුත් දේශපාලන සුළි කුණාටුවක් අපි පසුගිය මැතිවරණයේදී දැක්කා. අවිස්සාවේල්ල ආසනයේ විතරක් නෙවෙයි

මුළු රට පුරාම අපි දැක්කා. පවතින ආණ්ඩුවේ යම් කිසි අඩුපාඩුකම් තියෙනවා. ඒවා අපි නැහැ කියන්නේ නැහැ. අපි කොතන හිටියත් හරි දේට හරි හා වැරදි දේට වැරදි අපි කියනවා. අළුත් පක්ෂයක් යටතේ අවිස්සාවේල්ල ආසනයේ විතරක් නෙවෙයි කොළඹ දිස්ත්‍රික්කයෙන්ම විජයග්‍රාහී විදිහට ජයග්‍රහණය කරන්න මට හැකියාව ලැබුණා. ඒ හැකියාව ලැබුණේ මම කළ වැඩ කොටසත් පක්ෂය ඇතුළෙත් කලින් හිටිය වාමාංශික නායකයෝ වගේම අපේ පක්ෂය ඇතුළෙත් ගැටලු තිබුණා. කකුලෙන් අදින්න උත්සාහ කළා. මගේ ගමේ වාමාංශික තරුණ තරුණියෝ සියළුදෙනා පක්ෂ භේදයෙන් තොරව මට විශාල සහයෝගයක් දුන්නා. මට ප්‍රථම ස්ථානයට ජයග්‍රහණය කරන්න හැකියාව ලැබුණා. එය විජයග්‍රහණයක් විදිහට තමයි මම දකින්නේ. අනෙක් තැන් වල කොට්ඨාස 23 ක් දිනනකොට කොට්ඨාස 03 යි අපි ජයග්‍රහණය කරන්නේ එක්සත් ජාතික පක්ෂය විදිහට. සුසන්ත රූපසිංහ මැතිතුමා අළුතින් මේ පක්ෂයට එකතු වුණේ. අපේ දුන්කලහේනේ හාමුදුරුවෝ උදව් කරපු උපුල් ජිනේන්ද්‍ර මන්ත්‍රීතුමා. මටම කියලා හදා ගත්ත ඡන්ද පදනමක් මට තියෙනවා. අපි අරන් ආපු ඡන්ද ප්‍රමාණයත් එක්ක තමයි එක්සත් ජාතික පක්ෂයෙන්වත් එක ගොඩක ඡන්දයෙන් ජයග්‍රහණය කරන කෙනෙක් නෙමෙයි මම. ඒ නිසා මම ජයග්‍රහණය කළා කියන විශ්වාසය මට තියෙනවා. නමුත් මට අපේක්ෂකත්වය ලබා දුන් පක්ෂයට මම ස්තූතිකරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා ගරු සභාපතිතුමනි. ඒවගේම අද ප්‍රාදේශිය සභාව නියෝජනය කරන්න ආනන්ද රූපසිංහ මැතිතුමා, චන්දන බාලසූරිය මැතිතුමා, එම්.ජී. ප්‍රේමරත්න මැතිතුමා, උපුල් චන්දන මැතිතුමා, දුන්කලහේනේ හාමුදුරුවෝ වගේ අය නැති එක ගැන මම කණගාටු වෙනවා. ඒ අයගෙත් විශාල දැනුම් සම්භාරයක් තිබුණා. හොද කථිකත්වයක් තිබුණා. කථා කරන්න හැකියාව තිබුණ අය මේ මැතිවරණ ක්‍රමයත් එක්ක අහිමි වුණා. මේ සභාව ගම නියෝජනය කරන්න ඉන්න ඕන අය. ඒ අය නැති වීම ගැන මම කණගාටු වෙනවා. උප සභාපතිතුමා වෙනුවෙන් එතුමාගේ දුව හෝ පෙනී සිටිනවා. අපි දේශපාලනයට එන්නේ පක්ෂයක් ගොඩනගන්නම නෙවෙයි. අපි ගම වෙනුවෙන් පක්ෂ පාට භේදයෙන් තොර වැඩ කරන්න අපිට ඡන්දය දෙන්න කියලා හැමෝම කියන්නේ නමුත් එය වචනයට පමණක් සීමා කරමින් ජනතාව රවට්ටමින් මේ සියලු දේශපාලඥයෝ තමන්ගේ අරමුණු ඉටු කර ගන්න තමන්ගේ පක්ෂය දියුණු කර ගන්න ඒවගේ කෙනෙහිලි කම් කරන හැටි අපි දක්නවා. නමුත් එය නොවෙයි විය යුත්තේ තමන්ගේ ගම වෙනුවෙන් ප්‍රදේශය වෙනුවෙන් පක්ෂ පාට භේදයෙන් තොරව වැඩ කරන්න ඕන. එය තමන්ට බලපානවා. එය මට වුණු නිසා මම කියන්නේ. ඒක ඇත්ත. මම එය යථාර්ථයක් විදිහට අත් වින්දා. අපි සමහර යෝජනා වලට එකගතාවය දැක්වුවේ නැත්තේ මේ මැතිවරණ ක්‍රමයෙන් බලාපොරොත්තු වුණු දෙයක් තිබුණා. මේ මැතිවරණ ක්‍රමයෙන් සැමට එක හා සමානව කොට්ඨාසයට වග කියන නායකයෙක් බිහි වෙන්න ඕන. ඔබතුමා සියළුදෙනාට පොදුවේ සාමානුපාතික විදිහට වැඩ කරන්න. ඔබතුමා සභාපතිවරයා විදිහට උප සභාපතිවරයා විදිහට වැඩි මුදල් ප්‍රමාණයක් ලබා ගත්තාට කිසි ගැටලුවක් නැහැ. එය ඔබතුමාලාගේ වරප්‍රසාදය. අනෙක් මන්ත්‍රීවරුන්ට පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව එක හා සමානව සලකන්න. අපි මේ ආසනය වෙනුවෙන් වැඩ කරමු කියන ඉල්ලීම මම ඔබතුමාගෙන් කරනවා. මම විමල් ප්‍රසන්න මන්තිතුමාට විහිළුවක් කළේ. එතුමා දවසක් කිව්වා ජයන්ත රෝහණ සභාපතිතුමාගේ ගොට්ටා මම තමයි කියලා. එය සභා වාර්තා වල තියෙනවා. මහා සභාවක් දවසක එතුමාම එහෙම කිව්වා. එහෙම කියලා එතුමාම නැවත බළලුන් ලවා කොස් ඇට බාවනවා වගේ පළවෙනි සභාවේ යෝජනා 02 ක් ගේනකොට මම හිතුවා මේ සැරේත් ඒක හරිම තමයි කියලා. මම ඒ නිසා විහිළුවට කිව්වා. එය හරි නම් තොප්පිය දා ගත්තට බොහොම ස්තූතියි. එහෙම කටයුතු කරන්න එපා. සියළුදෙනාට වගකිය යුතු මන්ත්‍රීවරයෙක් වෙයි කියලා බලාපොරොත්තු වෙනවා. සියළුදෙනාටම විශේෂයෙන් මගේ ගම්වාසීන්ට අවිස්සාවේල්ල ආසනයේ සියළුම දෙනාට මම මනාප ක්‍රමයෙන් පළමුව ආපු කෙනෙක් ඒ සියළුම දෙනාට මම ස්තූතිවන්ත වෙනවා. ඉදිරියට මීට වඩා යමක් කිරීමේ බලාපොරොත්තුව ඇතිව සියළුදෙනාටම නැවත වරක් ස්තූතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

<u>**ගරු ප්රාදේශීය සභා මන්ත්රි චන්දන ලියනගේ මැතිතුමා.**</u>

ගරු සභාපතිතුමා උප සභාපතිතුමා ඇතුළු සහෝදර මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි. මාධ්‍ය වේදි මහත්වරුනි, සීතාවක ප්‍රාදේශිය සභාවේ අළුත් මැතිවරණයත් එක්ක අළුතින් ගොඩ නැගුණු මහා සභාවේ පළමු රැස්වීම නැරඹීම සදහා මේ අවස්ථාවට පැමිණි ගැලරියේ සියලුදෙනාගෙන්ද අවසරයි. පළමුවෙන්ම අපේ ගරු සභාපතිතුමා ජයන්ත රෝහණ මැතිතුමාට සභාපතිවරයා ලෙස පත්වීම පිළිබදව අපි සුභ පතනවා. ඒවගේම මංජුල ප්‍රදිප් කුමාර් මැතිතුමාට උප සභාපතිවරයා ලෙස පත්වීම පිළිබදවත් සුභ පතනවා. ගරු සභාපතිතුමනි, සීතාවක ප්‍රා දේශිය සභාවේ පසුගිය අවුරුදු 04 ක කාල සීමාව තුල ඔබතුමාගේ සභාපතිත්වය යටතේ ලොකු වැඩ කොටසක් කළා. ඒ සභාවට අපි ආවේ එක්සත් ජනතා නිදහස් සන්ධානය හැටියට. බුලත් කොළය ලකුණ යටතේ තරග කරලා. මෙවර වෙනසක් වෙලා තියෙනවා. මෙවර අපි එන්නේ ශ්‍රිලංකා පොදුජන පෙරමුණ හැටියට. නෙළුම් පොහොට්ටුව ලකුණ ජයග්‍රහණය කරලා තමයි අපි සීතාවක ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්නේ. ඒක තමයි වෙනස. ගියවර බුලත් කොළය ජයග්‍රහණය කළා වගේම නෙළුම් පොහොට්ටුව ලකුණින් ජයග්‍රහණය කරලා තමයි සීතාවක ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්නේ. පහුගිය ජනාධිපතිවරණයෙන් අපේ කණ්ඩායම නියෝජනය කරපු මහින්ද රාජපක්ෂ මැතිතුමා පරාජයට පත් වුණාට පස්සේ අපි නැවත වතාවත් මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ බලවේගයට යොමු කර ගනීම සදහා ජනවාරි 08 වෙනිදායින් පස්සේ නුගේගොඩින් ආරම්භ කරපු පෙබරවාරි 18 වෙනිදා ආරම්භ කරපු ඒ ක්‍රියාදාමයේ ප්‍රතිඵලයක් තමයි ලංකාවේ සීතාවක ප්‍රාදේශීය සභාව වගේම බහුතර ප්‍රාදේශීය සභා නගර සභා ප්‍රමාණයක් නෙළුම් පොහොට්ටුව ජයග්‍රහණය කරලා අපි දැවැන්ත ජයග්‍රහණයක් ලබා ගත්තේ. නෙළුම් පොහොට්ටුව රටම ජයග්‍රහණය කරනකොට සීතාවක ප්‍රාදේශීය සභාවත් අපි කොට්ඨාස 23 ක් ජයග්‍රහණය කරනවා. ඉතා දැවැන්ත ජයග්‍රහණයක් කරලා තමයි අපි සීතාවක ප්‍රාදේශීය සභාවට එන්නේ. ඡන්දය ඉල්ලලා කොට්ඨාස 23 ක් ජයග්‍රහණය කරලා මන්ත්‍රිවරු 23 දෙනෙක් පත් වෙලා තමයි මේ ප්‍රාදේශිය සභාවට එන්නේ. එය දැවැන්ත ජයග්‍රහණයක්. ජාතික ලැයිස්තුවෙන් නම් කරපු කිසිදු මන්ත්‍රිවරයෙක් අපේ කණ්ඩායමේ නැහැ. සියළුමදෙනා මහජන ඡන්දයෙන් ජයග්‍රහණය කරපු මන්ත්‍රිවරු විදිහට තමයි පත් වෙන්නේ. එය තමයි අපි ලබපු දැවැන්ත ජයග්‍රහණය. හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් යුත් ශ්‍රිලංකා පොදුජන පෙරමුණ ලෙස අපි ගොඩ නගපු දේශපාලන බලවේගය විදිහට තමයි අපි ජයග්‍රහණය කරන්නේ. රටේම ජයග්‍රහණය වගේම සීතාවක ප්‍රාදේශීය සභාවේ ජයග්‍රහණය උදෙසා ශ්‍රිලංකා පොදු ජන පෙරමුණ විදිහට අපි පක්ෂ ගණනාවක් එකතු වෙලා ඒ පක්ෂ වල ජයග්‍රහණයක් හැටියට තමයි මේ ජයග්‍රහණය ලැබෙන්නේ. විශේෂයෙන් මම සිහිපත් කරන්න ඕන ශ්‍රිලංකා පොදුජන පෙරමුණ හැටියට අපේ අවිස්සාවේල්ල ආසනයේ සංවිධායක ලෙස කටයුතු කල නිතිඥ රවින්ද්‍ර ජයසිංහ මැතිතුමා විශේෂයෙන් සිහිපත් කරන්න ඕන මේ ජයග්‍රහණය පිටුපස හිටපු පුද්ගලයෙක් හැටියට. මහජන එක්සත් පෙරමුණේ දිනේෂ් ගුණවර්ධන නායකතුමා, ගීතාංජන ගුණවර්ධන මැතිතුමා මතක් කරන්න ඕන. අවිස්සාවේල්ල ආසනයේ අපිට හිටපු එකම මහජන නියෝජිතයා හැටියට ශ්‍රිලංකා කොමියුනිස්ට් පක්ෂයේ මහේෂ් අල්මේදා මැතිතුමා එතුමා එතුමාගේ සහයෝගය අපිට ලබා දුන්නා. ඒවගේම පිවිතුරු හෙළ උරුමයේ නායක උදය ගම්මන්පිල මැතිතුමා, අපේ ආසනයේ සංවිධායක අරුණ පී දිවිගල්ල මැතිතුමා, මේ මැතිවරණ ජයග්‍රහණය සදහා අපිට සහයෝගය දුන්නා. සමස්ත රටම ජයග්‍රහණය කරනකොට සීතාවක ප්‍රාදේශීය සභාවත් එයට එකතු කිරිම සදහා දැවැන්ත සහයෝගයක් මේ අය ලබා දුන්නා. විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕන මේ මැතිවරණ ක්‍රමයට අනුව විකෘති මැතිවරණ ක්‍රමයක් වුණත් මේ මැතිවරණ ක්‍රමයට මුහුණ දීලා මැතිවරණය ජයග්‍රහණය කිරිම සදහා කොට්ඨාස වශයෙන් අපිට තරග කරන්න ලැබුණේ. පහුගිය මැතිවරණයේ මනාප ක්‍රමයට ඉදිරිපත් වෙනකොට මුළු සීතාවක ප්‍රාදේශීය සභාවටම අපි තරග කළේ. නමුත් අළුත් මැතිවරණ

ක්‍රමයේදි අපි එක කොට්ඨාසයකට සීමා වුණා. මට ලැබුණු කොට්ඨාසය මාවතගම කොට්ඨාසය. මාවතගම ජනතාව ඉතාමත් පැහැදිලි ජන මතයක් ඉදිරිපත් කළා. මාවතගම සියළු ප්‍රගතිශීලි ජනතාවට මගේ ගෞරවය ස්තූතිය මම මේ අවස්ථාවේදී පුද කරනවා. මගේ කොට්ඨාසයට මාවතගම නැගෙනහිර හා බටහිර වගේම තුන්නාන බටහිර කියන ග්‍රාම සේවක වසමත් අයත් වුණා. විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕන. තුන්නාන බටහිර ජනතාවට විවිධ ගැටලු ඇති වුණා මේ මැතිවරණ ක්‍රමය ඇතුළේ. විවිධ හැලහැප්පිම් වලට විවිධ තර්ජන ගර්ජන වලට ඒ ජනතාවට මුහුණපාන්න සිදු වුණා. තුන්නාන බටහිර මා සමග වැඩ කල සියලු බලවේග වලට මේ දේ වලට මුහුණපාන්න සිදු වුණා. ඒ සියල්ල අභිබවා ගිහිල්ලා තුන්නාන බටහිර ග්‍රාම සේවක වසම ඇතුලේ වැඩිම ඡන්ද ප්‍රමාණය පොහොට්ටුව ලකුණ ජයග්‍රහණය කරන්න තුන්නාන බටහිර ප්‍රගතිශීලි ජනතාව දැක්වූ සහයෝගයට මම හිස නමා ආචාර කරනවා. මාවතගම කොට්ඨාසය තුල දැවැන්ත ජයග්‍රහණයක් ලබා ගෙන සීතාවක ප්‍රාදේශීය සභාවට මන්ත්‍රීවරයෙක් විදිහට තේරි පත්වීම සඳහා නන් අයුරින් සහයෝගය ලබා දුන් සියළුම දෙනාට මගේ ගෞරවය ප්‍රණාමය මේ අවස්ථාවේදී පුද කරනවා. විමල් ප්‍රසන්න මන්ත්‍රීතුමා කිව්වා වගේ මේ පළමු පියවර පමණයි. අපි මේ රටේ දැවැන්ත ජයග්‍රහණයක් ඉදිරියේදී ලබනවා. ඉදිරියේදී පැවැත්වෙන සියළු මැතිවරණ පොහොට්ටුව ලකුණ ජයග්‍රහණය කරවීම සඳහා අපි ඇප කැප වෙනවා. අපි පක්ෂ හැටියටත් පොදුජන පෙරමුණ හැටියටත් විමල් ප්‍රසන්න මන්ත්‍රීතුමා කිව්වා වගේ නාම යෝජනා ලැබිමේ ඉදන් අඩුපාඩු සිදු වුණා. ඒ සියල්ල අමතක කරලා රට කියන සාධකය මුල් කරගෙන අපි ඉදිරියේදී අපේ අරමුණ සාක්ෂාත් කර ගනිමු. ඉදිරියේදී රටම ජයග්‍රහණය කරවීම සඳහා ඇප කැප වෙලා මේ සියළු බලවේග ඒකරාශි කරන්න අපි සූදානම් වෙන වෙලාවක තමයි මේ ප්‍රාදේශීය සභාවේ පළමු මහා සභාව අද දිනයේදී පවත්වන්නේ. මන්ත්‍රීවරයෙක් ලෙස තේරි පත්වීම සඳහා සහයෝගය දැක්වූ සැමට මාගේ ගෞරවය ප්‍රණාමය පුද කරන ගමන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විදිහට ඡන්දය ඉල්ලුවාට නෙළුම් පොහොට්ටුව ලකුණින් ඡන්දය ඉල්ලුවාට අපිට මේ අවස්ථාව ලැබෙන්න මූලික වුණු කාරණයක් තියෙනවා. ඒ මම ජාතික නිදහස් පෙරමුණේ සාමාජිකයෙක් වුණු නිසා. මගේ ගෞරවය මේ අවස්ථාවේදි ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශ මැතිතුමන්, පක්ෂයේ ප්‍රධාන ලේකම්තුමා ඇතුළු සියලු ම දෙනාටම මගේ ස්තූතිය පුද කරනවා. ජාතික නිදහස් පෙරමුණේ සාමාජිකයෙක් නොවුණා නම් මට නාම යෝජනා මේ අවස්ථාවේදි ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ තැනට එන්න මට මූලික වුණේ ජාතික නිදහස් පෙරමුණ. ජාතික නිදහස් පෙරමුණට මගේ ගෞරවය පුණාමය පුද කරමින් මන්ත්‍රීවරයෙක් වීම සඳහා සහයෝගය දැක්වූ සියළුදෙනාට නැවත වතාවක් ස්තූතිය පුද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි යසරු රාජපක්ෂ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු පාලක පක්ෂයේ මන්ත්‍රීවරු හා විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි. සියළුදෙනාටම සුභ අළුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරනවා. අද සීතාවක ප්‍රාදේශීය සභාවේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නියෝජනය කරමින් මට නැවතත් සීතාවක ප්‍රාදේශීය සභාවට පත් කිරිම සම්බන්ධයෙන් අපේ පක්ෂයට මම මුලින්ම ස්තූතිය පුද කරනවා. ශ්‍රිලංකා නිදහස් පක්ෂය විදිහට 1991 දී සිට සීතාවක ප්‍රාදේශීය සභාවට පත් වුණු දවසේ ඉදන් මතක් කරන්න ඕන ශ්‍රිලංකා නිදහස් පක්ෂය නියෝජනය කල හිටපු උප සභාපති ඩී.ඩී. නිමල්සිරි මැතිතුමා ඇතුළු සියලු ශ්‍රිලංකා නිදහස් පක්ෂයේ මූලික මන්ත්‍රීවරු හැටියට එතුමන්ලා ශ්‍රිලංකා නිදහස් පක්ෂය නියෝජනය කළා. අද එතුමාගේ පුත්‍ර රත්නය වසර 25 කට පසු ශ්‍රිලංකා පොදුජන පෙරමුණින් හෝ වෙනත් පක්ෂයකින් නැවත ප්‍රාදේශීය සභාව නියෝජනය කිරිම සුභදායක කටයුත්තක් ලෙස සලකනවා. 1997 දී මගේ පියා සීතාවක ප්‍රාදේශීය සභාව නියෝජනය කළා. සිරිසේන රාජපක්ෂ මැතිතුමා ශ්‍රිලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් 2002 වසරේදීත් සීතාවක ප්‍රාදේශීය

සභාවේ විපක්ෂ නායක ධූරය ශ්‍රීලංකා නිදහස් පක්ෂයට ලබා ගනිමින් ශ්‍රීලංකා නිදහස් පක්ෂය බල ගැන්වීමට ප්‍රමුඛතාවය ගෙන කටයුතු කළා. ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරුන් වරියන් ඒ සඳහා කටයුතු කළා. 2006 සීතාවක ප්‍රාදේශීය සභාවේ ප්‍රථම ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා විදිහට මගේ පියා පත් වුණා. නමුත් එතුමාගේ අභාවයෙන් පස්සේ නැවතත් උපසභාපති ධූරය දැරූ ශ්‍රීලංකා නිදහස් පක්ෂය තමයි සීතාවක ප්‍රාදේශීය සභාවේ නායකත්වයට පත් වුණා. ඊට පස්සේ තමයි ඔබතුමා ජයන්ත රෝහණ සභාපතිතුමා පත් වුණේ. එදා ඒ ඔබතුමා සමග 2011 දී සීතාවක ප්‍රාදේශීය සභාවට නවක මන්ත්‍රීවරයෙක් විදිහට එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් බුලත් කොළය ලකුණින් මට සභාව නියෝජනය කරන්නට අවස්ථාව ලබා දුන් ඔබතුමාගේ නායකයින් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නායකයින් විදිහට දිනේෂ් ගුණවර්ධන හිටපු අමාත්‍යතුමා, ගීතාංජන ගුණවර්ධන හිටපු අමාත්‍යතුමා, ශ්‍රීලංකා නිදහස් පක්ෂ අවිස්සාවේල්ල ආසනයේ ප්‍රධාන සංවිධායකතුමා සුමිත් සොයිසා මැතිතුමා ඒ සියළුදෙනාගේ ශක්තියෙන් මම 2011 දී එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් 13 වෙනි මන්ත්‍රීවරයා විදිහට පත් වුණා. පස්සේ අපි මේ දේශපාලන වතාවරණය උඩ යම් යම් ගැටලුකාරි තත්වයන් බාධක ඇති වුණා. ඒ ඇති වුණු තත්වයන් උඩ තමයි ගයාන් දුමින්ද මන්ත්‍රීතුමා ප්‍රකාශ කල ආකාරයට අපි යම් කිසි තීරණයකට එළඹිලා අඩුපාඩු දැකලා අපි යම් කිසි දේශපාලන තීන්දුවකට පැමිණියේ. ඒ දේශපාලන තින්දුව නිවැරදි කියලා මට තේරුණේ 2015 වසරේදී ශ්‍රීලංකා නිදහස් සන්ධානයේ හිටපු මහ ලේකම්තුමා වර්තමාන සභාපතිතුමා පොදු අපේක්ෂකයා විදිහට ඇවිත් මෛත්‍රිපාල ජනාධිපතිතුමා රට භාර ගැනීම නිසා මම ගත්ත තීරණය නිවැරදි කියලා මම අදටත් විශ්වාස කරනවා. අපි ශ්‍රීලංකා නිදහස් පක්ෂය විදිහට වර්තමානයේ යම් පසුබෑමකට යම් අඩපණ වීමකට පත් වුණත් ඒ අඩපණ වීම කෙසේ වෙතත් ශ්‍රීලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානය පසුගිය මහ මැතිවරණයෙන් පස්සේ ශ්‍රීලංකා නිදහස් පක්ෂය, එක්සත් ජනතා නිදහස් සන්ධානය පසුබෑමකට ලක් වුණා කියලා කිව්වත් අනෙක් පක්ෂ දෙක හා සසඳන කල තනි පක්ෂයක් විදිහට සන්ධානයක් විදිහට ශ්‍රීලංකා නිදහස් පක්ෂය තමයි ප්‍රධාන වෙන්නේ. මම දකින විදිහට අපි තමයි ජයග්‍රහණය කරලා තියෙන්නේ. අපි ලංකාවෙන් ලක්ෂ 17 ක් පමණ ඡන්ද ප්‍රමාණයක් ලබලා තියෙනවා. අවිස්සාවේල්ල ආසනයේ ඡන්ද 9000 කට කිට්ටු ප්‍රමාණයක් ලබලා තියෙනවා. අපිට මන්ත්‍රීවරු 1300 කට එහා පැත්ත ඉන්නවා එක්සත් ජනතා නිදහස් සන්ධානයට. අපි සෑහීමකට පත් වෙනවා රටේ තියෙන දේශපාලන වතාවරණය උඩ අපිට මේ තැන ලැබීම පිළිබඳව අපි සෑහීමකට පත් වෙනවා. එක්සත් ජනතා නිදහස් සන්ධානය විදිහට පසුගිය මැතිවරණයේදී අපි උඩුගම් බලා තමයි පීනුවේ. ගරු සභාපතිතුමනි, අපි උඩුගම් බලා පීනුවාට උඩු ගම් බලා පීනන පාත්‍රය තමයි කවදාහරි බුදු වෙන්නේ කියන එකත් මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමතියි. මම නියෝජනය කල ගලගෙදර කොට්ඨාසය. ගලගෙදර කොට්ඨාසයෙන් ජයග්‍රහණය කල මන්ත්‍රීතුමාට මම සුභ පතනවා. ඒවගේම අපි ලබා ගත් ඡන්ද ප්‍රමාණය හැටියට මා ලැබූ ඡන්ද ප්‍රමාණය අවිස්සාවේල්ල ආසනයේ වැඩිම ඡන්ද ලබා ගත් එක්සත් ජනතා නිදහස් සන්ධානය විදිහට ලබා ගත් පුද්ගලයා විදිහට මට ඒ ශක්තිය ධෛර්යය ලබා දුන් ගලගෙදර උතුර, දකුණ හා නැගෙනහිර ජනතාවට හදපිරි ස්තුතිය පුද කරන අතර ඉදිරියේදී ඔබ ගෙන යන මේ වැඩ පිළිවෙලට සාර්ථක විදිහට අපේ පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ තේරුවේ සියළුම ජාති නියෝජනය වන විදිහට තමයි ජාති ආගම් කාන්තා නියෝජනය අනුව අපේ පක්ෂයේ මන්ත්‍රීවරු තුන්දෙනා තේරිලා ඉන්නේ. අපිත් ගරු සභාපතිතුමාට සහයෝගය දක්වන්න තීරණය කළා. මොකද ඔබතුමාත් එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් පත් වුනු හිටපු මන්ත්‍රීවරයෙක් විදිහට මේ ඉන්න අපේ කොට්ඨාස 23 ම දිනපු මන්ත්‍රීවරු බුලත් කොළය යටතේ කලින් හිටිය අය විදිහට අපි ආඩම්බර වෙනවා ඒ දිනපු 23 ත් එක්ක අපේ 03 ත් එකතු කළොත් 26 ක් වෙනවා කියලා. ඔබතුමාගේ අතේ තමයි එය තීරණය වෙන්නේ. ඔබතුමාගේ සහයෝගය මතයි එය තීරණය වෙන්නේ. අපේ නායකයෝ කියන කටයුතුත් එක්ක කණ්ඩායම් නායකයින් කියන විදිහට ඉදිරියේදීත් මේ කටයුතු වලට අපිට සහයෝගය ලබා දෙන්න අපි දන්නේ නැහැ තව අවුරුදු කීහිපයකින් අපි

එකතු වෙන්නත් පුළුවන්. ශ්‍රීලංකා නිදහස් පක්ෂය විදිහට එක්සත් ජනතා නිදහස් සන්ධානය විදිහට. තනි තනිව ගමන් කරන්නත් පුළුවන්. යන ගමන කෙසේ වෙතත් මේ ප්‍රාදේශීය සභාව තුල අපි තුන්දෙනෙක් ඉන්නවා. අපිටත් පහසුකම් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ශ්‍රීලංකා නිදහස් පක්ෂය හා එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් අපේක්ෂකයෝ 43 දෙනෙක් තරග කළා. ඒ සියලුදෙනාටත් ස්තුතිවන්ත වෙනවා. ශ්‍රීලංකා නිදහස් පක්ෂයට ජය වේවා. එක්සත් ජනතා නිදහස් සන්ධානයට ජය වේවා යැයි ප්‍රකාශ කරමින් මම නිහඩ වෙනවා. බොහොම ස්තුතියි.

<u>ගරු ප්රාදේශීය සභා මන්ත්රි සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් මහජන ගැලරියේ සිටින බස්නාහිර පළාත් සභා මන්ත්‍රී මහේෂ් අල්මේදා මැතිතුමා ඇතුළු සියලුම දෙනාට සුභ අළුත් අවුරුද්දක් වේවා යැයි ප්‍රාර්ථනා කරනවා. අපි අවස්ථාව ටිකක් කලින් ලබා ගන්නවා ඉක්මනින් මේ ස්ථානයෙන් බැහැර වීමට අවශ්‍ය නිසා. ප්‍රාදේශීය සභා ආරම්භ කල දවසේ සිට වසර 24 ක් මේ ප්‍රාදේශීය සභාව නියෝජනය කරපු මගේ ආදරණිය මව රංජනි ඉද්දගොඩ මන්ත්‍රීතුමියගේ පුතෙක් හැටියට මට මේ සභාව නියෝජනය කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. එතුමිය සීතාවකට පමණක් නෙමෙයි ලංකාවටම අඛණ්ඩව පළාත් පාලන ආයතනයක් නියෝජනය කල මන්ත්‍රීවරිය හැටියට තමයි පසුගිය කාලයේ කටයුතු කළේ. පසුගිය කාල සීමාව තුලදී අපේ පවුලේ ඇති වුණු තත්වයන් එක්ක එතුමියට පසුගිය මැතිවරණයට තරග කරන්නට අවස්ථාව නොලැබිච්ච වෙලාවේ අපෙන් කරපු ඉල්ලීමත් එක්ක මැතිවරණයට ඉදිරිපත් වෙලා මේ වනවිට ජයග්‍රහණය ලබා ගෙන එතුමිය කරගෙන ආ වැඩ කොටස ඉදිරියට කරගෙන යාමට අපි සුදානම් වෙලා ඉන්නවා. විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕන මැතිවරණය පැවැත්වෙන කාල සීමාව තුළදී අපිව මේ ව්‍යාපාරයට යොමු කල අපේ ආදරණිය පියාණන් අපිට නැති වුණා. ඒ කාල සීමාව තුල අපි ඉතාමත්ම අසිරු අවස්ථාවක ඉදිද්දි අපිට ශක්තියක් වෙමින් අපිව දේශපාලනය සඳහා නිර්මාණය කල අපේ පක්ෂයේ නායක දිනේෂ් ගුණවර්ධන මැතිතුමන්ට, ගීතාංජන ගුණවර්ධන මැතිතුමන් එක්ක සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපේ දේශපාලන ගමනට මහේෂ් අල්මේදා මැතිතුමා, රවින්ද්‍ර ජයසිංහ මැතිතුමා වැනි දේශපාලන නායකයින් අපේ බල කඳවුර නියෝජනය කරන සියලු දේශපාලන පක්ෂවල නියෝජිතයින් අපිට ශක්තියක් වුණා. ඒ නිසා අපිට සහයෝගය දැක්වූ සැමට ස්තුතිවන්ත වෙන්න මෙය අවස්ථාවක් කර ගන්නවා. ශක්තිමත් ජයග්‍රහණයක් රට හමුවේ ගොඩනගන්න හැකි වුණු අවස්ථාවක්. අපේ ජයග්‍රහණයත් සහතික කරන්නට උදව් කළ සැමට ස්තුති කරන්නට මෙය අවස්ථාවක් කර ගන්නවා. ගරු සභාපතිතුමනි, සීතාවක ප්‍රාදේශීය සභාවේ නමවෙනි සභාපතිවරයා විදිහට ඔබතුමා පත් වෙන්නේ. දෙවරක් පිට පිට පත් වුණු ප්‍රථම සභාපතිවරයා ලෙස තමයි ඔබතුමා පත් වෙන්නේ. අපි විශ්වාස කරනවා ජනතාව තැබූ විශ්වාසය රැකගෙන සියළුම මන්ත්‍රීතුමන්ලා සමග ශ්‍රීලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරන මන්ත්‍රීවරු එක්ක සීතාවක ජනතාව වෙනුවෙන් ගෙන යන ඒ වැඩ පිළිවෙල ඉදිරියට ගෙනියන්ට ඔබතුමාට මේ සියලු මන්ත්‍රීවරු ශක්තිය ලබා දෙයි. ඒ ශක්තිය ලබා ගන්නට අපිත් සියළු ශක්තිය යොදවලා සීතාවක ජනතාවගේ ජයග්‍රහණයට අපි කටයුතු කරන බව ප්‍රකාශ කරන්න කැමතියි. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙනුවෙන් ජනතාව තබලා තියෙන විශ්වාසය ජනවාරි 08 වෙනිදා ජයග්‍රහණය ආපස්සට හැරුණු වෙලාවේ ජනතාව තේරුම් අරගෙන රටේ බහුතරය විදිහට මේ ගමන ඉදිරියට ගෙනියන්න අවස්ථාව දීලා තියෙනවා. මේ ගමන ඉදිරියට ගෙන යන්න අපි කැප වෙනවා වගේම මැතිවරණයේදී අපි නියෝජනය කලේ කොස්ගම කොට්ඨාසය හැටියට. ඒ කොට්ඨාසයේ තාවල්ගොඩ, කනම්පැල්ල බටහිර හා ඉහළ කොස්ගම උතුර ග්‍රාම සේවා වසම් නියෝජනය කළා. ජනතාව අපිව ජයග්‍රහණය කරලා නියෝජිතයා හැටියට අපිව පත්කළා. මේ සියළු සංවර්ධන කටයුතු ඔවුන් හමුවට ගෙන යන්නට ඒ ජනතාව නියෝජනය කරනවා. ඒ ජනතාවට ස්තුතිය පුද කිරිමට මෙය අවස්ථාවක් කර ගන්නවා. ඔවුන්ගේ විශ්වාසය මේ සභාවෙන් ලැබිය යුතු සියළුම වරප්‍රසාද ඒ ජනතාව

වෙනුවෙන් හා සීතාවක බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ක්‍රියා කිරීමට කටයුතු කරනවා. පසුගිය වසර 03 ක කාලය සභාව මහජන නියෝජිතයින්ගෙන් තොර වුණු අවස්ථාවේ මේ සභාව මෙහෙයවපු ලේකම් චන්දන පද්මසිරි මහතා ප්‍රධාන කාර්ය මණ්ඩලය ඔවුන්ගේ උපරිමය යොදවලා කටයුතු කළා. අපේ යම් යම් අවස්ථා වලදීත් ඉතාමත් මැනවින් ක්‍රියාත්මක වෙලා අපට සහයෝගය ලබලා දුන්නා. ඔවුන් ඒ කරපු සේවය පිළිබඳව ස්තුතිවන්ත වීමට මෙය අවස්ථාවක් කර ගන්නවා. සභාපතිතුමා පුමුබ මන්ත්‍රි මණ්ඩලයට ඉදිරි වසර 04 ක කාලය තුල මේ සභාව මෙහෙවලා මේ සභාවෙන් ජනතාව වෙනුවෙන් කරන්න පුළුවන් දේ ඉටු කරන්නට ශක්තිය ධෛර්යය ලැබේවා යැයි ප්‍රාර්ථනා කරමින් ඔබතුමාටත් අපේ ශක්තියටත් ලබා දෙන බවට පොරොන්දු වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ප.ව. 1.15 ට දිවා විවේකය සඳහා සභාවේ කටයුතු අත්හිටුවන ලදී.**

**ප.ව .2.10 ට නැවතත් මහා සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.**

<u>ගරු සභාපතිතුමා</u>

දිවා විවේකයෙන් පසු සභාවේ කටයුතු ආරම්භ කරනවා මම අවස්ථාව දෙනවා සභාව අමතන්න කියලා. දැන් වේලාව 2.10 යි තව මන්ත්‍රිතුමන්ලා 30 කට වඩා වැඩි ප්‍රමාණයක් කතා කරන්න ඉන්නවා. මම වෙලාව සීමා කරන්න උත්සහා කරන්නේ නැහැ. නමුත් මම කියන්නේ අඩුම ගානේ විනාඩි 15 ක් වත් සභාව ආමන්ත්‍රණය කරන්න කියන කාරණාව තමයි ඔබට මතක් කරන්නේ. ඒ අනුව සභාව ආමන්ත්‍රණය කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයන්ත රණවක මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමන්ලාටත් මන්ත්‍රීතුමියන්ලාටත් ඒ වගේම ගරු උප සභාපතිතුමාත් අද මංගල සභාවේ ලේකම්තුමා ප්‍රධාන කාර්ය මණ්ඩලයේ සියළු දෙනාගෙනුත් අවසරයි. අද මම දීර්ඝ කතාවක් කරන්න යන්නේ නැහැ. විශේෂයෙන්ම සීතාවක ප්‍රාදේශීය සභාවේ 1991 ඉඳලා පලවෙනි සභාව නියෝජනය කල මන්ත්‍රීවරයෙකු හැටියට අපිට අද දවල් දිවා භෝජනය ගන්නා විට මට මතක් උනා මොන තරම් මේ සභාව වෙනස් වෙලා තියෙනවද කියලා. මොකද අපේ හිටපු සභාවේ චන්ද්‍රසිරි ගමගේ මන්ත්‍රීතුමා සමග මා කතා කලේ අපේ නවක මන්ත්‍රීවරුන්ට විශේෂයෙන් සඳහන් කරන්නේ අපි 1991 සභාවට එනකොට අපි එක්සත් ජාතික පක්ෂය මම නියෝජනය කළේ ඒවගේම මහජන එක්සත් පෙරමුණ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දොලොස් දෙනෙක්, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රී වරයෙක් හා එක්සත් සමාජවාදී පෙරමුණේ මන්ත්‍රීවරයෙක්. ඒ අනුව එදා අපි මහ සභාවක් ඉවර වෙනකොට හැබැයි අපි දවල් දෙක තුන වෙනකොට අපි මේක ඉවර කරනවා . අපිට හම්බවෙන්නේ මං හිතන්නේ සන්ධ්‍යා මිස් ඒ කාලේ අළුත් පත්වීම් ලැබිලා මේ සභාවට ඇවිත් හිටියේ එක්කෝ ප්ලේන්ටියක් දෙනවා ටී බොන අයට ටී එකක් දෙනවා. අද අපි සභාවට ආවම බුෆේ සෙට් එකක කෑම ඇරලා දවල්ට හොඳට කාලා බීලා මේ සන්තෝෂෙන් ඉන්න වෙලාව මම මේ කිව්වේ ඒ වෙනස නවක මන්ත්‍රීවරු විශේෂයෙන්ම හිතනවා ඇති මේ පහුගිය කාලේ හොඳට කන්න ඇති කියලා මේ සත්‍ය කතාව කියන්නේ අපේ අත්දැකීම් එක්ක 1998 අපේ ගමගේ චන්ද්‍රසිරි මහත්තයලා ඉන්න කාලේ තේ බොන්න අපිට ගෙනාවා. ප්ලේන්ටි හරි මොනවා හරි ඔය සාමාන්‍ය ෂෝට්ස් වර්ග මොනවා හරි ඊට පස්සේ කෑම පාර්සලයකට මේක පරිවර්තනය කළා. පහුගිය කාලේ අපි සියලුදෙනා උදේ 10 ට නවත්තලා ෂෝට්ස් මොනා හරි කාලා තේ බීලා ඊට පස්සේ දවල්ට ආපහු කෑම පාර්සලයකුත් හම්බෙනවා ඕකත් කනවා. මං දන්නේ නෑ අද වනවිට ඒක තවත් වෙනස් වෙලා තියෙනවා ඉස්සරහටත් මෙහෙමම යයිද මංගල සභාවට නිසා මෙහෙම උනාද දන්නේ නැහැ. කොහොම උනත් 22 දැන් 43 ක් වෙලා සභාවෙත් වියහියදම් හුඟක් වැඩිවෙලා අපිට විශේෂයෙන් මම හිතන්නේ අපේ චේතනා දීමනාව ගැනත් කියන්න ඕනේ. අපි පලවෙනි සභාවට එනකොට

රුපියල් 995 ක් තමයි හම්බ උනේ. 91 දී ඊට පස්සේ කාලයක් යනකොට රුපියල් 1595 ක්. ඔල්ගා මන්ත්‍රීතුමිය ඒ කාලේ නියෝජනය කරපු කෙනෙක් මේ සම්බන්ධයෙන් දන්නවා. ඊට පස්සේ චන්ද්‍රිකා මැතිණිය ඇවිල්ලා 3095 ක් කළා. ඊට පසුකාලීනව මේක රුපියල් 5000ක් උනා මහින්ද රාජපක්ෂ මහත්මයා රු.5000 ද කොහෙද මම හිතන්නේ හැබැයි ඊට පස්සේ එතුමා 2014, 2015 ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කරන්න ඉස්සෙල්ලා පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්ට අර 5000 ක් දීපු එක එකපාරට 15000 ක් කලා. පොඩ්ඩක් මේක සාක්කුවට දැනෙන මොකද ඒ නිසා සමහරු හිතනවා අපේ ගම්වල ජීවත් වෙන අයත් මේ එන අයත් හිතනවා මේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු මාර දෙයක් කරන්නේ පුදුම සල්ලියක්නේ මේගොල්ලන්ට තියෙන්නේ. හැබැයි මේක බොහෝම අසරණ මන්ත්‍රීකමක් මම දකින විදියට. අපිට මඟුල් ගේ දානේ ගේ මළ ගේ මේ සියල්ල තියෙනවා. මම දන්න හැටියට අපේ සභාවේ මන්ත්‍රීවරු එක්කෙනෙක් දෙන්නෙක් තුන්දෙනෙක් ඇරෙන්න අනිත් අය සභාවේ කොන්ත්‍රාත් කළේ නෑ කවදාවත්. කොන්ත්‍රාත්කරුවෝ පස්සේ ගිහිල්ලා මුදල් හඹා ගියේ නෑ. මේකයි සත්‍ය කතාව අපේ හිටපු පරණ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු දන්නවා. එක්කෙනෙක් දෙන්නෙක් ඔය අතර ඉන්න පුළුවන්. එහෙම සභාවක තමයි අද අපි 43 දෙනෙක් මේ වාඩිවෙලා ඉන්නේ හැබැයි ඒකෙ අනිත් එක තමයි මම කියන්න ඕනේ මම එදා 91 ආවේ එක්සත් ජාතික පක්ෂයේ අලියා ලකුණෙන් ඡන්දේ ඉල්ලා තමයි ආවේ ඒ නිසා අදත් අලියා ලකුණෙන් තමයි පහුගිය මැතිවරණයට මම තරඟ කළේ. ඒ මැතිවරණයට තරඟ කළාම අළුත් ක්‍රමයකට මේ මැතිවරණය ආවේ. මගේ කොට්ඨාශයෙන් තරඟ කළ මගේ මිත්‍රයා අශෝක වැලිකල මහත්මයා අපි දෙන්නා එක පන්තියේ එක ඉස්කෝලේ යන කාලේ ඒ හින්දා එතුමයි මමයි තරඟ කළහම මම එතනදි පරාද උනා. ඇත්ත කතාව බලපුවාම මම ඡන්ද 1527 ක් එක්සත් ජාතික පක්ෂයෙන් මට ඡන්ද හම්බුනා එතුමට 2185 ක් ද කොහෙද මට මතක විදියට ඒ හින්දා එතුමා තමයි උඩුමුල්ල කොට්ඨාශයේ මන්ත්‍රීවරයා විදියට පත්වුනේ. මම බලාපොරොත්තු උනා මේ දේශපාලනයේ තවදුරටත් ජනතාවට මොකද අපි කරලා තියෙන සේවයත් එක්ක මේක සමහරක් වෙලාවට ප්‍රමාණවත් නෑ කියලා හිතලා අළුත් මන්ත්‍රීවරු පත් වුනාම අපි අයින් වෙන්න ඔනේ නමුත් පක්ෂයේ ලොකු ඉල්ලීමක් තිබුණා අපේ සංවිධායකවරයා ලෙනාඩ් කරුණාරත්න මැතිතුමාගෙත් පක්ෂයේ නායකයින්ගෙත් අපි ඒ කොට්ඨාශවලින් පැරදුනත් අනුපාත ක්‍රමය තුළ මේ සභාව නියෝජනය කරන්න ඕනෙ කියන එක එතුමන්ලාගේ ලොකු ඉල්ලීමක් තිබුනා ඊට පස්සේ තමයි අපේ මංජුල මන්ත්‍රීතුමා, ඔල්ගා මන්ත්‍රීතුමිය අපි සියලුදෙනා තීන්දු කළේ මේ විදියට මේ මන්ත්‍රීධූරය භාරගන්න. ඊට සමාන කොට්ඨාශ තරඟ කරලා දිනපු තමුන්නාන්සේලාත් පැරදිච්ච අපිත් එක ගානයි ඔක්කෝම මන්ත්‍රීවරු වෙනසකට තියෙන්නේ උප සභාපතිතුමයි සභාපතිතුමයි විතරයි ජන්දෙන් දිනපු ඒ හින්දා මෙතෙන්දි සමහරක් වෙලාවට දැන් කියන්න පුළුවන් “ ඕකා පිනට ආපු එකා“ කවුරුහරි කියන්න පුළුවන් ඕවා ඒ හින්දා පිනට එන්නත් පිනක් තිබුණ නිසා තමයි එහෙම ආවේ ඒ නිසා මේක අපිට එක පක්ෂයක් තිබුණේ මොකද මම අලියා ලකුණින් අපිට එක අනන්‍යතාවයයි තියෙන්නේ මට අයිඩින්ටි කාඩ් 02 ක් නෑ මට පාස්පොට් දෙකක් නෑ එකයි තියෙන්නේ. මට එක පක්ෂයයි අලියා ලකුණෙන් ආවේ. ඒ හින්දා මම හිතන්නේ අපි ඒවා ඒ විදිහට ස්ථාවරයක ඉන්නවා යසිරු මන්ත්‍රීතුමා බුලත් කොලෙන් කිසි ප්‍රශ්නයක් නැහැ. එතුමා බුලත් කොලේ ඒ වගේ මගේ මිත්‍රයා අපේ කවුද අපේ චන්දන මුදුන්කොටුව මන්ත්‍රිතුමා අපිත් එක්ක එකට හිටපු මන්ත්‍රීතුමා එතුමා 2002 වෙනකොට අපේ අලියා ලකුණෙන් අවේ. හැබැයි එතුමා ඊට පස්සෙ පක්ෂෙ වෙනස් කලා ඒක ගැටළුවක් නැනේ අද අපිට තිබුනා අපි පක්ෂයක් හැටියට ඒ ගත්ත තීරණය ඒ විධියට ඉස්සරහටත් ගෙනියන්න ඒ නිසා තමුන්නාන්සේලාට විශේෂයෙන් මම දීර්ඝ කතාවක් කරන්න යන්නේ නෑ අපිට අලුතෙන් පත් වු මන්ත්‍රීවරු විශාල ප්‍රමාණයක් ඉන්නවා මේ සභාවේ. ඒ වගේම අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු හිටපු ගරු සභාපතිවරයෙක් චන්ද්‍රසිරි ගමගේ මැතිතුමා ඒ වගේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු කිහිපදෙනෙක් ඉන්නවා. මෙතෙන්දි අවසන් වශයෙන් මම කියන්නේ පහුගිය මැතිවරණය තිබ්බා. මේ මැතිවරණයෙන් තමුන්නාසේලා ඉතාමත් සුන්දර මුහුණු ටිකක් මේ සභාවේ තියෙනවා කොට්ඨාශ 23 ක් පොදු ජන

පෙරමුණ ජයග්‍රහණය කළා. ඒ කොට්ඨාශ 23 ක් ජයග්‍රහණය කළාම අපි කොට්ඨාශ 03 ක් පමණක් ජයග්‍රහණය කළේ. ඉලුක්ඕවිට උපුල් ජිනේන්ද්‍ර මන්ත්‍රීතුමාත් , වැලිකන්න - සුසන්ත රූපසිංහ මන්ත්‍රීතුමාත්, තුන්නාන / කුඩළුවිල ගයාන් දුමින්ද මන්ත්‍රීතුමාත්. හැබැයි ඒ ජයග්‍රහණයෙන් පස්සේ මම දැක්කා මාධ්‍ය වලින් මේ රටේ ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ඉතාමත්ම කණගාටුදායක කතාවක් කියනවා එතුමා කියනවා මේ පොල් ලෙල්ලක් තිබ්බත් මේක දිනනවා කියලා. ඒත් මම හිතන්නේ පොදුජන පෙරමුණට ඡන්දෙ දීපු ඡන්දෙ ඉල්ලපු තමුන්නාන්සේලාට එතුමා ආචාර්යවරයෙක් හැටියට විශාල අගෞරවයක් තමුන්නාන්සේලා කැමතිනම් විතරක් අපිත් පුළුවන් අපිත් සහයෝගය දෙනවා එතුමා කියපු දේට අප්‍රසාදය පල කරලා යෝජනාවක් මේ සභාවට. ගෙනල්ලා ඒක සම්මතයකට පත් කරන්න මොකද ඒක කලේ තමුන්නාන්සේලාට මිසක් අපිට නෙවෙයි . මේ රටේ පොදුජන පෙරමුණට ඡන්දෙ දීපු අයට තමයි ඒ අගෞරවය ඇති වෙන්නේ. ඒ නිසා මොකද මම දන්නවා මගෙත් එක්ක තරඟ කරපු අශෝක මහත්තයා පොල් ලෙල්ලක් නෙමෙයිනේ. එතුමා ඉතාමත්ම හොඳ මිනින්දෝරු මහත්මයෙක්. උගත් මහත්මයෙක් ඒ නිසා එහෙම අගෞරව කළහම සමස්තයක් හැටියට මේ රටේ ඒක විශාල අගෞරවයක්. ඒ නිසා තමුන්නාසේලා සියලුදෙනාටම මේ වාසනාවන්ත අවුරුද්දේ තමුන්නාන්සේලා කැමතිනම් මගේ යෝජනාව පස්සේ ලියමු මේක ඉවරවෙලා ඒ හින්දා සියලු දෙනාටම විශේෂයෙන්ම මැතිවරණ කාලේ මේ වේදිකාවල්වල නන්දකුමාර මහත්මයාගේ ගමට ගියාම මම කිව්වා එතුමා බිලි බෝයි කරලා කියලා. රවීන්ද්‍ර ජයසිංහ මහත්මයා ඒක තමයි දේශපාලනය කියන්නේ ඒක කියන්න එපැයි ඒ හින්දා විශේෂයෙන්ම අපි මෙතෙන්දි සමහර වෙලාවට විවිධ කතා කියලා අන්තිමට එක වෙන පැත්තකට තමයි විහිදුනේ නන්ද කුමාර මහත්මයා ජයග්‍රහණය කලා රවීන්ද්‍ර ජයසිංහ මහතාට ඇතුලට එන්න බැරි උණා ඉතින් ඒ නිසා විශේෂයෙන්ම මේ දේශපාලනය අපි මෙතෙන්දි විවිධ තර්ක විතර්ක ගෙනල්ලා සමහර වෙලාවට විවිධ කතා කියනවා හැබැයි හොඳට මතක තියාගන්න අපි මේක මෙතනින් අවසන් කරලා යනවා මිසක් මේක ගහමරා ගන්න වැඩක් නෙමෙයි ඒ නිසා එලියේ අපි සියලුදෙනා එකට ඉන්න ඕනෙ. පහුගිය කාලේ අපේ සභාපතිතුමාගේ පහුගිය සභාවල් වලදී එතුමාට අපගේ සහයෝගය සම්පූර්ණයෙන්ම අපි ලබාදුන්නා. අපි කොයි වෙලාවකවත් හරිදේට විරුද්ධ වුණ අය නෙමෙයි අවසාන අයවැයේදී විතරයි අපි විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළේ. ඒ මොකද එදා අපිට දේශපාලන තීන්දුවක් ගන්න සිදු වු වෙලාවක් ඒ වගේ දේශපාලන වශයෙන් ලොකු වෙනසක් වෙන්න යන වෙලාවේ ඒ දේශපාලන තීන්දුවත් එක්ක අපි වෙනස් වෙන්න ඕනෙ. එහෙම නැතුව සභාව චන්ද්‍රසිරි ගමගේ මැතිතුමා සභාපතිවරයා කාලේ පාලක පක්ෂයේ මන්ත්‍රීවරු 9 යි හිටියේ. විපක්ෂෙට 13 දෙනෙක් ඉඳලත් එදා අපේ සහයෝගය අපි ලබාදුන්නා මහේෂ් අල්මේදා මැතිතුමාටත් එහෙමයි. ඒක හින්දා එහෙම ලොකු බෙදීමක් ඇති කරගෙන නැහැ අපි ඒවා බෙදන්න බලාපොරොත්තු වෙන්නෙත් නෑ. අපි සභාව පාලනය කරන කාලේ මේ විපක්ෂ මන්ත්‍රීවරු සියලුදෙනා එකට එකතුවෙලා අයවැය ජයග්‍රහණය කළා. ඒ නිසා අපිට දේශපාලන වශයෙන් කිසි ප්‍රශ්නයක් නැහැ එතෙන්දි අපි සභාපතිතුමාගෙන් ඉල්ලනවා දැන් පාලක පක්ෂයේ 23 යි විපක්ෂයේ 20 යි මැතිවරණය කොහොම තිබ්බත් අන්තිම ප්‍රතිඵලය මේකෙ අවසාන ප්‍රතිඵලය විය යුත්තේ ඒ නිසා මෙතෙන්දි ප්‍රාදේශීය සභාවේ තියෙන සම්පත් බෙදී යාමේදී යම්කිසි විමධ්‍යගත මුදල් බෙදීමේදී ඒ සියල්ල සාධාරණව ඉෂ්ට කරන්න ඒ කටයුතු කරන්න ඒ සියල්ලටම අපි සහයෝගය හම්බෙනවා. ඒ නිසා ඔබ සියලුදෙනාටම මේ අවුරුද්දේ අලුත් අවුරුද්ද අවසාන උනා විතරයි මගේ සුභ පැතුම් එක් කරමින් මේ අළුත් සභාවේ ඉදිරියට යන්න ශක්තිය ධෛර්යය අපේ ගරු සභාපතිතුමාටත් විශේෂයෙන්ම අපේ උප සභාපතිතුමාටත් එතුමාවත් විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕනෙ. එතුමා 2006 ඉඳන් මේ සභාවේ ඉන්නවා. අපේ නාම යෝජනා කැන්සල් වෙච්ච වෙලාවේ මන් හිතන්නේ තුන්වෙනි වර එතුමා මේ සභාව නියෝජනය ඒ නිසා එතුමන් දැන් ජොෂ්ඨ මන්ත්‍රීවරයෙක් බවට පත් වෙලා තමයි දැන් උප සභාපතිවරයා හැටියට පත් වෙලා තියෙනවා තුන්වෙනි වරටත් මේ සභාවට ඇවිල්ලා තියෙනවා මේ සියල්ල ගත්තහම මම හිතන්නේ

ඔබතුමාලා සියලුදෙනාම. මේ අපි ඔක්කොම එකතුවෙලා ගියාම කිසි ගැටලුවක් වෙන්නේ නෑ. ඒ නිසා එක දෙයක් කියනවා සභාපතිතුමා හරි තීරණ ගන්නකොට අපි ඒ සියල්ලටම උදවු වෙනවා හැබැයි වැරදි තීරණ ගන්නකොට අපිට ඒක කරන්න බෑ. හරි දේකටත් වැරදි දෙයක් කරන්න කියලා යම්කිසි කණ්ඩායමක් පොළඹවනවා නම් අපි ඒ දේවල් වලට උදව් කරන්නෙත් නෑ. ඒ හින්දා ඔබතුමාට මේ සභාව කරගෙන යන්න ශක්තිය ධෛර්යය ලැබෙයි දේශපාලන වශයෙන් අපි එකක් දැනගෙන හිටියා ඒක මම කියන්න ඕනෙ. මේ මැතිවරණ සටනේ එක්සත් ජාතික පක්ෂය දිනුවානම් ඒකේ සභාපතිවරයා වෙන්නේ මම එකේ කිසි ගැටළුවක් නෑ අපි දැනගෙන හිටියා ඔය සන්ධානය දිනුවොත් ඔබතුමා ඒකේ සභාපති වෙන්නෙ කියලා ඒක මං හිතන්නේ ඒ විධියටම උනා. ඒක කිසිම ප්‍රශ්නයක් නැතුව මොන ගැටලු ආවත් අද අවසානේ ඒ දේ සිද්ධවෙලා තියෙනවා. ඒ නිසා ඒකාබද්ධ විපක්ෂයේ තමුන්නාන්සේලාත් මේ සියලුදෙනා එකතුවෙලා දීර්ඝ ගමනක් යන්න තියෙනවා. අපේ යසරු මන්ත්‍රීතුමා මෙතුමාගේ පියාණන් තමයි මම සභාපති කාලේ මගේ ළග අනිත් පැත්තේ වාඩි වෙලා හිටියේ අද ඉන්නවා එතුමාගේ පුතා ඒ හින්දා එතුමා මන් හිතන්නේ ඉදිරියේදී දේශපාලනයේ මොන මොන තීරණ ගනීද කියන්න බෑ පහුගිය කාලයේ මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිතුමා සමග කටයුතු කලා අනාගතයේදී එතුමා උදව් වෙයි අපේ - චන්දන මන්ත්‍රීතුමාට සහාය දෙයි මීට වැඩිය මම කතා කරන්න යන්නේ නෑ විශේෂයෙන්ම මගේ කොට්ඨාශයේ මට 1527 ක් ඡන්දය දුන්න ඒ ඡන්ද දායකයන් සියළු දෙනාටම මගේ ගෞරව පුර්වක ස්තුතිය ප්‍රණාමය පුද කරන අතර මගේ මිත්‍රයා අශෝක වැලිකල මැතිතුමා එතුමාට උඩුමුල්ල කොට්ඨාශයේ වැඩ කටයුතු කරගෙන යන්න එතුමාට ශක්තිය ධෛර්යය ලැබේවා එතුමාට මේ මන්ත්‍රී ධුරය තුල තවත් ඉදිරියට යන්න ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඩ වෙනවා. ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මමත් වැඩි වෙලාවක් ගන්නේ නෑ. මුලින්ම සභාපතිතුමාටත් ඒ වගේම ගරු උප සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන් ඇතුළු ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාධ්‍යවේදීන්ටත් සියළු දෙනාටම සුබ අලුත් අවුරුද්දක් වේවා. ප්‍රකාශ කරමින් සියලු දෙනාගෙන්ම අවසර ඉල්ලා සිටිනවා. මංගල සභාවේ මංගල කතාව කරන වෙලාවේ මේ අවස්ථාවේදී මම මුලින්ම ඡන්දෙ පරාද වුනා. මේ ස්ථානයට එවන්න තීරණය කරපු පක්ෂයේ නායකතුමා ඇතුළු සියලු දෙනාටම විශේෂයෙන් අවිස්සාවේල්ල ආසන සංවිධායක ගරු ලෙනාඩ් කරුණාරත්න මැතිතුමා ඒ වගේම මා වෙනුවෙන් පෙනී සිටි එස්.එම්. මරික්කාර් මැතිතුමා ඒ වගේම ගරු අමාත්‍ය හිරාන් වික්‍රමරත්න මැතිතුමා ඇතුළු සියලුම දේශපාලන මණ්ඩලයට මාගේ ගෞරව පුර්වක ස්තුතිය මේ අවස්ථාවේ පුදකර සිටිනවා. මාව පරාජය වුණත් මෙතනට එන්න අවස්ථාව සලසා දීම පිළිබඳව. ඒ වගේම මගේ කොට්ඨාශයේ ජනතාව ඡන්ද 1206 ක් මා වෙනුවෙන් ප්‍රකාශ කළා. ඒ ප්‍රකාශ කරපු ජනතාවටත් විශේෂයෙන්ම වතුකරයේ දෙමළ ජනතාවටත් මාගේ ගෞරව පුර්වක ස්තුතිය මේ අවස්ථාවේ පුදකර සිටිනවා. ඒ වගේම මගේ කොට්ඨාශයේ විහාරස්ථාන 06 ක ස්වාමීන් වහන්සේලා මට ආශිර්වාද කළා. ඒ ස්වාමීන්වහන්සේලා ඒ වගේම කෝවිල් වල ආගමික පූජකවරුන්ට මාගේ ගෞරවනීය ස්තුතිය පුදකර සිටිනවා. ඒ වගේම මා හදාවඩා ගත් දෙමවුපියන්ටත් සහෝදරයන් මාගේ ඥාතීන් ඒ වගේම වග කොට්ඨාශයේ මා වෙනුවෙන් කැපවුණු සියලුදෙනාට සීතාවක කොට්ඨාශයේ සීතාවක බල ප්‍රදේශයේ සියළු ජනතාවට මාව දිරිමත් කළ සියලුදෙනාට මාගේ ගෞරවනීය ස්තුතිය මේ මංගල සභාවේ මා පුදකර සිටිනවා. ඒ ප්‍රකාශ වලදී මං හිතන්නේ දීර්ඝවත් කතාකළ යුතු නැහැ. නමුත් වචන කිහිපයක් තියෙනවා සභාපතිතුමා අපේ සභාපතිතුමා වග ප්‍රදේශයට ආසන්න ප්‍රදේශයකින් පත්වීම පිළිබඳව මගේ සුබපැතුම් ඔබතුමාට පුද කරනවා. ඒක අපිට අපේ ප්‍රදේශයට ලොකු ගෞරවයක් මට බොරුවට ඔබතුමාට බටර් ගාලා ඔබතුමාට හිනාවෙන්න මට කිසිම

අවශ්‍යතාවයක් නෑ. මම විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට විපක්ෂය තමයි ඇත්ත වශයෙන්ම අසුන් ගෙන තියෙනවා ජනතාව තීරණය කරලා තියෙන්නේ ඒ තීරණයට ගරු කරමින් මේ විපක්ෂයේ කාර්යභාරය අකුරටම ඉටු කරමින් අකුරටම කරන්න උත්සාහ කරනවා සභාපතිතුමා කොතෙකුත් වාද භේද වාද විවාද ඇතුලේ ඕනෑම දේකට මුහුණදීලා විශේෂයෙන්ම පක්ෂයේ එක්සත් ජාතික පක්ෂය ආරක්ෂා කරමින් එක්සත් ජාතික පාක්ෂිකයන් ආරක්ෂා කරමින් මේ සභා බල ප්‍රදේශයේ ජීවත් වෙන ජනතාවගේ උන්නතිය වෙනුවෙන් පෙනී සිටීමට මම මේ සභාව තුළ කටයුතු කරනවා. කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශයට පත් කරනවා එමෙන්ම අපේ වන්දන මුදුන්කොටුව මන්ත්‍රීතුමා මං හිතන්නෙ ප්‍රකාශ කළා අපේ සභාව විසුරුවා හැරියා කියලා 2014, 2015 විසුරුවා හැරියා නෙමෙයි ගරු මන්ත්‍රීතුමනි සභාපතිතුමනි ප්‍රකාශ කරන්න ඕනෙ අපේ කාල සීමාව අවසන් වෙලා සභාව විසිරිලා ගියා. අපේ ආණ්ඩුව ආවා කියලා විසුරුනා නෙමෙයි කාලය අවසන් වීමත් සමග විශේෂයෙන්ම ප්‍රකාශ කරන්න ඕනේ. ඒ වගේම අපිට මේ සභාව තුළ අද හරිම ලස්සනයි මන්ත්‍රීවරුන් 43 දෙනෙක් මේ සභාවේ වාඩිවෙලා ඉන්නවා ඒ අතර නවකයන් මම දැනුවත් විදියට 29 දෙනෙක් මේ සභාව තුළ ඉන්නවා. ජ්‍යෙෂ්ඨයෝ 13 දෙනෙක් හෝ 14 දෙනෙක් මේ සභාව තුළ කලක් නියෝජනය කරපු මම මන්ත්‍රීවරයෙක් හැටියට මේ තුන්වෙනි වතාවට මම තුන්වෙනි මන්ත්‍රී මණ්ඩලයෙත් පස්වන මන්ත්‍රී මණ්ඩලයෙත් හයවෙනි මන්ත්‍රී මණ්ඩලයෙත් සීතාවක ප්‍රාදේශීය සභාවේ පත් වීමේ ප්‍රීතිය සතුට මම මේ අවස්ථාවේ ප්‍රකාශයට පත් කරනවා. මං හිතන්නේ අපිට හොඳ සභාවක් බලන්න පුලුවන් ඉදිරියට අපේ සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා පහුගිය කාලෙ වගේ උදේ වරුවේ තේරුණා ටිකක් අමාරුවෙන් වගේ තීරණ ගන්න බවක් මට පෙනුනා එහෙම වෙන්න එපා. බය වෙන්න එපා සමහර විට ඔබතුමාව විවිධ කණ්ඩායම් විසින් පාලනය කරන තත්වයට වගේ දෝ කියලා සැකයක් මට ඇතිවුනා. එහෙම වෙන්න එපා මොන විදියෙන් හරි සභාපති ධූරය ලබාගත්තා. ඒක ලොකු ජයග්‍රහණයක් කවුරු මොනව කළත් කාට බලය තිබුණත් මොනදේ මොන ආකාරයට තිබුනත් ඔබතුමා හත්දෙනෙක් එක්ක සභාපතිධූරය ලබාගෙන ඉන්නේ ඒක ලොකු ජයග්‍රහණයක් අවිස්සාවේල්ල ජනතාව ලැබූ ලොකු ජයග්‍රහණයක් මම මේවා කියන්නේ ඔබතුමා දිරිමත් කරලා මට මොනවත් ලබා ගන්න මගේ එහෙම කිසිම අරමුණක් නැහැ. හැබැයි සමහර වෙලාවට සමහර අය තුළ කලකිරීම් ඇතිවෙලා ඇති අපිටත් ඒවා ප්‍රකාශ වෙලා තියෙනවා. පොහොට්ටුව දිනලා රවින්ද්‍ර ජයසිංහ මැතිතුමාගේ පාලක පක්ෂයට 11 ක් 12 ක් තිබිලත් ඒ සභාපති ධූරය ඒ පැත්තට ලබාගන්න බැරිවීම පිළිබඳව ගැටළු මේ ආසනය තුල තියෙනවා අපි ඒවා දන්නවා හැබැයි ඒ සියල්ල පරාජය කරන්න ඔබතුමාට හැකියාව ලැබිලා තියෙනවා. ඔබතුමයි නායකයා ඔබතුමාගේ නායකත්වයෙ තියෙන දක්ෂකම තමයි මම විශ්වාස කරනවා ඒ ලබාගත්ත දේට බය වෙන්නේ නැතුව ඒ සභාවේ තීරණ ගන්නකොට උදේ වගේ නැතුව නිකන් ඇඹරිලා වගේ තීරණ ගන්නේ නැතුව කෙලින් ඍජු තීරණ ගන්න සභාපතිවරයෙක් වශයෙන් කටයුතු කරන්න කියලා කාරුණිකව ඉල්ලා සිටිනවා බෙහොම ගෞරවයෙන් ඒ වගේම අපේ උප සභාපතිතුමා මොන ප්‍රශ්න තිබුනත් ඔබතුමා ඉතිහාසයේ පළවෙනි වතාවට උපසභාපති කෙනෙක් වැඩ භාරගැනීමේ උත්සවයක් කරලා සීතාවක ප්‍රාදේශීය සභාවේ උප සභාපති තනතුරට පත්වුනා. අපි එතුමාටත් අපගේ ගෞරව පූර්වක ස්තුතිය මේ අවස්ථාවේ පුදකර සිටිනවා. එතුමාට සභාපති ධූරය නොලැබීම ගැන අපි කණගාටු වෙනවා. හැබැයි උපසභාපති ධූරය ලැබීම ගැන අපි මේ අවස්ථාවේ සතුට ප්‍රකාශ කරනවා. කොහොම උනත් නවක මන්ත්‍රීවරු හැටියට ඒ සියලු දෙනාගෙන් ඉල්ලා සිටින්නේ සාමූහිකව හොඳ සංවාදයකට ගිහිල්ලා හොඳ විසංවාදයකට ගිහිල්ලා සම්මුතියකට ඇවිල්ලා මේ කටයුතු කරගන්න තමුන්නාන්සේලාගේ දක්ෂතාවයන්, ඒ අවබෝධයත් හැකියාවත් ප්‍රයෝජනයට අරන් සීතාවක ජනතාවට යමක් කරන්න සියලුදෙනා උත්සාහ කරන්න කියලා ඉල්ලා සිටිමින් ආදායම් වියදම් ලේඛණය බැලුවහම අද වෙනකොට සභාවේ සාමාන්‍ය තිබු මුදල මිලියන 10 ක විතර මුදලක් මේ සභාව සමහරු සමහර වෙලාවට අර්ථ කථනය කරනවා කෝටි ගණන් ආදායම් තියෙනවා කියලා. මට මතකයි වග හන්දියේ ජනතා විමුක්ති පෙරමුණේ නායකයා ඇවිල්ලා

ප්‍රකාශයක් කළා ඡන්ද කාලෙ සීතාවක ප්‍රාදේශීය සභාවේ ආදායම කෝටි 30 ක් කියලා අවබෝධය පිළිබඳ ගැටළු තියෙනවා. මේවායේ ගැටලු තියෙනවා මේක සාමාන්‍ය යෙන් යන් වර්ෂයකට මෙහි එහෙම ආදායමක් නෑ කෝටි 5 ක් 6 ක් මිලියන 50ක් විතර අයවැය දුන්නහම බලා ගන්න පුලුවන් ඒ කෝටි 5 තුල තියෙන ආදායමෙන් වැඩි කොටසක් මහ රජය පළාත් සභාවෙන් එවන මුදල් මේකෙ සමස්ත ආදායම බැලුවොත් මං හිතන්නෙ ඉතාම සුලු මුදලක් තියෙන්නෙ හරියට ගණන් හදලා බැලුවොත් මේ 43 තුන්දෙනාට බනිස් කන්නත් මදි රයිස් එකක් තමයි තියෙන්නේ ඒ හින්දා තමුන්නාන්සේලා මේ ආපු තැන මොන විදියට ද ගෞරවාන්විතව මේ සේවය කරන්නේ මොකක්ද අපි මේ කරන්න ආවේ කියන එක පිළිබඳව හොඳ අවබෝධයක් තියාගෙන මේ කටයුත්ත කිරිම තමයි වැදගත් වන්නේ. ඒ නිසා ඒ අවබෝධය ලබාගෙන කටයුතු කරන්න කියලා ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම යසරු මන්ත්‍රීතුමා සභාපතිතුමාට සහයෝගය ඉතාම ඉහලින් පලකලා. අපිට ඒකට බොහොම ආඩම්බරයි ඔබතුමාලගේ ක්‍රියාව හැබැයි එහෙම බැලුවොත් සභාපතිතුමා කමිටුවට ගැටලුවක් වෙන්නේ නෑ ආණ්ඩු පක්ෂය කොටසින්ම යසරු මන්ත්‍රීතුමාට යම්දෙයක් ලබා දුන්නා නම් ප්‍රශ්න විසදන්නත් පුළුවන් මේ තියෙන තත්වය උඩ එතුමාට ඒ ගොඩෙන් කොටසක් ලබලා දුන්නා නම් ජනතා විමුක්ති පෙරමුණට අපිට යම්දෙයක් ලබාගැනීමේ හැකියාව තියෙනවා. අපි විශේෂයෙන්ම දේශපාලන වශයෙන් කවුරු ඡන්දයෙන් පරාජයට පත්වුනත් කිසි සැකයක් නෑ අපි පරාජය හිස නමලා පිළිගන්න ඕන වෙලාවක සූදානම්. හැබැයි සමහරු උදම් අනනවා අපි දිනුවා කියලා. හැබැයි මිනිස්සු සමහර වෙලාවට මෙහෙම කියනවා අපි මේ පුද්ගලයෝ දිහා බලලා නෙමෙයි ඡන්දය දුන්නෙ අපි දුන්නෙ මේ ආණ්ඩුව ප්‍රතික්ෂේප කරලා එහෙම නැත්නම් මේ මහින්ද රාජපක්ෂ මහත්තයාට ගරු කරලා කියලා මතයක් සමාජය තුළ තියෙනවා. සමහරු අපි දිනුවා කියන මතයට උදම් අනනවාට වඩා යම් රැල්ලකට යම් දේශපාලන පෙරලියකට ආපු ඡන්දෙක ඡන්දෙ ලබාගෙන තමයි සමහරු මෙතෙන්ට ඇවිල්ලා තියෙන්නෙ සමහර අයට පුද්ගලවාදීව ඡන්දෙ දීලා නෑ. සමහර අය ඒ නිසා තමයි අර එක අමාත්‍යවරයෙක් එක මන්ත්‍රීවරයෙක් කිව්වෙ පොල් ලෙල්ලක් තිබ්බත් දිනනවා කියලා. අපි විශ්වාස කරනවා මේ සභාවේ පොල් ලෙලි නෑ කියලා. හැබැයි පොල් ලෙල්ලක් නොවී මේ සභාව තුළ වැඩකටයුතු කරන්න කියලා සියලුදෙනා අධිෂ්ඨාන කරගන්න එහෙම පොල්ලෙලි උනොත් ඒ කවුද පොල් ලෙලි කියන එකත් අපි ප්‍රකාශ කරන්නට බය නැතුව ප්‍රකාශ කරනවා. ඒ වගේම අපි පරාදවුනා තමයි අපි පරාදයි අපේ පරාජයේ වගකීම අපේ පක්ෂය සමහර අවස්ථාවලදී භාර ගන්න ඕනේ. භාරගන්න ඕනෙ අපි නෑ කියලා කියන්නේ නැහැ. මේවා මාධ්‍යයයේ ලිව්වත් කිසි ගැටළුවක් නැහැ හැබැයි අපේ පක්ෂයට වඩා අපේ පරාජයේ වගකීම මේ රටේ අද පවතින අද ඉන්න ජනාධිපතිතුමා අපි පත්කරගත්ත ජනාධිපතිතුමා පිළිබඳ විශේෂයෙන්ම මතක් කරන්න ඕනෙ. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා අපි තමයි ඒ පුටුවේ වාඩි කෙරෙව්වේ එක්සත් ජාතික පාක්ෂිකයන් හැටියට හැබැයි අද ගුණමකු ජනාධිපතිවරයෙක් හැටියට රටට සුදුසුද නැද්ද කියන තීරණේ අපිටම ගන්න වෙන යුගයක් කියන එක අපි බය නැතුව මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. මම කණගාටු වෙනවා 2015 වර්ෂයේ එතුමා අපේ පක්ෂයේ පොදු අපේක්ෂකයා කරගෙන අපේ ඡන්දයෙන් පත්කර ගැනීම පිළිබඳව මගේ කණගාටුව මම මේ වෙලාවේ මේ සීතාවක ප්‍රාදේශීය සභාවේ පලකර සිටිනවා. එතුමා තමයි මේ රට යම් අරාජික තත්වයකට පත්වෙලා තියෙනවානම් දේශපාලන වශයෙන් රටේ නායකයා හැටියට එතුමාගේ සුදුසු නුසුදුසු දේ ප්‍රකාශ කිරීම නිසා තමයි මේ සියලු දේවල් ඇරුනාම. මම පැහැදිලිව කියනවා අපි සුදුසු නැති නායකයෙන් අපේ රටේ ජනාධිපති විදියට පත්කරගත්තා කියන එක මම මේ අවස්ථාවේ කණගාටු වෙනවා මම ඒ ගැන බොහොම කණගාටුවෙන් කටයුතු කරනවා එක්සත් ජාතික පක්ෂයක් මේ පක්ෂය මෙවැනි තත්වයකට මුහුණ දීලා තියෙන්නේ අපි 2015 කරගත්තා වු ලොකු මහා මෝඩකම මම විශ්වාස කරනවා අපේ පක්ෂයේ නායකයෝ.මින් ඉදිරියට එවැනි තීරණ නොගනී කියන විශ්වාසය මා තුළ තියෙනවා. එහෙම තීරණ ගත්තොත් එවැනි අවස්ථාවක එක්සත් ජාතික පක්ෂයේ පාක්ෂිකයෙක් හැටියට එයට පිටුපාලා කටයුතු කරන්න ඉදිරියේදී

කටයුතු කරනවා කියලා ප්‍රකාශ කරනවා මීට වඩා දීර්ඝම කතා කරන්නේ නැහැ නැවත වරක් සියලු සියලු සභාපතිතුමා ප්‍රමුඛ සියලු මන්ත්‍රීවරුන්ට මාගේ ගෞරවනීය ස්තූතිය සුබ පැතුම් පුද කරමින් ලැබුවාවූ මේ සිංහල දෙමළ අලුත් අවුරුද්ද සුබම සුබ අලුත් අවුරුද්දක් වේවා විශේෂයෙන්ම මාගේ මේ ඡන්ද කොට්ඨාශයේ සියලු ජනතාවට වතුකරයේ දෙමළ ජනතාවට සියලුදෙනාටම මට උදවු කරපු සියළු දෙනාටම මාගේ ගෞරවනීය ස්තූතිය පුදකර සිටිනවා. සියලුදෙනාටම සුබ අලුත් අවුරුද්දක් වේවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. ප්‍රේමරත්න මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, ඒ වගේම උප සභාපතිතුමනි ගෞරවනීය මන්ත්‍රීවරුනි ඒ වගේම එක්සත් ජාතික පක්ෂයෙන් තරඟ කරලා පැරදිලා හරි සභාවට පැමිණි හිතාදර මන්ත්‍රීවරුන්ගෙන් හා ඒ වගේම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන්ගෙන්ද ඒ වගේම ලේකම්තුමා ප්‍රමුඛ අපේ සභාවේ කාර්ය මණ්ඩලයේ සියලු නෝනාවරුනි මහත්වරුනි. ඇත්තෙන්ම මම පෞද්ගලිකව සතුටු වෙනවා සරුංගලේ ලකුණ යටතේ තරග වැදිලා ස්වාධීනෙන් ඡන්දේ ඉල්ලලා ඒ කණ්ඩායම හැටියට ජයග්‍රහණය කරලා පින්නවල දිද්දෙණිය ප්‍රදේශයේ අහිංසක ජනතාව වෙනුවෙන් යමක් කරන්න එදා ඒ ලබා දී තිබු සීමිත ඡන්දය වෙනුවෙන් ඒ වගේම මේ අවස්ථාව වනවිට කොට්ඨාශ ක්‍රමය තුළ මම අදහන මගේ දේශපාලන නායකයා හැටියට ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඒ වගේම හිටපු නියෝජ්‍ය අමාත්‍ය තනතුරු කිහිපයක් හොබවන දේශපාලනයට දැවැන්ත ශක්තියක් වූ ගීතාංජන ගුණවර්ධන මැතිතුමා ඒ වගේම විශේෂයෙන් සිහිපත් කරන්න ඕනෙ මැතිවරණයෙන් අපගේ සියලුම රුස්වීම සඳහා පැමිණිලා දැවැන්ත ශක්තියක් ලබාදුන්න රවීන්ද්‍ර ජයසිංහ මැතිතුමා. මම ඒ අවස්ථාවේ එතුමා ගැන සිහිපත් නොකළානම් මම ඇත්තටම අසාධාරණයක් කළා වෙනවා. ඒ තුළින් මම අද සතුටු වෙනවා ජනතාවගේ අවශ්‍යතා මුදුන්පත් කරගැනීම සඳහා මහින්ද රාජපක්ෂ අපේ ශ්‍රේෂ්ඨ නායකයා සලකලා හෝ කොට්ඨාශයෙන් කොට්ඨාශයට ඉදිරිපත් වෙච්ච අපේ පක්ෂයේ සියලුම අපේක්ෂකයන් මන්ත්‍රීවරුන් කරන්නට ඒ කොට්ඨාස වල ඡන්ද දායකයෝ ගත් උත්සහායට හා එම ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් තමයි අපි අද මේ මංගල මහා සභාව අද සීතාවක ප්‍රාදේශීය සභාවේ සභා ශාලාවේ පවත්වන්නේ. ඒ අහිංසක මිනිසුන්ගේ ගුණ සුවඳයි අද මේ වෙලාවේ සිහිපත් කරන්නට ඕනෙ. විශේෂයෙන්ම අපේ පක්ෂයේ පොහොට්ටුව ලකුණ යටතේ තරග කරලා ආපු ඒ ගෞරවනීය සියලුම මන්ත්‍රීවරුන් අපි දැක්කා ගිය අවුරුදු 04 තුළ මොනතරම් කටුක දේශපාලන ගමනක්ද ආවේ මොනතරම් හැලහැප්පීම් වලට අපිට මුහුණදෙන්න උනාද මොනතරම් සභාපතිතුමාගේ කකුල් දෙකෙන් අදින්න සූදානම් උනාද ඒවාට උඩගෙඩි දීලා අද ඔය කිඹුල් කඳුලු හෙලන ගරු මන්ත්‍රීතුමාලා කියනවා ඕනෙම සහයෝගයක් දෙනවා කියලා. රතිඤ්ඤා කූරට ගිනි තියලා පත්තු කරලා තියලා උඩින් බලනවා මේක සුදු රෙද්දකින් වහනවා හැබැයි ඒක ඒගොල්ලො අදහස් කලානම් අපි ඒ පහුගිය අවුරුදු 04 න් දැනගෙන හිටියා මේ මොකක්ද මේගොල්ලො එදා කළේ මම හිතන්නේ. මේ පාරත් ගරු සභාපතිතුමනි රැවටෙන්නට එපා තමුන්නාන්සේ ශක්තිමත් ගරු මන්ත්‍රීතුමන්ලා 23 දෙනෙක් මේ සභාවේ ඉන්නවා. අපි අනුකම්පා කරලා ඒ අයට උදවු කරමු. ප්‍රශ්නයක් වෙච්ච වෙලාවට උදවු කරමු. ඔවුන් කෙරෙහි විශ්වාසය තියාගෙන මේ අවුරුදු හතරේ ගරු සභාපති පුටුවේ ඉඳගෙන ඒ අයගේ ආශිර්වාදය බලාපොරොත්තු වෙන්න එපා කියන ගෞරවනීය ඉල්ලීම මම තවදුරටත් ප්‍රකාශ කරනවා. ඒ වගේම වැඩිදුර කතා කරන්නට යාම අපේ නවක ගරු මන්ත්‍රී තුමන්ලා තුමියන්ලාට කරන අසාධාරණයක් ඒ නිසා අපි එක පවුලක එක අම්මා තාත්තාගේ දරුවෝ විදියට මේ පොහොට්ටුව ලකුණ යටතේ තරඟ කරලා ජයග්‍රහණය කරපු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා අපේ සම්පත් විධියට රැකගෙන ඉදිරියටම යමු. ඔබතුමාට ජයග්‍රහණය කරා ගමන් කිරීමට ශක්තිය ධෛර්ය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා ස්තූතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනී හෙක්ටර් පීරිස් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන්ද ලේකම් මහතා ප්‍රධාන කාර්ය මණ්ඩලයේ සියලුදෙනාගෙන්ද අවසරයි. මුලින්ම මා ස්තුතිවන්ත වෙනවා සීතාවක ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට මේ ස්ථානයට එවීම සම්බන්ධයෙන් මගේ දෙව් පියාණන් වහන්සේට පළමුව මාගේ ස්තුතිය පුද කරනවා. ඒ වගේම මාගේ ආදරණීය මෑණියන්ට, පියාණන්ට ඒ දෙදෙනා දැන් අප අතර නොහිටියත් මම ඒ දෙපලට මාගේ ගෞරවනීය ස්තූතිය සහ මාගේ සහෝදරයන් සියලුදෙනාටත් මගේ ගෞරවනීය ස්තූතිය මා මේ මොහොතේ පළමුකොට ප්‍රකාශ කර සිටිනවා. ඒ වගේම මිරිස්වත්ත, හිඟුරල, අළුත්අම්බලම ග්‍රාම සේවක කොට්ඨාශවල ඉන්න මාගේ ආදරණීය ඡන්ද දායකයින් සියලුදෙනාටමත් මා මේ මොහොතේ මාගේ ගෞරවනීය ස්තූතිය පුද කර සිටිනවා. සීතාවක ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීවරයෙක් කිරීම සම්බන්ධව. ගරු සභාපතිතුමනි, අද අපි මේ ඉදගෙන තියෙන්නේ මේ ප්‍රාදේශීය සභාවේ විකෘති මැතිවරණයෙන් කියලා මන්ත්‍රීවරුන් දෙන්නෙක් තුන්දෙනෙක්ම කිව්වා. විශේෂයෙන්ම මෙරටේ මුලාසනය හොබවන අතිගරු ජනාධිපතිතුමන් පවා ප්‍රකාශයට පත් කොට සිටියා මේක විකෘති මැතිවරණයක් කියලා. අවුරුදු දෙකහමාරක් තිස්සේ විළිරුදාව හැදිලා හිටපු අම්මා කෙනෙක් දරුවා බිහිකලාට පස්සේ ඒ දරුවා අංගවිකල උනායි කියන එක අපි කවුරුත් මේ මොහොතේ දන්න දෙයක්. විශේෂයෙන්ම ජනතාවගේ පරමාධිපත්‍යය ඡන්ද බලය කියන අයිතිය රුපියලේ කාසියක් උඩ දාලා තීරණය කරන තත්වයට අද මැතිවරණය තීන්දු කළා කියලා අද තමුන්නාන්සේලා කවුරුත් දන්නවා. එවැනි මැතිවරණයකින් ජයග්‍රහණය කරලා තමයි සීතාවක ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට අපිට මෙතන ඉන්න අවස්ථාව ලැබිලා තියෙන්නේ. විශේෂයෙන්ම මා මේ මොහොතේ ස්තූතිවන්ත වෙන්න ඕන මගේ සදාදරණීය නායක ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමන්ට සහ ඒවගේම ගීතාංජන ගුණවර්ධන මැතිතුමාට, නියෝජ්‍ය ඇමතිතුමන් මේ ගෞරවනීය ස්තූතිය පුදකර සිටිනවා. මම මා හට නාමයෝජනා ලබාදීමට ශක්තියක් වීම සම්බන්ධව. ඒවගේම මගේ මේ සුවිශේෂි ජයග්‍රහණය ලබන්නට මට සුවිශේෂ ශක්තියක් වූ පළාත් සභා මන්ත්‍රී මහේෂ් අල්මේදා මැතිතුමා ඒ වගේම රවින්ද්‍ර ජයසිංහ මැතිතුමා ඒවගේම අපේ චන්දන සහෝදර වේදිකාවට ඇවිත් අපිව ශක්තිමත් කළා ජනතාවට කරුණු පැහැදිලි කරලා දුන්නා. එවැනි වාතාවරණයක් තුළ තමයි අපි මේ සීතාවක ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්න හැකියාව ලැබුනේ. විශේෂයෙන්ම මම මතක් කරන්නට ඕනේ අපි ප්‍රාදේශීය සභාවේ පුටුවේ ඉඳගත්තේ කාලා බීලා එහෙම නැත්නම් මේ මන්ත්‍රීවරයා වෙලා ගමට යන්න නෙවෙයි. විශේෂයෙන්ම හඬක් නගන්නට බැරි අහිංසක ජනතාවගේ හඬ මේ ප්‍රාදේශීය සභාවට ගෙන එන්න. ඒ හඬ අපට ගෙනියන්නට බැරිනම් මේ ප්‍රාදේශීය සභාව තුළ ගරු සභාපතිතුමනි අපි මේ මන්ත්‍රී ධූරයක් කිරීමේ ප්‍රතිඵලයක් නෑ. විශේෂයෙන්ම මම අද සතුටු වෙනවා මේ ප්‍රාදේශීය සභාව තුළ අපේ හිතවත් ජයන්ත රණවක මැතිතුමා මම හිතන්නේ විපක්ෂ නායකතුමා එතුමා අපි එකට අපේ ප්‍රාදේශීය සභා බල මණ්ඩලවල යෞවන සමාජ බලමණ්ඩල වල කාලයක් තිස්සේ දේශපාලන පක්ෂ භේදවලින් තොරව එතුමා එක්සත් ජාතික පක්ෂයේ වුවත් අපි මහජන එක්සත් පෙරමුණේ වුනත් අපි ලස්සනට ඒ බල මණ්ඩලවල සාමාදානයෙන් වැඩ කටයුතු කරගෙන ගිය අවස්ථා තිබුණා. ඒ නිසා මම හිතනවා එතුමන්ලාගේ සහයෝගය ඔබතුමාට ලැබේවි. මේ ප්‍රාදේශීය සභාව ශක්තිමත් කරන්න ඒ නිසා දේශපාලන වේදිකාවල කියවුණ දේවල් ගැන අපි දැන් කතා කරලා වැඩක් නෑ මොකද ඒ කාල පරිච්ඡේදය තුලදී තමන් ජයග්‍රහණය කිරිමට බොරු හෝ බේගල් ඇදබාලා තමන් ජයග්‍රහණය කිරිමට සිතුවා මිස අනිත් කෙනාගේ ආත්ම ගරුත්වය ගැන බලපු නැති අවස්ථා තිබුණා මම ස්තූතිවන්ත වෙනවා. මගේ කලාපය තුල මගේ

සහෝදරයා අමල් පුස්සැල්ල මැතිතුමා අද එතුමා මේ ස්ථානයේ ඉන්න එක මට ලොකු ගෞරවයක් අපි දෙන්නා නාම යෝජනා භාර දීලා මේ මැතිවරණ කාලේ අපි පල්ලියේදී හමු වුණු විටදි කිව්වේ අපි දෙන්නටම එකට මේකේ ඉදගන්න හම්බවුණා නම් තමයි හොද කියලා දැන් මම සතුටු වෙනවා. විශේෂයෙන්ම මම එතුමට කිව්වා මැතිවරණයෙ ඡන්ද සටන ඉවරවෙලා ඡන්දේ ගණන් කරන විට මම එතුමට කිව්වා අද ඉදලා මම සනී අයියා ඔයා අමල් මල්ලි ඒ නිසා අපි දෙන්නා නිසා ගම බෙදුනොත් ඒක ප්‍රශ්නයක් ඒ නිසා අදින් පස්සේ මේ මැතිවරණය අවසන් කියලා මම සතුටු වෙනවා අදා මට එතුමා ශක්තියක් එතුමාට මමත් ශක්තියක් ගම දියුණු කරන්න. ඒ නිසා ගරු සභාපතිතුමනි අපි 43 දෙනොම මන්ත්‍රීවරු මේ ගම්වල හඩක් නගන්නට බැරි මේ ආසනය තුල ජනතාවගේ හඩ ගෙනියන්නට අපි මේ ඇවිත් ඉන්නේ ඒ නිසා අපි දැන් හැල හැප්පීම් වුණා. ඇති අපේ 11 ක් ඉන්නව අපේ 7 ක් ඉන්නවා අපේ 3 ක් ඉන්නවා අපේ 20 ක් ඉන්නවා කියනවාට වඩා යමක් කරන්නට තමයි අපි සූදානම් වෙන්න ඕනේ විශේෂයෙන්ම පොහොට්ටුවේ ජයග්‍රහණය ගැන කතා කරන විට එදා මහින්ද සුළඟ ඇති නොවුනා නම් අද පොහොට්ටුවක් නැහැ. අන්න ඒක අද කාටත් අමතකයි එදා දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, විමල් වීරවංශ මැතිතුමා උදය ගම්මන්පිල මැතිතුමා, ගීතාංජන ගුණවර්ධන මැතිතුමාගේ නිවසේ සාකච්ඡාවේ ප්‍රතිඵලයක් තමයි මේ මහින්ද සුළඟ බිහි වුනේ මම මේක බය නැතුව කියනවා ඒ තුලින් තමයි පොහොට්ටුව බිහි වුණේ ඒ බිහිවුණ පොහොට්ටුවට තමයි අද මේ රට ජයග්‍රහණය කරන්න පුළුවන් වුණේ. ඒ නිසා කවුරුහරි සමහරවිට පොල්පිති තිබ්බත් ජයග්‍රහණය කරවන්න පුළුවන් කිව්වා නමුත් අපි එහෙම නොවෙයි මට මතක් වෙනවා ජන්දේ ගණන් කළාට පස්සේ 1815 ක් මට ඡන්ද ලැබෙනකොට මට මතක් උනේ 1815 කැරැල්ල මොකද එවැනි මැතිවරණ කාල පරිච්ජේදයක් මේ සීතාවක ප්‍රාදේශීය සභාවේ සුවිශේෂි ජයග්‍රහණය මම කිව්වොත් මා නිවැරදියි. මාගේ අනිකුත් පක්ෂවල වේදිකාවල කියවුණේ හිඟන්නට පුලුවන්ද දිනන්නට කියලා මගේ ගේ පිටිපස්සේ එක රැස්වීමකදි කියලා මේ වචනේ කියනකොට මගේ පුතා මට කිව්වා තාත්තේ මම ඔයාගේ ජේ ෂීට් එක ගෙනිහින් පෙන්නනන්නද කියලා. නමුත් අපි අපේ දේශපාලනයේ විරුද්ධවාදීන්ට වෛර කළේ නෑ. අපි එකතු වෙලා මේ සටන ගෙනිච්චා. අපේ වේදිකාවල විරුද්ධවාදීන්ට වචනයක් කියන්න මම ඉඩ දුන්නේ නෑ මොකක් හරි කියා ගෙන එනවානම් කකුල පාගනවා මගේ විරුධවාදියාගේ ගේ ඉස්සරහා මම කැන්වසින් ගියේ නෑ. මම ඒවා කලා ඒ වගේම මගේ විරුද්ධවාදියාගේ ගේ ඉදිරිපිට කාර්යාලය ගහන්න ලැබුනා නමුත් මම එහෙම කළේ නෑ දේශපාලනේ අවුරුදු 04 න් ඉවර වෙයි නමුත් අපි ගම තුල සහෝදරයන් වගේ ඉන්නට ඕනේ ඒ නිසා මම සියලු දෙනාගෙන්ම ඉල්ලීමක් කරනවා මේ ගරු සභාවෙන් ඉල්ලීමක් කරනවා. මම අළුත් මන්ත්‍රීවරයෙක් උනත් අපි මේ 43 දෙනාම මන්ත්‍රීවරු එක අම්මෙකුගේ තාත්තෙකුගේ දරුවෝ වගේ මේ ප්‍රාදේශීය සභාව දියුණු කරමු. මේ ප්‍රාදේශීය සභාව ගෙනියන්න හරි අමාරු තත්වයකට පත් නොවී 43 දෙනෙක් නිසා අපිට කම්ටු හමුවුනේ නැහැ කියලා හිතන්නේ නැතුව අපි 43 දෙනාම මේ අහිංසක ජනතාවගේ හඩ මේ ප්‍රාදේශීය සභාවට ගොනල්ලා ඒ වගේම ගම දියුණු කරන්නට ශක්තියක් වෙමු කියන ආයාචනය කරමින් ගරු සභාපතිතුමනි ඔබතුමාට අපේ ගෞරවය හා ප්‍රණාමය පුද කරනවා දෙවෙනි වරටත් සභාපති බවට පත් වුණා අපිටත් ගෞරවයක් ඔබතුමා ගේ පැමිණීම ඔබතුමාට අපි අදහන ආගම අනුව යාඥා කරනවා. ඔබතුමාට ශක්තියක් ලැබෙන්නට කියලා. ඉදිරි වසර 04 කිසිම ගැටළුවක් නැතිව ප්‍රාදේශීය සභාව ඉහලට ඔසවා තබන්නට ශක්තිය ලැබෙන්න කියලා මේ ලබපු නව වසර සුභ නව වසරක් වේවා. සුභ ආනාගතයක් වේවායි ප්‍රාර්ථනා කරමින් මා නිහඩ වෙනවා . ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝකිල සම්පත් වර්ණසිරි මැතිතුමා</u>

ගරු සභාපතිතුමාගෙන්ද ලේකම්තුමා ඇතුලු එම කාර්ය මණ්ඩලයෙන්ද අවසරයි මාධ්‍ය වේදින්ගෙන්ද ජාතික

ලැයිස්තුවෙන් තරග කරපු මන්ත්‍රීවරුන්ගෙන්ද මහේෂ් අල්මේදා මැතිතුමා එතුමා දැන් නැහැ කලින් හිටියා එතුමගෙන්ද අවසරයි. පහුගිය මැතිවරණයෙන් සාලාව කොට්ටාශයෙන් මැතිවරණයට තරග කර මැතිවරණයෙන් ජයග්‍රහණය කර අද පලවෙනි වරට මේ මංගල සභාවේ කතාවක් කිරිමට ගැන සන්තෝෂ වෙනවා. තවද මාගේ කොට්ඨාශයේ මා හට නාම යෝජනා ලබා ගැනීමට මා වෙනුවෙන් ඇප කැප වුණ මගේ ජයග්‍රහණය වෙනුවෙන් අවිස්සාවේල්ල ආසන සංවිධායක හිටපු සභාපති රවීන්ද්‍ර ජයසිංහ මැතිතුමාට මා ස්තුතිවන්ත වෙන අතර ඒ වගේම මහජන එක්සත් පෙරමුණේ ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා හා ගරු ගීතාංජන ගුණවර්ධන මැතිතුමා මාගේ දේශපාලන ගමනට බලයක් වෙමින් හයියක් වුණ එතුමන්ට මා බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා තවද මැතිවරණ කොට්ඨාශයේ විවිධ අත්වලින් අප සමග එක්වෙලා පොහොට්ටුවෙන් ඒකාබද්ධ විපක්ෂය යන පක්ෂයෙන් තරග කරන්නට සහාය දුන් විමල් වීරවංශ මැතිතුමාට මා මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙනවා. තවද බන්දුල ගුණවර්ධන මැතිතුමාටද, ගම්මන්පිල මැතිතුමාටද ස්තුතිවන්ත වෙනවා මාගේ කොට්ඨාශය තුල මාගේ ජයග්‍රහණය වෙනුවෙන් කැපවුන සාලාව, මුරුතගම, පහල කොස්ගම බටහිර යන ප්‍රදේශවල ජනතාව බොහොම ඇපකැප වෙලා මට මේ ගමනට සහාය දැක්වුවා. ඒ වගේම මගේ යාළු හිත මිතුරන් මාගේ දෙමාපියන්ටත් මා මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙනවා වැඩි වේලාවක් කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ ගමන එන්න අපි බොහොම කැපවීම් කලා ඒ කැපවීම් කරලා මෙතනට ඇවිල්ලා මෙතන ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු ඉන්නවා ඔවුන්ගේ කතා වලින් අපිට බොහොමත් දේ පැහැදිලි වෙනවා. ඉතින් අපේ බලාපොරොත්තුවත් අපේ ගම්වල ජනතාවට සාධාරණයක් ඉටු කිරිම තමයි මාගේ හිතේ තියෙන්නෙත් අපි අපේ කොට්ඨාශ 26 න් 23 ක් අපි ජයග්‍රහනය කරලා නමුත් අපි 23ක් නැතුව 26ම එකට අරගෙන අපේ ජනතාවට පාට පක්ෂ නැතුව මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ සියලු දෙනාටම එක සේ එක ගමනක් යාමට මේ ප්‍රාදේශීය සභාව සවි ශක්තිමත් ප්‍රාදේශීය සභාවක් හැටියටත් බැබලෙන ප්‍රාදේශීය සභාවක් හැටියට ගෙනියමු කියලා. අවුරුදු 03 ක් ලේකම්තුමාගේ පාලනය යටතේ පාලනය වුනා. මම මෙතනදී දැනගත්ත දේවල් අනුව ලේකම්තුමා බොහොම ලොකු කාර්යභාරයක් අපේ මේ ඉන්න කාර්ය මන්ඩලයත් එක්ක එකතු වෙලා ඉටු කරලා තියෙනවා ඒකටත් බොහොමත්ම ස්තුතිවන්ත වෙමින් අපේ ඉදිරි වැඩ කටයුතු සඳහා ජ්‍යෝෂ්ඨයන්ගේ සහයෝගය ලබා දෙන මෙන් ඉල්ලා සිටිමින් නවක මන්ත්‍රීවරයෙක් හැටියට ගරු සභාපතිතුමාට සුභ පතමින් මගේ කතාව අවසන් කරනවා බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නන්ද කුමාරසිංහ මැතිතුමා</u>

ගරු සභාපතිතුමාගෙන්ද , ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් හා තුමියන්ලාගෙන්ද , ඒ වගේම සීතාවක ප්‍රාදේශීය සභාවේ ගරු ලේකම්තුමාගෙන්ද අනෙකුත් සහෝදර කාර්ය මණ්ඩලයෙන්ද අවසරයි. පලමුවෙන්ම ගරු සභාපතිතුමනි, මාව මේ තත්වයට මම මේ අළුත් මන්ත්‍රීවරයෙක් බවට පත් කරන්නට කටයුතු කරපු මගේ හදවතින් මම ස්තුති වන්ත වෙන්න ඕනේ මහජන එක්සත් පෙරමුණේ නායක ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාටත් ඒ වගේම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගරු නියෝජ්‍ය කතානායක ගරු ගීතාංජන ගුණවර්ධන මැතිතුමාටත් වර්තමානයේ සභාපති ජයන්ත රෝහණ මැතිතුමාටත් මගේ හද පිරි ප්‍රණාමය මම මේ අවස්ථාවේ පුද කර සිටිනවා. ඒ වගේම ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ අවිස්සාවේල්ල ආසනයේ හිටපු සභාපති ගරු නීතිඥ රවීන්ද්‍ර ජයසිංහ මැතිතුමාටත් මාගේ හදපිරි ප්‍රණාමය මාගේ අවංක ආදර ස්තුතිය මේ අවස්ථාවේදී පුද කර සිටිනවා. ඒ වගේම අපේ ගැලරියේ පිටුපස අපේ වර්තමාන පළාත් සභාවේ ගරු මහේෂ් අල්මේදා මැතිතුමාටත් මා ගෞරවපූර්වක ස්තුතිය පුද කර සිටිනවා. මොකද මේ සියලු දෙනාගේ කැපවීම නිසා තමයි අද මම කළුඅග්ගල ප්‍රදේශය නියෝජනය කරමින් අද මෙතනට මන්ත්‍රීවරයෙක් ලෙස ඇවිල්ලා තියෙන්නේ මොකද මම බොල්ලතාව, අකරවිට, කහටපිටිය, ගිරාඉඹුල , කළුඅග්ගල

ආදී ප්‍රදේශවලින් මා ලැබු ඡන්ද ප්‍රමාණය 2318 ක් වෙනවා මා ලැබූ ඡන්ද ප්‍රමාණය මට මේ ඡන්ද ප්‍රමාණය ලබා ගැනීමට බොල්ලතාව, අකරවිට, කහටපිටිය, ගිරාඉඹුල, කළුඅග්ගල ආදී ප්‍රදේශවල මට ඡන්දේ දුන්න සියලුම දෙනාටම මාගේ හද පිරි ප්‍රණාමය මේ අවස්ථාවේ පුද කර සිටිනවා. ඒ වගේම මට සමාවෙන්න ඕනේ මට අමතක වුණා අපේ අකරවිට ලෙනවර රජමහා විහාරස්ථානයේ බොල්ලතාව පුරාණ විහාරස්ථානයේ හා කළුඅග්ගල පුරාණ විහාරස්ථානය ආදී වෙහෙර විහාරස්ථානවල නායක හාමුදුරුවරුන් මාගේ මේ නාමයෝජනා ලබා ගැනීමට දැවැන්ත කැපවීමක් කරලා තමයි මට මේ අවස්ථාව ලබා දුන්නේ මේක මට නිකම්ම බන්දේසියක තියලා දුන්නා නෙමෙයි. බොහොම කැපකිරීම් කරලා තමයි මම මේක ලබා ගත්තේ අපේ හාමුදුරුවුරුන් වහන්සේලාට මා නමස්කාර පූර්වකව ස්තුතිවන්ත වෙනවා. විපක්ෂ නායක තුමා කිව්වා ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා කියලා පොල් ලෙල්ලක් ගානට අපේ මන්ත්‍රීවරු පත්වෙලා ඉන්නවා කියලා මම පැහැදිලිව කියනවා ඒක කිව්වේ ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු නෙමෙයි එක්සත් ජාතික පක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු තමයි. අපේ ගමේ ගිහිල්ලා අපිව පොල් ලෙල්ලක් ගානට පත් කලේ ඒ මන්ත්‍රීවරු කියන එක මම පැහැදිලිව කියනවා අපේ ගමේ අපිව නිකන් දෙකේ කාසියට පත් කරලා අපිට වැඩ කලේ අපි වාහනේ ගෙදර යන කොට අපෝ නන්ද කුමාර කියන කෙනා කියනවා. මම රණවක මහත්තයාට එදා ඉදලා ගරු කරපු කෙනෙක් හිටපු සභාපතිතුමා බොහොම ගරු කලා. අපේ ගේ ළග ලයිට් ටිකත් රණවක මහත්තයා තමයි දාලා දුන්නේ. මම ඒකත් මතක් කරනවා. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු අපිට බොහොම මඩ ගැහුවා අපි ඒවට නොබියව මුහුණ දුන්නා බොල්ලතාව, අකරවිට, කහටපිටිය, ගිරාඉඹුල, කළුඅග්ගල ප්‍රදේශවල ජනතාව ඒවට උත්තර දීලා තියෙනවා මම වැඩිය කතා කරන්න යන්නේ නෑ. ගරු සභාපතිතුමනි මගේ ප්‍රදේශය තමයි බොල්ලතාව, අකරවිට, කහටපිටිය, ගිරාඉඹුල, කළුඅග්ගල ඒ ප්‍රදේශයේ තමයි කැළණි ගං මිටියාවතයි බොහොමයක් ජනතාව ජීවත් වෙන්නේ. ඒ ප්‍රදේශයේ ජනතාව ගොඩාක් වැලිගොඩ දැමීම වැනි රැකියා තමයි කලේ. රැකියා ප්‍රශ්නය හරියට තියෙනවා අපි ගැනත් බොහෝ බලාපොරොත්තු තියලා තියෙනවා ඒ ගැන සභාපතිතුමාට අපේ සභාවෙන් කරන්න පුලුවන් සියලුම පහසුකම් අපි ලබා දෙන්න මොකද අපි ගැන බලාපොරතේතු තියලා තමයි අපිව පත් කරලා තියෙන්නේ ඔබතුමාගෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා අනිත් මන්ත්‍රීවරුන්ට ලබා දෙන වරප්‍රසාද ඒ සමානව අපිටත් ලබා දීලා අපගේ ප්‍රදේශවල සංවර්ධන කටයුතු කරන්නට ජනතාවට අපට ලබාදුන් ඒ ජනවරම වෙනුවෙන් එක එක මන්ත්‍රීවරු අපිව පොල්ලෙලි ගානට දාන්න හැදුවට අපි පොල්ලෙලි වගේ වෙන්නේ නැතුව වැඩ කරන්න අපිට ශක්තිය ලබා දෙන්න කියලා ඉල්ලමින් සියළු දෙනාටම තෙරුවන් සරණ පතමින් මා නිහඩ වෙනවා. ස්තුතියි.

<u>*ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා*</u>

මුලාසනයේ සිටින ගරු සභාපතිතුමනි ඒ වගේම උප සභාපතිතුමා ඇතුළු මේ ස්ථානයේ සිටිය සියළුම මන්ත්‍රීවරුනි මන්ත්‍රීවරියනි ඒ වගේම අප ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමා ඇතුලු සියලුම කාර්මණ්ඩලයේ සියලු දෙනාගෙන් අවසරයි. මාධ්‍ය වේදී මහත්වරුනි, විශේෂයෙන්ම පළවෙනි සැසි වාරයේදි ප්‍රාදේශීය සභාවේ නවක මන්ත්‍රීවරයෙකු හැටියට මෙම සභාවේ වාඩි වෙන්න හැකියාව ලැබීම පිළිබදව මා ලැබූ ජයග්‍රහණයක් ලෙසයි විශේෂයෙන්ම සලකනවා. ඇත්ත වශයෙන්ම කියන්න ඕනේ මට ඡන්ද හිමිකම ලැබෙන්නේ. 1987 වසරේදි පාර්ලිමේන්තු මැතිවරණය සදහා එතකොට මම අවුරුදු 18 ක තරුණයෙක්. හැබැයි මම ඉපදිච්ච දවසේ ඉදලා 1994 වෙනකන් මම දැක්කේ එවකට තිබුණ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවේ තිබුණ ක්‍රියාකාරකම් ඒ නිසා තරුණයෙක් හැටියට මම එදා හිතුවා මේ ආණ්ඩුව තිබුණා ඇති මේ ආණ්ඩුව පෙරලීම සදහා මගේ ඡන්දය පාවිච්චි කරනවා පමණක් වෙනුවට මම අපේ බල ප්‍රදේශයේ එදා තිබුණ පොදු ජන එක්සත් පෙරමුණත් සමග සම්බන්ධ වෙලා පොදු ජන එක්සත්

පෙරමුණ නියෝජනය කරපු කොළඹ දිස්ත්‍රික්කයේ අපේක්ෂකයෙකු වූ ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ මැතිවරණ ව්‍යාපාරයට එම ක්‍රියාකාරින් සමග සක්‍රියව දායක වෙලා එදා හැකියාව ලැබුණා පොදු ජන එක්සත් පෙරමුණු ආණ්ඩුවක් පිහිටුවන්නට. ඒ විතරක් නෙවෙයි ඉන්දික ගුණවර්ධන මැතිතුමාව මේ ප්‍රදේශයේ කීර්තිමත්ම දේශපාලන නායකයෙකු හැටියට විෂයයන් ගණනාවක ශක්තිමත් අමාත්‍යවරයෙක් හැටියට පත් කර ගන්න අපි කැපවුණා. එවකට අපි ලැබූ ජයග්‍රහණයක් හැටියට ඒ විතරක් නොවයි එතුමාගේ දේශපාලනයත් සමග සම්බන්ධ වෙලා ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ සම්මේලනයේ සාමාජිකත්වය ලබාගෙන ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ පහස යටතේ මේ දේශපාලන අත්පොත කියවන්නට අපිට එදා ඒ භාග්‍යය අවස්ථාව උදා වුණා. ඒ විතරක් නෙමෙයි එතුමා ඊට පස්සේ කැළණි මිටියාවත පොදු ජන උදානය ලෙස බහුජන සංවිධානයක් සකස් කරගෙන ඒ තුල විවිධ ක්ෂේත්‍රයන් යටතේ මේ ප්‍රදේශයට පමණක් නොව කොළඹ දිස්ත්‍රික්කයටම අත්‍යවශය දැවැන්ත සේවාවක් සිදු කරන්නට එතුමාට හැකි වුණා ක්ෂේත්‍රයන් ගණනාවක් යටතේ ඒ සංවිධනය ක්‍රියාත්මක වුණා. ඒ සංස්කෘතික අංශය භාරව කටයුතු කිරිමට අපිට එදා හැකි වුණා. අපි ඒ සංවිධාන හැටියට එලෙස ක්‍රියාත්මක වෙනවා වගේම එළඹෙන මැතිවරණ ජයග්‍රහණය කිරිම සඳහා එතුමා සමග අත්වැල් බැදගෙන කටයුතු කරනු ලැබුවා. ඒ අනුව 1997 වර්ෂයේදී සීතාවක ප්‍රාදේශීය සභා මැතිවරණයේදී මහේෂ් අල්මේදා මැතිතුමා ඇතුලු අපේ කොමියුනිස්ට් පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු කිහිපදෙනෙක් මේ සභාවට ගේනන අපිට හැකියාව ලැබුණා. ඒ යටතේ මහේෂ් අල්මේදා මැතිතුමාව මේ සභාවේ සභාපතිවරයා හැටියට පත් කරන විට අපිට හැකියාව ලැබුණා ඒ විතරක් නෙවෙයි 99 වර්ෂයේදී පැවති පළාත් සභා මැතිවරණයේදී මහේෂ් අල්මේදා මැතිතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන් කටයුතු කිරිමට අපි කැපවුණා. අපි දවස් ගණනාවක් එතුමාගේ නිවයේ රැදිලා ඒ දේශපාලනය කටයුතු මෙයෙවමින් කටයුතු කළා. එතුමා විසින් ඒ අවස්ථාවේදී මා හට යෝජනා කලා මගේ පෞද්ගලික ලේකම් හැටියට කටයුතු කරන්නයි කියලා. එම ඉල්ලීම මගෙන් කෙරුවා එවකට මම කෘෂිකර්ම නියාමකවරයෙකු වශයෙන් දැන් අපි කියනවා කෘෂි නිෂ්පාදන පරික්ෂක සහායක ලෙස කොස්ගම ගොවිජන සේවා මධ්‍යස්ථානයට අනුයුක්තව කටයුතු කරන අවස්ථාවේදී එම රැකියාවෙන් අස්වෙලා දේශපාලනය කරන්නට තිබුණ ආශාව හා උනන්දුව නිසා මම මහේෂ් අල්මේදා මැතිතුමාගේ ලේකම් හැටියට 1999 වර්ෂයේදී පත් වුණා ඒ වගේම මට මතකයි මහජන එක්සත් පෙරමුණ නියෝජනය කරන ලයනල් කාරියවසම් මැතිතුමා එදා පළාත් සභාවට තෙරී පත්වුණා. අපේ වර්තමාන සභාපතිතුමා ලයනල් කාරියවසම් මැතිතුමාගේ ලේකම් වරයා හැටියටත් අපි දෙදෙනා සමකාලිනයෝ හැටියට කටයුතු කරන්න අවස්ථාව උදා වුණා . එදා සිට අද දක්වා අඛණ්ඩවම වසර 19 ක කාලයක් එතුමාගේ ලේකම් වරයා හැටියටත් මහේෂ් අල්මේදා මැතිතුමා පළාත් සභාවේ අමාත්‍යවරයෙකු වූ අවස්ථාවේ එතුමාගේ සම්බන්ධීකරණ ලේකම් හැටියටත් කටයුතු කලා. ඒ කාලය තුලදීත් මට මේ සභාවේ මන්ත්‍රීවරයෙකු නොවුනත් මට මේ සභාවේ සිටිය බොහෝ නිලධාරීන් මට අළුත් අය නෙවෙයි නවකයින් නෙවෙයි. මොකද අපි පසුගිය කාලයේ මගේ රාජකාරි කටයුතුත් සමග අපි ගනුදෙනු කරපු ආකාරය පිළිබිඳව විශේෂ අමුත්තක් දැනේනේ නැහා. විශේෂයෙන්ම මේ අවස්ථාවේ ඉන්දික ගුණවර්ධන මැතිතුමා පුණ්‍යානුමෝදකව සිහිපත් කරන්න ඕනේ එතුමා අපිට ලබාදුන් නායකත්වය නිසා තමයි අදි දින මේ අවුරුදු 19ට පසුව හෝ මේ තනතුර ලබා ගන්නට හැකියාව ලැබුනේ. විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනේ පසුගිය පළාත් පාලන මැතිවරණයේදී පෙබරවාරි 10 වෙනිදා තිබුන මැතිවරණයේදී මම අංක 7 සුදුවැල්ල කොට්ඨාශයෙන් තරග කරලා විශේෂයෙන්ම මගේ මැතිවරණ කොට්ඨාශයේ ඡන්ද 4288 ක් තිබුණා ප්‍රකාශිත ඡන්ද 3408යි ඒ 3408 න් 2013ක් ලබා ගැනීමට මට හැකි වුණා. අපේ ජයග්‍රහණය කරපු මන්ත්‍රීවරු 23 දෙනාගෙන් මට දෙවන ස්ථානයෙන් ප්‍රතිශතයෙන් අවස්ථාව ලැබුණා. අපි මේ මැතිවරණය ජයග්‍රහණය කරනවාට වැඩිය දැවැන්ත වූ අරගලයකට මුහුණ දිමට සිදු වුණා අපිට අපේක්ෂකත්වය ලබා ගන්න. ඒ තුල අපි මැතිවරණ ව්‍යාපාරය මෙහෙයෙවලා මට සුදුවැල්ල කොට්ඨාශය ජයග්‍රහණ කිරිමට හැකියාව ලැබුණා. විශේෂයෙන් සඳහන් කරන්න ඕනේ මගේ මේ ජයග්‍රහණයට

මහේෂ් අල්මේදා මැතිමාට මගේ හෘදයාංගම ස්තුතිය පුද කරනවා. එතුමා අපේ කොමියුනිස්ට් පක්ෂයත් සමග සාකච්ඡා කරලා ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ සමග ආසන 03 ක් අපේක්ෂකත්වය ලබා ගන්න ලැබුණා එය ලබා දීමට කටයුතු කරපු මහේෂ් අල්මේදා මැතිතුමාට නැවත ස්තුතිය පුද කරනවා ඒ වගේම අපේ කොමියුන්ස්ට් පක්ෂයේ අපේ ප්‍රධාන ලේකම් සභාපති සහෝදරයා ඇතුලු ඒ සියලු දෙනාටම මගේ ගෞරවය ප්‍රණාමය පුද කර සිටිනවා. ඒ වගේම ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ අවිස්සාවේල් ආසනයේ ප්‍රධාන සංවිධායක නීතිඥ රවීන්ද්‍ර ජයසිංහ මැතිතුමා මා හට විශාල සහයෝගයක් දැක්වුවා. ඒ වගේම මහජන එක්සත් පෙරමුණ දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත් ගීතාංජන ගුණවර්ධන මැතිතුමාත් මට පෞද්ගලිකවම දැවැන්ත වූ ශක්තියක් ලබා දුන්නා. මගේ මැතිවරණ ව්‍යාපාරය සාර්ථක කරගන්නක ඒ වගේම අපේ අනෙකුත් සහෝදර පක්ෂ ජාතික හෙල උරුමය අපිට සහය ලබා දුන්නා. මේ සියලු දෙනාටම මගේ ගෞරවය ප්‍රණාමය පුද කරන්න මම මේක අවස්ථාව කර ගන්නවා. ඒ වගේම මගේ මව්තුමිය භාර්යාව ඇතුළු මගේ සහෝදර සහෝදරියන් ඥාති හිතමිතාදීන් ඇතුළු ගමේ සිටින සියලුදෙනා මේ මොහොතේ සිහිපත් කරනවා. ඒ වගේම මෙවැනි ජයග්‍රහණයක් ලැබීමට 434 මාවල්ගම ග්‍රාම සේවා වසමත් සුදුවැල්ල ග්‍රාම සේවා වසමේ සිටින සියලු ජනතාවත් මට දැවැන්ත වූ ශක්තියක් ලබා දුන්නා. ජන්ද 2013ක් ලබා දීලා මාව ඉදිරියටම ගෙන ඒමට සහයෝගය ලබා දුන් සුදුවැල්ල ග්‍රාම සේවා කොට්ඨාශයේ ජන්දය දුන්න සියලු දෙනාටත් මගේ හෘදයාංගම ස්තුතිය පුද කරන්න මේක අවස්ථාවක් කර ගන්නවා. ඒ වගේම මම කියා සිටිනවා ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය නියෝජනය කරමින් තුන් දෙනකේ සිටිනවා එවගේම ගරු සභාපතිතුමනි ඔබතුමා ගන්නා සියළුම හොද යෝජනා සම්බන්ධයෙන් අපගේ පක්ෂයේ මන්ත්‍රීවරු 3 දෙනාගේම සහයෝගය ලබාදෙන අතර මෙම අපේ ප්‍රාදේශීය සභාව අද පළාත් පාලන ආයතන අතර හොඳම ප්‍රාදේශීය සභාවක් බවට පත් කර ගැනීමට අපි කටයුතු කරමු යැයි කියන යෝජනාව මේ අවස්ථාවේදී මා විසින් කරනු ලබනවා. ඒ වගේම විශේෂයෙන් සඳහන් කරන්න ඕනේ වසර දෙකක් මාස 10 ක පමණ කාලයක් දේශපාලන අධිකාරියෙන් තොරව තිබුණ කාලයේදී අපේ ලේකම්තුමා හා කාර්ය මණ්ඩලය මෙය අයාලයේ යන්න නොදී දැවැන්ත වූ සේවාවක් එම කාලය තුලදී ඉටු කළා. අපි පහුගිය කාලයේදී දැක්කා එතුමන්ලා නිවාඩු දවස් ඉරිදා දවස් පවා කැප කරමින් බල ප්‍රදේශය තුල තියෙන සභාව සතු පොදු සුසානභූමි ක්‍රිඩා පිට්ටනි එලිපෙහෙලි කර සුද්ධ කිරිමට පවා යෙදුනා. ඒ කාලයේ ඩෙංගු මදුරු වසංගතය පාලනය කරන්නට ඔබතුමා හා ඔබතුමාගේ කාර්ය මණ්ඩලය ගත් උත්සාහය ස්තුති පූර්වක වෙනවා. මෙම සභාවේ ඉදිරි වසර 04 ක කාලය අපි ඔබතුමා කරන සෑම හොද කටයුත්තකටම අපේ පක්ෂය හැටියට අපේ සහයෝගය උපරිම ආකාරයෙන් ලබාදෙන බව ප්‍රකාශ කරමින් මෙම අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් බොහොමත්ම ස්තුතිවන්ත වෙනවා. ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා</u>

ගරු සභාපතිතුමන් ප්‍රමුඛ මන්ත්‍රී මණ්ඩලයෙන් හා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් හා මාධ්‍යවේදී මහත්වරුන් හා ගැලරියේ සිටින සියළු දෙනාගෙන් අවසරයි. අද දවසේ බොහොම දීර්ඝ කතා වලින් පස්සේ මම ඔබට මතක් කරන්නේ පොහොට්ටුවෙන් ජන්දෙ ඉල්ලපු තවත් එක් අපේක්ෂකයෙකු වශයෙන් නෙවෙයි පිවිතුරු හෙල උරුමය මේ ලංකාවේ සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා කටයුතු කරන පක්ෂයක් තියෙනවා නම් අන්න ඒ පක්ෂය නියෝජනය කරන මේ බල ප්‍රදේශයේ බෞද්ධයෙක් හැටියට තමයි මට කතා කරන්න වෙන්නේ. මා ඔබව දන්නේ ශාන්ත ජෝන් බොස්කෝ විද්‍යාලයේ ගුරුවරයෙක් හැටියට දේශපාලනයට අළුත් මගක් නෙවෙයි මට. නමුත් මම අළුත් මගක් ගන්නේ වමේ ප්‍රගතිශිලි බල කඳවුරේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් 2000 වසරේ තමයි මම දේශපාලනයට පිවිසෙන්නේ. 2000 තමයි මම සීතාවක බල ප්‍රදේශයේ පදිංචියට එන්නේ. මට ලොකු අභියෝගයක් තිබුණා මුල ඉඳලම ඒ අභියෝගය තමයි කොට්ඨාසශය දිනා ගැනීමේ තැන ඉඳලා ආසන

සංවිධායක වරයෙකු වශයෙන් නොව ඒ කොට්ඨාශය දිනා ගැනිමේ තැන ඉදලා විශාල අභියෝගයක් තිබුණා. ඒ විශාල අභියෝගය ජයග්‍රහණය කරන්න ශක්තිය හා ධෛර්යය සැපයු බොහෝ දෙනෙක් ඉන්නවා පිවිතුරු හෙළ උරුමයට සීතාවක ප්‍රාදේශීය සභාව තුල උදය ගම්මන්පිල පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාය කරන්න ලැබෙන එකම අවස්ථාව අරුණ දිවිගල්ල විතරයි ඒ අරුණ දිවිගල්ලට ලැබෙන අවස්ථාව ලැබෙන්නේ දෙසැම්බර් මාසේ 20 වෙනිදා රාත්‍රි 6.45 ට තමයි මට පණිවිඩය හම්බබෙන්නේ. අර සනී මන්ත්‍රීතුමා කියපු විදියට එහෙම නැත්නම් කළුඅග්ගල පැත්තෙන් කිව්වා වගේ ටිකට් එක ලැබෙන්නේ සවස 6.45 ට සමහර අය නාම යෝජනා දීලා ඇවිල්ලා කැන්වසිනුත් පටන් අරගෙන ඉවරයි. ජයග්‍රහණය ලබා ගැනීමේ කාරණාවේදී මට එබඳු කර්තව්‍යයක් ඉටු කරන්න වුණා. ඒ

කාලයේදී මට නායකත්වය සපයපු උදය ගම්මන්පිල මැතිතුමාටත් ඒ වගේම විශේෂයෙන්ම නීතිඥ රවීන්ද්‍ර ජයසිංහ මැතිතුමාටත් ඒ වගේම මග හසර පිලිසකර කරන්නට මාර්ගය පැහැදිලි කරන්න කටු කොහොලු ඉවත් කරන්නට කටයුතු කරපු ගරු සභාපතිතුමාටත් පොහොට්ටු පක්ෂය නියෝජනය කරමින් මැතිවරණය සඳහා ඉදිරිපත් වු සියළු මන්ත්‍රී අපේක්ෂකයන් 23 නෙවෙයි 26 දෙනොටම මා විශේෂ ස්තූතිය පුද කරනවා. මොකද ආසන සංවිධායකවරයෙක් වශයෙන් මට මගේ අනිත් කොට්ඨාශවල කෝකිල මන්ත්‍රීතුමාගේ ඇරෙන කොට චන්දන මන්ත්‍රීතුමාගේ ඇරෙනකොට අනිත් කොට්ඨාශවලට යාමට වේලාවක් හමුවුනේ නැහැ. දීර්ඝ සටනක් කරන්න වුණා මොකද අපේ කොට්ඨාශයේ තුනෙන් එකක් දෙමළ ඡන්ද තිබුණේ ඒ දෙමළ ඡන්ද තියෙන වෙලාවේ මට පොඩි අභියෝගයක් තිබුණා උදය ගම්මන්පිල කියන නම කියන්න බැහැ කියන කාරණාව මට බොහෝ දෙනෙක් දුරකථනයෙන් දැන්වුවා. මේක කොහොම වෙයිද දන්නේ නෑ කියලා අපි මේවා කතා කරන්නට ඕනේ ඒ වුණාට මම විශ්වාස කලා වේරගොල්ල උතුර දකුණ කුඩාම කොට්ඨාශය භූමි ප්‍රමාණය විශාලයි එක ඡන්ද මධ්‍යස්ථානයයි තියෙන්නේ මං හිතන්නේ ඒක මගේ වාසනාවට ලැබිච්ච තැනක් ඒ නිසා ඒ වාසනාව එකට එකතු කරගෙන අපිට පුළුවන් වුණා ගැටළුවක් නැතුව මේක ජයග්‍රහණය කරන්න එහිදී වර්ග වාදය පරාජයට පත් වුණා පරාජයට පත්වෙලා ඉවර වෙලා සිංහල දෙමළ මේ සියළු සහෝදරයෝ මාත් එක්ක එකට එකතු වෙලා මේ දේශපාලන යාන්ත්‍රණය තුල ක්‍රියාත්මක වුණා ඒ නිසා මම මේ වෙලාවේදී ස්තූතිවන්ත වෙනවා වර්ග වාදයකින් තොරව කෝවිල් වල පූජකතුමාත් මුස්ලිම් පල්ලියේ පූජකතුමාත් පුවක්පිටියේ ඒ වගේම විහාරස්ථානවල ගෞරවනිය ස්වාමීන් වහන්සේලාත් විශේෂයෙන්ම ශාන්ත ජෝන් බොස්කෝ මහා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලයේ සියලු දෙනාත් මාත් එක්ක එකට එකතු වෙලා දේශපාලන මතවාදයකින් තොරව සහෝදරත්වයෙන් බැදිලා කටයුතු කලා ඒ වගේම මේ සභාවේ සිටින සෑම මන්ත්‍රීවරයෙක්ම මේ අයගෙන් මගේ හිත රිදිමට කාරණාවක්. වෙලා නැහැ මේතාක් මා ඔබට මතක් කරනවා සහෝදරත්වයෙන් සමගියෙන් යන්න පුළුවන් ගමන ඉතාමත් සාර්ථක ගමන් මගකින් ඉදිරියට තල්ලු වෙන්න අවශ්‍යයි හදවතයි , මොලයයි, වැඩයි මේ ටික එකට එකතු කරලා කටයුතු කරන කොට වැඩ වල හැඩ තියෙන්න ඕනේ. හැඩ වල හඩ තියෙන්න ඕනේ. හඩවල වැඩ තියෙන්න ඕනේ. හැඩයි , හඩයි, වැඩයි තියෙන තැනකට ඇවිල්ලයි කියලයි මට හිතෙන්නේ. මම විශ්වාස කරන්නේ හඩ විතරක් තිබුණට වැඩක් නැහැ වැඩ නැත්තනම්. හඩ අද දැනගත්තා. මේවගේ වැඩත් තියෙන්න ඒවායේ හැඩත් තියෙන්න ඕනේ කියන පණිවුඩය මතක් කරමින් මා වෙනුවෙන් මට ඡන්දය ලබා දීලා මාව මේ තැනට ගෙන්න ශක්තිමත්ව දායකත්වය උසුලපු මගේ ආදරණීය ඡන්ද දායකයින්ට අම්මට අප්පට මෙන්ම මගෙත් එක්ක මේ ගමනට අත්වැලක් බැදගෙන මේ වේදිකාවේ ඉන්න මේ සභාපතිතුමා ප්‍රමුඛ උප සභාපතිතුමා ප්‍රමුඛ මගෙන් ඉගෙන ගත්ත දරුවොත් ඉන්නවා අද කාර්ය මණ්ඩලයේ ඒ හැම දෙනාමත් එක්ක එකතු වෙලා අපිට මේ ගමන් මග යන්න ශක්තිය ධෛර්යය සපයන හැම දෙනාටම එකට අත්වැල් බැදගෙන හොද ගමන් මගක් යන්න අර මුලින්ම ආවනේ පරිත්‍යාගශීලීත්වය පරිත්‍යාගශීලීත්වය කියන්නේ උතුම් ගුණයක් ඒ වුණාට පරිත්‍යාගශීලීත්වයෙන් ප්‍රයෝජන ගන්නේ නැත්නම් ඒ

ගැනත් අපිට දෙවතාවක් හිතන්න වෙනවා කියන කාරණාව මතක් කරමින් පක්ෂ පාට නැහැ කිව්වට ඒවා ඔක්කොම තියෙනවා එක මවකගේ දරුවො කියලා 43 ම එකට ඉන්නවා කිව්වට ඕවා කතන්දර විතරයි ඒ නිසා පැහැදිලිව මතක් කරන්නේ ඔබත් ඒ සියලු කතන්දර එකට එකට ගොනු කරගෙන අපේ තැන කොතනද කියන කාරණාව එක මතක තියාගෙන අපේ තැනත් එක්ක ඉදිරියට කටයුතු කරනන ශක්තිය ධෛර්යය උපයා ගන්නවා මේ සභාවෙන් කියන කාරණාව මතක් කරගෙන විශේෂයෙන්ම කෙලවරේ සිටින ෆ්‍රැන්සිස් මගේ සහෝදරයා ෆැන්සිස් අපි සිංහල දෙමළ භේදයක් තිබුණේ නෑ ෆැන්සිස් අපේ පිලට ගේන්නට කටයුතු කරද්දි සුමිත් විජය මුණි සොයිසා පළාත් සභා මන්ත්‍රීතුමා ඒ ලබා ගැනීම සිද්ධ වුණාට අද දවසේත් අපිට එකට යන්න ගමනක් තියෙන බව මතක් කරමින් මට උදවු කරපු ෆ්‍රැන්සිස් සහෝදරයත් මේ සියළුදෙනාත් ගරු සභාපතිතුමාත් ලේකම්තුමා ඇතුලු මේ සියලු කාර්ය මණ්ඩලයත් ස්තුතිවන්ත වෙමින් විශේෂයෙන් මට ඡන්දය ලබාදුන් ඒ සියලු දෙනාට ස්තුති වන්ත වෙමින් නිහඬ වෙනවා. ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් ජිනේන්ද්‍ර මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, උප සභාපතිතුමනි මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි ගරු ලේකම්තුමා ඇතුලු සියලු නිලධාරි මණ්ඩලයෙන් අවසරයි. මාධ්‍යවේදී මහත්වරුන්ගෙන් අවසරයි. එදා මට එළඹුන පළාත් පාලන මැතිවරණයේ ඉලුක්ඕවිට කොට්ඨාශය නියෝනයට කරමින් මට ජයග්‍රහනයක් අත්පත් කර දුන් මගේ ආදරණීය ජනතාව වෙනුවෙන් එතුමන්ලා වෙනුවෙන් ස්තුතිය පුද කරන්න පලමුවෙන්ම මට අවස්තාව ලබා දීම සම්බන්ධයෙන් මා සන්තොෂ වෙනවා මොකද මම අද මහජන නියෝජිතයෙක් හැටියට මාව ඔසවලා තියලා ගමේ ගැටළු ප්‍රශ්න හඳුනාගෙන ඒවා වෙනුවෙන් ඉදිරියට ඇවිල්ලා කතා කරලා ගමට යමක් අරගෙන යන්න තමයි මාව මේ ස්ථානයට ඒව්වේ මොකද එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහනය කරපු කොට්ඨාශ තුනෙන් එක් කොට්ඨාසයක තමයි මම හිටියේ මොකද ලොකු අභියෝගයක් තිබුණා මම නවකයෙනක් හැටියට ඉතිං මාව මෙතනට එවලා මගෙන් එතුමන්ලා බලාපොරොත්තු වන කාරණාවන් ඉෂ්ඨ සිද්ධ කිරිම තමයි මගේ අරමුණ. මොකද මං ගරු සභපතිතුමනි, ඔබතුමාගේ තියෙන හොඳ කාරණාවන් වලදී මම ඔබතුමාත් සමග පෙනී සිටිනවා. මොකද මට අවශ්‍යා වන්නේ මගේ ජනතාව වෙනුවෙන් යහපත් හොද මහජන නියෝජිතයෙක් වීම පමණයි. මොකද මම කුඩා බොහොම ඉතාමත්ම අසරණ විදියට වෙරවීරියෙන් ජීවත් වෙන සුළු ව්‍යාපාරයක් කරගෙන ජීවත් වෙන පුද්ගලයෙක් හැටියට සමහරවිට ඉදිරි කාලයේදී මට මේ මන්ත්‍රීවරු නින්දා අපහාස කරන්නත් ඉඩ තියෙනවා මොකද මම දවල්ට මේ ටවුමේ තමයි ඉන්නේ. දකින්න පුළුවන් මොකද මම ව්‍යාපාරය හැටියට කරන්නේ කිර වගාව වෙලාවකට මම වැඩ කිට් එකෙන් ඉන්නත් පුළුවන් ඒ අවස්ථාවලදී අපේ මේ මන්ත්‍රීවරු මේ කවුද මේ මන්ත්‍රීවරයෙකු හැටියට සුදුසු නැහැ කියලා කියන්නත් පුළුවන්. නමුත් ඒ මාගේ රැකියාව ඒක තමයි ඒකෙන් තමයි ජනතාව වෙනුවෙන් යමක් කරන්නේ. මම පාසල් යන මගේ දරුවන් වෙනුවෙන් යමක් කරනේනේ. මම මේ රැකියාවෙන් ඒ නිසා මම ඔබ තමුන්න්සේලාගෙන් පලමුවෙන්ම ඉල්ලා සිටින්නේ. එවැනි අපහසුතාවයන්ට මාව පත් කරන්න එපා කියලා බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම තමයි මම මහජන නියොජිතයෙක් හැටියට ඇවිල්ලා මෙයින් හම්බකරගෙන මෙයින් වැජඹෙන්න ආවා නොවෙයි. මගේ මේ මන්ත්‍රී වැටුප මගේ කොට්ඨාසය බොහොම දුෂ්කරයි මාගේ කොට්ඨාසය තුල සිටින ජනතාවට රාත්‍රි කාලයේදී රෝහලක් වෙත යන්න ඉතාමත් අමාරුයි. රාත්‍රි 8.00 පසුව මම මගේ මන්ත්‍රී වැටුප යොදවලා ගිලන් රථ සේවාවක් ආරම්භ කරන්න ඉන්නේ. උපුල් ජිනේන්ද්‍ර මනුසත් පදනම හරහා ඒ පදනමට මගේ වැටුප බැර කරලා ඒ තුලින් මගේ කොට්ඨාසය තුල සිටින ඒ ජනතාව වෙනුවෙන් සේවයක් කිරිම තමයි මගේ බලාපොරොත්තුව. මම ඔබ තමුන්නාන්සේලාගේන් ඉල්ලා සිටිනවා මහජන නියෝජිතයෙක් විදියට ඇවිල්ලා

ඉන්නේ මහජනතාවට සේවයක් කරන්න අපි මේ ප්‍රාදේශීය සභාවේ ආදර්ශමත් මහජන නියෝජිතයෙක් වෙන්න මට ඕනේ වෙලා තියෙන්නේ. එහෙම නැතිව මන්ත්‍රී කමෙන් උඩගුවෙලා උඩ පනින්න නොවෙයි. ආදර්ශමත් මහජන නියෝජිතයෙක් වෙන්න පමණයි. ඉතිං ඔබ තමුන්නාන්සේලාගේ සහයෝගය මට ලබා දෙයි කියලා මම විශ්වාස කරනවා. ගරු සභාපතිතුමනි මට තවත් කණගාටු වෙන කාරණයක් සිදු වුණා ඒ ඔබතුමා දිවුරුම් දෙන උත්සවය අපිට දැනුම් දුන්නේ නැහැ. නමුත් උප සභාපතිතුමාගේ දිවුරුම් දෙන උත්සවය අපිට දැනුම් දුන්නා මම හිතනවා එතනදී අපිව වෙන් කරලා තිබුනද අපිව අඩු කොට සලකනවාද කියලා මගේ හිතට නැගුනා. නමුත් මම උපසභාපතිතුමාගේ ඒකට අවේ නැහැ. මොකද එහෙම ආවානම් ඔබතුමා හිතයි මේ මෙයාගේ පැත්තේ එක්කෙනෙක් කියලා. ඒ නිසා මම ඒකට ආවෙත් නැහැ සභාපතිතුමනි. වැඩි කාල වේලාවක් ගන්නේ නැහැ කතා කරන්න බොහෝ දේවල් තියෙනවා. නමුත් මං වෙනුවෙන් කැපවුණ මාව මෙතට ගෙනාපු ඉළුක්ඕවිට කොට්ඨාශයේ සිංහල දෙමළ ජනතාවට මගේ අවංක ස්තුතිය පුද කරමින් ඔවුන් වෙනුවෙන් මට කරන්න පුළුවන් උපරිම දේ කරනවා කියලා පොරොන්දුව දෙමින් මට මේ අවස්ථාව හිමි කර දුන්නේ ඔවුන් ඔවුන් වෙනුවෙන් කරන්න පුළුවන් උපරිම දේ කරනවා කියන පණිවිඩය දෙමින් නිහඬ වෙනවා මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, උප සභාපතිතුමා මුලික මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි ලේකම් තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයේ සේවක මහත්වරුනි, දැනට වසර 30 ට ඉස්සෙල්ලා අපි අපේ දේශපාලන කාලයේ බලාපොරොත්තු වුණ නායකත්වය 1988.02.16 වන විට මහ පාරේ මරා දානකොට විජය කුමාරතුංග කියන ගෞරවනීය මිනිහා මරා දාන කොට දේශපාලනයට බැස්ස පුද්ගලයෙක් වශයෙන් 1988.02.16 මම දේශපාලනයට පිවිසෙන්නේ. එදා මට දොට්ට බැහැලා ඇවිල්ලා අපි දේශපාලන ක්‍රියාවලිය තුල ඉස්සරහට එන කොට බොහො තැන්වල කියවුනා කොමියුනිස්ට් පක්ෂ ගැන කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රථම වතාවට අවිස්සාවේල්ල ආසනයෙන් තරග කරන්නේ 1988 පළාත් සභාවට තරග කරනවා නිතිඥ සිසිර ගමගේ මහතා.ඒ තරග කරන්නේ පළාත් සභාව දිනන්න නෙවෙයි අපි පළාත් සභා ක්‍රමය හරියි කියලා මේ රටේ ජාති වාදයට විරුද්ධව මේ රටේ සාමය වෙනුවෙන් එලියට බැහැපු පිරිසක් 1988 දෙපැත්තෙන්ම මිනි මරන කොට අපි දොට්ට බැහැලා අපි දේශපාලනය පටන් ගත්තේ. මට මතක් වෙනවා ඒ කාලේ දේශපාලන මුල් කදවුරේදී අපි එක්ක කිහිප දෙනෙක් හිටියා ප්‍රසන්න අල්මේදා, වෙත්තසිංහ, බැසිල් ගමගේ අපි සියලු දෙනා එලියට බැහැල මිනි මරණ කාලේ ගෙයක් ගානේ ඇවිදලා පටන් ගත්ත දේශපාලනේ අපි 1993 අවුරුද්දේ ඉංදික ගුණවර්ධන ඇමතිතුමා මුලින්ම අරගෙන එන්නේ හංවැල්ලට. අවිස්සාවේල්ල හා හංවැල්ල ශාඛාව. එතුමාගේ හයිය හා ධනය පාවිච්චි කරලා පළාත් සභාවට අරගෙන ආපු මට මතකයි මාවතගම තුත්නානට ගිය අවස්ථාවේ කැම්පේන් එක ගෙනියන කොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂේ කට්ටිය කව්වා කැම්පේන් එක යන්න එන්න එපා කිව්වා ඉන්දික ගුණවර්ධන මැතිතුමාව ප්‍රතික්ෂේප කලා හැමෝම. එවැනි කාලෙකදි අපි බොහොම ටික දෙනෙක් අරන් ගිහිල්ලා ගොඩ දැම්මේ 1998 අපිට තරග කරන්න සිද්ධ වුණා මහේෂ් අල්මේදා මැතිතුමා මම චන්ද්‍රසිරි ගමගේ මැතිතුමා තරග කරලා අපි 9 දෙනෙක් තරග කලා තුන්දෙනකේ දිනුවා. ආනන්ද රූපසිංහ මහත්තයා පැරදුනා. අපි ජයග්‍රහණය කරලා ඇවිල්ලා 97 තමයි මම දැක්ක හොදම මන්ත්‍රී මණ්ඩලය හිටියේ මහජන එක්සත් පෙරමුනේ 06 ක් පත් වෙද්දි එක්සත් ජාතික පක්ෂයේ 06 ක් පත් වෙද්දි ජනතා විමුක්ති පෙරමුනේ අපි 9 ක් පත් වුනා. 13 යි 9 යි අපි සභාව අරගෙන ගියා කිසිම ගැටළුවක් නැතුව. එදා මෙදා තුර අපි දේශපාලනයේ විවිධ තැන් නියෝජනය කරලා තියෙනවා හැබැයි මම දේශපාලනයේ බොහොම පැහැදිලිව කියලා තිබුණා මම ජාති වාදයටත්

ආගම් වාදයටත් බෝඩ් වාදයටත් විරුද්ධයි මම දේශපාලනයේ අ සහ අවසානය තමයි ඒක. ඒ නිසා මම 2001 වන විට ඉන්දික ගුණවර්ධන මැතිතුමා පරදවනවා. පරදවලා ගෙදර යවනවා. අපිට නායකයෙක් හිටියේ නෑ එතකොට ඒ වුනත් 2001 අවුරුද්දේදී මමත් චන්ද්‍රසිරි ගමගේ මහත්තයත් ආනන්ද රූපසිංහ මහතා අපි 7 න් 3ක් දිනනවා එහෙම දිනලා අපි ඇතුලට එනවා ඒ එක්කම අපි 2006 අවුරුද්දේ රවීන්ද්‍ර ජයසිංහ මහතා මම මතක් කරන්න ඕනේ අපේ ගෞරවනීය නායකත්වය මම මතක් කරන්න ඕනේ සිරිසේන රාජපක්ෂ මැතිතුමා එතුමා තමයි මම දැක්ක විශිෂ්ට නායකයා ඕනෑම මොහොතකදී බැරි වෙලාවෙත් පුළුවන් වෙලාවෙත් තම පක්ෂය කණ්ඩායම වෙනුවෙන් වැඩ කරපු නායකයෙන් නැතිවෙච්ච එක සීතාවක ප්‍රාදේශීය සභාවට ලොකු පාඩුවක් සිරිපාල කරුණාරත්න මහතා එතුමා විශාල සේවාවක් සිදු කලා. අපි 2006 පස්සේ මම හිතනවා මම පරිසර කමිටුව නියෝජනය කරමින් වැඩ කළා. 2011 වන විට සියලු දෙනාම යුද්ධ ජයග්‍රහනයෙන් උද්දාමට පත් වෙලා පස්සේ මම ඡන්දය ඉල්ලනවා. සමානුපාතික ක්‍රමය නවත්වලා වැඩ කරලා කොට්ඨාස ක්‍රමයට යා යුතුයි කියල මම විශ්වාස කළා. අපි යෝජනා සම්මත කළා සභාවේදී. 2011 යුද්ධ ජයග්‍රහණයෙන් උද්දාමයට පත් වෙලා සමානුපාතික ක්‍රමය නවත්වලා කොට්ඨාස ක්‍රමය තුලින් මාවත් ඔබතුමාවත් පරද්දනවා සරුංගලය කියලා ස්වාධින කණ්ඩායමක් එනවා. ඇවිල්ලා පොදු සන්ධානයෙන් ඉල්ලපු සමහර අය පරද්දන්න ඒක තමයි ඒගොල්ලන්ගේ බලාපොරොත්තුව වුනේ. 1947 සිල්වා මහත්තයා කියනවා ස්වාධින කණ්ඩායමක් කියන්නේ වෘත්තිය පුහුණුව කියලා. මම ජන්ද 10 කින් පරාජයට පත්වෙලා ගෙදර යනවා. නමුත් මම ඒ වන විට ඉන්දික ඇමතිතුමාගෙන්වත් කිසිම රජයේ රස්සාවක් ඉල්ලාගෙන තිබුනේ නෑ. මම ගෙදර යන කොට ලක්ෂ 2 ½ රත්තරන් බඩු උගස් තියලා තිබුනේ කන්න විදිහක් නැහැ. මම ගිහිල්ලා හම්බු වුණු අයගෙන් එක් අයෙක් කියනවා මගේ ලග තියෙනවා පාසල් කම්කරු තනතුරක් එක් දෙන්න පුලුවන් කියලා අනිත් කෙනා මට කිව්වේ කරන්න දෙයක් නෑ කියලා. හැබැයි පළාත් සභාව අපේ, පාර්ලිමේන්තුවත් අපේ, ප්‍රාදේශීය සභාවත් අපේ , හැබැයි මම කල්පනා කලා මට මෙහෙම නම් මගේ ඉන්න පාක්ෂිකයන්ට කොහොම සලකයිද මේ ආණ්ඩුව කියන එක. හැබැයි මම දාලා ගියේ නැහැ. ඒ වුනාට 2005 ජනාධිපතිවරණය වන විට මම දාලා ගියේ නෑ එක්සත් ජාතික පක්ෂය දිනයි කියලා බලාගෙන හිටියේ. ජයග්‍රහණයෙන් පස්සේ ලාභ ගන්න ආවා සමහර අය. ඒ කාලේ පොස්ටරයක් ගහන්න කෙනෙක් හිටියේ නෑ. මම තීරණය කළා මහින්ද රාජපක්ෂ මහත්තයාට ඡන්දය දෙන්නේ නැහැ කියලා. මම ඡන්දය දුන්නේ නැහැ. මම පක්ෂයේ හිටියා. අපි හිතුවා සාධාරණ පිළිතුරක් දෙයි කියලා නමුත් දුන්නේ නැහැ. නමුත් පක්ෂය දාලා ගියේ නැහැ. මම කා පස්සෙවත් ගියේ නැහැ රක්ෂාවක් ඉල්ලගෙන. මම තනි වුණ වෙලාවේ මගේ යහළුවා තමයි මාත් එක්ක හිටියේ. මගේ ආයතනයේ පුස්සැල්ල ආයතනය. ගරු සභාපතිතුමා පිලිප් කේ වැවිට මැතිතුමා මට අවස්ථාවක් දුන්නා. මම එතුමාගෙන් ඇහුවා මම ඡන්දය ඉල්ලන්නද කියලා. එතුමා මට ඡන්දය ඉල්ලන්න අවස්ථාව දුන්නා. මට එතුමා බොහෝ උදව් කරලා තියෙනවා. අළුත් මන්ත්‍රිවරුත් පරණ මන්ත්‍රිවරුත් මෙතන ඉන්නවා. දොට්ට බහින්න වුණොත් අපිට කිසි කෙනෙක් උදව්වට එන්නේ නැහැ. උදව්වට ඉන්නේ ගෙදර අය විතරයි. නෝනයි දරුවෝයි. හිටියොත් අම්මා තාත්තා විතරයි. මාව දේශපාලනයට යොමු කළේ මගේ පියා ගුරුවරයෙක් ලෙස වැලිකන්න පාසලේ. මාව දේශපාලනයට යොමු කළ සිල්වා පියතුමා. මට යම් අවස්ථා ලැබුණා 2005 දි යම් තින්දුවක් ගත්තා. මම රවි මහත්තයාට කිව්වා මම යනවා රවි කියලා. මහේෂ් අල්මේදා මන්ත්‍රිතුමාටත් කිව්වා මම යනවා කියලා. මම ගිහින් මගේ දේශපාලනය මම කළා. වැලිකන්න තොට්ඨාසයෙන් මම පළාත් පාලන ඡන්දය සදහා ඉදිරිපත් වුණා එක්සත් ජාතික පක්ෂයෙන්. මම කිව්ව මම යූ එන් පී කාරයෙක් නෙමෙයි. මම ආවේ මෛත්‍රිපාල මහතා දිනවන්න. හොද කෙනෙක් දාලා දිනවන්න කියලා මම එපා කියද්දි මට බලහත්කාරයෙන් තරග කරන්න කියලා කිව්වා. අත්සන් කරන කොටත් කිවා. ආර්ථිකයත් හොද නැහැ. සුදුසු කෙනෙක් දාන්න කියලා. මට තරග කරන්න කියලා දිරිගැන්වූ රණවක මහත්තයා, මංජුල වීරරත්න මහත්තයා. දයා මහත්තයා ඉන්දික මල්ලි ඒ සියළුදෙනා මතක් කරනවා. ඒ ගෞරවය ආරක්ෂා කරන්න මම

තරග කළා. එවිට මම කිව්වා මේකට කවුරු ආවත් මම දිනලා පෙන්නනවා කියලා. මම අභියෝග කළේ එදා.මම එහෙම කළේ පෞද්ගලික මට්ටමින් නොවේ. වැලිකන්න හා ළහිරුගම කවුරු ආවත් මම දිනනවා කියලා මම කිව්වා. පැල්පොල මම පරාදයි. වැලිකන්න ළහිරුගම සිංහල දෙමළ මුස්ලිම් බෞද්ධ කතෝලික හින්දු ඒ හැමෝම මට ඡන්දය දුනා. මට ඡන්දය දුන්නේ පෝස්ටරයක්වත් ගහලා නෙමෙයි. මම කාගේවත් ෆොටෝ ගැහුවෙත් නැහැ. මම කිව්වේ වඩා සුදුසු කෙනාට ඡන්දය දෙන්න කියලා. මට දෙන්න කියලා කිව්වෙත් නැහැ. මගේ කොට්ඨාසයේ ජනතාවට යමක් කරන්න මට යුතුකමක් තියෙනවා. මම හෙන්චයියෙක් වෙන්නේ නැහැ. මට යමක් දැන ගන්න තියෙනවා නම් මම ඒක අහලා දැන ගන්නවා. ඒ මගේ හැටි. තමුන්නානසේට බලයක් තිබිලා තියෙනවා. ඉදිරියටත් තියෙනවා. පොදුජන පෙරමුණ මේ රටේ බලය ගන්න කොට ඒකාබද්ධ විපක්ෂයේ නායකයා දිනේෂ් ගුණවර්ධන මහත්තයා. එතුමාගේ නායකත්වයෙන්. මම කිව්වා කවර පක්ෂයකින් ආවත් සභාපති වෙන්නේ ජයන්ත කෙනෙක් කියලා. එක්සත් ජාතික පක්ෂයෙන් ආවා නම් ජයන්ත රණවක මහත්තයා. පොදු ජන පෙරමුණ ආවොත් ජයන්ත රෝහණ මහත්තයා කියලා. වැලිකන්න පිරිසක් හිටියා නිති විරෝධි කටයුතු කරන පිරිසක්. ඒ අයට මාව යවන්න ඕන වුණා. ඒ අය කිව්වා මාව ගෙදර යවනවා කියලා. නමුත් වැලිකන්නේ මිනිස්සු කැමති වුණේ නැහැ නීති විරෝධි කටයුතු කරන අයට. මන්ත්‍රීවරු දෙපලක් හිටියා. පොහොට්ටුවේ හා යූ එන් පී එකේ. මම එදත් කතෝලිකයෙක්. අදත් කතෝලිකයෙක්. නමුත් පල්ලි යන්නේ නැහැ. සමහර අය කිව්වා සුසන්ත රූපසිංහ කතෝලිකයෙක්. ආගමට විරුද්ධව කටයුතු කරනවා. පූජකතුමාට විරුද්ධව පොලිසි ගිහින් තියෙනවා කියලා. එහෙම කරලාත් මාව පරද්දන්න වුණේ නැහැ. මම තව අවුරුදු 04 කින් ගෙදර යනවා. වැලිකන්න ප්‍රදේශයට සුදුසු කෙනෙක් දාලා දිනවන්න දැන්මම ලැස්ති කරන කියලාත් ඉල්ලනවා. ඔබතුමාට මම සුභ පතන්න ඕන. කාරණා 02 ක් තියෙනවා. ඔබතුමා වැලිකන්න විද්‍යාලයේ හා රාජසිංහ විද්‍යාලයේ ආදි ශිෂ්‍යයක්. අප ඒ කාලයක් තිස්සේ එකට වැඩ කළා. මගේ දේශපාලනය මම ළග තියෙනවා. නමුත් සභාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ඕනම උදව්වක් මම කරනවා. ඔබතුමාගේ පැත්තෙන් වැලිකන්න එක මන්ත්‍රවරයායි ඉන්නේ. සුසන්ත රූපසිංහ විතරයි තමුන්නාන්සේත් ගමට යන්නේ මගේ ගම පහු කරලා. තමුන්නාන්සේත් මට උදව් කරයි කියලා මම හිතනවා. ඔබතුමාටත් උප සභාපතිතුමාටත් සුභ පතමින් මම යමක් දැනගන්න ඕන නම් කථා කරන බවත් මතක් කරනවා. ලේකම්තුමාත් පහුගිය කාලයේ විශාල සේවයක් කළා. ඉදිරියටත් එසේ කටයුතු කරන්න. සියළුදෙනාටම ස්තුතිවන්ත වෙමින් මම නිහඩ වෙනවා. බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගීතාමනි ස්වර්ණලතා මැතිතුමිය.</u>

ගරු සභාපතිතුමනි, ගරු උප සභාපතිතුමනි, ගරු ලේකම්තුමනි පක්ෂ විපක්ෂ මන්ත්‍රීතුමන්ලාගෙන් හා මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. කාර්ය මණ්ඩලයෙන් අවසරයි. 2018.02.10 වන දින පළාත් පාලන මැතිවරණයෙන් අංක 12 දිද්දෙනිය කොට්ඨාශය සඳහා තරග කරලා වැඩි ඡන්ද ප්‍රමාණයක් අරගෙන වැඩි ඡන්ද 800 කට ආසන්න ප්‍රමාණයක් අරගෙන සීතාවක ප්‍රාදේශීය සභාවට එන්න හැකි වීම ගැන මම ඉතාමත් සන්තෝෂ වෙනවා. පොහොට්ටුව ලකුණින් තරග කරලා මගේ ඡන්ද කොට්ඨාශය තුල ඡන්ද මධ්‍යස්ථාන 03 ක් තිබුණා. ඒ ඡන්ද මධ්‍යස්ථාන තුනේම වැඩිම ඡන්ද ලබා ගැනීමට මට හැකි වුණා. ඒ හැකි වුනේ දිද්දෙණිය උතුර, දකුණ නිරිපොල, නිරිපොල දකුණ එම ග්‍රාම සේවා වසම් 04 ම ඡන්ද කොට්ඨාශ වල ඡන්ද දායකයන්ගේ උපරිම කැපවීම මත ඒ මොකද මට විවිධ බාධක ආවා ඔබතුමා දන්නවා. මම දේශපාලනයට ප්‍රවිශ්ට උනේ කොහොමද කියලා මගේ මහත්තයා තමයි මේ දේශපාලනයේ හිටියේ. එතුමා උදේ ගිහිල්ලා අත්සන් කරලා ආවා. පාන්දර 3.00ට 21

වෙනිදාට එළිවෙන්න තමයි කාන්තා නියෝජනයේ පොඩි අඩුපාඩුවක් කියලා මාව එක්කගෙන ගිහිල්ලා එතුමාගේ නම ලිස්ට් එකෙන් අයින් කරලා මගේ නම ඇතුල් කලේ ගරු සභාපතිතුමනි. මම හිතන්නනේ ඒක ඔබතුමා දන්නවා අනෙකුත් අයත් දන්නවා. ඒ ඔස්සේ මට මගේ කොට්ඨාශය තුල විවිධ තර්ජන ගර්ජන බොහොමයක් ආවා. මොකද මාව දන්නේ ගාමිණී මහත්තයාගේ පවුල කියනවා මිසක් ගීතාමනී ස්වර්ණලතා ලෙස කිසිම කෙනෙක් දන්නේ නෑ. නමුත් මගේ විරුද්ධ පක්ෂයේ අය මොකද කලේ මට මගේ කැම්පේන් එක මට කිසිම කරදරයක් නැතුව කරලා දුන්නා මොකද එයාලා කිව්වා ගාමිණී නෙවෙයි ජන්දේ ඉල්ලන්නේ එයාගේ පවුල කියලා. මම මේ අවස්ථාවේ පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා විපක්ෂය ඇතුලු ඒ කණ්ඩායම් හතරටම. ගරු සභාපතිතුමනි මේ මැතිවරණ ක්‍රමය යටතේ ජයග්‍රහණය විජයග්‍රහනයක් ලෙසට පත් කර ගැනීම සඳහා අවශ්‍ය ශක්තිය හා උපදෙස් ලබාදෙමින් දිනෙන් දින පැයෙන් පැය තත්පරෙන් තත්පරේ අපිට උපදෙස් දුන්න අපිට යෝධ බල යෝධ ශත්තියක් වුණ පළාත් සභා මන්ත්‍රී ගරු මහේෂ් අල්මේදා මැතිතුමා, හිටපු ප්‍රාදේශීය සභා සභාපති නීතිඥ රවීන්ද්‍ර ජයසිංහ මැතිතුමා ඒ වගේම මම මතක් කරන්න ඕනේ. එස්.ඒ. ප්‍රේමචන්ද්‍ර මහතා මගේ ගේ ලගින් යනකොට කතා කරලා අහනව. ඔබතුමියට මොකද වෙන්න ඕනේ මගේන මොනවද වෙන්න ඕනේ කියලා. මගේ පලවෙනි රැස්වීමට ඇවිල්ලා එතුමා කතා කලා මට ගොඩක් ලොකු ශක්තියක් ධෛර්යයක් ලබා දුන්නා එතුමා ගරු සභාපතිතුමනි , තම කොට්ඨාශය වන අංක 12 දිද්දෙනිය කොට්ඨාශය කාන්තා නියෝජනය සඳහා පරිත්‍යාග කරලා මගේ මහත්තයා ගාමිණී විජේරත්න මහතා එතුමාට මම පලමුවම ස්තුතිවන්ත වෙනවා. එතුමා මේ පොහොට්ටුව දිනවීමට පොහොට්ටුව දිනවීමේ කාර්යය තම දෙවුර මත දරාගෙන මේ මැතිවරණ රාජකාරියේ යෙදුනා ඒ වගේම එතුමාට ශක්තියක් ධෛර්යයක් ලබා දුන්නා දිද්දෙණිය කොහොලන්කන්ද ආරණ්‍ය සේනාසනයේ දිද්දෙණියේ විමලසංඛ නායක හාමුදුරුවෝ උන්වහන්සේගේ අවවාද අනුශාසනා ලබාගෙන අපි හරියට හරි මග ගමන් කලා අපිට චෝදනා කල කිසිම කෙනෙක් සමග අපි රංඩුවට ගියේ නෑ. අපි ඒක විවේචනය කරන්න ගියේ අපි අපේ මැතිවරණය කාර්යය ඒ විදියට කරගෙන ගියා ගරු සභාපතිතුමනි. මම වැඩිය කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නෑ සීතාවක ප්‍රාදේශීය සභාව ලංකාවේ තියෙන පලමුවෙන්ම හොඳම ප්‍රාදේශීය සභාව බවට පත්වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දනුෂ්කි ප්‍රභානි අල්මේදා මැතිතුමිය</u>

ගරු සභාපතිතුමනි, ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු සභාවෙන් අවසරයි. මම අංක 13 හංවැල්ල නගරය සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හදවත බඳු නගරය කියලා කියන්න කැමතියි නගරයේ කොට්ඨාශයේ මන්ත්‍රීවරිය විදියට අද මෙම ගරු සභාව නියෝජනය කරනවා. ඒ වගේම කියන්න ඕනේ අපි අද පරාජයට පත් කලේ මේ කොට්ඨාශයේ හිටපු ඉතාම ප්‍රභල මන්ත්‍රීවරියක් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරියක් වැඩි ඡන්ද විශාල ප්‍රමාණයකින් පරාජයට පත් කරලා තමයි සීතාවක ප්‍රාදේශීය සභාව අද මේ විදියට නියෝජනය කරන්නේ. ඒ වගේම තව කියන්න ඕනේ මට ඡන්ද අයිතිය ලැබිලා තවම වසර දෙකයි නමුත් මම ක්‍රියාකාරි දේශපාලනය පටන් ගත්තේ මේ වසර දෙකට බොහොම කලින්. අපේ සුසන්ත මන්ත්‍රීතුමා දන්නවා මට අවුරුදු 14 ඒ තමයි ඉස්සල්ලම මහේෂ් අල්මේදා මැතිතුමාගේ රැස්වීම් වලදී කතාකරපු ගැහැනු ළමයෙක් මම. ඒ වගේම තව දෙයක් කියන්න ඕනේ ශ්‍රී ලංකාවේ ලාබාලම මහජන ඡන්දයෙන් තේරී පත් වුණ ලාබාලම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරියක් ලෙස මම මේ සභාව නියෝජනය කරනවා. ඒ වගේම ඒ විශිෂ්ට ජයග්‍රහණය ලබා ගැනීමට ඒ ජයග්‍රහණය දෙවුර මත දරාගෙන කටයුතු කලේ මේ කොට්ඨාශයේ ජනතාව ඒ නිසා ඔවුන් හඳුන්වන්නට ඕනේ මේ ජයග්‍රහණය ඔසවාගෙන සිටින ගල් කුළුණු වශයෙන් ඔවුන්ට මම මුලින්ම ඔවුන්ට ස්තුතිවන්ත විය යුතුයි අපි. ඒ වගේම මේ මැතිවරණ ව්‍යාපාරය පුරාවට ඊට පෙර අපිට විශාල ශක්තියක් වුණ ගරු පළාත් සභා මන්ත්‍රී හිටපු අමාත්‍ය ගරු මහේෂ් අල්මේදා මැතිතුමා

එතුමා පෞද්ගලිකව අවිස්සාවේල්ල ආසනයේ සෑම කොට්ඨාශයකටම ගිහිල්ලා මන්ත්‍රීවරයෙකුගේ නිවසට ගිහිල්ලා සීතාවක පුර නගර සභාවේ පවා සෑම මන්ත්‍රීවරයෙකුටම විශාල ශක්තියක් වුණු මම ගෞරව පූර්වකව සිහිපත් කරන්න ඕනේ අවිස්සාවේල්ල ආසන සංවිධායක අධී නීතිඥ රවීන්ද්‍ර ජයසිංහ මැතිතුමන් එතුමන් කිසිම තනතුරක් අපේක්ෂා නොකර මැතිවරණ ප්‍රචාරණ කටයුතු මැතිවරණයේදී මෙන්ම මැතිවරණයෙන් පසුවත් වර්තමාන තත්වයන් පවා මේ සියළුම මන්ත්‍රිවරුන්ට හා මන්ත්‍රීවරියන්ට විශාල ශක්තියක් වෙනවා. ඒ බවත් සිහිපත් කල යුතුය. ඒ වගේම මම දේශපාලනය ගැන කතා කල යුතු නෑ. මම අවුරුදු 19න් මේ දේශපාලනයට එන්න හිතාගෙන හිටපු කෙනෙක් නෙවෙයි මම තවම අ.පො.ස උසස් පෙළ විභාගය නිම කරලා විශ්ව විද්‍යාලය සඳහා අයදුම් කරලා ඉන්න ශිෂ්‍යාවක් මම තවම විශ්ව විද්‍යාල ප්‍රවේශ පත්‍රයවත් ලැබිලා නෑ. මේ මන්ත්‍රිකම ලැබෙන විට මගේ අධ්‍යාපනය ඒ වගේම අහඹු සිදුවීමක් වගේ දේශපාලනය මගේ හොඳට හෝ නරකට මට මෙය ලැබුනේ අනාගතය ගැන අපි කියන්න දන්නේ නෑ ඒ වගේම ප්‍රසන්න අල්මේදා මැතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනේ. මේ සෑම මන්ත්‍රීවරයෙක්ම මොකද විශේෂයෙන්ම මේ පොදු ජන පෙරමුනේ මන්ත්‍රීවරුන්ට මෙන්ම සෑම මන්ත්‍රිවයෙකුටම ස්තුතිවන්ත වන අතර මම එතුමාට ස්තුතිවන්ත වුනේ අද එතුමා නිසයි මහරගම නගර සභාවේ ලැයිස්තුවට වුණ දේ අපේ සීතාවක ප්‍රාදේශීය සභාවේ ලැයිස්තුවට සිද්ධ නොවීමට කටයුතු කිරිම නිසා ඒ වගේම ගාමිණී මැතිතුමා ඔවුන් ඔවුන්ගේ අපේක්ෂකත්වය කැප නොකරන්නට මේ කාන්තා නියෝජනය සම්පූර්ණ නොවීම නිසා මේ ලැයිස්තුව ප්‍රතික්ෂේප වෙන්නට තිබුණා. ඒ නිසා අපි ඔවුන් දෙදෙනාට අපි විශේෂයෙන් ස්තුති වන්ත වෙන්න ඕනේ ඔවුන් මේ මැතිවරණ ව්‍යාපාරයේ බොහොම බර උසුලගෙන කටයුතු කරපු අය ඒ වගේම මම ගැන කියන්නම් සුසන්ත මන්ත්‍රීතුමා සඳහන් කලා මගේ පියාණන් 88 දේශලනයේ ප්‍රසන්න අල්මේදා මැතිතුමන් 88 ක්‍රියාකාරි දේශපාලනයට පිවිසුණු ආකාරය කිව්වා එතුමන් සමග සමකාලිනයෙක් විදියට නමුත් එතුමා ඡන්දෙන් ඉදිරිපත් වෙලා මන්ත්‍රීධූරයක් ලබා නොගෙන එදා පටන් මම දන්න විදියට එතුමා පාසල් කාලයේදී පවා ක්‍රියාකාරි දේශපාලනයට පිවිසුණ ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ තරුණ ප්‍රධාන ක්‍රියාකාරි සාමාජිකයෙක් වශයෙන් ඇත්ත වශයෙන්ම මම එතුමාගේ ඇස් දෙකෙන් තමයි මම 80 දශකයේ , 90 දශකයේ දේශපාලනය දැක්කේ මම තාවමත් ඒ දේශපානය දකින්නේ එතුමාගේ ඇස් දෙකෙන් ඒ නිසා මම උපන්ගෙයි වාමාංෂිකයෙක් මම අනිකුත් පක්ෂවල එහෙයියෙක් නොවයි කිසිදු ප්‍රසිද්ධ නායකයෙක් ප්‍රමෝට් කරන මන්ත්‍රීවරියක් නෙවෙයි. මම උපන්ගෙයි වාමාංෂිකයෙක් හැටියට ජනතාවට සේවය කිරිමේ පිවිතුරු අරමුණ ඇතිව මෙම සභාව නියෝජනය කරන්නියක් විදියට මම කියන්න කැමතයි සර්වකාලීන දේශපාලන අත්දැකීම් මට මගේ අවට දේශපාලන වටපිටාවෙන් ලැබෙනවා මට අවුරුදු 20 යි තවම ඒ අවුරුදු 20 ඇතුලත මම උපන් දා සිට තාත්තාගෙන ලැබුණ ඒ දේශපාලන අත්දැකීම් සහ ගරු මහේෂ් අල්මේදා මැතිතුමාගෙන් හා මගේ පියාණන්ගෙන් ඒ සේවය යටතේ විවිධ පුද්ගලයන් මුණ ගැසුනා විවිධ පුද්ගලයන් ආශ්‍රය කරන්නට ලැබුණා. ඒ නිසා මම හිතනවා මම මේ තැනට එන්න නුසුදුසු කෙනෙක් නොවෙයි. කියන එක ඒ වගේම මම තව දෙයක් කියන්න ඕනේ. පිවිසීමට පුංචි අදහසක් පුංචිකාලේ ඉඳලා තිබුණා ඒ නිසා මේක මට නොලැබිය යුතුව තිබුණ දෙයක් නොවේ ලැබිය යුතුව තිබුණ නමුත් නියමිත කාලයට පෙර ලැබුණු දෙයක් හැටියට තමයි මම සලකන්නේ සමහර විට මේ දේශපාලන ගමන අතර මැද නවත්තලා මට අපේක්ෂකත්වය ලබාදුන් ගරු ප්‍රසන්න අල්මේදා මැතිතුමාට ඉඩ ලබාදෙන්න අවස්ථාව ලැබුණොත් මම අනිවාර්යයෙන් ඒ ගැන දෙපාරක් හිනේ නෑ එය ලබා දෙනවා ඒ පිළිබඳවත් සඳහන් කරමින් මමත් මගේ හද යෞවනය කැප කරමින් මේ දේශපාලනයට පිවිසිලා ඉන්නේ මටත් අනාගත අපේක්ෂාවන් තියෙනවා මගේ අධ්‍යාපන කටයුතු පැත්තෙන් මම ඒ සියල්ල සාක්ෂාත් කර ගත යුතුයි. මම මං වෙනුවෙනුත් යමක් කර ගත යුතුයි. ඒ පිළිබඳවත් සඳහන් කල යුතුයි. ඒ වගේම විශේෂයෙන්ම සඳහන් කල යුතුයි මම නියෝජනය කරන ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ නායක ඩී වී ගුණසේකර මැතිතුමා එතුමාත් අපිට ඇත්තටම අපිට සමීපව කටයුතු කරලා

අපිට නිතර දැනමුතුකම් දෙන මැතිවරණ කාලයේ මෙන්ම ඉන් පසුවත් අපිව නිතරම දැනුවත් කරමින් අපේ වගකීම් හා යුතුකම් පිළිබඳව දැනමුතුකම් ලබා දෙන අපිට නිවැරදි මාර්ගයට යොමු කරන එතුමා අපිට ලබා දෙන මාර් ගෝපදේශකත්වය ලබා දෙනවා. රටේ දේශපාලනයට සමග මම මේ ප්‍රදේශයේ ගෞරවණීය දේශපාලන ඉතිහාසයකට හිමිකම් කියන වර්තමාන පුරුකක්. මම මේ ගරු සභාවේ මන්ත්‍රීවරු 43 ක් වන මහජන නියෝජිතයන්ගෙන් එක්කෙනෙක් ඒ නිසා මම කැමතියි අනිකුත් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සභාව තුලදී වගේම අපි නවකයෝ සභාවෙන් පිටතදීත් ඒ කිසිම නවක මන්ත්‍රී වයෙකුගේ හෝ මන්ත්‍රීවරියගේ මැතිවරණ කාලයේ දී කියපු කරපු දේවල් ඒවා ඔවුන්ගේ දේශපාලන වාසිය තකා කියපු දේවල් වෙන්න ඇති නමුත් අපි එලියේදී මෙන්ම ඇතුලෙදිත් අපේ ආත්ම ගරුත්වය ආරක්ෂා කරගනිමින් කටයුතු කරයි කියන එක මම බලාපොරොත්තු වෙනවා. ඒ වගේම තවත් දෙයක් කියන්න ඕනෙ අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රී වරියක් නිසා මට බොහෝම හිත්වේදනාවක් උනා. එතුමා කිව්වා ඔබතුමා සමග වන 7 දෙනා සහ ඇත්තටම ගරු මන්ත්‍රීතුමනි මම දෙයක් කියනන් මෙම ගරු සභාව තුලදී ඉන්නේ පක්ෂ දෙකක් එනම් ආණ්ඩු පක්ෂය හා විපක්ෂයයි ආණ්ඩු පක්ෂය තුල පිල් දෙකක් නෑ ආණ්ඩු පක්ෂය තුළ ඉන්නේ ගරු සභාපතිතුමා උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීවරු 23ක් ඒ නිසා ඒක දෙකට බෙදන්න විපක්ෂයට උවමනාව තිබුණත් ඒක කරන්න බැහැ අපි සාමාන්‍යයන් 23 දෙනෙක් එකට ඉන්න කොට 23 දෙනාම එකම මතයක ඉන්නේ නැති වෙන්න පුළුවන් පුංචි පුංචි මත භේද පුංචි පුංචි රණ්ඩු ඇති වෙන්න පුළුවන්. නමුත් අපි එළියට දෙන්නේ එක මතයක්. අපේ මේ 23 දෙනාගේම මතය ඒ මතය ඇතුළේ අපි 23 දෙනාම නියෝජනය වෙනවා. අපි 23 දෙනාගේම මතය සමස්තය ඒ නිසා අපි දෙකට බෙදිලා නැහැ කියලා කියන ඕනෙ. ඒ වගේම තව දෙයක් කියන්න ඕනෙ මන්ත්‍රීවරුන්ගේ ගෞරවයට ආරක්ෂා වෙන පරිදි නවකයන්ට ඉඩ හසර හදලා දෙන්න. තව දෙයක් කියන්න ඕනෙ හංවැල්ල නගරය කියන්නෙ ඓතිහාසික වශයෙන් වගේම විශාල වෙළඳමය වටිනාකමක් තියෙන නගරයක් සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තියෙන. ඒ නිසාම අපි දන්නවා අපේ පැත්තේ ගංවතුර ප්‍රශ්නය කාණු පද්ධතිය දේශපාලන ප්‍රශ්න නිසා ගොඩක් සංවර්ධනය සීමා වෙච්ච නගරයක් සති ගණන් දින ගණන් එක තැන නැවතිලා තියෙනවා මේ ප්‍රශ්න නිසා. ඒ නිසා අපි ඒ පිළිබඳව සෞඛ්‍ය සහ පරිසර පද්ධතිය ගැන ඒ නිසා ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම ස්තුතිවන්ත වෙනවා සියළුම දෙනාට. ඔබ සැමට සුබ සන්ධ්‍යාවක් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුසන්ත මැතිතුමා</u>

සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමා ඒ වගේම මෙම පහල හංවැල්ල ජනතාව ජයවීරගොඩ ජනතාව ප්‍රථමයෙන් මේ අවස්ථාවේදී මම ස්තුතිය පුදකර සිටිනවා. ඒ වගේම මගේ ජයග්‍රහණය පිටුපස මම පළාත් සභාවට තරඟ කරපු මන්ත්‍රීවරයෙක් සමඟයි මම ප්‍රාදේශීය සභාවට තරඟ කළේ. ඉතින් ඒ අවස්ථාවේදී මට මුලින්ම බාධක කම්කටොලු ගොඩක් ආවා. සීතාවක ප්‍රාදේශීය සභාවෙන් තමයි මගේ ඉඩමට කුණු දාන්නෙ. එම අවස්ථාවේදී මම තරඟ කරන අවස්ථාවේදී ගම හැම තැනම පෝස්ටර් ඇලෙව්වා සභාවෙන් මම සල්ලි අරගෙන මගේ ඉඩමට කුණු දානවා කියලා. ඒ අවස්ථාවේදී ඒ හැම කොට්ඨාශයකම ඒ මන්ත්‍රීතුමන්ලා කිව්වා මෙයාට සල්ලි දෙන්න එපා මෙයාට සභාවෙන් ගෙවනවා කියලා. මං මේ අවස්ථාවේදී කියන්න කැමතියි මම කළේ සභාවට පරිත්‍යාගයක් මිසක් සල්ලි ගන්න දෙයක් නෙමෙයි ලේකම්තුමා පැහැදිලිවම දන්නවා. මම එතුමාව වරින් වර දැනුවත් කළා. මට මේක කරන්න අමාරුයි කියලා. මට අපහාස කරනවා මිනිස්සු. මට එහෙම කරන්න එපා කියලා. ඊට පස්සෙ ලේකම්තුමා මගෙ හැම ප්‍රශ්නෙකටම එකඟව

පිළිතුරු දුන්නා. මඩ පොස්ටර් ගැහුවා. ඒ වගේම මට චෝදනා කළා. මාධ්‍යයෙන් එච්චා. ඒ හැමදේකටම මූණ දෙමින් තමයි මම මේ අවස්ථාවේදී මන්ත්‍රීධූරය ලබා ගත්තේ. ඒ වගේම මගේ මේ ජයග්‍රහණය පිටුපස මගේ නායක ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඒ වගේම ගරු ගීතාංජන ගුණවර්ධන මැතිතුමා ඒ වගේම අපේ සභාපති ගරු ජයන්ත රෝහණ මැතිතුමා හා චන්දන ලියනගේ මැතිතුමා රවින්ද්‍ර ජයසිංහ මැතිතුමා, ගරු මහේෂ් අල්මේදා මැතිතුමා, මගේ හැම රැස්වීමකටම එකතු වුණා. රැස්වීමට නොගිහින් එකටම කටයුතු කරපු එක ගැන මේ අවස්ථාවේදී මම ආඩම්බරයෙන් ඒ හැමදෙනාටම ස්තුතිවන්ත වෙනවා. මම මගේ ගම් තුන වශයෙන් විශේෂයෙන්ම පහල හංවැල්ල ජනතාව ඒ නොයෙකුත් ප්‍රකාශ මධ්‍යයේ මට සෑහෙන ඡන්ද සංඛ්‍යාවක් ලබා දුන් පහල හංවැල්ල ජනතාවට මම මේ අවස්ථාවේදී අවංකවම ස්තුතිවන්ත වෙනවායි කියන එක මම ප්‍රකාශ කරනවා. ඒ වගේම මම මම ව්‍යාපාරයක් කරන පුද්ගලයෙක්. ඕනෑම දේකට එරෙහිව සභාපතිතුමාත් එක්ක එකට ඉදගෙන එකසේ වැඩ කිරීමට කටයුතු කරනවා. අපි හැමදෙනාම එකතු වුණාම බොහොම සතුටුයි. කොට්ඨාසයේ සංවර්ධන කටයුතු කරගෙන යාමට අවශ්‍ය සහයෝගය ලබා දෙන මෙන් ඉල්ලා සිටිමින් පහල හංවැල්ල ජනතාවටත්, වලව්වත්තෙ ජනතාවටත්, ජයවීරගොඩ ජනතාවටත් වැඩක් කරන්න මට අවස්ථාව ලබාදීම ගැන මං ඔබ හැමට සුබම සුබ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඔබ සැමට බුදුසරණයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩී. සමන්ත කුමාර මැතිතුමා</u>

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ගරු ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන්ද මාධ්‍ය වේදීන්ගෙන්ද අවසරයි. ඇත්තටම මම දේශපාලනය ගැන කතා කරන්නෑ. කවුරුත් දන්න මම ක්‍රිඩකයෙක් හා සමාජ සේවකයෙක් කියලා. ඉතින් මාව මෙතෙන්ට ඇදලා දාපු අයට මට ස්තුති කරන්න තමයි තියෙන්නෙ. ඉතින් මිනිස්සු එක්ක වැඩ කිරිම සමාජ සේවයයි තමයි මූලිකම දේ. ඉතින් ඒ අයට ස්තුති කරන්න මම මේක අවස්ථාවක් කර ගන්නවා. මම මුලින්ම මගේ සංවිධායක වන ගරු නිතිඥ රවින්ද්‍ර ජයසිංහ මැතිතුමා ඉතා ආදරයෙන් සිහි කරන ගමන් ඒ වගේම මහේෂ් අල්මේදා මැතිතුමා, ඒ වගේම වේවැල්පනාව පැත්තෙන් මාත් එක්ක මට උදවු කරපු යසවර්ධන මැතිතුමා සහ ඒ සියළුදෙනාට ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම වේවැල්පනාව පැත්තේ ජනතාව මේ සියලුදෙනාම ආදරයෙන් මතක් කරනවා. ඒ වගේම මේ අවස්ථාවේ මම විශේෂ දෙයක් කියන්න ඕනෙ සභාපතිතුමනි, මම ජයග්‍රහණය කළාම ඒ ජනතාව කිව්වේ පළවෙනි වතාවේම මේක නිකන් හරි කියන්න කියලා. වේවැල්පනාවේ ක්‍රීඩා පිටියේ තියෙන කළු ගල ඉවත් කරලා දෙන්න. ඉතින් ඒගොල්ලො මට ඊයෙත් කිව්වා ඔබතුමාට එය ඉවත් කරලා දෙන්න පුළුවන් කියලා. මට ඒ සියලුදෙනාගේම සහයෝගයත් එක්ක සභාපතිතුමාට මන්ත්‍රී මණ්ඩලයට අපේ සීතාවක ජනතාවට හොඳ සේවයක් කරන්න වාතාරවරණයක් ඉදිරියේදී ලැබෙයි. කොහොමත් සැලසෙනවා. සියලු දෙනාටම ඒ සඳහා ශක්තිය ලැබේවා .ඔබ සැමට සුබ නව වසරක් වේවා පතමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්. වරුණ දිලිප් කුමාර මැතිතුමා</u>

සුබ සැන්දෑවක් වේවා. ගරු සභාපතිතුමා ඇතුළු ගෞරවනීය මන්ත්‍රී මණ්ඩලයෙන්ද ලේකම්තුමා ඇතුළු සහෝදර කාර්ය මණ්ඩලයෙන්ද අවසරයි. ඒ වගේම ස්තුතිවන්ත වෙනවා මට මේ අවස්ථාව ලබා දුන්නු ගරු සභාපතිතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම දේශපාලනයේ ලොකු චරිතයක් නැති උනාට දේශපාලනයට ආවම දැනගත්තා මේකෙ තියෙන බැරෑරුම්කම නමුත් මේ දේශපාලන ගමනේදී මගේ කොට්ඨාශයේදී විශාල ජයග්‍රහණයක් ලබාගන්න විශේෂයෙන්ම දේශපාලනයේදී පරිණතයි කියාගත්ත මිනිස්සු ගම්වැදිලා ගම විනාශ කරන

වෙලාවෙ ගමට ඒ අභියෝගය භාරගත්ත ඡන්ද 950කට වැඩි ප්‍රමාණයකින් ජයග්‍රහණය කරන්න ලැබිච්ච මම මේ අවස්ථාවේ මගේ ගමේ ජනතාවට මගේ ආචාරය ගෞරවනීය ස්තුතිය පුදකරනවා. ඒ වගේම විහාරස්ථානවල විහාරාධිපතින් වහන්සේලාටත් මෙහෙණින් වහන්සේලාටත් ඒ වගේම දේශපාලන අධිකාරියේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සංවිධායකතුමා නිතිඥ. රවින්ද්‍ර ජයසිංහ මැතිතුමාත් ඒ වගේම සෙසු පක්ෂවල නායකයන් විශේෂයෙන් ගීතාංජන ගුණවර්ධන මැතිතුමා ඒ වගේම විපක්ෂයේ මහේෂ් අල්මේදා මැතිතුමා අනිත් පක්ෂවල නායකයනුත් ඒ වගේම සහෝදර මන්ත්‍රීවරුනුත් අයෝම් මන්ත්‍රීවරයා වගේම අපේ සභාපතිතුමා අපේ උප සභාපතිතුමා ගරු චන්දන මුදුන්කොටුව මන්ත්‍රීතුමා, චන්දන ලියනගේ මන්ත්‍රීවරයා කථානායක කවුද අපේ සහෝදරයා ඒ වගේම අපේ සභාපතිතුමත් මගේ මැතිවරණ රාජකාරී වලට විශාල වශයෙන් සහයෝගය දුන්නා. ඒ අයටත් බොහෝම ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම සඳහන් කරන්න ඕනෙ යම් යම් දේශපාලන වශයෙන් අතුගෑවිච්ච පුද්ගලයින් මේ අවස්ථාවේදී යම් යම් යුද්ධ ප්‍රකාශ කරන්න පෙළඹිලා තියෙනවා. නමුත් සභාපතිතුමා ඔබතුමාට කියනවා ඔබතුමා ඉන්නෙ හත්දෙනෙක්ගෙන් සමන්විත කණ්ඩායමක් හත්දෙනෙක් නෙමෙයි ඔබතුමා දැනගන්න ඕනෙ අපි තුන්දෙනෙක් ඉන්නවා . අපි සහය දෙනවා ඒ නිසා විවිධ වේශයන් ගත්ත වන්දිභට්ටයන් ඔබතුමාට විවිධ ස්වරූපයෙන් ඇවිත් ඉන්නවා. නමුත් අපි ඔබතුමාගෙන් ඉල්ලා හිටිනවා ඒ වන්නිල ඇත්තන්ගෙන් ප්‍රවේසම්වෙන්න කියලා. අපි තුන්දෙනෙක් ඔබතුමා සමඟ ඉන්නවා ඒ නිසා ඒකෙ පංති මට්ටමක් අපිට අවශ්‍ය නෑ. සභාවෙ දර්ශනය ගෙනියන්න අපි ඉදිරිපත් වෙලා ඉන්නවා කියන එකත් මේ සභාවේ කටයුතු කරගෙන යාමට අවශ්‍ය සහයෝගය ලබලා දෙනවා නිරන්තරයෙන්ම. විවිධ පුද්ගලයින්ගෙන් ඉදිරිපත් උනා මේ ඡන්දය ජයග්‍රහණය කරන්න පුලුවන් කියලා. පුළුවන් තමයි මොකද විපක්ෂය නියෝජනය කරන්නේ ඒ කියන්නේ ආණ්ඩු පක්ෂය නියෝජනය කළේ ඒ පොල් ලෙල්ලක් පොල් පිත්තක් තරම්වත් වටින්නෙ නැති අය කියලා. ඒ වගේම මේ අවස්ථාවේදී ගම්වල ජනතාවටත් අධිකාරියටත් ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම ජනතා නියෝජිතයෙක් විදිහට ගමට සංවර්ධනය සංවර්ධනය ලබා දෙන්න සභාපතිතුමාගෙත් කාර්ය මණ්ඩලයෙත් ගරු මන්ත්‍රීවරුන්ගෙත් සහයෝගය බලාපොරොත්තු වෙනවා. ඒ අනුව අපෙන් ලැබෙන්න ඕනෙ සහයෝගය ලබා දෙනවා. ඒ වගේම මේ අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් සියළුම දෙනාට සුභ අළුත් අවුරුද්දක් වේවා යැයි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්. පී. උපුල් ප්‍රසන්න මැතිතුමා</u>

සුබ අළුත් අවුරුද්දක් වේවා ඔබ සියලුදෙනාටම. ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා, ඒ වගේම අපේ නවක මන්ත්‍රීවරු මන්ත්‍රීතුමියන් ඒ වගේම අපිත් එක්ක අපේ ලැයිස්තුව නියෝජනය කරපු අපේ ලැයිස්තුවේ මන්ත්‍රීවරු ඇතුළු ගැලරියේ රැඳී සිටින අපේ සියලුම සහෝදර සහෝදරියන්ගෙන් අවසරයි. ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලුදෙනාගෙන් අවසරයි. අපේ මාධ්‍ය අංශයෙන් පැමිණිලා සිටින සියලුදෙනාගෙන් අවසරයි. ඇත්ත වශයෙන්ම අපි නවකයෝ හැටියට මේ ප්‍රාදේශීය සභාවට පය තැබූ මේ අවස්ථාවේ මංගල සභාවේ මංගල කතාවේදී මම ප්‍රකාශ කරන්න කැමතියි හැමකෙනාම ගොඩක් වෙලා කතාකළා. ඒ වගේම අපි හැමෝටම අප්පිරියා වෙන මට්ටමක් තියෙන්නෙ. ඒ තරම්ම කාලයක් ගියා අපේ මන්ත්‍රීතුමන්ලාගේ කතාවේ කියාගෙන යන්නෙ එකම දේ ද මන්දා හැමදෙනාම කියන්නේ මං හිතනවා මං පොඩි වෙනස් දෙයක් කියන්න ඕනෙ. පරණ අය හිතාගෙන ඉන්නවා ඇති මේක එතුමන්ලාගේ බුදලයක් කියලා. නැහැ එහෙම නොවයි අළුත් අයත් මේවා භාර ගන්න ඕනේ. මේ සභාවේ භාරගන්න ඕනෙ එතුමන්ලාගෙනුත් මේ රටට සමාජයට අළුත් දෙයක් වෙන්න තියෙනවා. මොකද අපි නවකයෝ හැටියට මගේ දේශපාලනය අවුරුදු 21 වෙනවා. මම ප්‍රාදේශීය සභාවට එනකොට සමහර මිනිස්සුන්ට හරි

වේදනාවයි. මං කියන්නෙ ඒ වේදනාව පාලනය කර ගන්න ඕනේ අපි සියලු දෙනාම හැමදාම ජීවත් වෙන්නේ නැහැ. යම් කාලයක් තමයි අපි මේ මිහිතලේ ජීවත් වෙන්නේ. ඒ ජිවත්වෙන කාල පරාසය තුළ අපිට සමාජයට ඉපදෙන්න ඉන්න දරුවන්ට අපෙන් ඉටු විය යුතු සේවාවක් තියෙනවා ඔවුන්ගේ දේවල් තමයි අපි මේ පරිහරණය කරන්නෙ. අපි ඔවුන්ට ආරක්ෂාව සලසා දිය යුතුයි. ඒ නිසා අපි ඒ හැඟීමෙන් කටයුතු කල යුතුයි අපි කණ්ඩායමක් හැටියට මේ ප්‍රාදේශීය සභාවට තරඟ කරලා ජයග්‍රහණය කරලා මේ වතාවෙත් තියෙන තත්වයෙන් ගොඩ යාගන්න තියෙන සටන තමයි දැන් අපි හැමෝටම තියෙන්නේ මෙතෙක් කාලයක් පාලනය කරපු පාලකයෝ අපේ රටට වෙච්ච දේ අපි දන්නවා. හැම දෙනාටම අත්දැකීම් තියෙනවා පොඩි දරුවෝ පවා අද මේ රට මොනවද වෙලා තියෙන්නෙ මොනවද වෙන්න යන්නේ කියන හැඟිමෙන් තමයි ජීවත් වුනේ. ඒ නිසා මම කියනවා අපිට අරගල තිබ්බා ඒ අරගල ජයග්‍රහණය කරලා අපි අද ප්‍රාදේශීය සභාවට පය තිබ්බා. අපි මන්ත්‍රීවරු නොවුනට අපේ ගම්වලට විශාල සේවයක් කරලා තියෙනවා. සියලුදෙනාම අහලා ඇති මම දේශපාලනය කරනකොට 1998 දී ඉන්දික ගුණවර්ධන මැතිතුමත් එක්ක අපි දේශපාලනය පටන්ගත්තේ. මට ඡන්දෙවත් තිබුණේ නෑ මම දේශපාලනය පටන් ගන්නකොට. 1987 මට අවුරුදු 17 දි තමයි මම දේශපාලනය පටන් ගත්තෙ. පාප්ප පොල්කටුව අරගෙන දේශපාලනය කරන්න පටන් අරගෙන ඔය ඉන්න මන්ත්‍රීවරු කොහොම කෑ ගැහුවත් ඔය කෑ ගහන මන්ත්‍රීවරුන්ට වැඩි සේවයක් මේ ප්‍රසන්න කියන චරිතය කරලා තියෙනවා. ඒ නිසා අපිටත් අයිතිවාසිකමක් තියෙනවා මේකට තරඟ කරලා ඒවා උරගාලා බලන්න අයිතියක් අපිටත් තියෙනවා. ඒ නිසා අපි කරපු සේවය මිනිසුන් අගය කරනවා. ඒ නිසා නවක මන්ත්‍රීවරු මම හිතන හැටියට කවුරුවත් ඔය කෑ ගහන හැටියට නටන්න සූදානම් අය නෙමෙයි. ඔවුන් ජාතිය වෙනුවෙන් තමන්ගෙ රට වෙනුවෙන් සටන් වදින්න සූදානම් පුද්ගලයෝ. අපේ සහෝදර මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටින්නේ ඔවුන්ට හරි පාර කියාදෙන්න ඔවුන්ගේ ශක්තියට ශක්තියක් වෙන්න කියලා ඉල්ලමින් අපි පහුගිය කාලෙ වගේ කා කොටාගන්නෙ නැතුව අපේ මන්ත්‍රීවරු 23 ක් ඉන්නවා. සභාපතිතුමාට අපේ පූර්ණ සහයෝගය දෙනවා. නිවැරදි මාර්ගයේ ගෙනිහිල්ලා අපි අපේ අහිංසක ජනතාවට හොඳ සේවයක් කරන්න. ලේකම්තුමා සමග පසුගිය කාලයේ කථා කරලා වැඩ කටයුතු රාශියක් කරගත්තා. පහුගිය කාලෙ ගංවතුර ඇතිවෙච්ච වෙලාවෙ ඔබතුමාට එක කෝල් එකයි දුන්නෙ මාස එකහමාරක් දෙකක් විතර ජනතාවට වතුර දෙන්න එතුමා කටයුතු කළා. කටයුතු සිද්ධ උනා. වග ප්‍රදේශයේ සියලු ජනතාවට මගේ අවංක ස්තුතිය පුදකරනවා. ඒ අනුව මේ අවස්ථාවේ මගේ ගම් ප්‍රදේශයේ ජනතාවට තුම්මෝදර, පල්ලේවාසල. ඒ වගේම ඉරිදාපොල හල්පෙවත්ත මේ ආදී සියලුම ජනතාවට අපේ ප්‍රණාමය, ස්තුතිය ප්‍රකාශ කර සිටිනවා. ඒ වගේම අපිට නායකත්වය දීලා ශක්තිය සහයෝගය දුන් ගරු මහේෂ් අල්මේදා මැතිතුමා එතුමා නිරන්තරයෙන්ම අපිට හැමවෙලාවෙම මන්ත්‍රීවරයක් වශයෙන් කටයුතු කරන්න උගන්නපු එතුමාටත් මේ අවස්ථාවේදී ස්තුති . ඒ වගේම දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මගේ රැස්වීම් මාලාවකටම ඇවිත් බොහෝ සහයෝගය ශක්තිය ලබාදුන්නා. ඒ වගේම බන්දුල ගුණවර්ධන මැතිතුමාටත් ඒ වගේම නිතිඥ රවින්ද්‍ර ජයසිංහ මැතිතුමාටත් ස්තුතිය මේ අවස්ථාවේ පුදකරමින් වග ප්‍රදේශයේ ජනතාවට ප්‍රණාමය මේ අවස්ථාවේ පුදකර සිටිනවා. සමාවෙන්න ඕනෙ අපේ විහාරස්ථාන ටික මතක් කරන්න ඕනෙ ඒ කොට්ඨාශයේ සියලුම විහාරස්ථානවල නායක ස්වාමීන් වහන්සේලා සියලු දෙනාටම මම මේ අවස්ථාවේ නමස්කාර පූර්වකව ස්තුතිය පුද කරනවා. ඔබ සියලුදෙනාටම ජයවේවා කියමින් සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ඔබ සියලුදෙනාටම ජයවේවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩී. චින්තක දේවින්ද සමරවීර මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් විදියට අද මන්ත්‍රීවරුන්ගේ කතාබහෙන් ගොඩක් දේවල් ඉගෙන ගත්තා. සමහර කතාවල ගන්න දෙයක් තිබුනෙත් නෑ. නමුත් කතාකරන කොට අපිට තේරුනා සමහර කතාවල අපිට ගන්න දේවල් තිබුනා සමහරක් දේවල් වැඩකට නැති දේවල්. අපේ හැම මන්ත්‍රීවරයෙක්ම මං හිතන්නෙ තේරුම් ගන්න ඕනෙ අද මෙතනට ඇවිල්ල ඉන්න මන්ත්‍රීවරු 43 දෙනාම නවකයෝ සභාපතිතුමාත් එක්ක. මං එහෙම කියන්නෙ මේ මැතිවරණ ක්‍රමය ඇතුලේ අපි නවකයෝ මං හිතන්නෑ පහුගිය කාලෙම තිබුණු මැතිවරණ ක්‍රමයට කවුරුවත් තරඟ කළා කියලා. මොකද මේ මැතිවරණ ක්‍රමය ඇතුලෙ අපි නවකයෝ නොවුනත් අපි අලුත් වැඩසටහනකට නොගියොත් අපිට කවදාවත් ආයෙ මේ ප්‍රාදේශීය සභාවට තරඟ කර ජයග්‍රහණය ලබාගන්න බැරි වෙනවා. ඒ මොකද කොට්ඨාශ ක්‍රමය හරිම වෙනස් ක්‍රමයක් ඒක තේරෙන්න ඇති. අපි කොට්ඨාස 26 කට තරඟ කරනකොට 23 දෙනෙක් අපෙන් පත්වෙනකොට අපෙන් 03 ක් එලියට යනවා. මිනිස්සු හොඳට කල්පනා කරලා තමයි ඡන්දෙ දීලා තියෙන්නෙ. අපි දේශපාලනයට ඉස්සෙල්ලා ගෙවල් වලට ගියා. ඒ ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂයේ හෝ වේවා ගෙවල්වල මිනිස්සු අපිත් එක්ක කතා කරපු දෙයක් තමයි සමහර මිනිස්සුන්ගෙ ගෙවල්වල තත්වය සෑහෙන සෝචනීයයි. ඉතින් නවක මන්ත්‍රීවරුන් හැටියට අපි අද මෙතෙන්ට ඇවිල්ලා ඉන්නෙ වෙන කාටවත් හදන්න නෙමෙයි අතිගරු අපේ හිටපු ජනාධිපතිතුමා පළමුවත් මව්බිම, දෙවනුවත් මව්බිම කියන ආදර්ශයේ ඉඳගෙන කොට්ඨාශය තුළ ජනතාවගේ වැඩ ටික කරන්න තමයි අපි ඇවිල්ලා ඉන්නෙ. .. මෙතනින් එහා වෙන කාත් එක්කවත් අපේ ගිවිසුමක් නෑ. ඒ මිනිස්සුන්ගෙ ප්‍රශ්න ටික මෙතෙන්ට ගෙනල්ලා ඒවට අවශ්‍ය සහයෝගය ලබාදීලා විශේෂයෙන් ලේකම්තුමා එක්ක හොඳ ක්‍රමයක් අනුගමනය වෙනවා ඒක කියන්න ඕනෙ. අපිට කියලා තියෙනවා ඒ ක්‍රමය හොඳයි. අලුත් තාක්ෂණය යොදාගෙන අලුත් වැඩ පිළිවෙලක් එක්ක දැන් ඒක වැඩිදියුණු කරගෙන ඉතා ඉක්මණින් මිනිසුන්ට සේවය සලසන්න ඕනෙ ඒත් එක්කම මම හිතුවා අපි මන්ත්‍රීවරු විදියට මිනිසුන්ට මොනවහරි දෙයක් කරන්න ඕනෙ කියන එක. සමහරක් වෙලාවට සමහරක් සැලසුම් මං අතින් ඇවිල්ල ලබාදෙනවා සමහරක් ව්‍යාපෘතීන් අනුමැතිය ලබාදෙනවා. ඒවා ගමට ඇවිල්ලා සංවර්ධනය පටන් ගන්නකොට තමයි අපි දන්නෙ. මෙතන . මොකක්ද හදන්නෙ කරන්නෙ කියලා. එවිට ජනතා විරෝධයට අපිට පිටුපාන්න බෑ. අපිට එකතුවෙන්න වෙන්නෙ ඒ ජනතා විරෝධයක් එක්ක. අපිට එදාට තමුන්නාන්සේලාට විරුද්ධ පැත්තෙන් ඉන්න වෙනවා ඒක හින්දා යම් අනුමැතියක් දෙනවා නම් ඒක කොට්ඨාශයේ මන්ත්‍රීවරයා දැනුවත් කරන්න. මේ මන්ත්‍රීවරු 26 ම හරිම වැදගත්. ජනතාවට වගකියන්න ඕනෙ. ඒ හින්දා ඒ 26 දෙනා මූලික කරගන්න සංවර්ධනය ගම්වලට යවන්න ඕනෙ කියන එක මම විශේෂයෙන් මතක් කරලා සිටිනවා. ඒත් එක්කම මං හිතනවා ප්‍රාදේශීය සභාවේ ආදායම් ගැන කතා කළා මං හිතන්නෙ අපි මන්ත්‍රීවරු විදියට ඊළඟ සභාවාරෙදි අපි බලමු ආදායම් වැඩිකරගන්න මොනවද අපි කරන්න ඕනෙ.. අපේ තියෙනවා පාදුක්කෙ ඉඳල ගත්තම අපේ පොල මං හිතන්නෙ දවස් දෙකයි වැඩ කෙරෙන්නෙ ඉතින් අනිත් දවස්වලට අපිට මොකක්හරි ආදායමක් උපයන්න පුළුවන් සම්පත් මොනවද ප්‍රාදේශීය සභාව ඇතුලෙ තියෙන්නෙ අපිට ආදායම් උපයගන්නෙ කොහොමද කියන එක අපිට හොයාගන්න පුළුවන් උනොත් මිනිස්සුන්ට ඒවා අපිට වියදම් කරන්න පුළුවන් ඒ හින්දා ඒ යෝජනාවත් මං කරනවා. විශේෂයෙන් මතක් කරන්නට ඕනෙ මගේ මැතිවරණය පටන් ගන්නකොට මගේ මුල්ම දැන්වීම් පත්‍රිකාවේ ගියේ අපේ නායකතුමා අපේ පොහොට්ටුවේ නායකතුමා හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉතින් එතුමා මූලික කරගෙන මගේ රූපය දාලා නෙමෙයි මගේ මේ මැතිවරණ ප්‍රචාරක කටයුතු ආරම්භ කළේ. එදා විපක්ෂයේ අය කියපු දෙයක් තමයි මගේ කොට්ඨාශයෙන් තරඟ කරන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමා කියන එක. ඒ තුළ තමයි අපේ ජනතාව මහින්ද රාජපක්ෂ මැතිතුමත් එක්ක තමයි මේ ජනතාව නැගිට්ටෙ. ඒ හින්දා මම දන්නෙ නෑ අනික් පක්ෂවල ඒ රූප අරගෙන ගියෙ නැති උනාට අපිට අපේ නායකයාගේ රූපයත් එක්ක තමයි. අපිට ඒක තුළ ජනතා ප්‍රසාදය තිබුණා. ඒක අපි ගෞරවයෙන් මතක් කරන්න ඕනෙ. ඒත් එක්කම මම නියෝජනය කරන දේශපාලන පක්ෂයේ නායක

ඒකාබද්ධ විපක්ෂයේ නායකතුමන් ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මතක් කරනවා මේ අවස්ථාවේදි. ඒ වගේම අපේ හිටපු ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන් ගීතාංජන ගුණවර්ධන මැතිතුමන් මේ අපේ ආසනයේ සංවිධායකතුමා ඒත් එක්කම පළාත් සභා මන්ත්‍රීතුමා ගරු මහේෂ් අල්මේදා මැතිතුමා ඒත් එක්කම අපේ හිටපු සභාපතිතුමා ගරු නිතිඥ. රවීන්ද්‍ර ජයසිංහ මැතිතුමා ඒත් එක්කම අපේ ගරු සභාපතිතුමා ඒත් එක්කම මගේ වේරගල, මාහිංගල, අංගමුව මේ සියලු ජනතාවත් එක්ක ඒ සංඝයා වහන්සේලා සියලු දෙනාවම මම මේ වෙලාවෙ මතක් කරන්න අවස්ථාවක් කරගන්නවා. වැඩිදුර කතා කරන්නෙ නෑ බොහොම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. නිමල් යසසිරි කළුපහන මැතිතුමා</u>

සියලු දෙනාටම ලැබුවාවූ නව වසර සුබ අලුත් අවුරුද්දක් වේවායි මුලින්ම මම ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම අභිනවයෙන් පත්වෙච්ච අපේ ගරු සභාපතිතුමාගෙන්ද උප සභාපතිතුමා ඇතුළු සීතාවක ප්‍රාදේශීය සභාවට තේරී පත්වූ ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා සහ සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලුදෙනාම ඒ වගේම මේ අවස්ථාවට සම්බන්ධවෙලා ඉන්න සියලුම අමුත්තන්ගෙන් මම අවසර ගන්නවා. අරුක්වත්ත කොට්ඨාශයෙනුයි මම තරඟ කළේ. මොකද මම ඇත්තටම දේශපාලන මන්ත්‍රීවරයෙක් විධියට මේ සභාවට එන්න හිටපු කෙනෙක් නෙමෙයි. ගරු සභාපතිතුමාත් ඒක දන්නවා. මොකද අපි ප්‍රදේශයට ඉතා හොඳ නායකයෙක් පත් කරලා මේකට අරන් යමු කියලා අපි අතරේ යෝජනාවක් තිබුනා. මොකද අපි වැඩ කටයුතු කරන්නෙ මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අවුරුදු 25 ක් පමණ සමාජ මෙහෙවරක් කරපු පුද්ගලයෙක් හැටියට අපි කමිටුවක් පත්කරලා තිබුනා මෙවර මැතිවරණයට අපේ එතකොට ගාමිණී පෙරේරා මැතිතුමා තමයි අරුක්වත්තෙන් එන්නෙ. මේ ඡන්ද ක්‍රමය යටතේ කෘෂිකර්ම නිලධාරීතුමන්ලාට ඒ අවස්ථාව ගිලිහී ගියා. මමවත් මගේ පවුලෙ අයවත් මගේ බිරිඳවත් ඇත්තටම කැමති නෑ. ඒකට හේතුව තමයි මගේ බිරිඳගේ තාත්තා යසවර්ධන මැතිතුමා මේ සභාවේ මන්ත්‍රී කෙනෙක් විදියට කටයුතු කළා. ඒ අත්දැකීම අපේ බිරිඳට තියෙනවා. මන්ත්‍රී කෙනෙක් උනහම ගෙදරට ඇතිවන තත්වය නිදහස, ආර්ථික තත්වය හීන වෙනවා. ඇමතිකමට වැඩිය වියදම් අපිට යනවා. අපි ඒවා කරගෙන යනවා සමහර අවස්ථා වලදී සම්බන්ධතා ගිලිහී යනවා. සමාජමය කටයුතු වලදී එහෙම වෙන්නෙ නෑ. අපිට අවශ්‍ය ප්‍රමාණය අපි කාල වෙලාව වෙන්කර ගන්නවා. මගේ සමාජ මෙහෙවරේදී මං ලොකු ලොකු ඇමතිවරු පස්සෙ ගියේ නෑ. මගේ මුලින්ම හිටියා සුමිත් විජයමුණි සොයිසා මැතිතුමා. එතුමා තමයි මගෙ නායකයා වෙලා හිටියෙ. එතුමගේ නැවේ පොඩි හිලක් තිබුනා. ඒක හින්දා අපි පොඩ්ඩක් ඒකෙන් බැහැලා අයින් උනා. අයින් උනාට පස්සෙ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා හැරුනට පස්සෙ අපිත් බැස්සා බෝට්ටුවෙන් බැහැලා අයින් වුණා. සීතාවක ජන පවුර හදාගෙන අපි ගෙයක් හදන්න පටන් ගත්තා. ඒ ගෙයි අපි සාමාජිකයෝ වෙලා ඒ සාමාජිකයන්ට ඒ නිවස්නයක් හදලා දුන්නා. අපේ ප්‍රදේශයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පක්ෂයක් හැටියට අද ඒ සියලුදෙනාම මාත් එක්ක එකතුවෙලා ඉන්නවා. වාමාංශික ප්‍රදේශයක් තමයි අරුක්වත්ත ප්‍රදේශය. කොල්වින් මහත්තයා කියන්නෙත් එක්සත් ජාතික පක්ෂ ප්‍රබලයෙක්. එතුමාත් මමත් ඡන්දෙ ඉල්ලනවා මොකද ජනතාව ඇවිල්ලා මට කිව්වා අනිවාර්යයෙන්ම ඔයා මේ පාර ප්‍රාදේශීය සභාවට ඉල්ලන්න ඕනෙ. ඔබතුමාව තමයි පත්කරන්නෙ කිසිම කෙනෙක් ඉල්ලන්නේ නෑ චම්පික ඇමතිතුමත් මට ඇවිල්ලා කිව්වා. ඊට පස්සෙ මෙතුමා මාව ගාමිණී ලොකුගේ ඇමතිතුමා ළඟට ගෙනිල්ලා ලබා දුන්නා ඡන්දෙ ඉල්ලන්න. මම කොල්වින් මහත්තයාගෙන් ඇහුවා කොලින් මහත්තයා අපි දෙන්නා සහෝදරයො දෙන්නා වගේ ඉන්නෙ මම දිනුවොත් මම මේක කරගෙන යනවා ඔයා දිනුවොත් ඔයා කරගෙන යන්න කියලා. එතුමාත් ඒක පිළිගත්තා. අපි බොහෝම සහෝදරත්වයෙන් තමයි අරුක්වත්ත ඡන්ද ව්‍යාපාරය අරගෙන ගියෙ. අපිට එක වේදිකාවට නගින්න තිබ්බා ඕනෙනම්. කොහොම හරි

මම ඡන්ද 702 ක වැඩි ඡන්දෙන් තේරි පත්වෙලා ආවා. අපි දැනගෙන හිටියා මේ පක්ෂවල ක්‍රියාකාරීත්වය අපිට ලැබෙන බව. . ජයන්ත රණවක මහත්තයාටත් අපි අභියෝග කළා මතක ඇති. ජයන්ත රණවක මහත්තයාටත් මේ ඡන්ද ප්‍රතිඵලය ගැන. මැතිතුමාත් ඒක පිළිගන්නවා. ඉතින් එවැනි තත්වයක් උඩ ඔබතුමා පිළිගන්න ඕනෙ අරුක්වත්ත ප්‍රදේශයේ ලොකුම දේ තමයි ගං වතුර. ඒ නිසා පවුල් 117 ක් අවතැන් වෙනවා. අපේ අතින් අපි එකතු කරලා . ඒ අයට උදව් කරනවා. ඒ වගේ අපි කටයුතු කළා. හාමුදුරුවො ඇවිල්ලා අපිට උදව් උපකාර කරනවා. මම ප්‍රාදේශීය සභාවට තේරීපත්වුනේ ඒ ජනතාවගේ සේවය කරන්න කියලා මම තමුන්නාන්සේට මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා ඒ වගේම වවුල් කැලේ ප්‍රදේශය ගත්තොත් වවුල් කැලේ ප්‍රදේශය කියන්නෙ බීමට ජලය පවා නොමැති කාලවකවානු වලදී ලේකම්තුමා තමයි අපට ජලය ලබා දීමට කටයුතු කළේ ඔවුන්ට වතුර ටිකක් හරි බොන්න. එතකොට මම හිතන්නෙ අපි 23 දෙනෙක් ඉන්නවා. මන්ත්‍රීවරුන් විපක්ෂයෙත් ඉන්නවා 22 ක් අපි 23 දෙනාමත් අපේ ගරු සභාපතිතුමන්ට ඒ ශක්තිය ධෛර්යය ලබාදෙනවා. අපි උඩින් එකක් යටින් ආයෙත් නූල් සූස්තර වැඩ කරන අය නෙවෙයි. අපි අවංකව ගම් ප්‍රදේශවල ජීවත්වෙලා මිනිස්සුන්ට උදව් උපකාර කරන්නෙ. ඒ ශක්තිය ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමාලා කාර්ය මණ්ඩලයේ ඔබතුමාලා දෙනවා ඔබතුමාලව රකින්න ඕනෑම අවස්ථාවක කැපවෙනවා කියන එක මම මේ අවස්ථාවේදී පොරොන්දු වෙනවා. මමත් අර මහත්තයෙක් කිව්වා වගේ කිට් එක වෙනස් කළාම මහත්තයෙක් හැබැයි මම වැඩ ටික හරියට කරගෙන යන්න ඕනෙ. මොකද මට ලොකු වේතනයක් හම්බවෙන්නෙ නැනෙ. මම ඒක ජනතාවට කියලා තියෙනවා අපි කමිටු පත්කරනවා. කමිටු වලින් තමයි මේ ප්‍රශ්න විසඳගන්නෙ. එම නිසා තමුන්නාන්සේලා දැනුවත්ව අපිත් මේක හොයලා බලනවා අපි එතකොට සාකච්ඡා මාර්ගයෙන් හැමදේම විසඳගමු. එතෙක් කවුරු පිනුම් ගැහුවත් අපිත් පිනුම් ගහනවා කියලා තමුන්නාන්සේලාට මතක් කරන්න කැමතියි. එම නිසා මට මේ අවස්ථාව ලබා දුන්නු අපේ ගාමිණී ලොකුගේ ඇමතිතුමා ඇතුළු ප්‍රදේශයේ අපේ ජනතාව මගේ බිරිඳ ඇතුළු සියලු සහෝදරයින් සියලු දෙනාටත් ඒ වගේම මගේ ඇත්තටම මම අවංකව දේශපාලන වශයෙන් ගෞරවය කරන හිටපු ප්‍රාදේශීය සභා සභාපති ගරු නිතිඥ රවින්ද්‍ර ජයසිංහ මැතිතුමාත් ඒ වගේම ප්‍රාදේශීය සභා හිටපු සභාපති හා පළාත් සභා මන්ත්‍රී මහේෂ් අල්මේදා මැතිතුමාත් ඒ වගේම මතක් කරන්න ඕන මගේ ගම්වලට ලක්ෂ අනුවක වියදමින් ඔබතුමා වතුර ව්‍යාපෘතියක් ලබාදුන්නා. පාරවල් වලට අපිට සැහෙන සහයෝගයක් ලබාදුන්නා අපි සැහෙන වැඩ කොටසක් කළා ගමට. එමනිසා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා අපේ දෙවන පෙල නායකයෙක් ඉන්නවා එතුමාත් සියලුදෙනාත් එක්කම එකතුවෙලා ඔබතුමාට ශක්තිය ධෛර්යය ලබා දෙනවා. එම නිසා අපේ තේරී පත්වූ සියලුම මන්ත්‍රීවරුන්ට මම නිතැතින්ම හැමදාම ගෞරව කරනවා. මොකද අපි මෙතන පෞද්ගලික දේවල් වලට නෙමෙයි ඇනකොටා ගන්නෙ. එමනිසා බොහෝ දෙනා අනුන්ගේ පෞද්ගලිකත්වයට හානි නොකර ඒ කටයුත්ත ඉදිරියට කරගෙන යාමට තමුන්නාන්සේලාට ශක්තිය ධෛර්යය ලැබේවා කියා කියමින් හැමදාම ඔබතුමාට ගරු කරනවා තමුන්නාන්සේට සුබ අනාගතයක් වේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහෝම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, උප සභාපතිතුමා, මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි. අද මේ සභාවට එන්න අවස්ථාව ලබා දුන්නේ අපේ පක්ෂයේ නායක අපේ පක්ෂයේ අනුශාසක අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ විශේෂ මැදිහත් වීම තුළ තමයි මට මේ අපේක්ෂකත්වය සභාවට එන්න මඟ පෑදුනේ. ඒකට විශේෂයෙන්ම උදවු උපකාර කළා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අවිස්සාවේල්ල සංවිධායක. හිටපු සභාපති රවීන්ද්‍ර ජයසිංහ මැතිතුමා ඒ වගේම අපේ පළාත් සභා ගරු මහේෂ් අල්මේදා මැතිතුමා

අපට මේ සඳහා විශාල සහයෝගයක් ලබාදුන්නා. තමුන්නාසේලා දන්නවා මේ අපේක්ෂකත්වය ලබාගැනීම මේ ඡන්දයට ඉදිරිපත්වෙලා ජයග්‍රහණය ලබාගන්නට වඩා අමාරු කාරණාවක්. ඒ නිසා මට විරුද්ධව නොයෙකුත් විදියට කටයුතු කරමින් නොයෙකුත් අපහාසාත්මක පුවත් පල කරමින් චෝදනා කරමින් ඒ අපේක්ෂත්වය ලබාගැනීම නවත්වන්න කටයුතු කරපු කීපදෙනෙක් හිටියා. ඒ සියල්ලම ජයග්‍රහණය කරලා මට පුළුවන් උනා මේ සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට අද මේ සභාවට ඇවිල්ලා මගේ ප්‍රදේශයේ ජනතාවගේ අපේක්ෂාවන් ඉටු කරන්න මේ සභාව ප්‍රයෝජනයට ගන්න. ගරු සභාපතිතුමනි, මා නියෝජනය කරන කොට්ඨාශය ගලගෙදර අංක 24 ඒ කොට්ඨාශයේ ග්‍රාම සේවා වසම් තුනයි. ඡන්ද දායකයෝ 7569 ක්. ඒ වගේම සුවිශේෂයි මුස්ලිම් ජනතාව. ඒ වගේ වාතාවරණයක් යටතේ ඉතාම ප්‍රබල සටනක් මට කරන්න සිද්ධ උනා විශේෂයෙන්ම මං හිතන්නෙ මට අභියෝගයක් උනා එක්සත් ජාතික පක්ෂයට වඩා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයා කියන එක මතක් කරන්න ඕන. එතුමාගේ පියාගේ ගරුත්වය ප්‍රදේශයේ ජනතාව එතුමා ගැන විශාල පැහැදීමකින් හිටපු ජනතාවක් හිටියා. ඔමේ අවස්ථාවේදී මතක් කරනවා. මට 1997 මේ මැතිවරණයේදී මේ සභාව නියෝජනය කරන්නට අවස්ථාව ලැබුණා. මං ඒ වෙනකොට අපේ මුළු බල ප්‍රදේශයම ආවරණය වන වෙන විදියට අපේ මැතිවරණ කටයුතු කරමින් අපේ මැතිවරණ ලැයිස්තුවේ තුන්වෙනි ස්ථානය ලබා ගෙන සභාව නියෝජනය කරන්න පුළුවන් වුණා. 1999 ජූලි මස මහේෂ් අල්මේදා මැතිතුමා ප්‍රාදේශීය සභා සභාපතීත්වයෙන් ඉවත්වෙලා පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට දිවුරුම් දෙනකොට මට පුළුවන් උනා එතුමාගේ ඒ හිස්වූ සභාපති ධුරය අපේ පක්ෂයට ලබාගන්න. හුහක් දුර ඒ මාතෘකාව ගැන කතා කරන්නේ නැහැ. නමුත් මගේ මැතිවරණ ව්‍යාපාරය ගැන මා සඳහන් කරන්න ඕනෙ. මට පුළුවන් උනා ඒ කාලය තුළ සුවිශේෂි කාර්යයන් මේ ප්‍රදේශය වෙනුවෙන් කරන්න. තමුන්නාන්සේලා දන්නවා හංවැල්ල මාකට් ගොඩනැගිලි සංකීර්ණය මගේ පාලන කාලයේදී ගොඩනැගුනා. මං හිතන්නෙ කඩ 70 ක් විතර තියෙනවා. විශාල ආදායමක් ලබනවා. ඒ එක්කම මං සන්තෝසයෙන් කියන්න ඕනෙ පාදුක්ක නගර සංවර්ධනය වෙනුවෙන් එදා ඉන්දික ගුණවර්ධන ඇමතිතුමා නාගරික සංවර්ධන කටයුතු වශයෙන් කටයුතු කළා. එහිදි පාදුක්ක නගරයේ සංවර්ධනය දකින්නට. ඒ නිසා අපිට පුලුවන් වුනා. 1997 දී සභාවට පත් වුණු අපේ ඒ මන්ත්‍රීවරුන්ගෙන් අද මේ ස්ථානයේ ඉන්නේ අපේ ජයන්ත රණවක ගරු මන්ත්‍රීතුමා හා මෙතුමියත් හිටියා. තමුන්නාසේලා තුළ යම් අවබෝධයක් තියෙන්න ඇති. එදා මේ සභාවේ රැස්වුන විදියට අපේ තිබුණ ඉඩකඩ පිළිබඳ එතුමා කතාකළා. මට මතක් වෙනවා පසුගිය කාලෙ මේ සභාවේ යම් කිසි සිද්ධියක් වුණා. ඒ සිද්ධිය එදා වුණා නම් අපේ සභාවේ අපි රැස්වෙච්ච විදියට. ඔබතුමා හිටියනම් ඒ තරම් ලඟින් ලඟින් ඉඳගෙන තමයි අපේ සභාව රැස්වුනේ. අපහසු තත්වයේ තමයි අපි එදා ඒ රැස්වීම පැවැත්තුවේ. මම සන්තෝස වෙනවා මේ සුවපහසු ස්ථානයක්ලබාදෙන්නට ඒ හිටපු අපේ සභාපතිවරයෙක් වෙන රවීන්ද්‍ර ජයසිංහ මැතිතුමාට පුළුවන් උනා මේ වගේ ස්ථානයක් අපිට ලබාදෙන්න. අපි මේ වෙලාවෙ සිහිපත් කරන්න ඕන. මිත්‍රවරුනි ගරු මන්ත්‍රීවරුනි අපි මේ මැතිවරණයට ඉදිරිපත් උනාම මේ මැතිවරණයේදී අපි ඡන්ද ගත්තා. අපි කතාකරපු දේවලුත් තිබුනා අපි ජනතාවට කියපු දේවල් ජනතාවගේ හඬින් අපිට තේරුනා. ඒ නිසා ජනතාවගේ හදවත් අපි තේරුම් අරගෙන තිබුණ නිසා ඒ ජනතාවගේ හදවත් තුළ සිටි අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා. ගරු සභාපතිතුමනි, මම හුහක් ලොකු දේවල් කිව්වෙ නෑ. සුළු කාරණා ඉදිරිපත් කළේ. මව්පියෝ සුරකිමු. දේශීය ආර්ථිකයක් ගොඩනගමු. මේ ඔබේ අවස්ථාවයි. රට වෙනුවෙන් යුතුකම් ඉටුකරමු. මේ මාගේ ගෞරවනීය ඉල්ලීම. පොහොට්ටුව දිනවමු. මහින්ද රාජපක්ෂ යුගයක් නැවතත් බිහිකරමු. ඒක අරගෙන තමයි අපි ජනතාව අතරට ගියේ. මම කියන්නෙ නැහැ පාරවල් හදන එක අපි නොකළ යුතුයි කියලා. අපි ඒක කරන්නට ඕනෙ. ඒ වගේම මගේ ඡන්ද ව්‍යාපාරයේදී මම ප්‍රකාශ කළා මං පැහැදිලිවම කිව්වා මෙම මැතිවරණ බල ප්‍රදේශයේ සංවර්ධනය මෙන්ම ගරුතර මහා සංඝරත්නයේ හා ආගමික නායකතුමන්ලාගේ සහ දේශප්‍රේමී ජනතාවගේ විරෝධය එල්ල වී ඇති රට නව යන මාවතකට යොමු කරමු. ඉදිරිපත් කර ඇති නව ව්‍යවස්ථා

යෝජනාවට විරෝධය ප්‍රකාශ කර අවුරුදු 30 ක් පුරා ඒකීයභාවයක් වෙනුවෙන් අපේ ජීවිත ආරක්ෂා කර ගැනීම සඳහා සටන් කරමු. ඒ සඳහා නායකත්වය දුන් නායකයන්ට එරෙහිව ගන්නා ක්‍රියාමාර්ගයන්ට විරෝධය පල කර රටේ අනාගත පුරවැසියන් වෙනුවෙන් රටේ ජාතික සම්පත් විනාශ කිරීමට ගන්නා පියවරයන්ට විරෝධය ප්‍රකාශ කරන ජනමත විචාරණයක් පවත්වා ඔබේ ඡන්දය පොදුජන පෙරමුණට ප්‍රකාශ කරන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ජනතාව ඒකටයි ඡන්දය දුන්නෙ. ගරු මන්ත්‍රීවරු. ගරු සභාපතිතුමනි ඒ නිසා මම මගේ ධූරයේ ඉතිරි කාලයත් මම බලාපොරොත්තු වෙන්නේ ජනතාව සේවය කරන්න. ඒ නිසා මම තව දීර්ඝ කාලයක් මේ විදියට මැතිවරණයට ඉදිරිපත් වෙලා කටයුතු කරන්න මට අවස්ථාවක් ලැබෙයි කියලා මම විශ්වාස කරන්නෑ. නමුත් මගේ ජීවිතයේ ඉතිරි කාලය මේ කියාපු මේ මං ජීවිතය වෙනුවෙන් මගේ ප්‍රදේශයට. ඒ එක්කම මම මේ අවස්ථාවේ විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෙ මම මහජන ඡන්දයෙන් ගලගෙදර කොට්ඨාශය නියෝජනය කරන්න පත්වෙලත් පවතින මැතිවරණ ක්‍රමය තුළ අපි පිළිගත්තත් නොගත්තත් අපේ කොට්ඨාශයට තරඟ කරපු යසරු මන්ත්‍රීතුමා අපේ කොට්ඨාශයටත් මන්ත්‍රීවරයෙක් හැටියට පත්වෙලා ආවා. මම එතුමාගේ පියා සමඟ 1997 මේ සභාවට තේරී පත්වුනා. එතුමා ඉතා විශාල වශයෙන් මට සහයෝගය දුන්නා. ඒ සහයෝගය අති විශාලයි. ඒ නිසා එතුමාගේ ප්‍රකාශයත් සමඟ එතුමා ඉදිරියේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණත් එක්ක එකතුවෙලා. අපි කියපු විදියට මේ රට වෙනුවෙන් වැඩ කරන්නට රටේ යහපත වෙනුවෙන් අපිත් එක්ක එකතුවෙලා වැඩකරන්න තමුන්නාසේට අවස්ථාව ලැබෙනවා කියන එක විශ්වාසයි. ඒ නිසා තමුන්නාන්සේට ජනතාවගේ කැමැත්ත පක්ෂවලින් නෙමෙයි ජනතාවගේ කැමැත්තෙන් පත්වෙන මන්ත්‍රීවරයෙක් හැටියට. තමුන්නාන්සේලාට ඉදිරියේදී අවස්ථාවක් තියෙනවා. අපිත් එක්ක එකතුවෙලා වැඩ කරන්න කියන කාරණාව මතක් කරන්න කැමතියි. මිත්‍රවරුනි, ගරු මන්ත්‍රීවරුනි මම දිගටම කතා කරන්නට බලාපොරොත්තු වෙන්නෙ නෑ. විශේෂයෙන් කියන්නට ඕනෙ මගෙ මැතිවරණ ව්‍යාපාරය සඳහා මම කලින් කිව්වා වගේ විශාල බාධාවට ලක්වෙච්ච ව්‍යාපාරයක්. මට ඒ මැතිවරණ ව්‍යාපාරයේදී ශක්තිය දෙන්නට රවීන්ද්‍ර ජයසිංහ මැතිතුමා, මහේෂ් අල්මේදා මැතිතුමා ඒ වගේම ඇතුළු සහයෝගය ලබා දුන් සියළුදෙනා මතක් කරන්න ඕන. මගේ ඒ ඡන්ද ව්‍යාපාරය තුළින් උදය ගම්මන්පිල හෙළ උරුමයේ නායකතුමන්, බැසිල් රාජපක්ෂ මැතිතුමා, ගිතාංජන ගුණවර්ධන මැතිතුමා, ඇතුළු සියළු දෙනාට මම මගේ ස්තුතිය පුද කර සිටිනවා. ගරු සභාපතිතුමනි, මට දර්ශනයක් තියෙනවා. මම ගලගෙදර කොට්ඨාශය සංවර්ධනය කිරීමේ වැඩපිළිවෙලක් මම සකස් කරනවා. මම ඒක ඉදිරියේදී ප්‍රකාශ කරනවා. ඒ වැඩ කොටස කරන්නට තමුන්නාන්සේලාට සීතාවක ප්‍රාදේශීය සභාවේ පමණක් පුළුවන්කමක් ලැබෙන්න නැහැ. ඒක අපේ පළාත් සභාවේ සහාය අවශ්‍ය වෙනවා. ජයන්ත රණවක මැතිතුමා සඳහන් කළා පොල් ලෙලි කතාවත්, පොල්ලෙලි කතාවත් සමඟ ඒ කතාව කරපු මන්ත්‍රීතුමාට අපේ විරෝධය ප්‍රකාශ කරන්න මේ සභාව සූදානම්. මම මෙහෙම කියනකොට කතාවක් ගැන මතක් කරන්න ඕනෙ. අපේ ඡන්දයෙන් දිනලා විශාල ඡන්ද සංඛ්‍යාවක් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ අරගෙන කටයුතු කරනකොට එක් ඇමතිවරයෙක් ප්‍රකාශ කළා කිව්ව කතාවක් අවුරුද්දකකාලයක් කිසිම දීමනාවක් නැතුව මේ මන්ත්‍රීවරු වැඩ කරන්න කටයුතු කරන්න ඕනෙ කියල. ලැජ්ජ නැතිකම සියලු වරප්‍රසාද භුක්ති විඳිමින් අපිට තියෙන මේ සොච්චම් වරප්‍රසාද අහිමි කරන්න එතුමන්ලා ඒ විදියට කථා කරනවා. ඒ එක්කම මට තවත් කතාවක් මතක් වෙනවා සමහර තැන්වලදී එක මාධ්‍යවේදියෙක් අහනවා මේ සභා වලට ඉඩ ප්‍රශ්නයක් තියෙනවද කියලා. ඊට පස්සෙ තවත් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මහ ලේකම්තුමා තවත් ප්‍රකාශයක් කරනවා. බරපතල ප්‍රකාශ ගරු සභාපතිතුමනි, එතුමා කියනවා ප්‍රාදේශීය සභා වලට පාරවල් හදන්න අපි ආණ්ඩුවෙන් සල්ලි දෙන්නෙ නෑ කියලා. එතුමාගේ පොල් වත්තෙන් නම් එතුමාගේ අර බෝට්ටු වලින් හම්බවෙන සල්ලි වලින් දෙනවා නම් ඒ ගැන ප්‍රශ්නයක් නෑ. නමුත් මේ රජයේ බදු මුදල් ප්‍රදේශයේ ජනතාවට සේවය කරන්න නොදෙනවා කියන කාරණාව ඉතාමත් ලැජ්ජා සහගතයි. මන්ත්‍රීවරයෙක් ඇමතිවරයෙක් මගේ කොට්ඨාශය තුළ මම ජයන්ත රණවක මන්ත්‍රීතුමාට

යෝජනා කරනවා. ඒ ප්‍රකාශ වෙනුවෙන් මේ සභාවට යෝජනාවක් ගේන්න අපේ විරෝධය ප්‍රකාශ කරන්න කටයුතු කරනවා කියලා. ඒනිසා ඒ ප්‍රකාශයත් කරමින් මගේ මම මේ වගේ දිග වෙලාවක් ගැනීම පිළිබඳ කණගාටුවත් පල කරනවා. මේ අවස්ථාව දීම පිළිබඳව ස්තුතිය ප්‍රකාශ කරනවා. සියලුදෙනාටම ලැබුවාවූ නව වසර බලාපොරොත්තු ඉෂ්ට වෙන සුබ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා සියලු දෙනාට තෙරුවන් සරණ පතනවා.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු මන්ත්‍රීතුමනි. අපි තේ එකක් සූදානම් කරලා තියෙනවා මේ සභාව තවත් කල් තියලා ගත්තොත් වෙලාව ගතවෙනවා. මන්ත්‍රීවරු 15 දෙනෙක්වත් මේ සභාවේ නතර වෙන විදියට ගිහිල්ලා එන්න කියලා ආරාධනා කරනවා.
.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඔල්ගා අතුකෝරළ මැතිතුමිය</u>

ගරු සභාපතිතුමනි, උප සභාපතිතුමනි, සහෝදර මන්ත්‍රීවරුනි, මන්ත්‍රීතුමියනි, ලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්ම මහත්මීනි, ජනමාධ්‍ය මහත්තුරුනි, සියලුදෙනාගෙන් අවසරයි. මම හිතන්නේ මම නියෝජනය කරන හයවෙනි ප්‍රාදේශීය සභාව මේ. 1991 සභාව නියෝජනය කරමින් එක් සභාවක් විතරයි අපිට අහිමි උනේ. ඒ නියෝජනය තුළ අපි අද මම හිතන්නෙ මම කණගාටුවෙන් කියනවා මම මෙම අවස්ථාවට ආවේ මන්ත්‍රීවරියක් හැටියට අපේ ජයග්‍රහණය තුළ නොවේ මේ පවතින මැතිවරණ ක්‍රමය තුළ ඒක මම ප්‍රකාශ කරන්නේ ඇත්තටම මගේ කැමැත්තක් තිබුණේ නෑ මේ මන්ත්‍රී ධූරය භාරගන්න. පක්ෂය තුළ එක් කාන්තාවක් මේ සභාවට ආවනම් ඒ ඔල්ගා අතුකෝරළ කියන එක පක්ෂයෙන් කියලා තිබුණා. ඒ නිසා මම මන්ත්‍රීවරයෙක් හැටියට ඉදිරිපත් උනා. මේ ඉදිරිපත්වීම මේ සියලු කටයුතු වෙනුවෙන් මම ප්‍රථමයෙන්ම මා අදහන ආගම අනුව දෙවියන් වහන්සේටත් දෙවි මව්න්ටත් ස්තුති කරනවා. ඒ වගේම මගේ මව්, මගේ ස්වාමිපුරුෂයා ප්‍රමුඛ මගේ දරුවෝ මගේ පුතාලා තුන්දෙනා මගේ මේ සටනේදී ගොඩක් උදව් වුණා. ඒ වගේම දිද්දෙණිය නිරිපොල , ඉහල හංවැල්ල දකුණ යන ප්‍රදේශ තුළ මට උදවු කරපු ප්‍රමුඛත්වය අරන් උදවු කරපු සියලුම සහෝදර සහෝදරියන්ට මම ස්තුති කරනවා. මේ කටයුත්තෙදි මට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරියක් හැටියට එන්න මැතිවරණ ව්‍යාපාරය තුළ මට කරපු උදව් උපකාර පිළිබඳව. ඒ වගේම මම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරියක් හැටියට 91 ඉඳන් මේ දක්වා මේ සභාව නියෝජනය කරලා සභාපතිවරු ගණනාවක් එක්ක මේ සභාවේ වැඩ කටයුතු කළා. ඒ හැම වැඩකටයුත්තකදිම මම .... කටයුත්තක් කරනකොටම එක්සත් ජාතික පක්ෂය පක්ෂයක් හැටියට මම ආරක්ෂා කරමින් හැමදාම පක්ෂය වෙනුවෙන් ඉදිරිපත් වුනා. මට ඇහුනා අපේ මන්ත්‍රීවරයෙක් කියනවා වන්දි භට්ටයෝ වෙලා ඉන්නවා කියලා. ඇත්තටම ගරු මන්ත්‍රීතුමනි ඔබතුමාට කියන්න ඕනෙ අපි පක්ෂයක වන්දි භට්ටයෙක් වෙනවා කියන්නෙ ඒක නුසුදුසුකමක් නෙමෙයි ඒක නුගත්කමක් නෙමෙයි. ඒක තමා අපි වියයුත්තේ මේ පක්ෂය තුළ වන්දි භට්ටයෙක් හැටියට කටයුතු කිරීම තමයි අපි අනිවාර්යයෙන් කළ යුත්තේ. පක්ෂය ආරක්ෂා කරගෙන පක්ෂය වෙනුවෙන් හඬක් නගලා ජනතා සේවයක් කරන්න තමයි අපි මේ අවස්ථාවට ඉදිරිපත් උනේ. ඒ වගේම ගරු සභාවල් තුළ අපි අවුරුදු 20 ක් විපක්ෂය නියෝජනය කළා.

අවුරුදු 20 ක් අපි සභාවේ විපක්ෂයෙ ඉඳලා මේ සභාව තුළ තමයි අපි අද ආණ්ඩු පක්ෂයත් එක්ක අපි හවුල් උනත් රජයක් එක්ක මේ පක්ෂය ආණ්ඩුව මේ සභාවත් නියෝජනය කරන්නෙ. සමහර මන්ත්‍රීවරු අපිට ප්‍රකාශ කළා ගරු සභාපතිතුමාට අනුකම්පාව ඉල්ලගෙන අපි කතා කරනවා කියලා. නෑ මන්ත්‍රීතුමනි, ගරු සභාපතිතුමනි, අපි අනුකම්පාවක් ඉල්ලන්නෙ නෑ අපි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට මේ සභාවට යම්දෙයක් ගේන්න ඕනෙ නම් ඒ අනුකම්පාව අපි තමුන්නාන්සේලාට ලබාදෙනවා කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෙ. මොකද මැති ඇමතිවරු එක්ක සම්බන්ධකම් තියාගෙන තමුන්නාසේලා පහුගිය කාලවල තමුන්නාන්සේලාගේ ප්‍රදේශ සංවර්ධනය කරන්න කටයුතු කළා. අපිට දීලා නෙමෙයි. අපි සභාව තුළ අපිට ලැබෙන දෙයින් යමක් කළා. එදා තමුන්නාන්සේලා ලක්ෂ 15, 20, 30 වියදම් කරනකොට ඒවායින් කොටසක් අපිට දුන්නෙ නෑ. ඒ තත්වයක් යටතේ අපි සභාව තුළ බොහෝම අහිංසක විදියට අපි කටයුතු කළේ. නමුත් අද මං කියනවා මේ අවස්ථාවේදී තමුන්නාන්සේලාගේ මේ සභාවට යම්කිසි දෙයක් අපිට ගේන්න පුළුවන්නම් ඇමතිවරු ලව්වා මං අපේ අගමැතිතුමා ලව්වා අපිට ගේන්න පුළුවන් හැම සංවර්ධනයක්ම මේ සභාව හරහා ගේන්න අපි ඒ අනුකම්පාව තමුන්නාන්සේලාට ලබාදෙනවා කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ඒ වගේම මං කණගාටු වෙනවා මට මේ මැතිවරණයට ඉදිරිපත් වෙලා මාසයක් පමණ රෝහල්ගතව ඉඳලා මාසෙකට පස්සෙ තමයි මට මැතිවරණයට එන්න පුළුවන් උනේ. මං මාසෙකින් තමයි මගේ මැතිවරණ ව්‍යාපාරය ආරම්භ කළේ. මට වෛද්‍ය උපදෙස් මත මට ඇවිදින්න මහන්සිවෙන්න දේශන පවත්වන්න එපා කියලා තිබුන නිසා මට සිද්ධ උනා මම මාසයක් නිහඬව ඉඳලා මේ මැතිවරණයට ඉදිරිපත් වෙලා. අපි නංගි පෙන්නලා අක්ක දෙන දේශපාලනයකට අපි ආවෙ නෑ. අපි ගියෙ අපිමයි. අපිම ගිහිල්ලා බැණුම් ඇහුවත් මොන දේ කළත් අපි ඉදිරිපත් උනේ. අපේ පිංතූරෙ තමයි අපේ පොටෝ එකට දැම්මෙ. අපි කාගෙවත් පිංතූර දාලා මගේ මහත්තයාගේ පිංතූරෙ දාලා නෙමෙයි මම දේශපාලනයට ආවෙ. අන්න ඒකයි අපේ තියෙන ජයග්‍රහණය. අපි පරද උනත් අපේ ශක්තියෙන් ඉදිරියට ගියෙ අපිමයි. අපිම තමා ගිහිල්ලා අපි කතාකළේ. මේ ඔල්ගාට ඡන්දෙ දෙන්න කියලා තමයි ඉල්ලුවේ. ඒ නිසා මං කණගාටු වෙනවා ඒ කතන්දර අපිට කිව්ව නිසා තමයි අපිට මේ වෙලාවෙ ප්‍රකාශ කරන්න වෙන්නෙ. මේ දේවල් කියන්න බලාපොරොත්තුවෙන් ආවේ නැහැ. නමුත් ඒ කතන්දරය ඒගොල්ලො අපිට ඇඟිල්ල දික්කලා. දික්කරපු නිසා තමයි අපිට කියන්න සිද්ධ උනේ කියන එකත් මම කණගාටුවෙන් ප්‍රකාශ කරනවා. මම මේක කියනවා කියලා හිතේ තියාගෙන ආවෙ නෑ. වේදිකාවෙ කිව්වත් සභාවේ මේක කියන්නෙ නෑ කියලා ආවෙ. නමුත් අද මට ඒ දේ කියන්න සිද්ධ කළා. ඒ වගේම අපේ තව සහෝදර මන්ත්‍රීවරු කිව්වා සමහර ගෙවල්වලට යනකොට බොහෝම දුක්ඛිතයි කියලා. ඇත්ත එහෙම වෙන්න පුළුවන් සියලුම දේවල් තියෙනවා අපි මේ අද වැටිලා ඉන්නෙ අපි හදාගත්ත වලේ තමයි. අපි එදා මැතිවරණය කළත් ජයග්‍රහණය කරලා මාස දෙකක් තුනක් ඇතුළත මේ මැතිවරණයට අපි මුහුණ දුන්නානම් අපි මේ වගේ නෙමෙයි මීට වැඩිය දෙගුණ තෙගුණ කරන්නත් හඬක් නගනවා. අපි අවුරුදු දෙකහමාරක් තුනක් තිස්සෙ එළියෙ ඉඳලා අපෙන් ජනතාව බලාපොරොත්තු වෙච්ච යම්කිසි දෙයක් ඒ දේ අපිට ඉෂ්ට කරගන්න බැරිවෙච්ච මොහොතක තමයි අපි මේ අභියෝගයට මුහුණ දුන්නෙ. අනිත් එක තමයි සෝදා පාලුවක් තිබුනා. අපේ. මන්ත්‍රීතුමා කිව්වා වගේ ඇත්තටම මේ ඡන්දෙ දුන්නෙ පුද්ගලයෙකුට නෙමෙයි. මහින්ද රාජපක්ෂ කියන නමට. එතුමා අගමැති කරවමු කියලා පෝස්ටරේ ගැහුවහම ජනතාව බලාපොරොත්තු උනා මේ රජය තුළ මෛත්‍රීපාල ජනාධිපති වෙනකොට මේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා අගමැති කරන්න. ඒක තමා ඇත්ත කතාව. අපෙන් ගිලිහෙච්ච දේවලුත් එක්ක ජනතාව බලාපොරොත්තු වෙච්ච දේවලුත් එක්ක මේ මැතිවරණය සෝදා පාලුවක් බවට පත්වෙන්න. මෙන්න මේ අපි කපගත්ත වලේ අපිත් වැටුනු නිසයි. මැතිවරණ ක්‍රමයකුත් වෙනස් කළා. අපි පැරණි මැතිවරණ ක්‍රමයේ ගියානම් අපි මේ ආකාරයෙන් වැටෙන්න සිද්ධ වෙන්නෙ නෑ. අලුත් මැතිවරණ අලුත් අත්දැකීම් මේ මැතිවරණයට මුහුණ දෙන්නෙ කොහොමද කියලා අප ඉගෙන ගත්තෙ මේ මැතිවරණය තුළයි. අන්න ඒක නිසා අපි හිතනවා මේක අපේ

පරාජයක් නෙමෙයි. අපි මෙහෙම හරි අපි ජයග්‍රහණයක් නොලබා හරි මේ මැතිවරණය තුළ මේ සභාව නියෝජනය කරන එක ජනතාව දන්නවා කියන එක තමයි මගේ මතය. මං දන්නවා මෙතන නම් සඳහන් නොකළත් මට විරුද්ධව කටයුතු කරන විපක්ෂයේ මන්ත්‍රීවරු පවා කියලා තිබුණා මේ ඔල්ගා කියන එක්කෙනා මේ ප්‍රාදේශීය සභාව ඇතුළට එන්න ඕනෙ කියන එක මට යම්කිසි අය ප්‍රකාශ කළා. ඒ නිසා අපි මේ දේශපාලනය තුළ හම්බකිරීම් කරගෙන නෑ. අපි ජනතාව වෙනුවෙන් කැපවෙලා අපි කිසිදෙයක් අරගෙන නෑ. ඒ නිසා ජනතාව වෙනුවෙන් කැපවුණු සේවයක් කරන්න තමයි අපි මෙතනට ආවෙ. මං හිතන්නෙ අවුරුදු 20 ක් බලයක් තිබිලා ඒ අවුරුදු 20 ට අපිට කරන්න බැරිවෙච්ච දේවල් තිබ්බා. ජනතාව දුක් විඳිනවා ඇත්ත. ජනතාවගේ දුක් වලට උත්තර දෙන්න අපිට තව කාලය තියෙනවා ඉදිරියේදී මං හිතන්නෑ මේ අවුරුදු තුන තුළ යම්කිසි වැඩ කොටසක් අපි ඉදියේදී කරලා අපි ජනතාව ඉදිරියට යන්න සූදානම් බවත් මේ අවස්ථාවේදී මම ප්‍රකාශ කරන්න ඕනෙ. ඒ වගේම මං හිතන්නෙ අපි අතරේ අපේ සභාව ඇතුලේ බෙදීමක් තිබුනේ නෑ කියන එක ඒක නිවැරදි කරගත යුතුයි. සභාපතිවරයා එක දවසක දිවුරුම් දෙන්නත් උප සභාපතිවරයා එක දවසක ඇවිල්ලා උත්සව තියලා දිවුරුම් දෙන්නත් කියන එක තමයි පළවෙනි බෙදීම. මං හිතන්නෙ ඒක ආදර්ශයක් නෙමෙයි අනාදර්ශයක්. සභාවක් හැටියට ඒ සභාවේ සභාපති උපසභාපති එකට දිවුරුම් දෙන්න ඕනෙ. කවුරු කොහොම කෙසේ කිව්වත් ඒ බෙදීම තිබුණා. ඒක නිවැරදි කරගන්නවානම් අපි සන්තෝස වෙනවා. මේ අවස්ථාවේදී මං ඒක කියන්න ඕනෙ. ඒ වගේම සහෝදරවරුනි මං හිතන්නෙ අපේ සුසන්ත මන්ත්‍රීතුමා කිව්වා ඒ ප්‍රදේශයේ ජනතාව කතන්දරයක් කිව්වා කියලා. ගරු මන්ත්‍රීතුමනි ඔබ දැන් මන්ත්‍රීවරයෙක් මගේ ගම් ප්‍රදේශයේ මගේ පදිංචිය ඒ ප්‍රදේශයේ. ඔබතුමා මීත් ඉදිරියට ඒ ප්‍රදේශයට කොහොම උනත් ඒ ගොඩකිරීම් සඳහා ප්‍රාදේශීය සභාවේ කුණු නම් ගේන්න එපා එහෙම ගේනවනම් ඒකට විරුද්ධව අපි නැගී සිටිනවා ඒක මම මේ අවස්ථාවේදී පළවෙනි මංගල සභාවේදී මම ප්‍රකාශයක් කරනවා. මොකද අපිට ස්වභාවික සම්පත් තියෙනවා. නොයෙකුත් ලෙඩ රෝග බෝවෙනවා. ගං වතුර ගලපු අවස්ථාවේදි මම දැක්කා ඒ කුණු ගොඩවල් පාවෙච්ච හැටි. හැම තැනම කුණු ගොඩවල් පා උනා. ඒ වෙල් වලට දැම්මම ඒ කුණු ගැලවිලා ඇවිල්ලා මහ ගංවතුරෙන් ජනතාවට විශාල හානියක් සිද්ධ වෙනවා. ඒ හානියට ඉඩ තියන්න එපා කියලා මීත් ඉදිරියට. ඔබතුමාට මං ගෞරවයෙන් ඉල්ලා සිටින්නෙ මේ අවස්ථාවේදි. ඒ වගේම ගරු සභාපතිතුමනි, ඉන්නෙ අපේ 13 දෙනෙක් ඉන්නවා. තමුන්නාන්සේ හිටපු සභාපතිවරයා. තමුන්නාසේට වාසනාවක් තිබ්බා නැවත වතාවක් මෙතෙන්ට එන්න කවුරු කොහොම කිව්වත් අපි කොහොම කිව්වත් සභාපති පුටුවට ඉඳගන්නත් වාසනාවක් තියෙන්න ඕනෙ කියලා. ඒ වාසනාව ඔබතුමාට ලැබුණා. ඒ නිසයි අද කොච්චර බාධක තිබ්බත් ඔය තැනට ආවෙ. නමුත් මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ ඉදිරියේදී සභාපතිවරයා හැටියට අපි කාටත් ඔබතුමා සභාපතිවරයා වෙන්න. අපිට විරුද්ධව විවිධ පුද්ගලයින් කියන ඒවට අපිට ඇඟිල්ල දික්කරන්න එපා. ඒ විධියට ඇඟිල්ල දික්කරන්න කොයි මොහොතකවත් ඔබතුමා උත්සාහ කරන්න එපා. අපි වෙනුවෙන් මේ ප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන් අපි ඔබතුමාට අපේ සහයෝගය සම්පූර්ණයෙන් දෙනවා. මොකද අපි එදා හිටන් අපිට මතකයි චන්ද්‍රසිරි ගමගේ අපේ විපක්ෂයේ මන්ත්‍රීතුමා අපේ සභාවේ ඉන්නකොට අපේ සභාපතිවරයා හැටියට එතුමා ඉතා විශාල වැඩකොටසක් කළා. ඒ වගේම අපේ ලයනල් කාරියවසම් මැතිතුමා ඉන්න කාලෙ ඉඳලම අපි එදා මෙතන බැංකුවේ උකස් අංශයෙ තමයි සභාව තිබ්බෙ. අපි ඉඳගන්න අපි පුටුව ඇදගෙන ගිහින් ඕනෙ ඉඳගන්න. අපි ඒ තරම් හිරවීමක් තුළ සභාව ගෙනිච්චෙ. ලයනල් කාරියවසම් මැතිතුමාටත් අපි සහයෝගය දුන්නා. ඔබතුමාටත් අපි සහයෝගය දුන්නා. අවසාන වශයෙන් අවසාන වෙලාවෙදි අපිට දේශපාලන තීන්දුවක් ගන්න තිබුන නිසා දේශපාලන විධියට අපි තීන්දුවක් ගත්තා. ඒ තීන්දුවක් අපිට ගන්න අවස්ථාවක් ලැබුනෙ නෑ ඇත්තෙන්ම ගෙනිච්ච යම්කිසි ප්‍රශ්නයක් නිසා. නමුත් අපි ඒවා ඇදල මෙතන මේ සභාව අපවිත්‍ර කරනවා නෙමෙයි. අපිට වෙච්ච දේවල් අපි මේ කියන්නෙ. ඒනිසා මම හිතන්නෙ මම දීර්ඝ වශයෙන් කතා කරන්න අවශ්‍යා වෙන්නෙ නෑ. අපි ඉදිරියේදී මෙම

සභාව තුළ යම්කිසි දෙයක් කරන්න අපේ සහයෝගය සම්පූර්ණයෙන් හොඳ දේ කරන්න ලබාදෙනවා කියන එක කියනවත් සමඟම මේ සභා ගොඩනැගිල්ල මේ ස්ථානයේ හදන්න කියලා යෝජනාව ගෙනාවෙ මම ස්ථිර කළේ අපේ හිටපු උපසභාපති ආනන්ද රූපසිංහ මැතිතුමා. ඒත් ඊට පස්සෙ අපිට එන්න බැරි උනා මේ සභාවට. ඒ ඊට පස්සෙ ආපු රවින්ද්‍ර ජයසිංහ මැතිතුමා ඒ ස්ථිර කරපු යෝජනාව තුළ මේ ගොඩනැගිල්ල හැදුවා. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු හැටියට අපි කරපු දෙයක් තිබුනා. සමහර අපේ ලාබාල අය අපිට මෙහෙම කිව්වට මන්ත්‍රීතුමනි මන්ත්‍රීතුමියනි ලාබාල ඔබ අපෙන් ඉගෙන ගන්න. අම්මාතාත්තා අමතක කරලා වැඩ කරන්න බෑ.. පළවෙනි ස්ථානය අම්මාට තාත්තාට දෙන්න ඕනෙ. ඒ වගේම තමයි ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ට ගරු කරන්න ඒක ඉගෙන ගන්න ඔබතුමන්ලා හොඳ දේදි ගරු කරන්න වැරදි දෙයක් කරද්දි එය පෙන්වා දෙන්න කියන ඉල්ලීම කරමින් ඔබ සියලු දෙනාටම සුබ අලුත් අවුරුද්දක් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩී.අයෝම මධු ප්‍රසාද් දේවගේ මැතිතුමා</u>

හයවන සීතාවක ප්‍රාදේශීය සභාවේ ලාබාලම මන්ත්‍රීවරයා ලෙස පත්වීමට ලැබීම මම නවකයෙක් විදියට ලබපු භාග්‍යයක් ගරු සභාපතිතුමනි, ඔබතුමන් ප්‍රමුඛ ගරු උපසභාපතිතුමන් ඇතුළු, ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් ඇතුළු මන්ත්‍රීවරු සියලුදෙනාගෙන් අවසරයි. ඒවගේම ගරු ලේකම්තුමනි, සීතාවක ප්‍රාදේශීය සභාවේ සියලුම නිලධාරීන් සියලුදෙනාගෙන්ම, මාධ්‍ය වේදි සියලුදෙනාගෙන්ම, පැමිණ සිටින සියලුදෙනාගෙන්ම අවසරයි. තරුණයෙක් විදියට මේ දේශපාලන ගමන එන්නට මා හට සුවිශාල ශක්තියක් ලබාදුන්නු අද අප අතර නැති උනත් 1991 පළමු සීතාවක ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා ලෙස ඡන්ද 7 ක් නොලැබීම නිසා ඩී.ඩී. නිමල්සිරි උප සභාපති ධූරය හිමිවුනු මගේ ආදරණීය පියාණන් මම මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෙ. මගේ දේශපාලන ගමනට ශක්තිය වෙන්න අවශ්‍ය වුනු මේ මොහොත් අද එතුමන් අපි අතර නැති උනත් එතුමන්ගේ බලාපොරොත්තුව ඉටු කරන්නට තරුණයෙක් විදියට ලාබාල මන්ත්‍රීවරයෙක් විදියට එන්න අවස්ථාව ලැබීමට මම එතුමන්ව ගෞරවයෙන් මතක් කරනවා. එය සීතාවක ප්‍රාදේශීය සභාවේ අපේ කොට්ඨාශයේ පාදුක්ක කොට්ඨාශයේ වැඩිම කාලයක් මන්ත්‍රීවරයෙකු ලෙසින් උප සභාපතිවරයෙකු ලෙසින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ දේශපාලනයට විශාල කැපකිරීමක් කරපු ඩී.ඩී. කරුණාරත්න මැතිතුමා එතුමන්ගේ පරිත්‍යාගයත් එක්ක මට මේ අවස්ථාවේ කොට්ඨාශ ක්‍රමය තුළ පාදුක්ක කොට්ඨාශය නියෝජනය කරන්න අවස්ථාව ලැබුණු බව එතුමන්ව ගෞරවයෙන් යුතුව මතක් කරමින් යම් දේශපාලන දැක්මක් සහ එතුමාගේ අරමුණුත් එක්ක අපි කටයුතු කරනකොට පුංචි කාලේ ඉඳන් දේශපාලන පරිසරයක හැදිච්ච කෙනෙක් විදියට මම දේශපාලනය පුංචි කාලෙ ඉඳන් දැකපු කෙනෙක් විදියට ඒ දේශපාලන ගමන එන්න මට මගේ පවුලේ දේශපාලනය මට ගොඩක්ම සහයෝගයක් ලැබුනා කිව්වොත් මං හිතනවා මම නිවැරදියි කියලා. නමුත් එතනින් එහාට ගිහිල්ලා මම තරුණයෙක් විදියට නැගී සිටින්න ඕනෙයි කියන තැන ඉඳලයි දේශපාලනය අරගෙන ගියේ. මං හිතනවා යෞවන සමාජය ව්‍යාපාරයෙන් දේශපාලනයට ආපු කෙනෙක් විදියට ගරු සභාපතිතුමත් අද සභාපති පුටුවෙ වාඩිවෙලා ඉන්නෙ යෞවන සමාජය ව්‍යාපාරය තුළ අපිට ජ්‍යෙෂ්ඨයෝ විදියට ඔවුන් ලබාදුන්න ශක්තිය අපි මේ වෙලාවෙ මතක් කරන්න ඕනෙ. යෞවන සමාජය ව්‍යාපාරයෙන් දේශපාලනයට ඇවිල්ලා ඊට පෙර ඉගෙන ගත්ත පාසල පාදුක්ක සිරි පියරතන මධ්‍ය මහා විද්‍යාලයේ ශිෂ්‍ය නායකයෙකු ලෙසින් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය ක්‍රියාකාරිකයෙකු ලෙසින් මේ නායකත්වයේ ගුණාංගය ඉගෙන ගෙන අභියෝග වලට කරදර වලට මුහුණ දීලා මේ දේශපාලන ගමන ශක්තිමත් කරන්න ඒ දීපු දැනුම හා ඒ ලබාගත්ත අත්දැකීම් මං හිතනවා මේ දේශපාලනයට පත්වෙන්න මට සුවිශාල ශක්තියක් වෙලා තියෙනවා. විශේෂයෙන්ම

මතක් කරන්න ඕනෙ සීතාවක ප්‍රාදේශීය සභාවේ ලාබාලම මන්ත්‍රීවරයා ලෙස මමත් මන්ත්‍රීවරිය ලෙස ධනුෂ්කි මන්ත්‍රීවරියත් සීතාවක ප්‍රාදේශීය සභාවේ හොඳම කොට්ඨාශ දෙක නියෝජනය කරන්නෙ කිව්වොත් නිවැරදියි. විශේෂයෙන්ම පාදුක්ක සහ හංවැල්ල. ප්‍රාදේශීය සභාවට වැඩියෙන්ම ආදායම් ලබාදෙන කොට්ඨාශ දෙක. ඒවගේම මැතිවරණ ප්‍රශ්න සහ වැඩිම සුබ සාධන කටයුතු වලට මුහුණදෙන ස්ථාන දෙකක්. ඒ දෙකේ ඉන්න ලබාලම මන්ත්‍රීවරයා සහ මන්ත්‍රීවරිය මේ සභාපතිතුමන් සහ උපසභාපතිතුමන් ප්‍රමුඛ ඒ සියලුම මන්ත්‍රීවරු ඒ කටයුතු වලදි අපිට සුවිශාල සහයෝගයක් ලබාදෙයි කියලා අපි විශ්වාස කරනවා. මොකද උදේ නැගිට්ට මොහොතේ සිට රාත්‍රිය වනතුරුම හැමදාම නගරයට පැමිණෙන බොහෝ පිරිසකගේ ගැටළු නිවැරදි කරන්න තමයි අපිට සිද්ධවෙලා තියෙන්නේ. ඒ නිසා අපි ගෞරවයෙන් යුතුව බලාපොරොත්තු වෙනවා නවක මන්ත්‍රීවරු විදියට ජ්‍යෙෂ්ඨ ඔබ සියලුදෙනාම ඒ සහයෝගය අපිට ලබාදෙයි කියලා. මේ නගරය දියුණු කරන්න විශේෂයෙන්ම අලංකාර නගරයක් දර්ශනීය නගරයක් හොඳ පාදුක්ක නගරය විශේෂයෙන්ම අපි අපේ ක් සීතාවක ප්‍රාදේශීය සභාවට තරුණයෙක් ලෙස අලංකාර නගරයක් ලෙස පාදුක්ක නගරය පත්කළ යුතුයි කියන තැන අපි ඉන්නෙ. ඒ වගේම මේ අවස්ථාවේදී මම මතක් කරන්න ඕනෙ පාදුක්ක නගරයේ අපි හඳුනාගත්ත බොහෝ ස්ථානවල අලංකාරත්වයෙන් පිරුණු පාදුක්ක නගරයේ එදා පාදුක්ක නගරය අලංකාර කරන්න නිර්මාණය කරපු පාදුක්ක ප්‍රජා ශාලාව අද වනවිට වල් බිහිවෙලා එහෙම නැත්නම් වෙනත් අකටයුතුකම් වලට යොදාගෙන තියෙනවා. සභාපතිතුමා ඇතුළු සියලුදෙනාගෙන් මං ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ඒ අලංකාරවත් නගරයේ තියෙන එම ගොඩනැගිල්ල යථා තත්වයට පත්කරලා ප්‍රජා ශාලාවක් බවට නැවත පත්කරලා ජනතාවට සුබ සිද්ධියක් ලබාදෙන ස්ථානයක් බවට පත්කරන්න. පාදුක්ක නගරයේ තියෙන පැරණිම ගොඩනැගිල්ල විදියට ඒ වගේම මේ වෙලාවෙ මතක් කරන්න ඕනෙ මගේ මැතිවරණ ව්‍යාපාරය වෙනුවෙන් තරුණයෙකු ලෙසින් විශාල අභියෝගයක් මට තිබුණා මැතිවරණයේදී විශේෂයෙන් ප්‍රාදේශීය සභාවේ හිටපු විපක්ෂ නායකවරයා ප්‍රාදේශීය සභාවේ ජ්‍යෙෂ්ඨ නායකවරයෙක් චන්දන බාලසූරිය මැතිතුමන් එක්ක තමයි මට තරඟය තිබුනෙ. මං හිතනවා ඒ තරඟය මට ජයගන්න විශාල ශක්තියක් මගේ අවට හිටපු සහ මට උදවු කරපු වැඩිහිටියන් තරුණයන් විශාල ප්‍රමාණයක් මගෙත් එක්ක හිටියා. මං හිතන්නේ විශේෂයෙන් මතක් කරන්න ඕනෙ මගේ පියාගේ අභාවයෙන් පස්සෙ මේ දේශපාලන ව්‍යාපාරයේ අපිව දේශපාලනයේ අරගෙන ගියේ නීතිඥ රවීන්ද්‍ර ජයසිංහ මැතිතුමන් එතුමන්ට මම මගේ ගෞරවනීය ප්‍රණාමය පුදකරනවා. දේශපාලනයේ අන්ධයන් බවට පත්නොවී නියම ගමන යන්නට හග පෙන්වූ එතුමන්ට මාගේ ගෞරවනීය ස්තූතිය මම පුදකරනවා. මේ අවස්ථාවේදී ඒ වගේම අද නැති උනත් දේශපාලනය වෙනුවෙන් ශ්‍රීලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් සුවිශාල කැපවීමක් කරපු අපේ පවුලේ පියාණන් ඒ කැපකිරීම පාදුක්කෙන් කරනකොට ඒ කඳවුර රැකගත්ත අපේ දේශපාලන කඳවුර රැකපු සුමිත් විජයමුණි සොයිසා මැතිතුමන්ට අද අපේ කඳවුරේ නැති උනත් අපිව තරුණයෝ විදියට යම් ගමනක් අරගෙන යන්න උත්සාහ කළා. එතුමන් අපේ ගෞරවය පුදකරනවා මේ අවස්ථාවේදී. ඒ වගේම මගේ මැතිවරණ කටයුතු වෙනුවෙන් පාදුක්කට ඇවිල්ලා විශාල ශක්තියක් ලබාදුන්න ගරු ගීතාංජන ගුණවර්ධන මැතිතුමාත් ඒ වගේම දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත් ඒ වගේම බස්නාහිර පළාත් සභාවේ මහේෂ් අල්මේදා මැතිතුමන් ප්‍රධාන සියලුම අපේ දේශපාලන පක්ෂවල සියලුම ක්‍රියාකාරිකයන්ට මගේ ගෞරවනීය ස්තූතිය පුදකරනවා. ඒ වගේම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ තරුණියන් නියෝජනය කරලා මේ රටේ තරුණ ප්‍රජාව නව දේශපාලන සංස්කෘතියක් එක්ක ඒ අපි දැකපු පාර්ලිමේන්තුවේ අපි දකින සහ අපි දැකපු දේ දේශපාලනය එහා ගිය නව දේශපාලනයකට තරුණයේ ගෙන යා යුතුයි කියලා උගත් බුද්ධිමත් තරුණ පිරිසක් මේ දේශපාලනයට ගෙනා යුතුයි කියලා යම් දේශපාලන අරගලය එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ තරුණියන් එකතුවෙලා හිටියා. ඒ වගේම එයින් එළියට ඇවිල්ලා පොදුජන පෙරමුණේ තරුණ තරුණියන් හැටියට අපි ඒ අරගලය කරගෙන යනකොට මේ මැතිවරණය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ තරුණ සංවිධායක විදියට ඇවිල්ලා සුවිශාල ශක්තියක්

ලබා දුන්නා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා එතුමන්ට ගෞරවනීය ස්තූතිය පුදකරනවා පාදුක්ක කලාපයේම අපේක්ෂකයන් නව දෙනාම ජයග්‍රහණය කරන්න අපිට ඇවිල්ලා දුන්න ශක්තියට. එතුමා ප්‍රමුඛ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ තරුණ තරුණියන්ට මාගේ ගෞරවනීය පාදුක්ක ජනතාවගේ ස්තූතිය පුදකරනවා. ඒ වගේම මේ මැතිවරණයේදී සුවිශාල ශක්තියක් ලබාදෙමින් පහළ පාදුක්කේ ජනතාව මං හිතනවා සුවිශාල කැපකිරීමක් කළා. මං හිතන විදියට අහල තියෙන ඉතිහාසය තුළ එදා පැවති ගම් සභාවකවත් පාදුක්ක නගරයේ එක්සත් ජාතික පක්ෂයෙන් ගලවන්න බැරිවෙන්න ඒ ඡන්ද පෙට්ටිය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ඡන්ද වලින් පුරවන්න සුවිශාල ශක්තියක් අපිට ලබාදුන්නෙ පාදුක්කේ ජනතාව. ඒ සියලුම ජනතාවට මගේ ගෞරවනීය ස්තූතිය මම මේ අවස්ථාවේ පුදකරනවා. ඒ වගේම කිසි දවසක පාදුක්ක වෙළඳ ප්‍රජාව එක්සත් ජාතික පක්ෂයෙන් පිට ඡන්දය භාවිතා කරනු ලැබුවේ නෑ. මෙවර වෙනස් කරගන්න මට හැකියාව ලැබුණා ඒ සුවිශාල බලාපොරොත්තු බොහෝමයක් ඒ ව්‍යාපාරිකයන් තුළ තියෙනවා කියන බලාපොරොත්තුව ඉටු කරන්න අපිට සිදුවෙලා තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමා එදා පුංචි කාලෙ දැක්ක පාදුක්කමයි අදත් අපි දකින්නෙ ඒ නිසා පාදුක්ක නගරය අපි වෙනස් කළ යුතුයි. මේ නගරය වෙනස් කරලා මේ වෙළඳ ව්‍යාපාරිකයන්ට සුවපහසු නගරයක් හදමු. මේ නගරයට පැමිණෙන සියලුම කොට්ඨාශවල ජනතාවට පහසුකම් දෙන නගරයක් බවට මේ නගරය පත්කරන්න ඔබතුමා ඇතුළු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සහයෝගයත් අපි බලාපොරොත්තු වෙනව. ඒ වගේම ඒ ලබා දුන්නු සියලුම වැඩිහිටියන් උදවු උපකාර කළ සියලුදෙනාට ඒ වගේම මගේ මෑණියන් සහ මගේ සහෝදරියන් දෙන්නා ඒ වගේම මගේ පවුලේ සියලුදෙනාටත් ස්තූතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අශෝක වැලිකල මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, උප සභාපතිතුමනි, සහෝදර මන්ත්‍රීවරුනි, මන්ත්‍රීතුමියනි, ලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්ම මහත්මීනි, ජනමාධ්‍ය මහත්තුරුනි, සියලුදෙනාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මං හිතන්නේ සභාපතිතුමා හොඳටම දන්නවා. දැනට අවුරුදු ගානකට කලින් මෙතුමා මගේ නිවසට ගිහිල්ලා මාව දේශපාලනයට ගේන්න ඇද ගන්න බැලුවා. මං එදා ඒ අවස්ථාවේදී මග ඇරියා නමුත් මං සිහිපත් කරන්නට ඕනි වාමාංශිකව දේශපාලනය කරපු කීර්ති කරුණාරත්න මැතිතුමා එතුමා අඩි දෙක තුනක් පස්සට අරන් මෙවර අනිවාර්යයෙන්ම ඔබතුමා මේ ප්‍රාදේශීය සභා මැතිවරණයට ඉදිරිපත් වෙන්නැයි කියලා ඉල්ලීමක් කළා. ඒත් එක්කම පොදුජන පෙරමුණ වෙනුවෙන් ඒ අපේ ආසනයේ සංවිධායකතුමා රවීන්ද්‍ර ජයසිංහ මැතිතුමාගේ බලවත් ඉල්ලීමක් තිබුනා මේ සඳහා ඉදිරිපත් වෙන්න කියලා. ඉතින් මට කාල වේලාව රැකියාවත් එක්ක වෘත්තිය වේදියෙක් හැටියට කාල කළමනාකරණය පිළිබඳ ප්‍රශ්න තිබුණ නිසා මට දෙපාරක් මෙතෙන්ට එන්න නොලැබුනත් මේකට ඉදිරිපත් වෙන්න සිද්ධ වුණා මම මේ වාමාංශික දේශපාලන සමූහයේ මගේ දෙමව්පියෝ සියලුම දෙනාට මට මතකයි අපේ ගෙවල්වල ඉන්න කට්ටිය ඒ නිසා අපි කවදාමත්ම වාමාංශික දේශපාලන සමූහයේ එතුමන්ලා මගේ ලොකු තාත්තා මට මතකයි දැනට අග්‍රාමාත්‍යවරයෙක් වශයෙන් ඉඳලා දිවංගත වූ ගරු රත්නසිරි වික්‍රමනායක මැතිතුමාගේ දේශපාලන සහයෙක් හැටියට දේශපාලන කටයුතු කරපු ආකාරය ඒ අභාසය අපිට ලැබුණා. ඒ නිසා තමයි අපි දේශපාලනය භයානකයි කියලා මේ පැත්තට එන්න පුළුවන්කම අපිට ලැබුණේ. ඒත් එක්කම මම ගෞරවයෙන් සිහිපත් කරන්නට ඕනෙ මගේ ප්‍රතිවාදියා වුනේ ජයන්ත මහත්තයායි. ඒ අපි එකට ඉස්කෝලෙත් ගියා. එතුමාත් මාත් අතර පෞද්ගලික කොන්තර මුකුත් නෑ. අදත් අසෝක කියනවා මමත් ජයන්ත කියනවා සමාවෙන්න මෙහෙම කිව්වට නමුත් අපේ මිත්‍රකමට මේක බාධාවක් වෙන්නේ නැහැ. එතුමා එක ප්‍රතිපත්තියක සටනක් ගෙනිච්චා. මම තවත් ප්‍රතිපත්තියක් ඉදිරියට ගෙනල්ලා අවසානයේ මට ජයග්‍රහණය ලැබුණා. මම සන්තෝස වෙනවා එතුමා අපේ මේ ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායකවරයා හැටියට මගේ කොට්ඨාශයට නැවතත් පත්වීම පිළිබඳව. මං හිතන්නේ

සංවර්ධනයේදී එතුමාගේ සහාය අපේ කොට්ඨාශයට ලැබෙනවා කියන එක මම බලාපොරොත්තු වෙනවා. මං හිතන්නේ ඒ ආකාරයෙන් සිද්ධ වෙයි කියලා. ඒත් එක්කම මම වැඩිවෙලා කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නෑ ඔබතුමන්ගේ අවධානය යොමු කරන්න අපේ කහවල ප්‍රජා ශාලාව තුළ පුස්තකාලයක් දකින්න. ඒ පුස්තකාලයේ දැනට වහල තියෙන්නේ ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවනවා ඒක සතියකට සැරයක් වත් අපේ දරුවන්ට පොත්පත් පරිශීලනය කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න කියලා එත් එක්කම මම ඊළඟට ගෞරවයෙන් සිහිපත් කරන්න ඕනෙ මම මිනින්දොරුවරයෙක් වශයෙන් පිඹුරු සකස් කරලා එව්වට පස්සේ . අපේ තාක්ෂණ නිලධාරිතුමිය මට සහයෝගය ලබා දුන්නා. මමත් ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් නොවුනට එලියේ ඉඳන් මේ මහජනතාව රස්තියාදුවෙන තත්වය වළක්වන්න අපිට පුළුවන් උත්සාහය කළා. නමුත් දැන් මම හිතනවා මේ තුළට පැමිණි නිසා මගේ තිබෙන වෘත්තීය දැනුමෙන් යම් සේවාවක් මට මේ සභාව තුළ කරන්න පුළුවන් උනොත් මේ තුල තියෙන ඉඩම් ප්‍රශ්න අපිට නිරාකරණය කර ගන්න පුළුවන් උනොත් අපේ සම්පූර්ණ සහයෝගය ඒ වෙනුවෙන් ඔබතුමාටත් මේ සභාවටත් ලබාදෙනවා කියන එක මම මතක් කරන්න ඕනෙ. අවසාන වශයෙන් මම හිතන්නේ මම ස්තුති කිරීමක් කරන්නට ඕනෙ පොදුජන පෙරමුණේ අපේ මේ සංවිධායක රවින්ද්‍ර ජයසිංහ මැතිතුමාට විශේෂයෙන් මම ස්තුතිවන්ත වෙනවා මගෙ මැතිවරණ ව්‍යාපාරය තුළ එතුමා විශාල සහයෝගයක් මා වෙත ලබාදුන්නා ඒ වගේම මහේෂ් අල්මේදා ගරු පළාත් සභා මන්ත්‍රීතුමන් ඒ එක්කම මං හිතන්නේ දිනේෂ් ගුණවර්ධන මැතිතුමන් මගේ ගෙදරට ඇවිල්ල රැස්වීමක් පැවැත්වුවා. එතුමන්ලාගේ ඒ ඡන්ද ව්‍යාපාරය තුළ සහයෝගය අපිට ලබාදුන්නා. ඒ වගේම ගීතාජන ගුණවර්ධන මැතිතුමන් රැස්වීම් ගණනාවකට ඇවිත් මට උදව් කළා ඒවා මේ අවස්ථාවේ සිහිපත් කරනවා. ඒ වගේම ගාමිණී ලොකුගේ මැතිතුමන් මම දේශපාලනය සමඟ කටයුතු කරනවා. එතුමාගේ සහයෝගයත් ඉතා විශාල ලෙස මේ ජයග්‍රහණයට ලැබුණායි කියන එක ඉතාමත්ම කෘතවේදීව සිහිපත් කරනවා. ඒ වගේම මේ අවස්ථාවේදී කීර්ති කරුණාරත්න මැතිතුමාව ගෞරවයෙන් සිහිපත් කරනවා. එතුමා තමයි අපේ කොට්ඨාශයේ වාමාංශික කටයුතු නියෝජනය කළේ. ප්‍රාදේශීය සභාව තුළ ඉඳගෙන අපේ ප්‍රදේශයේ විශාල වැඩ කොටසක් කරලා ඔහු මං හිතන්නේ දේශපාලනයෙන් සමුගත්තා නෙමෙයි මට අවස්ථාව දීලා ඔහු පැත්තකට උනා කියන එක මං හිතනවා. මං ඉතාමත් කෘතවේදීව කීර්ති කරුණාරත්න මැතිතුමාවත් සිහිපත් කරනවා. මම කියන්නට ඕනි අර මෙතුමන්ලා කිව්වා වගේ ඔබතුමාට අපේ මන්ත්‍රීවරුන් 23 දෙනෙක් ඉන්නවා. ඒ නිසා කිසිදේකට බයවෙන්න එපා අපි සියලුදෙනා එක මිටක් වගේ තමුන්නාන්සේගේ හොඳ වැඩ වලට හැම දේකටම අපි සහයෝගය දෙනවයි කියන එකට පොරොන්දුවක් දෙන්න මම සූදානම්, අවසාන වශයෙන් මේ සභාවේ ඉදිරි කටයුතු වලදී අපිට තමුන්නාන්සේගේ සහයෝගය ඉතාමත් සෑම මන්ත්‍රීවරයෙක්ටම ලබාදෙනවයි කියන විශ්වාසය අප තුළ තියෙනවා. ඒ විශ්වාසය තියෙනවානම් මං හිතන්නේ ඒක තමයි අවශ්‍ය වෙන්නේ. ඒ විශ්වාසය ඔබතුමන් රැකගන්න කියන ඉල්ලීම කරමින් හැමෝටම සුබ අලුත් අවුරුද්දක් සුබ අනාගතයක් පතමින් මම නිහඬ වෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමල් පුස්සැල්ල මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, උප සභාපතිතුමනි, සහෝදර මන්ත්‍රීවරුනි, මන්ත්‍රීතුමියනි, ලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්ම මහත්මීනි, ජනමාධ්‍ය මහත්තුරුනි, සියලුදෙනාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, අපි දේශපාලනය කළේ අපේ අනන්‍යතාවයෙන් මං හිතන්නෙ අපිට හොඳ අත්දැකීමක් ඒ වගේම වටිනාකමක් මොකද අපි පිටිපස්සේ කිසිම කෙනෙක් හිටියේ නැහැ. විශේෂයෙන්ම කියනවනම් මගේ කොට්ඨාශය ඇතුලත අපේ එක්සත් ජාතික පක්ෂ සංවිධායකතුමා ඇරෙන්න කිසිම දේශපාලනඥයෙන් මගේ කොට්ඨාශයට ඇතුලට ඇවිල්ලා හිටියේ නැහැ. නමුත් අපි විශාල ඡන්ද ප්‍රමාණයක් අපේ පක්ෂය වෙනුවෙන් ලබාගත්තා. ඉතින් මේ පත්කළ මන්ත්‍රී ධූරය කිසිම වෙලාවක අවමානයට ලක්කරන්න බෑ මං වගේම අනිත් සියලුම දෙනා වෙනුවෙන් මම කතා කළේ ඒ නිසා

සියලු මන්ත්‍රී මණ්ඩලය හොඳටම දැනගන්න ඕන පාර්ලිමේන්තුවේ වෙන්න පුළුවන් පළාත් සභාවේ වෙන්න පුළුවන් ප්‍රාදේශීය සභාවේ වෙන්නත් පුළුවන් . මන්ත්‍රීවරයෙක් විධියට පත්වීම පත්වීමක්. ඉතින් ඒ පිළිබඳව මම විශේෂයෙන්ම කෘතඥතාපූර්ව වෙනවා. යම් අර්ථ දැක්වීම් මමත් අහගෙන හිටියා නවක මන්ත්‍රී කෙනෙක් හැටියට ඒ වගේම විශේෂයෙන් කියන්න ඕනෙ මම අළුත්අම්බලම ආදර්ශ කනිෂ්ඨ විද්‍යාලයෙන් ඒවගේම හංවැල්ල රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලයෙන් මූලකුරු ඉගෙන ගෙන ඊළඟට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් උසස් අධ්‍යාපනය හදාරලා එතනින් තමයි මම දේශපාලනයට අවතීරණ වෙන්නෙ. මේ දේශපාලනයට අවතීර්ණ වෙලා අවුරුදු 15 ක් එක්සත් ජාතික පක්ෂයේ ක්‍රියාකාරී දේශපාලනයේ යෙදිලා පළවෙනි වතාවට තමයි ප්‍රාදේශීය සභාව නියෝජනය කරමින් මන්ත්‍රී ධූරයක් ලබාගන්නේ. මේ මන්ත්‍රී ධූරය ලබාගන්නේ මං වෙනුවෙන් වෙහෙසිච්ච පක්ෂය වෙනුවෙන් වෙහෙසුණු අපේ ප්‍රදේශයේ ජනතාවට සේවයක් කරන්න. ඒ විතරක් නෙවෙයි අපි ඡන්දයකින් පත්වෙලා ඇතුලට ආවම අපිට දේශපාලනයක් බලන්න බෑ. මගේ ජීවිතයේ කිසිම දවසකදී මම දේශපාලන පක්ෂ මුල්කරගෙන කටයුතු කරලා නෑ. ඒ විතරක් නෙමෙයි සභාපතිතුමනි අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රී කණ්ඩායමක් ඉන්නවා ඒ සියලුදෙනාම එක්ක අපි සූදානම් ඔබතුමා ගන්න හැම හොඳ තීරණයකටම අපි එකඟ වෙන්න. ඒ වගේම යම් වැරැද්දක් තියෙනවා නම් නිවැරදි කරගන්න උදව් කරන්නත් අපි සූදානම්.එහෙනම් මම වැඩිදුර කතා කරන්නේ නෑ, මං හිතන්නේ සියලුදෙනාම කතාව ගොඩක් එහාට ගියොත් එහෙම සියලුදෙනාගේම වෙලාව තවත් නාස්ති වෙනවා .මම ඔබතුමාට ඇතුලු සියලුදෙනාටම ස්තූතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා. ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මැතිතුමා</u>

ගරු සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, ගරු උප සභාපතිතුමනි, ගරු ලේකම්තුමනි, කාර්ය මණ්ඩලය ඇතුළු අපේ සීතාවක ප්‍රාදේශීය සභාවේ සියලුම සහෝදර මන්ත්‍රීවරුනි, මාධ්‍යවේදීනි, සියලුදෙනාගෙන් අවසරයි. මම දෙමලෙන් කතාව පටන් අරගෙන සිංහලට ආවේ ඔබතුමන්ලට තේරෙන්නේ නැති නිසා. මොකද ඔබතුමන්ලා දෙමළ දන්නෙ නැති නිසා මම ඒකයි සිංහලෙන් කතාකළේ. පළවෙනියෙන්ම මම දේශපාලන, සීතාවක ප්‍රාදේශීය සභා දේශපාලන ඉතිහාසයේ පසුබිමෙන් ජීවත්වන පලවෙනි මන්ත්‍රීතුමා විය යුතුයි මං හිතන්නේ මොකද මගේ ගුරුන්නාසේට මම සලකන්නේ ඉලුක්ඕවිට හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොකද එතුමන් 1996 මැතිවරණයට සහභාගී වෙලා අපි සහයෝගය දීලා ඒ හරහා තමයි දේශපාලනය ඉගෙන ගත්තේ. එනිසා තමයි අපි එතුමව අමතක කරන්න .හොඳ නෑ එතුමාව මම සිහිපත් කරනවා. ඒ වගේම මට ප්‍රාදේශීය සභාවට එන්න මග පාදලා දුන්නේ එක්සත් පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා වගේම අවිස්සාවේල්ල ආසනයේ සංවිධායක ගරු ලෙනාඩ් කරුණාරත්න මැතිතුමන් ඒ වගේම මගේ පක්ෂයේ මගේ නායක ගරු මනෝරන්ජන් මැතිතුමාත් මම ස්තූතිවන්ත වෙනවා. මොකද එතුමා නොහිටියනම් මේ ප්‍රාදේශීය සභාව මම නියෝජනය කරන්නේ නැහැ. ඒක තමයි සත්‍ය කතාව. එහෙනම් ගරු සභාපතිතුමනි, මට විශාල වගකීමක් තියෙනවා මම එක කොට්ඨාශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් නෙමෙයි. මම කොට්ඨාශ 18 ක් ම නියෝජනය කරනවා. සමහර කොට්ඨාශ තුළ සමාවෙන්න සමහර ග්‍රාම සේවා වසම් තුළ තියෙනකොට වගවත්ත, පඤ්ඤාගුල, ලබුගම, සිරිනිවාස වත්ත, කනම්පැල්ල, සාලාව, නෝර්ත්අම්බලම් වත්ත, ඒ වගේම අපේ තුන්නාන වත්ත, ආදී විශාල විහිදිච්ච ප්‍රදේශයක් ඒ ප්‍රදේශය තුළ දෙමළ ජනතාවගේ ඡන්ද 4200කට ඒක විශේෂයෙන් මතක් කරන්න ඕන. මෙතන කතාබහට ලක්වුණ මේ ලැයිස්තුවෙන් පත්වෙච්ච මන්ත්‍රීවරු බොහෝම හැල්ලුවට ලක්කරනවා ඒක බොහොම වැරදියි. අපිට ඒ අවස්ථාව දුන්නා නම් මං පෙන්නනවා මම කවුද කියලා. ඒක පැහැදිලිවම මං මේ අවස්ථාවේදී ඒක මතක් කරන්න ඕනෙ. ඒවගේම ඒ කතාකරපු සහෝදර මන්ත්‍රීවරුන් පෙන්නන්න ඕන මේක කලින් තිබුන නම්. ඒක මම විශේෂයෙන් මතක් කරන්න

ඕනෙ. මගෙන් විශාල සේවාවක් වතුවල ජනතාව බලාපොරොත්තු වෙනවා. ඒක හින්දා සභාපතිතුමා මම මතක් කරන්න ඕනෙ මොකද වතුකරයේ ජනතාව ගැන හොඳටම දන්නෙ මම ලැයිමේ ජීවත්වෙන නිසා. අපේ සීතාවක ප්‍රාදේශීය සභාවේ සමහර මන්ත්‍රීවරු වතුවල ජනතාවත් එක්ක බොහෝම සමඟියෙන් සහභාගීත්වයෙන් වැඩකරලා තියෙනවා, උදව් කරලා තියෙනවා. මේ අපිට අවස්ථාවක් ලබා දීලා තියෙනවා මේ අපේ පක්ෂ නායක ඇමතිතුමන් ඒකෙ උපරිම ප්‍රයෝජන ලබා ගන්න වැඩකරන්න මම කැප වෙනවයි කියන එක ඔබතුමාගේ සහයෝගයත් විශේෂයෙන් මේ සභාවේ ගරුත්වය ආරක්ෂා වෙන විධියට ඒ වගේම අපෙන් යෝජනා මාලාවක් ඉදිරියේදී ඉදිරිපත් වෙයි. ඒ සියලු මේ සභාවේ ගරුත්වය ආරක්ෂා වෙන විදියේ දෙමළ වතුකරයේ අහිංසක ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් කියන එක විශේෂයෙන් මම මතක් කරන්න ඕනෙ. අපේ මේ ජයග්‍රහණය වෙනුවෙන් මට මේ අවස්ථාව ලබාදුන්න විශේෂයෙන් මම මතක් කරන්න ඕනෙ අභ්‍යන්තර උදවු කරපු විශාල පිරිසක් ඉන්නවා. මෙතුමන්ලා සියලුදෙනාටත් මගේ මේ අවස්ථාව ලබාදුන් සියලු දෙනාට මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙමින් අනාගතයේදීත් මගේ යෝජනා මාලාවක් මේ සභාවේ ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා කියමින් නිහඩ වෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කුමුදුනි ජයවර්ධන මැතිතුමිය</u>

මූලාසනය හොබවන ගරු සභාපතිතුමනි, මගේ ප්‍රදේශය නියෝජනය කරමින් වැඩි ඡන්ද ප්‍රතිශතයක් ලබාගෙන උප සභාපතිකම ධූරයට පත්වුනු ගරු උප සභාපතිතුමනි, ආදරණීය ගරු මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, සභාවේ අනෙකුත් සාමාජිකයිනි, ඓතිහාසික සීතාවක පුරවරයේ ගුරුබැවිල බලකොටුවේ උඩ ඉඳගෙන ඓතිහාසික මංගල සභාවක් හයවන සභාව මං හිතන්නේ මංගල සභාවට මෙසේ කතා කරන්න ලැබීම අපේ වාසනාවක් මේ මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා ආදරණීය කාන්තාවන් වෙනුවෙන් 25% ක ප්‍රතිශතයක් මෙම සභාවට ලබා දෙන්න මුල් වුණ ඔවුන් උදෙසා ආසන 10 ක් අපිට ලබා දෙන්නට මුල් වෙච්ච ඔවුන් උදෙසා 2016 පළවන වගන්තියේ මගේ හිතේ පළවන ප්‍රකාශනය ඒ 25% ක කාන්තා ප්‍රතිශතයක් ලබාදීමෙන් බලන්න කොච්චර ලස්සනද කියලා වෙනදට වඩා පොඩි වෙනසක් නැද්ද කියලා ඔබතුමන්ලාට වෙහෙසකාරී මොහොතක හරි පොඩ්ඩක් ඒ වෙහෙස නිවාගන්න හොඳයි නේද. මේ කාන්තාවෝ කියලා ගෙදෙට්ට කොටුකරලා හිටපු දරුවන්ව හදන්න විතරක් වැඩ කරපු උයපන් පිහපන් කියලා කොටු කරපු මේ ඓතිහාසික ලංකාවේ මහා සේවයක් කරපු විහාර මහා දේවිය ගැන, තව අනුලා දේවිය, ලීලා දේවිය, මතක් කරලා බලන්න ඉතිහාසය නැවත ඒ වගේ යුගයකට අපිව කැන්දගෙන ආවට ඒ පනත් සම්මත කරපු ඒ පුද්ගලයින්ට අපේ ස්තුතිය. අනික එක්සත් ජාතික පක්ෂයේ කාන්තාවක් විදියට මගේ ගරු නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත්, අපේ පක්ෂයේ අනෙකුත් නායකයින්ටත් මේ සභාවේ සභාවේ විපක්ෂ නායක ඇතුළු හැමදෙනාටත් ඔබ හැමදෙනාටත් මම ස්තුතිවන්ත වෙනවා. මේ වගේ අවස්ථාවක් අපිට උදාවීම ගැන. විශේෂයෙන්ම මගේ ආසනයේ සංවිධායකතුමා මම නියෝජනය කරන බෝපේ කොට්ඨාශයේ හිටපු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී. ප්‍රේමරත්න මැතිතුමන් මේ වෙලාවේ මම මතක් කරනවා. අපේ කිසිම අඩුව තියෙනවද කියලා ඕගොල්ලන්ට ජේන. පත්වෙච්ච මන්ත්‍රීවරු කියලා නෑ නේද ඒ නිසා කරුණාකරලා අද ඔබ ඉඳලා ඔබ හැමදෙනාම පිළිගන්න ජන්දෙන් පත්වෙලා ආවත් පක්ෂයේ පත්කරපු මන්ත්‍රීවරුන් මන්ත්‍රීවරියන් වුනත් හැමදෙනාම මේ සභාවේ අපි හැමදෙනාම එකයි කියලා මට කියන්න දැන් විශේෂ දේවල් නැහැ. අපි ස්තුති කරන්න ඕනෙ ඒවගේම අපි හිතනවා අපිට ගරු සභාපතිතුමා හරහා බොහෝම ඒකාකාරී විදියට බෙදිලා යයි කියලා. ඒ බලාපොරොත්තුව අපේ තියෙනවා, අපේ ප්‍රදේශයට යමක් කරන්න අපිට පුළුවන් වෙයි කියලා අපි හිතනවා. ගරු අයෝම මන්ත්‍රීතුමා කිව්වා වගේ ඒ දුක පහ කරපු පාදුක්කේ සියලුම දුක් කන්දරාව පහ කරලා අපිට යහපතක් කරලා දෙයි කියලා හිතෙනවා. බෝපේ ප්‍රදේශය, අරුක්වත්ත ප්‍රදේශය මං හිතන්නේ අපේ ප්‍රදේශ ගණනාවක් දැන් අපිට ඔබගේ සහයෝගයෙන්

දියුණු කරන්න අවස්ථාව ලැබිලා තියෙනවා. ඒ ගැන අංගම්පිටිය, උග්ගල්ල ඉතින් අපේ ඉන්න මේ පොදුජන මේ අනෙකුත් පක්ෂයේ මන්ත්‍රීවරුන් ඒ සඳහා අපිට හොඳ සහයෝගයක් දෙයි කියලා බලාපොරොත්තු වෙනවා. සහයෝගයෙන් කටයුතු කරමු. ජයග්‍රහණය එතනයි. ඔබ දන්නවා ඔබ කියපු හැම කතාවකම තිබ්බව සිදුවීම් හොඳ සිතුවිලි සමහර වෙලාවට පුංචි පුංචි වෛරකාර හෝ වැරදි සිදුවෙලා තිබුනා. මං ධම්ම පදයේ පළවෙනි ගාථාව ඔබට මතක් කරනවා. මනෝ පුබ්බංගමා ධම්මා මනෝ සෙට්ටා මනෝමයා. මනසාචේ පසන්නේන භාසේතිවා කරෝතිවා. තතෝනං දුඛමං හෝති ඡායාව අනපායිනි තතෝනං දුක්ඛ මං හෝති තත්තංකෝ වහතෝ පදං අපේ ජනතාවට ජනතාව වෙනුවෙන් කැපවෙමු. ජනතාවට යමක් කරන්න ඉන්න පුද්ගලයෝ. අපි හොඳ යමක් කළොත් අපේ හෙවනැල්ල වගේ අපි කරා එයි. නැත්නම් හරකා පස්සේ යන කරත්ත රෝදය වගේ අපිටත් කැරකෙන්න වෙයි. ඒක තමයි ස්වභාව ධර්මය. ආගමෙත් ඕක කියනවා මුං වැපිරුවොත් මුං ලැබේ. තල වැපුරුවොත් තල ලැබේ. මේ කුරානයෙත් ඒ වගේ දේවල් තියෙනවාමං හිතන්නෙ භගවත් ගීතාවෙත් ඒ වගේ දේවල් තියෙනවා අපි පොඩ්ඩක් අපේ තියෙන අපි කරන්න ඕනේ යුතුකම වටහාගෙන කටයුතු කරමු. ඒක තමයි මගෙත් ඉල්ලීම ඔබ සැමටම සුබම සුබ අනාගතයක්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශම්ණි ශ්‍රීමාලි මැතිතුමිය</u>

ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා, විපක්ෂ නායකතුමා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, අපි දන්නා ආකාරයට සීතාවක කියන්නේ උගත් බුද්ධිමත් වියත් සමාජ තලයකට දීර්ඝ ඉතිහාසයක් තියෙන ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයේ මුල් පුරවැසියා වන ඔබතුමාට මම බොහෝම ගෞරව බහුමානයෙන් මගේ සුභාශිංසන එකතු කරනවා මේ අවස්ථාවේදී. ඒ වගේම තමයි මන්ත්‍රීකමෙන් කුළුදුල් සුවඳ විඳින මා බොහෝම වාසනාවන්ත මන්ත්‍රීවරියක් කියලා මම හිතනවා මොකද එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රී කණ්ඩායමේ ලබාලතම මන්ත්‍රීවරිය මං. මව්වරු හා පියවරු අතරේ වැඩිලා ඉන්න අද බොහෝම අත්දැකීම් ගන්න පුළුවන් පිරිසක් එක්ක ඉන්න මෙතනට එන්න පුළුවන් වෙච්ච එක ගැන මම බොහෝම සන්තෝස වෙනවා. ඊළඟ කාරණාව තමයි මේ අළුත් මැතිවරණ ක්‍රමයත් එක්ක අපිට ලැබුනේ අළුත් අත්දැකීමක් ඒ අළුත් අත්දැකීම ලබාගන්න අපිට හැකියාව ලැබුනෙ අපි බොහෝම පරිපූර්ණ වුනා. මේ කවුරුහරි හිතනවනම් මේ ලැයිස්තුවෙන් පත්වුන මන්ත්‍රීවරුන්ට ඒක බන්දේසියක තියලා ඔයා මේක අරන් ගිහිල්ලා ගන්න කියලා දුන්නා කියලා අන්න එතන ලොකු වැරදිමක් තියෙනවා. මම හිතනවා මේ ලැයිස්තුවෙන් පත්වෙච්ච මන්ත්‍රීවරුන් ඒ දේ ලබාගන්න ලොකු කැපවීමක් කළා කියන එක. ඊළඟ කාරණාව තමයි මේක පාර්ලිමේන්තුවේදී සියලුදෙනා ඒකච්ඡන්දයෙන් සම්මත කරපු දෙයක් පත්කළ මන්ත්‍රීවරුන් කියන එක. ඊළඟ කාරණාව තමයි අපේ ජ්‍යෙෂ්ඨ බොහෝ පිරිසක් මේ මැතිවරණයෙන් පරාජයට පත්වුනා. ඔවුන් ලැයිස්තුවෙන් මෙතෙන්ට ආවේ ගෙදර ඉන්න බැරිකමට නෙමෙයි. ඒ මැතිවරණ ක්‍රමයේ තිබුනා ඔවුන්ව මෙතෙන්ට ගේන්න පුළුවන් හැකියාවක්. කාටහරි ප්‍රශ්නයක් තියෙනවානම් ඒ සම්බන්ධයෙන් අපිට කියලා වැඩක් නෑ මැතිවරණ කොමසාරිස්තුමාට තමයි කියන්න ඕනෙ. වෛරය පතුරන්නවත් වෛරය ගැන කතා කරන්නවත් අපි සීතාවක ප්‍රාදේශීය සභාව යොදා ගන්නවා නම් ඒක අපි අපිටම කරගන්න ලොකු හානියක්. කාලයත් එක්ක මේ අවුරුදු හතර ගෙවිලා යයි. හැබැයි ඊට පස්සේ අපි තැන් තැන්වල හම්බවෙලා කතා කරන්න පුළුවන් මමත්වයෙන් තොරව යන්න අපිට හැකියාව ලැබුනොත් ඒක බොහෝම වටිනවා. ඊළඟ කාරණාව තමයි මම විශ්වාස කරනවා මට මේ ලැබිච්ච මන්ත්‍රී ධූරය මගේ උගත්කමට, මගේ හැකියාවට වගේම මං පෙර කරපු පිනක් මට පල දීලා මට මේක ලැබිලා තියෙනවා කියලා. මට මැතිවරණ ක්‍රමය අළුත් නෑ. මට මැතිවරණ අළුත් නෑ. මට ඡන්ද අළුත් නෑ. මොකද මගේ සීයා මේ රටේ හිටපු ඇමතිවරයෙක් විදියට මම බොහෝම සන්තෝස වෙනවා අද මම මෙතන ඉන්න එක ගැන. මොකද

මම පොඩිකාලේ ඉඳන් දැක්කෙ මැති ඇමතිවරු මම පොඩිකාලේ ඉඳන් දැක්කෙ ඡන්ද වටපිටාවක් ඒ නිසා මගේ සීයාගෙන් මට ලැබිච්ච අභාසය මගේ අප්පච්චිගෙන් අම්මාගෙන් ලැබිච්ච අභාසයත් එක්ක අද මම මේ මන්ත්‍රී අසුනෙ වාඩිවෙලා ඉන්නවා කියලා මම හිතනවා. ඒ වගේම තමයි මගේ ආදරණීය නායකයා රනිල් වික්‍රමසිංහ ගරු අග්‍රාමාත්‍යතුමා මේ අවස්ථාව දෙන්න ලොකු කැපවීමක් කළා මං වෙනුවෙන් ඒවගේම තමයි අපිට ඉන්නවා කියන දේ ඇහුම්කන් දෙන බිම් මට්ටමේ ජනතාව කියනදේ අහන මේ පක්ෂයේ නැගිටින තාරුණ්‍යයට අත දෙන නායකයෙක්. ගරු පළාත් සභා මන්ත්‍රී ලෙනාඩ් කරුණාරත්න මැතිතුමා එතුමාට ලොකු වගකීමක් තිබ්බා මේ මන්ත්‍රීවරු පත්කිරීමේදී එතුමා ඒ මන්ත්‍රීවරු පත්කිරීමේදී ලොකු වගකීමක් අරගෙන හරිදේ කරන්න එතුමා ක්‍රියා කළා කියලා මම හිතනවා. ඒ වගේම තමයි තව දෙයක් කියන්න ඕනෙ මං මෙතනට එන ගමනේදී මට ලොකු ශක්තියක් උනේ කොළඹ විශ්ව විද්‍යාලයේ මහචාර්ය ශ්‍රී සුමන හාමුදුරුවෝ ඒ ඥාතීත්වයත් එක්ක උන්වහන්සේ මට හැමවෙලාවෙම කිව්වෙ හැම වෙලේම ඉවසන්න කියලා ඇත්තටම අද ඉවසීමට ලොකු ප්‍රතිඵලයක් ලැබිලා තියෙනවා. මගේ අම්මා අකාලයේ මිය යාමත් සමඟ මගේ අප්පච්චි මං වෙනුවෙන් ලොකු කැපකිරීමක් කළා මාව මෙතනට ගෙන්න. හොරණ තක්ෂිලා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබලා නුගේගොඩ අනුලා විද්‍යාලයෙන් සහ කොළඹ මියුසියස් විද්‍යාලයෙන් ඉගෙනගෙන කැළණි විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යාවක් විධියට අද අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවය කරමින් මං හිතනවා මට හැකියාව ලැබෙයි කියලා ජනතාවට ලොකු දෙයක් කරන්න. ඊළඟ කාරණාව තමයි අපේ මිනිස්සු බලාගෙන ඉන්නවා මොකද්ද දූර්වල තැන එතනට ගහන්න කියලා. මම මන්ත්‍රීවරියක් කියලා පත් උනාට පස්සෙ මට බොහෝ මිනිස්සු මඩ ගැහුවා සමාජ ජාලා වෙබ් අඩවි හරහා නමුත් මම ඒ ගැන බොහෝම සන්තෝස වෙනවා මොකද ඵල ඇති රුකටයි ගල් ගහන්නෙ කියලා මම මගෙ හිත හදාගන්නවා. ඒවගේම තමයි යොවුන් පාර්ලිමේන්තුවේ දක්ෂතම කථිකයා ලෙස තුන් අවස්ථාවක් ලැබිච්ච එකම මන්ත්‍රීවරිය මම. මම සීතාවක ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්නේ දක්ෂතම කථිකයා වෙලා යොවුන් පාර්ලිමේන්තුවේ දී අයෝම සහෝදරයා මට කලින් යොවුන් පාර්ලිමේන්තුව නියෝජනය කරපු සහෝදරයෙක්. යෞවන සමාජයේ ලොකු දෙයක් උනා මට මෙතෙන්ට එනකොට. ඒ හැමදේමත් එක්ක මම මෙතෙන්ට ඇවිල්ලා අද මමඔබතුමා ඉස්සරහ කතා කරනකොට මංගල සභාවාරයේදී මෙතන ගොඩක් දේවල් කිව්වා. වෛරය පැතිරුනා මම නැහැ කියන්නෙ නෑ කාටවත්. අපි ජාති වාදය වර්ණ වාදය ආගම් වාදය අමතක කරලා කටයුතු කරමු. හොඳ ප්‍රාදේශීය සභාවක් නිර්මාණය කළොත් අන්න එතන ලොකු දෙයක් තියේවි කියලා මං හිතනවා. ඒ වගේම තමයි තව දෙයක් කියන්න ඕනෙ අපේ මහේෂ් අල්මේදා මැතිතුමා පවුලේ හිතවතෙක් විධියට මට එතුමත් එක්ක කිසිම සට්ටනයක් නෑ. අපේ ප්‍රභානි අල්මේදා මන්ත්‍රීතුමිය ප්‍රකාශයක් කළා ශ්‍රී ලංකාවේම ලබාලතම මන්ත්‍රීවරිය එතුමිය කියලා නමුත් මං ඒකට කිසිම දෙයක් කියන්නේ නෑ. ඔව් මම කිසිම දෙයක් කියන්නෙ නෑ ඔබතුමියට මේ වෙන කතාවක් පටන් ගන්නෙ. මම දැක්කා ඒ වගේම තමයි මම මාධ්‍ය හරහා යනවා අනුරාධපුරය නියෝජනය කරමින් නගර සභාවට පත්වුනේ පොහොට්ටුවේම මන්ත්‍රීවරියක් සීතාවක ප්‍රාදේශිය සභාවේ අපිට ලාබාලම මන්ත්‍රීවරියක් ඉන්න එක ගැන අපි සන්තෝස වෙනවා. මම කියන්න ගියේ ඒක මිසක් ඔබතුමියට අපහාසයක් නෙමෙයි. ඒවගේම තමයි දෙයක් කියන්න ඕනෙ අපි මෙතෙන්ට ඇවිල්ලා තියෙන්නෙ පක්ෂ වාදය වපුරන්න නෙමෙයි. ඒවගේම තමයි ඔබතුමා මංජුල මන්ත්‍රීවරයා ප්‍රකාශයක් කළා ඔබතුමා වෙනුවෙන් හත්දෙනෙක් හිටියා කියලා. ඔබතුමාගේ ඒ ප්‍රකාශයට පොඩි දෙයක් එකතු කරන්න ඕනෙ. අපි නෙමෙයි කියන්නෙ ඔබතුමා දිවුරුම් දෙන උත්සවයට හත්දෙනයි ආවෙ. අපි දන්නෙ එච්චරයි. අපි කතා කරන්නෙ ඒ ගැන මිසක් ඔබතුමා ගැන අපිට ප්‍රශ්නයක් මෙතන නෑ. අපි කියන්නෑ ඔබතුමාගේ 23 දෙනා ගැන ගැටළුවක් තියෙනවද කියලා. අපි කියන්නෙ ඔතුමාගේ දිවුරුම් දීමේ උත්සවයට හත්දෙනෙක් ආවම අපි හිතනවා ඔබතුමාගේ සට්ටනයක් තියෙනවා කියලා. අපි කියන්නෙ අපිට ජේන දේ. අපිට වෙන ප්‍රශ්නයක් අපිට නෑ මෙතන. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් මම ලොකු දෙයක් ඉල්ලනවා.

මොකද විපක්ෂය තුළ විස්සක් අපිටඉන්නවා. ආණ්ඩු පක්ෂය තුළ ඔබතුමාට 23 ක් ඉන්නවා. ඇත්ත බලය තියෙන්න ඔබතුමාට නමුත් සීතාවක ප්‍රාදේශීය සභාවේ හරි දේ කරන්න ඔබතුමා වෙනුවෙන් විපක්ෂයේ අපි සියල්ලම හිට ගන්නවා වගේම ඔබ වැරදි දෙයක් කරනවා නම් විපක්ෂයක් විදියට ඔබතුමාව ගෙදර යවන්නත් අපි ලෑස්තිවෙලා ඉන්නවා කියන එක අපි කියනවා.ඒක මේ ඡන්දෙදි ජයන්ත රණවක මැතිතුමා ප්‍රකාශ කළා පොල් ලෙල්ලට ඡන්දෙ දුන්න කියන කතාව කිව්වා කියලා මෙතෙනදි කියන්න ඕනෙ. ඒක කිව්වෙ මේ අපේ මහරගමදී තිබ්ච්ච මාධ්‍ය හමුවකදී බන්දුල ගුණවර්ධන මැතිතුමාගෙන් ඇහුවාම බයිසිකලය කොහොමද ජයග්‍රහණය කළේ කියලා එතුමා කිව්වා මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන් පොල් ලෙල්ලක් ඉල්ලුවත් දිනනවා කියලා. කිව්වෙ අපි නෙමෙයි එගොල්ලන්ගේ ප්‍රශ්නෙ 2500 න් ජීවත් වෙන්න පුළුවන් කියලා බන්දුල ගුණවර්ධන හිටපු අමාත්‍යතුමා.ඒ නිසා මම ඔබතුමාට කියනවා උගත් වියතුන් ඇති හොඳ සීතාවකක් බිහි කරන්න ඔබතුමාට වගේම අපි හැමෝටම ශක්තිය ධෛර්ය ලැබේවා කියා මම ප්‍රාර්ථනා කරනවා. ඔබ සැමට සුබ අළුත් අවුරුද්දක් වේවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්ද්‍රානි සෙනෙහෙලතා පද්මසීලි මැතිතුමිය.**</u>

ගරු සභාපතිතුමන් ඇතුළු ගරු සභාපතිතුමා, ගරු ලේකම්තුමා, ගරු මන්ත්‍රීවරුන් ඇතුළු සීතාවක ප්‍රාදේශීය සභා කාර්ය මණ්ඩලය ද පැමිණ සිටින මහත්වරුන්ද මාධ්‍ය වේදි මහත්වරුන් ඇතුළු පැමිණ සිටින මහත්ම මහත්මීන්ගෙන් අවසරයි. මමත් ඇත්තටම නවක මන්ත්‍රීවරියක් උනාට දේශපාලනයට නවක නෑ. මන්ත්‍රී ධූරයක් නොලැබුනත් මන්ත්‍රීවරයෙක්ගෙන් ඉටුවිය යුතු විශාල වැඩ කොටස් විශාල ප්‍රමාණයක් ගම වෙනුවන් මම කරලා තියෙනවා. ඒවගේම අවුරුදු 20 ක් එක්සත් ජාතික පක්ෂයේ ක්‍රියාකාරී සාමාජිකාවක් විදියට මේ ගමන ඉදිරියට යන්න ජයන්ත රණවක මැතිතුමා සභාපති ධූරය කාලය තුල ඉතා විශාල ප්‍රතිපාදන මඟින් මට විශාල සේවයක් කරලා තියෙනවා. ඒ සේවය හරහා මම දිගින් දිගටම මේ සමාජ සේවය කරගෙන යනකොට ගරු සරත් ෆොන්සේකා අමාත්‍යතුමත් එක්ක එතුමාගේ පක්ෂයෙනුත් පළාත් සභා ඉල්ලලා නැවතත් මට ප්‍රාදේශීය සභා ඉල්ලන්නට ගරු ලෙනාඩ් කරුණාරත්න මැතිතුමන් මට අවස්ථාව සලසා දුන්නා. ගරු සභාපතිතුමනි, 2500 ක් මාසෙකට කන්න දීපු ගරු ප්‍රේමදාස ජනාධිපතිතුමත් පරාජය වුනා. යුද්ධය නිමා කරපු නිමා කරන්නට ජනතාවට නායකත්වය දුන්නු හමුදාවට නායක්තය දුන්නු අපේ නායකයා මහින්ද රාජපක්ෂය මහත්තයාත් පරාජය කරා. ඒ වගේම මේ මැතිවරණයේදී අපි නොහිතපු විදියට මේ නායකත්වයේ සෙවනැල්ල පසුපස වලනය වෙමින් ප්‍රමුඛත්වය දෙමින් මේ රටේ කවදාවත් මැතිවරණ ඉතිහාසයේ නොතිබුනු පවතින රජයකට පිටින් ප්‍රාදේශීය සභාව ජයග්‍රහණය කළා. ඒ වගේම ඒ ආසන්න කාලයක් තුළ .. ජයග්‍රහණයෙන් උදම් අනාගෙන ගරු අග්‍රාමාත්‍යතුමන් අයින් කරන්නට විශ්වාස භංගයක් ගෙනල්ලා විශ්වාස භංගය අන්ත පරාජයට පත් උනා. මේවා හරි සරල සිද්ධි. දේශපාලනයේ සරල සිද්ධි. ඒක නිසා අර කියනවානේ අපේ සීයලා පිට ගිනි ගන්න එපා ගෙදර ගිනි පිටට දෙන්න එපා. ඒ නිසා මේවත් කැළණි ගඟේ පාවෙච්ච පොල්ලෙලි ගානට දාලා ඉතින් අපේ වෛරයක් නැහැ නමුත් අපි කැමතියි ඔබතුමාත් එක්ක එකට වැඩ කරන්න. ඔබතුමා දිවුරුම් දෙන වෙලාවේ හිටපු ගාන 10 යි කියලා අපි දන්නවා නම් අපි එනවා. තීරණ ගන්නකොට අපි අනිවාර්යයෙන්ම ඔබතුමත් එක්ක ඉන්නවා. අපිට ඉන්නවා හොඳ කණ්ඩායම් නායකයෙක් පල පුරුදු පලපුරුදු හොඳ නායකයක් ඉන්නවා ඒ නිසා ඔබතුමා හොඳ දෙයක් කරනවානම් අතින් අදිනවා කකුලෙන් අදින්නෙ නෑ. හැබැයි නරක දෙයක් කරනවානම් ඔබතුමාට අපි නැහැ. වැඩි දෙයක් කියන්න අවස්ථාවක් කරගන්නෙ නැහැ. අපේ යෝජනා ඉදිරියේ ගේන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි කියන්න ඕනෙ සාලාව වසම තමයි වාසනාවන්තම වසම. මොකද මන්ත්‍රීවරු 5 ක් ඉන්නවා. ඉතින් අපේ මන්ත්‍රීවරු පස්දෙනාට බන්දේසියෙ තියලා ප්‍රාදේශීය සභා මන්ත්‍රීකම ලැබුන් නෑ. මට උදවු කරපු. මට ඉතාමත් ළඟින් උදව් කරපු සහායකයින්ගේ ගෙවල් දොරවල් පවා

කැඩුවා. මම අපේක්ෂිකාවක් විදියට මට උදවු කරපු අයට පහර දුන්නා. මට ඕනෙ මේ බෙදිච්ච ගම නැවත එකතු කරන්න. වෛරයක් නෑ . මම මේ අවස්ථාවේ සියලු දෙනාටම සුබ අළුත්අවුරුද්දක් ප්‍රාර්ථනා කරමින් නිහඩ වෙනවා. ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මාලනී චන්ද්‍රලතා මැතිතුමිය</u>

ගරු සභාපතිතුමා ඇතුළු සහෝදර මන්ත්‍රී මණ්ඩලයෙන්ද ලේකම්තුමාගෙන්ද අවසරයි මගේ දේශපාලන ජීවිතය මා ආරම්භ කළේ අවුරුදු 13 දී ඒ වගේම මට ඕනේ උනා ප්‍රදේශයට සේවය කරන්න. නමුත් මම මන්ත්‍රීවරියක් නොවුනට මගේ ගමේ ආසන්නතම මම මන්ත්‍රීවරියක් වගේම වැඩ කොටසක් ඉෂ්ඨ සිද්ධ කරපු කාන්තාවක් ඒ වගේම මම බය නැතිව කියනවා මම පත්වෙන්නේ පත්කල මන්ත්‍රීවරියක් ලෙසයි මම එහෙම කියන්න කම්මැලි වෙන්නේ නෑ මොකද අපේ පක්ෂයේ අපේ ගරු මන්ත්‍රීතුමා සහ අපේ පක්ෂයේ ජොෂ්ඨයෝ ඒකමතිකව මාව පත්කල යුතුයි කියලා තීරණය කලා ඒ මා පක්ෂයට කරලා තියෙන සේවය නිසා මම මුලින්ම ගමේ ඡන්දෙ ඉල්ලා බල මණ්ඩල වලින් ඊට එහා ජොෂ්ඨ ස්ථාන වලින් මටත් පොඩි කාරණයක් කියන්න හිතෙනවා මොකද පත් කල මන්ත්‍රීවරුන් අවතක්සේරුවට ලක් කල නිසා මට මගේ පියාගේ මුණ පෙන්නලා මේ පුටුවට එන්න පුළුවන් කමක් ලැබුණෙත් නෑ මගේ මහත්තයාගේ මුණ පෙන්නලා මේ පුටුවට එන්න ලැබුනෙත් නෑ මගේම ධෛර්යයනේ මම අවුරුදු 13 ඉදලා මේ දේශපාලනයට අවතීරණය වෙලා මෙච්චර කාලයක් ආපු නිසා මට පක්ෂයෙන් සලකපු නිසා මම මේ තැනට ආවා කියන එක මම මේ සභාවට කියන්න ඕනේ මම මීන් ඉදිරියට මේ කතාව අයේ කියන්නේ නෑ අද කියන අවසාන දවස මම හිතනවා කාගේ හරි හිත රිදුනානම් ඒකටත් සමාවෙන්න නමුත් මෙතනින් එහාට පත්කල මන්ත්‍රීවරුන් අවතක්සේරු කිරිම නවත්වා ගැනීම සදහායි මම මෙසේ පාවිච්චි කළේ එහෙමනම් ගරු සභාපතිතුමනි අපි දේශපාලනේ ගැන කතා කිරිම මෙතනට අවශ්‍යා නෑ අපි අද පැමිණුනේ මේ මංගල සභා රැස්වීමටත් මෙතනදී ඇත්ත වශයෙන්ම මම සතුටු වෙනවා ඔබතුමා සභාපති ධූරයට පත් වීම සම්බන්ධයෙන් අපිට එදා පැමිණීමට නොහැකි වුණා මට නම් ඇත්තටම එදා ආරාධනාව ලැබුණේ නෑ ඒක ගෙදරට දීලා තිබුණේ නෑ කොහොම නමුත් ඒ නිසා ආවේ නැහැ කියමුකෝ ඊළඟ රැස්වීමට ආවේ නෑ ඔබතුමගේ එකට එන්නේ බැරිවුණ නිසා ඒ රැස්වීමට ආවෙත් නැහැ. ඒක ප්‍රශ්නයක් වෙන නිසා ඒකට ආවෙත් නෑ අද පැමිණුනා මා ඔබතුමාට අනිත් සියලු දෙනා මතක් කල පරිදි ඔබතුමා විසින් ගන්නා හොද සියලුම තීරණ වලට මගේ පක්ෂපාතීත්වය ලබා දෙන බවත් අසාධාරණ තීන්දුවක් ගන්නා විට එයට විරුද්ධ වන බවත් මම ප්‍රකාශ කරනවා ඒ වගේම මා පත්කල මන්ත්‍රීවරියක් හැටියට සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල එක්සත් ජාතික පක්ෂය හා පාක්ෂිකයෝ ආරක්ෂා කිරිම සහ ඒ අයගේ අවශ්‍යා කටයුතු හැකි පමණින් ඉෂ්ඨ සිද්ධ කරන හැටියටත් මා මේ අවස්ථාවේ මතක් කරමින් සියලු දෙනාට සුභ අලුත් අවුරුද්ක් වේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඩ වෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සාගරිකා රූපසිංහ මැතිතුමිය</u>

ගරු සභාපතිතුමාගෙන්ද , ගරු උප සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රී මණ්ඩලයෙන්ද , ලේකම්තුමා ඇතුලු කාර්ය මණ්ඩලයෙන්ද අවසරයි සියළු දෙනාටම සුභ අළුත් අවුරුද්දක් වේවා. මුලින්ම මේ දේශපාලනයට මට යෝධ ශක්තියක් වුණ මගේ පියාණන් තමයි මතක් කරන්න ඔනේ එතුමා තමයි මේ සීතාවක ප්‍රාදේශීය සභාවේ හිටපු ගරු උප සභාපති ආනන්ද රූපසිංහ මැතිතුමා ඇත්තටම මම මේ පෙනී සිටිමක් විතරයි කරන්නේ එතුමා තමයි මගේ පස්සෙන් ඉදගෙන සියලුම දේ කරන්නේ මගේ විවාහ මංගල්‍යයත් එක්කමය මේ ඡන්ද කටයුතුත් තිබුණේ මගේ සියලුම දේ එතුමා තමයි කළේ ඒ වුණාට නීතියෙන් තාත්තාට ඡන්දේ ඉල්ලන්න බැරි වුණා ක්ෂේත්‍ර නිලධාරීන්ට

ජන්දේ ඉල්ලන්න බැරි වුනා ඒ වගේම ප්‍රචාරණ කටයුතු වලට සහභාගී වෙන්නත් බැරි වුණා ඒ නිසා තාත්තා මගේ ප්‍රචාරණ කටයුතු වලට සහභාගී වුණේ නෑ ඒ වෙලාවේ මගේ ඒ කටයුතු වලට සහාය වුණේ මගේ ස්වාමිපුරුෂයා එතුමාටත් මම මේ වෙලාවේ මගේ ගෞරවනීය ස්තූතිය පුද කරනවා. ඒ වගේම මගේ මැණියන්ටත් නැවත වතාවක් මගේ පියාණන්ටත් මගේ ගෞරවණීය ස්තූතිය පුද කරනවා. ඒ වගේම මගේ ග්‍රාමසේවා වසමේ සාලාව කොට්ඨාශ අංක 05 කොට්ඨාශය සාලාව, මුරුතගම, පහල කොස්ගම බටහිර , ඒ ප්‍රදේශයේ මට ඡන්දය ලබාදුන් සියලු දෙනාටමත් මා සමග එකට අත්බැදගෙන හිටපු විශාල පිරිසක් හිටිය ඒ සියලු දෙනාටත් මේ වෙලාවේ මගේ ස්තූතිය පුද කරනවා. තවද කාන්තා නියෝජනය සදහා මාව එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රී ධුර අපේක්ෂක ලැයිස්තුවට නම් කරපු  ශ්‍රී ලංකා නිදහස් පක්ෂ අවිස්සාවේල්ල ආසන සංවිධායක ගරු සුමිත් විජයමුනි සොයිසා මැතිතුමාටත්, බස්නාහිර පලාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමාටත්, පළාත් සභා හා පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍ය ෆයිසර් මුස්තාපා මැතිතුමාටත්, එක්සත් ජනතා නිදහස් සංධානයේ මහලේකම් ගරු අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමාටත්, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත් මාගේ ගෞරවණීය ස්තූතිය පුද කරනවා. තවද මගේ පක්ෂයෙන් තරග කරපු සියළුම අපේක්ෂක අපේක්ෂිකාවන්ටත් මාගේ ගෞරවණීය ස්තූතිය මේ අවස්ථාවේදී පුද කරනවා.  මොකද ඒ අය නිසා තමයි අද අපි තුන්දෙනා මෙතන ඉන්නේ  ඔවුන්ගේ කැපවීම නිසා තමයි අපි අද මෙතන ඉන්නේ ඒ හැම දෙනාටමත් මාගේ ස්තුතිය පුද කරනවා . මේ දේශපාලනයට මම නම් එන්න හීනෙකින්වත් හිතාගෙන හිටියේ නෑ මොකද අපේ තාත්තා දේශපාලනය කරද්දි පවුලෙන් ඈත් වෙලා හිටියේ අපෙන් ඈත්වෙලා හිටියේ අපිත් එක්ක පන්සලකටවත් යන්න අවේ නෑ ඒ තරම් ජනතාවත් එක්ක තමයි හිටියේ ඉතිං මගේ අම්මත් මට කිව්වේ ඔයානම් ඡන්දේ ඉල්ලන්න එපා දුවේ කියලා කිව්වේ ඒ වුනාට එහෙම තිබියදි පොඩි සිදුවීමක් වුණා මුහුණු පොතේ දැන්වීමක් පල කරලා තිබුණා දිට්ය ධම්ම වේදණීය කර්මය පලදුන්න ද කියලා මට දැන් කියන්න තියෙන්නේ ඒ කෙනාට ඒ තත්වය පල දීලා ද කියලා මොකද අද මෙතන එතුමා නම් පේන්න නෑ නමුත් අද මගේ තාත්තාව නියෝජනය කරන්න මම අද මෙතන ඉන්නවා ඒ වෙලාවේ මට හිතුනා මගේ තාත්තා වෙනුවෙන් මම මොනවා හරි දෙයක් කරන්න ඕනේ කියලා ඒක තමයි මට ශක්තියක් වුනේ එතුමාගේ ඒ දැන්වීම තමයි මට ලොකු ශක්තියක් වුණේ නැත්තම් මම සාමාන්‍යයෙන් පැත්තකට වෙලා ඉන්න කෙනෙක් වැඩි තකා බහක් නෑ තාත්තත් එක්ක ඡන්ද කටයුතු වලට ගිහින් නෑ කොහෙවත් ඉතිං මේ නිසා මම හිනෙකින් වත් හිතාගෙන හිටිය නෑ ඒ වුණාට ඒක මට  ශක්තියක් වුණා ඒ නිසා මම ඒ සහෝදරයාටත් මගේ හදපිරි ස්තුතිය මේ අවස්ථාවේ පුදකරනවා. ඇත්තටම මෙතන ඉන්නවා ජොෂ්ඨයො අපි ඔවුන්ට ගරු කල යුතුයි ඒ අයගේ අවවාද අනුශාසනා මැද තමයි අනිවාර්යයෙන්ම අපි මේ ගමන් යන්න ඕනේ මොකද එක එක වචන අල්ලගෙන දැන් කතා කරනවා ඇත්තටම අද රූපවාහිනිය බැලුමත් ගුවන් විදුලියෙන් ඇහෙන්නේත්  පත්තර වල යන්නෙත් ඔය දේමනේ එක එක අයගේ වචන අල්ලගෙන කතා කරන එක ඒ වුණාට ඇත්තටම අපි අද මෙතනට ඇවිල්ලා ඉන්න ජනතාවට සේවය කරන්නනේ ඉතින් අපි එක එක්කෙනාගේ වචන අල්ලගෙන කතා කරන්නේ නැතුව අපි එක එක පක්ෂ වලින් මෙතනට ආවත් දැන් අපි එක පවුලක් මම දකින්නේ ඉතින් එක පවුලක් විදියට ඉදගෙන අපි අපේ  ජනතාවට සේවය කරමුයි කියමින් මම මගේ කතාව අවසාන කරනවා . ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඥාන ප්‍රකාසම් ෆ්‍රැන්සිස් මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, ගරු ලේකම්තුමනි ,මාධ්‍යවේදී මහත්වරු පැමිණ සිටින සියළු දෙනාගෙන්ම අවසරයි. මම අංක 08 වේරගොල්ල කොට්ඨාශයෙන් පත් වු මන්ත්‍රීවරයෙක් මම සතුටට පත් වෙනවා ප්‍රාදේශීය සභා ඉතිහාසයේ දෙමළ මන්ත්‍රීවරයෙක් හැටියට ප්‍රථම අවස්ථාව ලැබීම සම්බන්ධයෙන් මම සන්තෝෂ වෙනවා තවද අපේ පක්ෂයට ලැබුණේ

ලැයිස්තුවෙන් තුන්දෙනයි ඒ තුන්දෙනාගෙන් දෙන්නෙක් ඉදිරිපත් කලාට පස්සේ විශේෂයෙන් අපේ ගරු යසරු මන්ත්‍රීතුමන් , එමෙන්ම ගරු සාගරිකා මන්ත්‍රී තුමියත් ඉදිරිපත් කලාට පස්සේ තව එකක් තිබුණා. ඒ එකටත් ලොකු තරගයක් තිබුණා නමුත් දෙමල නියෝජනයක් අවශයයි කියන නිගමනයට එළඹුනා. එහිදි පක්ෂයේ සභාපතිතුමා හා ලේකම්තුමා එමෙන්ම අවිස්සාවේල්ල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකතුමා ගරු සුමිත් විජයමුනි සොයිසා මැතිතුමා දීර්ඝ සාකච්ඡාවක් කරලා මට මේ මන්ත්‍රීධූරය ලබාදීම පිළිබඳව මම පළමුවෙන් පක්ෂයටත් මෙතුමාටත් මගේ ස්තුතිය පුදකර සිටිනවා. එමෙන්ම මට මේ මන්ත්‍රී ධූරය ලැබීමට ඉතා බෙහෙවින් උපකාර කළ අපේ ප්‍රදේශයේ කෝවිලේ ගරු ස්වාමිතුමා එමෙන්ම පන්සලේ ස්වාමීන්වහන්සේ එමෙන්ම ක්‍රිස්තියානි දේවස්ථානයේ ගරු පියතුමන් ඇතුළු ප්‍රදේශයේ සිංහල දෙමළ සියලුදෙනා මට බෙහෙවින් උදවු කළා. විශේෂයෙන් මතක් කළ යුතුයි මම කැපවීමෙන් ගොඩක් සේවයක් කරපු නිසා තමයි මම මෙතෙන්ට ආවේ. ප්‍රාදේශීය සභාවේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ වැඩිම ප්‍රතිශතයක් ලබාගත්තෙ. තවද ගොඩාක් අපේ වතුකරයේ ජනතාව සීතාවක ප්‍රාදේශීය සභාවේ වතු 15 ක් තියෙනවා. ඒ වතු පහළවට ඡන්ද ව්‍යාපාර ගියා. නමුත් වතුකරයේ ජනතාව ඡන්දෙ කාලෙට පමණක් පැමිණෙනවා අනිත් කාලෙට කවුරුවත් එන්නෙ නෑ පොරොන්දු දීලා යනවා කියලා නමුත් එවැනි දෙයක් ඉස්සරහට සිදුවෙන්නෙ නැති වෙයි කියලා මම හිතනවා. ඒත් ප්‍රාදේශීය සභාවේ සියලු වතු පාලනය වෙන පරිදි සිදුවිය යුතුයි කියලා මම අද ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. තවද මම ඇත්තටම දේශපාලනයට එන්න බලාපොරොත්තු උනේ නෑ. ඔබතුමා දන්නවත් ඇති ඔබතුමා හොඳින් අඳුරනවා කලින් වතාවන් දෙකකදී මට කතා කළත් මම ආවේ නෑ. මොකද මගේ දරුවන් බිරිඳ අකමැති නිසා. මේ ගමන ප්‍රදේශවාසීන්ගේ හා අනෙකුත් අයගේ ඉල්ලීම පිටයි මම මේ ඉදිරිපත් වුනේ. ඉතින් මට ඒකෙන් ජයග්‍රහණය ලැබුණා. ඒ හින්දා ස්තුතිවන්ත විය යුතුයි. අපේ ගරු අරුණ දිවිගල්ල මන්ත්‍රීතුමා පැවසුවා ඇත්තෙන්ම මම උදවු කළා කියලා. මම සතුටට පත්වෙනවා. ස්තුතියි. හේතුව උනේ මොකද අපේ කොට්ඨාශයේ සම්පූර්ණ ඡන්ද තියෙන්නේ 2590 යි. ඒත් ප්‍රකාශිත ඡන්ද උනේ 1808 යි. ඉතින් වැඩිපුරම 935 ක් තියෙන්නේ දෙමළ ජනතාවගේ ඡන්ද කොයි පැත්තටද ඡන්දෙ දෙන්නෙ කියලා ඔබතුමාලා දන්නවා. මම සතුටට පත්වෙනවා වේරගොල්ල කොට්ඨාසෙට මන්ත්‍රීවරුන් දෙන්නෙක් ඉන්නවා. දේශපාලනය කරද්දිත් අරුණ පී දිවිගල්ල මැතිතුමා මාත් එක්ක හුඟක් හිතවත්. එතුමා මාව මතක් කිරීම පිළිබඳව බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. තවද ඉදිරි කාලයේදීත් මගේ ප්‍රදේශයට සේවාවක් මගෙන් සිදුවිය යුතුයි. තව විශේෂ ඉල්ලීමක් තියෙනවා මට මතක් කිරීමට මගේ භාෂාවෙන් මට සුබ පතන්නට අවසර ඉල්ලා හිටිනවා. සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වන්දනා සූරියආරච්චි මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්ම මහත්මියනි, මාධ්‍යවේදී හිතවත් මහත්වරුනි, සීතාවක ප්‍රාදේශීය සභාවේ හයවෙනි සභා වාරය අවස්ථාව ඒ නිසා මේ වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් අදහසක් පලකිරීමට අවස්ථාව ලබා දී ගැන ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම මේ මැතිවරණයේදී වෙනස් දේශපාලන මතයක් හා ස්ථාවරයක් වෙනුවෙන් අවිස්සාවේල්ල සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොට්ඨාශ 26 තුළ ජනතා විමුක්ති පෙරමුණට ඡන්දය ලබාදුන් ජනතාවට ස්තුතිය පුද කිරීමටත් සභාව මෙය අවස්ථාවක් කරගන්නවා. විශේෂයෙන්ම අපි දන්නවා අද මේ පළාත් පාලන මැතිවරණ ක්‍රමය පිළිබඳව මේ සභාවෙන් සාකච්ඡා උනා. ඒ වගේම මේ ඡන්ද ප්‍රතිඵලයෙන් පස්සෙ අපේ රටේ දේශපාලන නායකයින් ඒ වගේම ආණ්ඩු පක්ෂයේ උදවිය ඒකාබද්ධ විපක්ෂයේ අය විවිධ මැති ඇමතිවරු නායකයින් මෙම මැතිවරණ ක්‍රමය හා මෙහි අවසන් ප්‍රතිඵලය පිළිබඳව විවිධ අදහස් දැරුවා. නමුත් අපි ජනතා විමුක්ති පෙරමුණ විදියට අපි දන්නවා මේ එදා ගයාන් දුමින්ද මන්ත්‍රීතුමා ඔහුගේ අදහස් පළකළා.

එතුමන් කිව්වා මේ පළාත් පාලන මැතිවරණ වෙනස කොට්ඨාශ ක්‍රමයට අදාල නව පනත මුලින්ම සකස් කළේ දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා ඇතුළු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා ඒ පනත ඇතුලෙ වෙච්ච අසාධාරණය ගයාන් දුමින්ද මන්ත්‍රීතුමාත් පැහැදිලි කළා. ඒ වගේම ජනතා විමුක්ති පෙරමුණේ අපි ඉතා පැහැදිලිව ඒ තිබ්ච්ච අසාධාරණ ප්‍රතිශතාත්මක ක්‍රමය ඇතුලේ එදා දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා ඇතුළු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා සකස් කරලා සෙසු බලය තියෙන ආණ්ඩු පක්ෂය ශක්තිමත් දේශපාලන බලයක් ලබා ගැනීමටත් සෙසු දේශපාලන පක්ෂවල මතයන් හා නියෝජකත්වය නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ඩෝසර් කරලා යන්න සකස් කරපු ඒ පළාත් පාලන මැතිවරණ පනත පසුගිය වසර තුන ඇතුලත වෙනස්කම් සිදුකරලා ඒ වෙනස්කම් වලට අදාල ක්‍රියාකාරී නායකත්වය හා දායකත්වය අපේ පක්ෂය නියෝජනය කරන පාර්ලිමේන්තුවේ අපේ පක්ෂ නායක අනුර දිසානායක සහෝදරයා ප්‍රමුඛ පක්ෂයේ අපේ පාර්ලිමේන්තුව නියෝජනය කරන අනෙකුත් පක්ෂවල මන්ත්‍රීවරුන් පක්ෂ නායකවරුන් සමඟ සම්බන්ධ වෙලා තමයි මේ නව පළාත් පාලන පනත පාර්ලිමේන්තුව තුළ සම්මත උනේ. ඒ නිසා අපි පක්ෂයක් විදියට මේ පනතට එකඟයි අපි අත්දෙකම උස්සලා කියනවා ඒකට හේතුව තමයි මෙහි නියෝජනයට වැඩි ප්‍රජාතන්ත්‍රවාදී අවස්ථාව තියෙන්නෙ. ඒ වගේම කාන්තා නියෝජනය මෙතෙක් මැතිවරණ ක්‍රියාදාමයන් වෙනස් කරලා නියෝජකත්වය වෙනස් කරලා කරගන්න පුළුවන් මේ පනත තුළ අපි දැක්ක නිසා තමයි මේ පනතට අපි එදා පක්ෂයක් විදියට ඡන්දෙ දුන්නෙ. පාර්ලිමේන්තුවේදී ඒ නිසා මේ මොහොතේ ඒ පනතේ ප්‍රතිඵලයක් විදියට මේ සභාව නියෝජනය කරන්න අද ජනතා විමුක්ති පෙරමුණේ අපිටත් වැඩි අවස්ථාවක් නිර්මාණය වෙලා තියෙනවා. අනිත් පක්ෂවලටත් ඒ අවස්ථාව තියෙනවා. ඉතින් ඒ නිසා අපි මේ පනත පිළිබඳව මේ පනතේ අවසන් ප්‍රතිඵලය පිළිබඳවත් කිසිඳු ගැටළුවක් අපිට නෑ. ඒ වගේම අපි බලාපොරොත්තු වෙනවා ඉදිරියේදී යළිත් මැතිවරණවලදී මෙම ප්‍රතිඵලය විකෘතියක් ලෙස දකිමින් ඇති වෙච්ච තත්වයන් ඒ නිසා පක්ෂයක් විදියට දකිනවා මේ ක්‍රියාවලිය ඇතුලෙ අවසන් ප්‍රතිඵලයත් එක්ක මේ මැතිවරණ ක්‍රමයේ තියෙන කාරණාව පිළිබඳව සංසන්දනය කරන එක වැරදියි. ඒක වෙනත් තත්වයක් ඒකට ආණ්ඩුවත් වගකිව යුතුයි අවසන් ප්‍රතිඵලයට අනෙකුත් පාර්ශවත් වගකිව යුතුයි. ඒ පනතේ තියෙන වාසිදායක තත්වයන් පිළිබඳවත් අපි බලාපොරොත්තු වෙනවා මේ සභාව නියෝජනය කරමින් වැඩි ප්‍රතිලාභයක් වැඩි සහන වැඩි මැදිහත්වීමක් ලැබ්ච්ච මේ අවස්ථාවෙන් උදාකරලා දෙන්න. ඉතින් ඒ නිසා මේ මොහොතේ ඒ එක්කම මේ සභාව පිළිබඳ යම් අදහසක් එකතු කරනවා. විශේෂයෙන්ම අද මෙතන අදහස් පලකරද්දී පාලක පක්ෂය නියෝජනය කරන පොදුජන පෙරමුණ මන්ත්‍රීවරු 23 කුත් ඒ වගේම විපක්ෂයේ මන්ත්‍රීවරු 20 ක් ආදී වශයෙන් තියෙන්නෙ. එක්සත් ජාතික පක්ෂයට 13 කුත් එක්සත් ජනතා නිදහස් සන්ධානයට 3කුත් ජනතා විමුක්ති පෙරමුණට 03 කුත්, ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පක්ෂයට 1කුත් ආදී වශයෙන් ඒ නිසා අපි සභාව තුළ බලාපොරොත්තු වෙනවා අපි අපේ පක්ෂ අනන්‍යතාවය හා ප්‍රතිපත්ති රැකගනිමින් ඒවා ආරක්ෂා කරගනිමින් වඩා නිවැරදි මහජන සේවාවක් මේ සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවට ලබාදෙන්න අවශ්‍ය කරන දායකත්වය ලබාදෙන්න. ඒ නිසා පක්ෂයක් ලෙස අපේ මන්ත්‍රී කණ්ඩායම ඒකමතිකව තීරණයක ඉන්නවා මේ සභාව තුළ වඩා නිවැරදි ජනතා සේවයක් සාධාරණ යෝජනා වලට ප්‍රතිපත්තිවලට ඒ වගේම වැඩපිළිවෙලවල් වලට වඩා නිවැරදි අවංක දායකත්වයක් සහයෝගයක් ලබාදෙන්න. ඒ වගේම මේ කොට්ඨාශ 26 ජීවත්වෙන ඒ ජනතාවට බදු ගෙවන වරිපනම් ගෙවන ඒ වගේම විවිධ අවශ්‍යතා හා පහසුකම් අපේක්ෂා කරන පොදුවේ මේ කොට්ඨාශ 26 තුළ ජීවත්වෙන ජනතාවට අවශ්‍ය කරන ජනතාවට හානිදායක හෝ වෙන අනිකුත් අහිතකර යෝජනා හා ප්‍රතිපත්ති වලට ඊට එරෙහිව කටයුතු කරන්නත් පක්ෂයක් ලෙස අපේ මන්ත්‍රී කණ්ඩායම කටයුතු කරනවා කියන අදහස මේ මොහොතේ අපි ඉදිරිපත් කරන්න කැමතියි. ඒ වගේම මේ වෙලාවේ අපි මේ සභාව නියෝජනය කරන මේක මංගල සභා වාරය මේ අදහස ඉදිරිපත් කළ යුතුව තියෙනවා. අපි මේ සභා බල ප්‍රදේශයේදී මැතිවරණ ව්‍යාපාරය ඇතුලේ මුහුණ දීපු අත්දැකීම් ගණනාවක් තියෙනවා. අර කිව්වා වගේ මේ මැතිවරණ ක්‍රියාදාමය ඇතුලේ කොට්ඨාශ මට්ටමෙන් 60%

කුත් සමානුපාතික ලැයිස්තුවෙන් පත්කළ මන්ත්‍රීවරුන් 21 ක් 40 ක් ආදී වශයෙන් මේ නියෝජනය ඇතුලේ අපි මේ සියලුදෙනාම මේ 43 ම අපි විශ්වාස කරන්නේ මහජන ඡන්දයෙන් තමන්ගේ දේශපාලන මතයන් නියෝජනය කරමින් මේ සභාව නියෝජනය කරන ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් විදයට අපි දකිනවා. ඒ නිසා පත්කළ කොට්ඨාශ ආදී වශයෙන් අපිට භේදයක් නෑ. ඒ වගේම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු 3 දෙනා කොට්ඨාශ 26 තුළම අපිට ඡන්දෙ දීපු නොදීපු සියලුදෙනාගේම යහපත වෙනුවෙන් සුබ සිද්ධිය වෙනුවෙන් ක්‍රියාකරන්න අපි පක්ෂයක් ලෙස ඉටුකරන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා අපිට කොට්ඨාශ අදාල නෑ, අපි ආසනයේ බල ප්‍රදේශ තුළම කොට්ඨාශ 26 තුළම ජනතා විමුක්ති පෙරමුණේ නියෝජනය ඒ සලකුණ වැඩ පිළිවෙල, ප්‍රතිපත්තිය, ඒ දැක්ම සමාජගත කිරීම සඳහා අවශ්‍ය වැඩකරන දේශපාලන නායකත්වය ක්‍රියාකාරීත්වය සහ අනෙකුත් කටයුතුත් එක්ක සම්බන්ධ කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ නිසා නව අදහසක් ඉදිරිපත් කළයුතුව තියෙනවා මම අද මේ ප්‍රදේශයේ ජනතාව මුහුණ දීලා තියෙන ප්‍රශ්න ගැටළු දැකලා තියෙනවා. එක පැත්තකින් කොට්ඨාශ 26 ම අපි පහුගිය මැතිවරණයේ යද්දි ඒ දැකපු කාරණා තියෙනවා.  මංමාවත් පිළිබඳ ගැටලු ජනතාවට තියෙනවා. ඒ වගේම මහජන සෞඛ්‍ය ගැටලු තියෙනවා. ඒ විතරක් නෙමෙයි දරුවන්ගේ අධ්‍යාපනය පෝෂණය පිළිබඳ ගැටලු ජනතාවට තියෙනවා. ඒ වගේම සමස්ත සංවර්ධනය පිළිබඳ ගැටලු ජනතාවට තියෙනවා. ඒ වගේම අපි දකිනවා අද කැළණි ගග මේ සීතාවක ප්‍රදේශයේ අපිට බලපාන බරපතල ප්‍රශ්නයක් ලෙස තියෙනවා. අද අපි දන්නවා කැළණි ගඟ ඉතාම බරපතල ලෙස ගැටලුවකට මුහුණපාලා තියෙනවා ඒ නිසා ජලය අපවිත්‍ර වෙලා පරිහරණයට නුසුදුසු මට්ටමේ තත්වයකට අද පත්වෙලා තියෙනවා. ඒ නිසා විවිධ සංවිධාන කැළණි ගඟ, ගං මිටියාවත, සුරැකීමේ ජාතික පදනම ලෙස එහි අනුශාසකවරයෙක් විදියටත් අපි අද කැළණි ගඟ පිළිබඳ ප්‍රශ්නට මැදිහත් වෙලා ඉන්නවා. ඒ නිසා අද කැළණි ගඟේ ජලය පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා. ඒ විතරක් නෙමෙයි අද බෝපේ පිටුම්පේ ඒ වගේම දිද්දෙණිය, ඒ ආදී වශයෙන් විශාල පාරිසරික ප්‍රශ්න ගල්වලවල් පිළිබඳ ප්‍රශ්න මස්කඩ පිළිබඳ ප්‍රශ්න බරපතල පාරිසරික ගැටලු රාශියක් තියෙනවා. ඒ නිසා මේ ආදී වශයෙන් විතරක් නෙමෙයි මේ අද සාලාව කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විදියටත් ඉතාම පැහැදිලිව අපි දන්නවා යුද්ධයක් සාලාවේ නැති උනාට සාලාව යුධ අවි ගබඩාව පිපිරිලා අවුරුදු 2 කට ආසන්න කාලයක් වෙනවා. සාලාව අවි ගබඩාව පිපිරීමෙන් විපතට පත්වෙච්ච ජනතාවට ව්‍යාපාරික ජනතාවට අවශ්‍ය කරන නිවැරදි රාජ්‍ය මැදිහත්වීම තාම ඉටුවෙලා නෑ. ඒ නිසා ඒ ගැටලු සාලාව ජනතාවට තියෙනවා. ඒ නිසා මේ ආදී වශයෙන් විශාල ගැටලු ගණනාවක් ඉස්සරහ තමයි මේ හයවන සැසිවාරය තියාගෙන අවුරුදු 4 ක් අපි ඉස්සරහට යන්න තියෙන්නේ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා ජනතා විමුක්ති පෙරමුණේ නායකයා විදියටත් මන්ත්‍රී කණ්ඩායම විදියටත් ඉදිරි වසර 4 ඇතුළත අපි අපේ පාර්ශවයේ මෙන්න මේ ගැටලු පිළිබඳව මැදිහත්වෙලා ජනතාවට අවශ්‍ය කරන ඒ කටයුතු ටිකට මැදිහත් වෙන්න අද මේ සභාවෙදි සභාගත කළා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික බැංකු ප්‍රකාශන 2018 ජනවාරි. ඒ ප්‍රකාශයේ ලැබීම් පිළිබඳ විස්තරයේ බැලුවම අපිට වැඩිපුර ලැබීම් ලැබෙන්නේ වරිපනම් සහ බදු ආදායමෙන්. මේ වෙනකොට අපි දන්නවා සාලාව කොට්ඨාශයේ පවුල් මැතිවරණ ව්‍යාපාරයට මැදිහත් වෙද්දි ආනන්දගම ජීවත්වෙන පර්චස් 10 ඉඩමක් සහිත නිවසක් සහිත ජීවත්වෙන ජනතාව අද ඕගොල්ලො සභාවට යැව්වත් මෙච්චර කාලයක් අපි මන්ත්‍රීවරු පත්කරලා සභාවට යවලා තියෙනවා අඩුගානේ ඕගොල්ලො සභාවට ගියෝතින් අපි හැමදාම වරිපනම් ගෙවනවා සභාවට පෝලිමේ ඉඳලා. අපේ කුණු ටික ගෙනියන්න කුණු ට්‍රැක්ටරය එන්නෙ නෑ ආනන්දගමට. මේ ආදී වශයෙන් ජනතාවට ප්‍රශ්න තියෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා අද වරිපනම් හා බදු වැඩි ආදායමක් එකතු කරන ඒ බදු ගෙවන හා වරිපනම් ගෙවන ජනතාවගේ ගැටලු වඩා නිවැරදිව හොයා බලලා මේ සභාව විසින් සාධාරණ විසඳුම් හා මැදිහත්වීම් ඉදිරියේදී සිදුකරන්න. ඒ නිසා මෙවැනි ගැටලු ගණනාවක් සහිතව තමයි අද අපිට මේ සභා වාරයේ ඉස්සරහට යන්න වෙලා තියෙන්නේ. ඒ නිසා අපි මුහුණ දීලා තියෙන අපේ බල ප්‍රදේශයේ කොට්ඨාශ 26 ජනතාව මුහුණ දී තියෙන මේ

ගැටළු පිළිබඳව මැදිහත් වීම් කරන්න අපි පක්ෂයක් ලෙස කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේම අපි විශ්වාස කරනවා මේ සභාව තුළ සියලුම පක්ෂ නියෝජනය කරන සභාපතිතුමා ප්‍රමුඛ උපසභාපතිතුමා ප්‍රමුඛ සියලුම මන්ත්‍රී කණ්ඩායම් මේ ජනතා ගැටලුවලට වඩා නිවැරදි විසඳුම් ලබාදීම සඳහා අපි සභා මණ්ඩලය ලෙස එකසේ ක්‍රියාකරන්න, සද්භාවයෙන් අවංකව කටයුතු කරන්න ඔබ කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා. ඒ විශ්වාසය මත තමයි වඩා නිවැරදි විසඳුම් වඩා නිවැරදි යෝජනා හා සැලසුම් වලට පක්ෂව ඒ වගේම එසේ නොවන ඒවාට විපක්ෂවත් කටයුතු කරන්න අපි පක්ෂයක් ලෙස බලාපොරොත්තු වෙනවා ඉදිරි කාලසීමාව ඇතුළත. ඒ වගේම පුංචි කාරණාවක් කිවයුතුව තියෙනවා. අද මේ සභාව ඇතුලේ කතාබහට ලක්වුණා විශේෂයෙන් තමතමන්ගේ විවිධ පක්ෂයන් පිළිබඳ ජයග්‍රහණයන් අපි දන්නවා මේ වෙලාවේ පසුගිය මැතිවරණයේදි විශේෂයෙන්ම පොදුජන පෙරමුණ, පොහොට්ටුව නෙළුම් පොහොට්ටුව පක්ෂය, ඒ මැතිවරණය ඇතුලේ ජනතාවගේ ශක්තිය අපි පැහැදිලිවම දන්නවා අපිත් එක්ක ඉදිරිපත් වෙච්ච අදහස් ප්‍රකාශ ඒ වගේම අපේ පත්වෙච්ච මන්ත්‍රීවරුන් මන්ත්‍රීවරියන්ගේ හෘද සාක්ෂිය තුළ ඇති ඒ සියලුදෙනාම ඡන්දෙ දුන්නේ කාරණා කීපයක් අරමුණු කරගෙන. පෙබරවාරි 11 වෙනිදට අපේ රටේ නව අගමැතිවරයා විදියට මහින්ද රාජපක්ෂ මහත්තයා පත්කර ගැනීමේ උවමනාව බලාපොරොත්තුව. අනිත් පැත්තෙන් ඒ මැතිවරණ ව්‍යාපාරය පුරාම ව්‍යාප්ත කරේ පතල කරේ සමාජගත කරේ ජාති වාදය ආගම් වාදය ඒ වගේම රට බෙදීමේ ව්‍යවස්ථා ඒ වගේ ඒවා. අපේ පහුගිය මැතිවරණ කාලය ඇතුළත විවිධ පාර්ශව විවිධ බලවේග රට බෙදන ප්‍රශ්න කතාකරමින් තිබුනා. දැන් ඒ ප්‍රශ්න සාකච්ඡා වෙන්නේ නෑ. දැන් මාධ්‍ය සංදර්ශන නෑ ඇයි මැතිවරණ කාලය තුළ ඒ ජයග්‍රහණය ලබාගැනීම වෙනුවෙන් ඒ මැතිවරණ ව්‍යාපාරය ඇතුලේ පාවිච්චි කළේ එවැනි දේවල්. ඒ නිසා ඒ වගේම ආණ්ඩුව අපි දැක්කා ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යවරයා ඒ වගේම ෆයිසර් මුස්තාපා අමාත්‍යවරයා තමන්ගේ රාජ්‍ය බලය ආණ්ඩු බලය අනිසි ලෙස පාවිච්චි කරමින් ඡන්ද දායකයාව බය කර ආණ්ඩු බලය අපිට තියෙන්නේ සභාවල් වෙන පක්ෂයකට ගියොත් ප්‍රතිපාදන දෙන්නෙ නෑ සභාව ගෙනියන්නා බෑ ආදී වශයෙන් ප්‍රකාශ කරමින් ජනතාව බිය වද්දමින් මැතිවරණ ජයග්‍රහණ ගන්න බලාපොරොත්තු උනා. ඒ නිසා මේ මැතිවරණ ව්‍යාපාරය ඇතුලේ ආණ්ඩුව නියෝජනය කරන ප්‍රධාන පක්ෂ තම තමන්ගේ බල අරගලය ඇතුලේ බලය කෙසේ හෝ ලබාගැනීම වෙනුවෙන් විවිධ කාරණා .....

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා</u>

සභාපතිතුමා, එතුමා කිව්වා මේ මංගල කතාවේ පක්ෂ දේශපාලන පක්ෂවලට බලපෑම් කරන්න බෑ. එහෙම එහෙම ඇමතිවරුන්ගේ නම් කියලා බලපෑම් කරන්න බෑ. එක හින්දා ඒ කතාව නවත්තන්න කියන්න. මංගල කතාව අපි අහගෙන හිටියා හැමෝටම සාධාරණ වෙලාවක් දුන්නා. ඔබතුමා මට කිව්වා වාඩිවෙන්න කියලා අපි ඒක අහලා වාඩි උනා .

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන සූරියආරච්චි මැතිතුමා</u>

දැන් මේ සභාවේ බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා ගැන සාකච්ඡා උනා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ගැන සාකච්ඡා උනා. ෆයිසර් මුස්තාපා අමාත්‍යාතුමා ගැන සාකච්ඡා උනා. චන්ද්‍රසිරි ගමගේ මන්ත්‍රීතුමා ගැන සාකච්ඡා උනා .

<u>ගරු සභාපතිතුමා</u>

ගරු මන්ත්‍රීතුමා ඔබගේ කතාව සීමා කරලා ඔබගේ කතාව අවසන් කරන්න. අද මංගල සභාව නිසා මම කාටවත් බාධා කළේ නෑ. යම් යම් දේවල් කතා කළා ඒ නිසා සීමාවේ ඉඳගෙන ඔබතුමාගේ කතාව අවසන් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන සූරියආරච්චි මැතිතුමා**

මන්ත්‍රීවරුන් මන්ත්‍රීවරියන් 39 දෙනෙක් මේ සභාවේ පැය ගණනක් කතා කරනවා අපි අහගෙන හිටියා. ඒ කතාවල තම තමන්ගේ පුද්ගලික අදහස් තම තමන්ගේ පෞද්ගලික ප්‍රතිරූප ඒ නිසා මම විශ්වාස කරනවා .
මේ මොහොතේ ඒ ජයග්‍රහණයන් පිළිබඳව කතා නොකර උදම් අනනවා වෙනුවට සභාවක් විදියට මේක ඇතුලේ අවශ්‍ය කරන ජනතාවට අර මන්ත්‍රීතුමියක් කිව්වා අපි මේ සභාවට ආවේ ජනතාවට සේවය කරන්න. ඒ නිසා අපි පක්ෂයක් විදියටත් අනෙකුත් පක්ෂවල මන්ත්‍රී සාමාජික සහෝදර මන්ත්‍රී මන්ත්‍රීවරියන්ගෙන් අපි සියලුම දෙනාගෙන් බලාපොරොත්තු වෙනවා වඩා නිවැරදි ජනතාව හොඳ සේවයක් සපයන්න. අන්න එතනදි මට පුළුවන් උපරිම දායකත්වය මේ සභාවේදි ගරු සභාපතිතුමා, උපසභාපතිතුමා ඇතුළු පාලක කණ්ඩායම් වලටත් ලබාදෙන්න. ඒ තැන්වලදී අපි අපේ ස්ථාවරත්වය ප්‍රතිපත්ති ආරක්ෂා කරගනිමින් සභාවට අවශ්‍ය කරන දායකත්වය ලබාදෙන්න අපි බලාපොරොත්තු වෙනවා. මං මගේ මේ අදහස් පල කිරිමේදී බලාපොරොත්තු වෙනවා අපි පක්ෂයක් ලෙස මේ සභාව නියෝජනය කරනවා. අනෙක් පක්ෂ වලට ලැබිච්ච ප්‍රතිශතය මගේ පක්ෂයටත් ලැබිලා තියෙනවා. ඒ නිසා මේ සභාවේ විපක්ෂය නියෝජනය කරන පක්ෂයක් හැටියට අපේ පක්ෂයට ලැබෙන්න ඕනෙ කරන ඒ අවස්ථාවන් වඩාත් සාධාරණව හා නිවැරදිව සභාවේ අවබෝධය හා ඒ සද්භාවය සභාව තුළ තියෙනවා ඒ වගේම ඒ අවශ්‍ය කරන සහයෝගය අපිට ලබාගන්න පුළුවන් එහෙම කළොත් තමයි ඒ නිසා ඒ සහයෝගයත් සමඟ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක් විදියට ඒ සභාව විසින් ඉදිරිපත් කරන අනාගත ජනතාවාදී යෝජනා හා සැලසුම් වලට සහයෝගය පල කරමිනුත් ඒ වගේම විරුද්ධ විය යුතු තැන්වල විරෝධය පලකරමින් කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේම අවශ්‍ය ඕනෑ වෙලාවක සහාය ලබාදෙන්න බලාපොරොත්තු වෙනවා. සභාව තුළ සහයෝගයෙන් කටයුතු කරමු කියන බලාපොරොත්තුවත් සමඟ සියලු දෙනාට සුබ අලුත් අවුරුද්දක් වේවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුනිල් රණසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමා ඇතුළු උප සභාපතිතුමා,ඒ වගේම ලේකම් මහත්මයා ඇතුළු කාර්ය මණ්ඩලයත්, ඒ වගේම මේ ගරු සභාව නියෝජනය කරන සියලුම මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා සියලුදෙනාගෙන් අවසරයි. අද දින මේ මංගල සැසි වාරයේ ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් හැටියට පත්වීම පිළිබඳව මම සන්තෝස වෙනවා. මුලින්ම මීට ප්‍රථම ඒ කතා කරපු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ගේ අදහස් සහ ඒ පලවෙච්ච කරුණු මේ සීතාවක ප්‍රාදේශීය සභාවේ ඉතිහාසය පිළිබඳව ඒ පලවෙච්ච කරුණු සම්බන්ධව අපි මේ මොහොතේ දැනුවත් උනා හැබැයි ඒ අදහස් තුළින් අපි දැක්කේ නැහැ මේ සීතාවක ප්‍රාදේශීය සභාවේ ඔවුන් වැඩි සංඛ්‍යාවක් ඔවුන්ගේ අදහස් ඔවුන්ගේ පුද්ගලිකත්වය තමන්ගේ ඒ කතාවලින් අපි දැක්කේ හැබැයි මේ සීතාවක ප්‍රාදේශී සභාවේ ප්‍රාදේශීය සභාවක් තුළ ජීවත්වෙන පොදු මහජනතාවගේ ප්‍රශ්න කතාකරමින් අපේ චන්දන මන්ත්‍රීතුමා කතාකරපු මොහොතේ ඒ වගේම අපි පක්ෂයක් හැටියට පක්ෂය තුළ කටයුතු කරන ආකාරය ගැන කතා කරන මොහොතේ බාධා කිරීම ගැන මම කණගාටු වෙනවා. අපි ජනතා විමුක්ති පෙරමුණ හැටියට එකම කණ්ඩායමක් හැටියට මේ සභාව නියෝජනය කරනවා. ඒ වගේම පසුගිය පළාත් පාලන මැතිවරණයේදී සාලාව කොට්ඨාශය නියෝජනය කරමින් එහි අපේක්ෂකත්වය සාලාව කොට්ඨාශයේ ජනතා විමුක්ති පෙරමුණේ මම නියෝජිතයා හැටියට කටයුතු

කළේ. එතෙන්දි මම සාලාව කොට්ඨාශයේ ජීවත්වන ඒ සහෝදර ජනතාවට ස්තූතිය පුදකරන්නට මේ අවස්ථාව යොදා ගන්නවා. සාලාව කොට්ඨාශයේ ග්‍රාම සේවා වසම් තුනක් තියෙනවා. එතෙන්දි පහල කොස්ගම බටහිර වසමේ අපි සම්බන්ධව විශ්වාසය පල කරලා ඒ වසම තුළ ජනතා විමුක්ති පෙරමුණ ජයග්‍රහණය ලබා ගත්තා. අපිට තියෙන්නෙ සාමූහික වගකීමක්. මේ සමස්ත ප්‍රාදේශීය සභා සීමාව තුළ ජීවත්වෙන පොදු ජනතාවගේ ඒ සේවාවන් සම්බන්ධව අපි ඉදිරියේදී ඔවුන්ට නිසියාකාරව සේවාවක් සැපයීමේ වගකීම තමයි අපිට පැවරිලා තියෙන්නෙ. එතෙන්දි ඒ සේවාවන් සැපයීමේදී ඔවුන්ට යම්කිසි අසාධාරණයක් වෙයි කියලා සිතනවා නම් ඒ වෙනුවෙන් පෙනී සිටීමටත් ඒ වගේම මේ ප්‍රාදේශීය සභාව තුළ ගන්නා හොඳ ක්‍රියාමාර්ග ඕනෑම කටයුත්තකදී අපි කණ්ඩායමක් හැටියට සහයෝගය පලකිරීමට කැමැත්ත පල කරන අතරම ඒ වගේම අකටයුත්තක් යෝජනා වෙනවා නම් අපි දේශපාලන පක්ෂයක් බලන්නේ නැතුව පුද්ගලයෙක් බලන්නෙ නැතුව එයට විරුද්ධත්වය ප්‍රකාශ කරන බවත් ප්‍රකාශ කරමින් ඇත්තටම කාල වේලාව ගොඩක් යන නිසා නැවතත් සීතාවක ප්‍රාදේශීය සභාවේ මා වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කරපු සහ අප වෙනුවෙන් විශ්වාසය තියපු සියලුම දෙනාට ස්තූතිය පුදකරන අතර ඔබ සියලු දෙනාටම ලැබුවාවූ නව වසර සුබම සුබ අලුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහෝම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ති චන්දිකා දමයන්ති මැතිතුමිය</u>

සභාපතිතුමා ඇතුලු උප සභාපතිතුමාගෙනුත් මේ වෙලාවේ අසුන් ගෙන සිටින මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාගෙනුත් ලේකම්තුමා ඇතුළු කාර්ය මන්ඩලයේ සියලුම දෙනාගෙන් අවසරයි ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් මම කාන්තා නියෝජනයකින් මන්ත්‍රීධූරය ලබා ගෙන ඉන්නනෝ ඇත්තටම සතුටු වෙනවා ජනතා විමුක්ති පෙරමුණ වැනි පක්ෂයක මන්ත්‍රීවරියක් වීමට ලැබීම ගැන ජනතා විමුක්ති පෙරමුණේ අපේ පක්ෂයේ තියෙනවා යම් කිසි ප්‍රතිපත්තියක් හරිදේ කරන  පක්ෂයක් හරි දේ වෙනුවෙන් පෙනී සිටින පක්ෂයක් හරි දේ වෙනුවෙන් කතා කරන පක්ෂයක් ඒක ගොඩාක් දෙනෙකුට දරාගෙන ඉන්න අමාරුයි. මෙතන ගොඩාක් වෙලා ගොඩාක් මන්ත්‍රීවරු කතා කලා නම් ගම් කිව්වා  ගොඩාක් දේවල් කිව්වා හිත රිදුනද දන්නේ නෑ මම හිතන්නේ ඒ සියලු දෙනා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රිවරු ඒවා ඉවසා දරාගෙන හිටියා ඒක තමයි  වැදගත් කම එතනයි තියෙන්නේ ඒ නිහතමානි කම අපිත් කතා කලේ අවංකවම හරිදේ වෙනුවෙන් හැමදාමත් ජනතා විමුක්ති පෙරමණ කියන්නේ හරි දේ වෙනුවෙන් කතා කරනවා එය කවුරු කොහොම කතා කලත් අපේ හරිදේ අපි කරනවා අපි හරිදේ වෙනුවෙන් කතා කරනවා මේ අවස්ථාවේ ගොඩක් කාල වේලාව ගිහින් තියෙනවා මම වැඩි වේලාවක් ගන්නේ නෑ හැමෝම කතා කරන්න පටන් ගත්තේ තමන්ට දේශපාලනයේ උදව් කරපු අයට ස්තූති කරන්න නමුත් අවසානයේ පලිගැනීම හා එවැනි දේවල් වලට ගොඩාක් කාලය ගෙවුනා අපි අපේ පක්ෂය තුල ඒවා නෑ අපි අපිට උදව් කල ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් සහයෝගය දක්වපු සියළුම ජනතාව වෙනුවෙන් අපි පෙනී සිටිනවා සියළුම දෙනාට ලැබුවා වූ නව වසර සුභම සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඒ. ප්‍රදීප් කුමාර් මැතිතුමා</u>

සුභ සන්ධ්‍යාවක් ප්‍රාර්ථනා කරනවා සියලු දෙනාටම. මට පොඩි කාලයක් ගන්න වෙනවා මොකද කොට්ඨාශ 26 ම නියෝජනය කරමින් තමයි මට කතා කරන්න වෙන්නේ මොකද අනිත් එක තමයි ගරු සභාපතිතුමනි ඔක්කොමලා කතා කලා තමන්ට සිදු වෙච්ච අසාධාරණකම් හා නාම යෝජනා ලබා ගැනීමේදී සිදුවෙච්ච දේ පිළිබඳව. මම කණගාටු වෙනවා ඔවුන්ට සිදු වෙච්ච අපහසුතාවයන් සම්බන්ධයෙන් මේ සියලු දෙනාටම මන්ත්‍රී ධූරය ලබා ගැනීමේදී ඔවුන්ට ලබන්න සිද්ධ වෙච්ච අත්දැකීම් සම්බන්ධයෙන් ඔවුන් කතා කලා මම නම් මේ ප්‍රාදේශීය සභාව

නියෝජනය කරන්න තුන්හිතකින්වත් බලාපොරොත්තුවෙන් හිටිය පුද්ගලයෙක් නෙවෙයි. විශේෂයෙන්ම චන්දන ලියනගේ මැතිතුමා දන්නවා අපේ ජයන්ත රණවක විපක්ෂ නායකතුමා දන්නවා බෙහොම අකමැත්තෙන් ආපු ගමනක් කියලා අපි මෙතුවක් කල් මේ සමාජයේ වැඩ කලේ සිවිල් සංවිධාන විදියට සිවිල් සංවිධාන උනාම බොහොම ස්වාධීනව ඕනෙම පක්ෂයක් එක්ක කටයුතු කරන්න හැකියාව තියෙනවා අපි 2013 ඉදලා මේ රටේ අපි දැක්කා යම් ව්‍යසනයක් ඒක මෙතනදිත් දැක්කා ඒ තමයි පක්ෂ වලට බෙදිලා පාටවලට බෙදිලා කොල නිල් රතු ජයග්‍රහණය කරන්න ගිහිල්ලා අන්තිමට මේ රට දිනෙන් දිනම වල පල්ලට යනවා අපි එදා දැක්කා බොහොම හොද ආදර්ශයක් මම මෙතනදි අපේ දෙමල මන්ත්‍රීවරුන් දෙන්නටට එතුමන්ලාගේ භාෂාවෙන් කතා කරන්න ලැබුණානම් හොදයි මම හිතනවා සභාපතිතුමා ඒ පිළිබඳ අවදානය යොමු කරයි කියලා එදා අපි දැක්කා දොෂාභියොගය වෙලාවෙදි කිසිදු දෙමල හෝ මුස්ලිම් මන්ත්‍රීවරයෙක් දෙපැත්තකට බෙදුනේ නැහැ. අපේ මන්ත්‍රීවරු තමයි දෙපැත්තට බෙදුනේ. නමුත් අපි ජාතික හිතවාදි පක්ෂයක් හැටියට ජාතිවාදි නොවෙයි නමුත් අපි පිලිගන්න ඕන අවුරුදු 2500 ක් ඉදලා ආපු සම්ප්‍රදායක් තියෙනවා ඒ සම්ප්‍රදායට අපේ කවුරුත් ගරු කරනවා අපේ දෙමළ පක්ෂත් ඒක පිලිගන්නවා මුස්ලිම් නියෝජනයක් නොවුනත් ඔවුනුත් පිලිගන්නවා ඔවුන්ගේ අයිතිවාසිකම් වලට අපි ගරු කරනවා නම් කිසිම ගැටළුවක් නෑ විශේෂයෙන්ම අපි ජනතාව දැනුවත් කලේ සියලු ප්‍රශ්න වලට හේතුව රටේ දෙවුන්දර තුඩුවේ ඉදලා පේදුරු තුඩුව දක්වා එක නීතියක් ක්‍රියාත්මක නොවීම දෙවන කාරණාව තමයි මැතිවරණයෙන් පස්සේ අපි පිල් වලට බෙදිලා කොල, නිල් රතු අනුව ජයග්‍රහණය කරන්න යාම තුල ජනතාව තමයි දුක් විදින්නේ මම හිතන්නේ මැතිවරණය ඉවරයි අපි මෙතනදිවත් පිල් බෙදෙන එක නවත්තමු අපි ආදර්ශයක් දෙන්න ඕනේ එදා දෝෂාභියෝගය වෙලාවේදී දෙමළ හා මුස්ලිම් ජනතාව අපිට එදා ඒ ආදර්ශය දුන්නා ඔවුන්ට අපි ඒකට දොස් කියලා වැඩක් නෑ අපේ තියෙන දුර්ජන ලක්ෂණ වලට අපි පක්ෂ සීයක් තිබුණත් අපි එකතැන අපේ තියෙන ගහ මරා ගැනීම් ඔවුන්ට කියලා වැඩක් නෑ ඔවුනගෙන් ගන්න පුළුවන් ආදර්ශත් අරගෙන අපි රටක් විදියට ඉදිරියට යන්නේ කොහොමද කියලා බලන්න ඔනේ මම පෙරදිත් කිව්වා අපේ පිටිපස්සේ කවුරුවත් හිටියේ නෑ බොහොම දුෂ්කරව ආපු ගමනක් අපිට අවශ්‍යව තිබුනේ මෙන්න මේ කාරණාව අපේ අත්පත්‍රිකාව දකින්න ඇතිනේ ඔබතුමන්ලා. අපි කාටවත් මඩ ගැහුවේ නෑ කිසි පුද්ගල චරිතයක් විවේචනය

කළේ නෑ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ගැනවත් මුකුත් කියන්නේ නැහැ. ඔවුන් ඔවුන්ට පුළුවන් විදියට යමක් කරලා තියෙනවා රට එක්සත් කරපු ජනාධිපති කෙනෙක් හැටියට මහින්ද රාජපක්ෂ මැතිතුමා අපේ යම්කිසි ගෞරවයක් තියෙනවා ඒකේ තර්කයක් නෑ අපි මේ සියලු කටයුතු රටක් විදියට ජාතියක් හැටියට දැනුවත් මේ කොල නිල් රතු බෙදීම් පැත්තකට දාලා ඉදිරියට ගියේ නැත්තම් අපිට රටට අනාගතයක් නෑ අපි ඒත් බැලුවා තරග කරන්නේ නැතිව මේ පණිවිඩය රටට දෙන්න පුළුවන්ද කියලා අපි මීට කලින් මැතිවරණයකදී 2013 කාලයේදී උත්සාහ කලා මේක නිකම්ම මිනිස්සුන්ට කිව්වට හරියන්නේ නෑ යම්කිසි මැතිවරණ කාලයේදී තමයි මේ මිනිස්සු මේ කියන දේවල් අහන්නේ එතනදි අපි ස්වාධීන කණ්ඩායමක් විදියට ඉදිරිපත් වෙන්න තීරණය කලා මම නම්, ගම් කියන්නේ නෑ මෙතනත් ඉන්නවා ම සමග සාකච්ඡා කල යම් යම් පුද්ගලයෝ කිසිම වෙලාවක අපි ද්වේශ සහගත විදියට මැතිවරණය කලේ නෑ අපේ වැලිකන්න මන්ත්‍රීතුමා කිව්වා ස්වාධීන කණ්ඩායම් කියන්නේ මෝඩයෝ කියලා නමුත් අපිට අවශ්‍ය වෙලා තිබුනේ මෙන්න මේ පණිවිඩය ජනතාව වෙත ගෙනියන්න. ඒ කියන්නේ පක්ෂ අනුව බෙදෙන්න එපා පාට අනුව බෙදෙන්න එපා පළමුව රට එදා අපිත් එක්ක එක්සත් ජාතික පක්ෂයත් හිටියා පොහොට්ටුවත් හිටියා මම ස්තුති වන්ත වෙනවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සංවිධායකතුමා ඒ වගේම අපේ එජාපයේ සංවිධායකතුමා ඒ වගේම රවීන්ද්‍ර ජයසිංහ මැතිතුමා අපි මේ සියලු දොන සමග කටයුතු කලා අපිට යම් ගැටළුවක් අවා හම අපි සාකච්ඡා කලා පක්ෂ අනුව බෙදිලා පාට අනුව බෙදිලා මේ රට ගොඩ ගන්න බෑ කියන එක මේ රට

ගොඩ ගන්න නම් අපි සියලු දෙනා එක්ව මම මෙතනදිත් ඔබ තමුන්නාන්සේනාගෙන් ඉතාමත් ඉල්ලා සිටිනවා ඡන්දේ ඉවරයි දැන් කොළ පාට ජයග්‍රහණය කරන්න, රතුපාට ජයග්‍රහණය කරන්න, නිල්පාට ජයග්‍රහණය කරන්න යන්න එපා අපි අවුරුදු හතරකින් ඒක කරමු තව අවුරුදු හතරක් තියෙනවා ඒකට හරි දේ හරියට දකිමු. විශේෂයෙන්ම බලන්න ඕනේ කවුද හරි කියන කාරණාව නෙවෙයි මොනවද හරි කියන දේ ඒක විපක්ෂයෙන් වෙන්නත් පුළුවන් ආණ්ඩු පක්ෂයෙන් වෙන්නත් පුළුවන් පිටිපස්සෙන් ඉදගෙන පිහියෙන් අනින් හදන්න එපා අපි එහෙම කරන්නෙත් නෑ එහෙම කරන අයට ඉඩ දෙන්නෙත් නෑ මම කියන්නනේ නෑ සභාපතිතුමාට සහාය දක්වන්නේ නෑ කියලා මේ රට නැත්තම් අපිට සභාවකුත් නෑ ඕනෑම මන්ත්‍රීවරයෙක් මට කතා කරන්න මට විශේෂ වගකීමක් තියෙනවා කොට්ඨාශ 26 ම නියෝජනය කරනවා විශේෂයෙන්ම මම මෙතනදි ලේකම්තුමාට පොරොන්දුවක් වෙනවා ඔබතුමා හා නිලධාරි මණ්ඩලය ආරක්ෂා කර ගැනීම සඳහා අපි කැප වෙනවා මේ ප්‍රදීප් කුමාර් ඉන්නවා කියන එක කියනවා ජනතාව වෙනුවෙන් සාධාරණයක් ඉටු කරන්න ඔබලාට මුහුණ පැමට එන ඕනෑම ගැටළුවකදී අපි මුහුණ දෙනවා. බෙහොමත්ම ස්තූතියි.

<u>ගරු සභාපතිතුමා</u>

බොහෝම ස්තූතියි ගරු මන්ත්‍රීවරු සියලුදෙනාටම, පුරා පැය 8.30 කට වැඩි කාලයක් මන්ත්‍රීවරුන් 42 දෙනෙකුගේ විවිධ දේශපාලන පක්ෂ නියෝජනය කරන අයගේ අදහස්වලට අපි ඇහුම්කන් දුන්නා. වෙනදාට මන්ත්‍රීවරුන් 21 කගෙන් පස්සෙ තමයි කතා කරන්නෙ අද 42 කගෙන් පස්සෙ සභාවේ කතා කරන්නෙ. ඉතින් කෙසේ නමුත් අපි හැමෝටම පහුගිය පළාත් පාලන මැතිවරණයේදී ඔබ අපි සියලුදෙනාටම සීතාවක බල ප්‍රදේශයේ 102,000 ක පමණ ජනතාවක් අපිට මේ සභාව නියෝජනයට වරම දුන්නා. මේ ප්‍රාදේශීය සභාවේ අවුරුදු 4 ක කාලයක් මේ බදු ගෙවන ජනතාවට පහසුකම් සපයමින් මේ සභාව පාලනය කරමින් කටයුතු කරන්න. ඒ නිසා අපි දේශපාලන පක්ෂවලට යොමුවෙලා අපේ සටන අපි සටන් කළා පොහොට්ටුව ලකුණෙන්. හිටපු අතිගරු ජනාධිපතිතුමා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය යටතේ. ඒ වගේම ඒකාබද්ධ විපක්ෂයේ නායක දිනේෂ් ගුණවර්ධන මැතිතුමන් ප්‍රමුඛ මහින්ද රාජපක්ෂ මැතිතුමා යටතේ පොහොට්ටුව ලකුණෙන් ආරම්භ කරපු මේ දේශපාලන පක්ෂය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, විමල් වීරවංශ මැතිතුමා, උදය ගම්මන්පිල මැතිතුමා සහ වාසුදේව නානායක්කාර මැතිතුමාගේ ප්‍රධානනත්වයෙන් ඇරඹුණා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ 2015 ජනවාරි මාසයේ 08 වෙනිදා පරාජයෙන් පස්සෙ මේ නායකයින් හතරදෙනා එකතුවෙලා ආරම්භ කරපු ඒ මහා දේශපාලන ව්‍යාපාරය එදා බොහෝදෙනා බොහෝ දේවල් කිව්වා නමුත් පෙබරවාරි මස 10 වෙනදා වෙනකොට මේ මූලාරම්භය, අපේ රටේ මහා දේශපාලන බලවේගය බවට පරිවර්තනය උනා. ඒ නිසා අපි ස්තූතිවන්ත වෙන්න ඕනේ මේ දේශපාලන පක්ෂය නායකයින් මහින්ද රාජපක්ෂ මහා පෞරුෂය තියෙන නායකයා අනෙකුත් සියලුදෙනා එකතු කරගෙන එක මිටකට අරගෙන මේ ජයග්‍රහණය නැවත වතාවක් අපේ රටට ලබාදෙන්නට එලෙස කටයුතු කරන්නට වීම පිළිබඳවත්. මේ මැතිවරණ සටනේ අපි සියලුදෙනා අපේක්ෂකයන් විදියට අපි පැමිණියේ පොහොට්ටුව ලකුණ විදියට. 26 දෙනෙක් තරඟ කරලා මේ 23 දෙනෙකුගෙන් යුත් කොට්ඨාශය ජයග්‍රහණය කරනවා. ඔබත් අපත් අනෙකුත් දේශපාලන පක්ෂවලත් ඒ බෙදන ක්‍රමය යනු අප යම් ආකාරයකට පිළිගත්තත් නොගත්තත් රටේ පවතින මැතිවරණ ක්‍රමයට අපි හැමෝම පත්වෙලා මේ සභාවේ වාඩිවෙලා ඉන්නවා. ඒ නිසා අපි හැමෝගේම වගකීම යුතුකම මේ වසර 4 ක කාලය තුළ ඒ මහජනතාව වෙනුවෙන් ඒ සේවාව ඉෂ්ඨ කරන්න. විශේෂයෙන්ම මම දේශපාලනයේ පළමු ඡන්දය 1997දී මම පරාදයි. මම කලිනුත් කියලා තියෙනවා මම 2001 දිත් පරාදයි. මම 2006 දි තමයි මන්ත්‍රීවරයෙක් වෙන්නෙ. 2011 දි තමයි පලවෙනි වතාවට මේ පස්වෙනි මණ්ඩලයේ සභාපති වෙන්නේ අවස්ථාව ලැබුණා. ඒ මේ මැතිවරණ ක්‍රමය අනුව මනාප නෙවෙයි. ඒ නිසා පක්ෂ ක්‍රමය ඉහල නායකයින්ගේ තීන්දු තීරණ අනුව තමයි මේ පළාත් පාලන

ආයතන 239 කට වඩා වැඩි ප්‍රමාණයක් නායකත්වය පත්කළේ. මේ ඒකාබද්ධ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නායක නායිකාවන් විසින්. වසර 4 ක පමණ කාලයක් සීතාවක ප්‍රාදේශීය සභාවේ අපිට නායකත්වය ලබාගන්න පුළුවන් වුනේ මේ නායකයින්ගේ ඒකමතික වූ එකඟතාවය හා කැමැත්ත මත. ඒ නිසා උප සභාපතිතුමත් එක්ක මන්ත්‍රීවරුත් එක්ක මේ ගමන යාමට ඒ පවරපු වගකීම මින් පෙර වසරකට පෙර ඉෂ්ඨ කළා වගේ මම ඉදිරියට අරගෙන යන්න අපි මෙහෙයවන බව කටයුතු කරන බව නායකත්වය ලබාදෙන බව මම ප්‍රකාශ කරන්න ඕනෙ. පසුගිය වසර 4 ක කාල සීමාවේ විවිධ බාධා කකුල් ඇදීම් මත සීතාවක ප්‍රාදේශීය සභාව තිබූ තැනින් ඉහලට ඔසවා තබන්නට සහයෝගය දෙන්න පුළුවන් මන්ත්‍රී කණ්ඩායමක් ලෙස සියලුම පක්ෂවල සහයෝගය ලැබුණා. අපි හොඳ තීරණ ගත්තා. අපිට සහයෝගයන් ලැබුණා. ඒ නිසා සීතාවක ප්‍රාදේශීය සභාව එදා 2011, 2012 වෙද්දි කොහොමද තිබුනෙ කියලා පළාත් පාලන කොමසාරිස්තුමියගෙන් ඇහුවොත් 2012 පත්වෙලා වසරක් ඇතුළත අපි සීතාවක ප්‍රාදේශීය සභාව කොළඹ දිස්ත්‍රික්කයේ හොඳම සභාව ලෙසට පත්කරන්න අපිට පුළුවන් උනා. ඒ එදා හිටපු මන්ත්‍රීවරු අපිට ලබාදුන්නසහාය නිසා. ඒ නිසා ලේකම්තුමාත් කාර්යමණ්ඩලයත් සහාය දැක්වූ මන්ත්‍රීවරුත් එක්ක අපේ ගමන ගියා. එදා සිට 2012 අවුරුද්දේ සිට අද මේ මොහොත දක්වාම කොළඹ දිස්ත්‍රික්කයේ හොඳම ප්‍රාදේශීය සභාව සීතාවක ප්‍රාදේශීය සභාවයි. ඒ කාල සීමාවේ මහින්ද රාජපක්ෂ මැතිතුමා නායකත්වයත් දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, ගීතාංජන ගුණවර්ධන මැතිතුමා, ඒ වගේම මහේෂ් අල්මේදා මැතිතුමා, සුමිත් සොයිසා ගරු මන්ත්‍රීතුමාත්, ඒ සියලුදෙනා එදා එකට ඉදගෙන වැඩ කළා. ඒ වගේම මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෙ ගිතාංජන ගුණවර්ධන මැතිතුමා සුවිශේෂී මට්ටමකට මේ සීතාවක අරගෙන එන්න එතුමා නායකත්වය දුන්නා. එමනිසයි කෝටි පහක මුදලින් අළුත් පුස්තකාලයක් අපිට හදන්න පුළුවන් වුනේ. ඒ නිසයි අපිට හංවැල්ල නගරයේ අළුත් පොළක් හදන්න පුළුවන් වුනේ. ඒ නිසයි කොස්ගම අළුත් පොලක් හදන්න පුළුවන් වුනේ. ඒ නිසයි ඉලුක්ඕවිට අපේ උද්භිත උද්‍යානයක් හදන්න පුළුවන් වුනේ. ඒ නිසයි අපේ ප්‍රදේශයට අලුත් ජලනල ව්‍යාපෘතියක් ලබා ගත්තේ. ඒ නිසයි අපේ ප්‍රදේශයේ අළුතින් ආදාහනාගාරයක් ඇතිවුනේ. මෙවැනි විශාල ව්‍යාපෘති ප්‍රමාණයක් අපේ බල ප්‍රදේශයට ගේන්න පුළුවන් වුනේ. එදා අපි සීතාවක ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විදියට මේ කාලේ අපේ නායකයොත් එක්ක එකතුවෙලා මේ සීතාවක පුරවරය ඉස්සරහට අරගෙන යන්න ප්‍රාදේශීය සභාව ගොඩනගන්නටත් අපිට විශාල වැඩ කොටසක් කරන්නට පුළුවන් වුන කාලසීමාව ලෙසට 2011 - 2015 කාලසීමාව පත්වුනා කියන එක මම බය නැතුව කියනවා. සීතාවක ඒ ගමන් මගේ මං හිතනවා 2011, 2015 කාලසීමාව අපි සුවිශාල ලෙස සීතාවකට සංවර්ධිත යුගයක් උදා කරන්නට අපිට නායකත්වය ගන්නට පුළුවන් වුනා. ඒ සඳහා අපේ මන්ත්‍රීතුමන්ලා විශාල සහයෝගයක් අපිට ලබාදුන්නා. අපි සඳහන් කරන්නට ඕනේ ඒ නිසා අපි ඒ සටන අත් නොහැර අපි ඒ බල ප්‍රදේශයේ ඉල්ලපු දා පටන් අද මේ මොහොත දක්වාම සටන අත් නොහැර පලානොගිය නායකයෝ විදියට මේ සටනේ ඔබත් සමඟ ඉඳලා මේ ජනතාව සමඟ ඉඳලා අපි මේ ජයග්‍රහණ උදා කරගත්තා. මේ ගමන යන්න මට හයිය දුන්න මගේ පියා මගේ මව් මගේ ගෙදර සහෝදර සහෝදරියන් ඒ අයගේ මග පෙන්වීම ශක්තිය මත ඒ වගේම අපේ ඥාතීන් එළමලවල මේ සියලුදෙනාගේ සහයෝගය විශේෂයෙන්ම අපිට එදා ලැබුනා. එදා තිබ්බ හයියත් එක්ක මෙවර කහහේන කොට්ඨාශය මට ජයග්‍රහණය කරන්න පුළුවන් වුනා. කහහේන, නෙළුවත්තුඩුව, එළමලවල මාබුල හා බ්‍රැන්ඩිගම්පල කියන ගම් පහේ ජනතාව ඒ වගේම අවංක නායකයින් සියලු දෙනාවත් මේ අවස්ථාවේ සිහිපත් කරනවා. ඒ යුගය අළුතින් ආපහු නැවත වතාවක් අපිට පටන් ගන්නට අපි කෙරෙහි විශ්වාසය තබලා අපිව එතනට අරගෙන ආපු එක ගැන අපි සතුටු වෙනවා වගේම මම මේ වෙලාවෙ ස්තූතිවන්ත වෙනවා නැවත වතාවක්. අපි අළුත් යුගයක් ආරම්භ කිරීමට යන මේ ගමන ජයග්‍රහණය ලබාගන්නට අපි කෙරෙහි විශ්වාසය තබලා අපිට ඡන්දය පාවිච්චි කරපු ජනතාව පිළිබඳව අපි සතුටුවෙනවායි කියන එක මේ අවස්ථාවේදී අපි මතක් කරන්නට ඕනෙ. ඒ වගේම මේ මැතිවරණය අපි ජයග්‍රහණය කළා. පවතින මැතිවරණ ක්‍රමය

නිසා ඡන්දය කල් දමමින් ගිය ආණ්ඩුව මැතිවරණ දිනාගන්න අපි බොහෝ දෑ කළා. ඒ නිසා අපි සඳහන් කරන්නට ඕනේ අපි නුවර ඉඳන් කොළඹට අපි පාර්ලිමේන්තු වටරවුමෙ ගිහිල්ලා උද්ඝෝෂණය කළා. පොලීසිය ගැහුවා. කඳුලු ගෑස් ගැහුවා. ඒ නිසා බොහෝ දේවල්වලට අපි පෞද්ගලිකව මුහුණ දුන්නා. සටන් කරලා කෑ ගහලා තමයි අපි මේ මැතිවරණ සටන දිනාගත්තේ හා අපි ජයග්‍රහණය කළේ. ඒ සටන් වලට නායකත්වය දෙන්න ඒ නිසා සමහර අය අහනවා අපි මොනාද කළේ කියලා. එදා නුගේගොඩින් ආපු මේ මහා ජනතා රැල්ලෙ ඒ මහා ජන සටනේ අපේ නායකයොත් එදා ඒ ජනතා සටනේඒ ජනතා රැල්ල ඇති කිරිම සඳහා එදා ලංකාවේ තිබුණු සෑම රැලියකටම ජනතාව සහභාගී කරගෙන අපි අපේ උපරිම සහයෝගය ලබාදුන්නා වගේම මමත් අපේ හෝමාගම හිටපු සභාපතිතුමත් රත්නපුර වේදිකාව හදන තැනට අපි ගිහිල්ලා කටයුතු කළා. ඒ වගේම අපි සඳහන් කරන්නට ඕනෙ ඉන්පසු ජාතික නායකයින් රැස්වීමට සහභාගී කරවීම සඳහා ඒ ක්‍රියාවලියටත් අපි නායකයෝ එක්කන් යන්න ඕනෙ තැන්වලට එක්කන් යන්න තරම් අපි සීතාවකින් ඒ සඳහා දායකත්වය ලබාදුන්නා කියන කාරණාව මතක් කරන්න ඕනෙ. ඒ නිසා මම මේ ටික කතාකළේ පහුගිය මැතිවරණ කාල සීමාව ඇතුලෙ බොහෝදෙනා බොහෝ දේවල් කිව්වා. ඒ නිසා ජයන්ත රෝහණටත් මේ සටනෙ මේ සීතාවක ප්‍රාදේශීය සභාවේ මෙතෙන්ට එන්න අවශ්‍ය සුදුසුකම් ප්‍රමාණයක් අපි ඕනවටත් වැඩිය සම්පූර්ණ කරලා තිබුනයි කියන කාරණාව මං කියන්න ඕනෙ. ඒ නිසා මං කියන්නෙ නෑ අනිත් අය මෙතනට එන්න සුදුසු නෑ කියලා. නමුත් අපි අවශ්‍යයි කියන සුදුසුකම් ප්‍රමාණය පක්ෂයක් විදියට ඒ 2015 ජනවාරි මස 8 වෙනිදායින් පස්සෙ මේ දක්වා අද වෙනකන් ජනතා රැල්ල ඇති කරන්න සහ පවත්වාගෙන යන්න ඒ ජයග්‍රහණය වෙනුවෙන් අපි කැපවුනා කියන කාරණය අපි මේ වේලාවෙ බොහොම ගෞරවයෙන් මතක් කරන්න ඕනෙ. ඒ වෙනුවෙන් දිනේෂ් ගුණවර්ධන මැතිතුමා,ගීතාංජන ගුණවර්ධන මැතිතුමා ඇතුළු අවිස්සාවේල්ල ආසන බල මණ්ඩලයේ අපිත් එක්ක ඒ මහා සටනට එකතු වුනා වගේම අනෙකුත් දේශපාලන පක්ෂවලත් එසේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෙන්ම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ,කොමියුනිස්ට් පක්ෂය ,පිවිතුරු හෙළ උරුමය ආදි බොහෝ පක්ෂ එකතුවෙලා මහා ලොකු ජයග්‍රහණයක් දක්වා ගෙනයාමට මුල පුරපු බව අපි සඳහන් කරන්න ඕනෙ. ඒ නිසා දේශපාලන කාරණා පිළිබඳව මීට වඩා මම කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නෑ. මම පහුගිය සභාවේ වැඩ කරපු විදිය දැක්කහම මේ මංජුල මන්ත්‍රීතුමා කිව්වා අද තීරණ ගන්න බය වුණායි කියන එක. හැබැයි ඔබතුමා එදා කිව්වා සභාපතිතුමනි ඔබතුමා කලබල වැඩිද තද වැඩිද කියලත් පහුගිය සභාවකදීඇහුවා. හැබැයි මම එදා මන්ත්‍රීවරු 15 ක් ඉන්නකොට එහෙම කරනකොට ඔබතුමා එහෙම ඇහුවා. මම යම් තීන්දුවක අපි ගත්ත අත්දැකීම් එක්ක අපේ ඒක යම් ප්‍රමාණයකට යනකොට මේ දේවල් වඩා හොඳ තත්වයකට ගන්න මං හිතනවා එහෙම කරහාම මං විශ්වාස කරනවා එදා මට පහරදෙනකොට ඊට වඩා දෙයක් මට කරන්න තිබුණේ නෑ. අද මන්ත්‍රීවරු 23 ක් ඉන්නවා ආණ්ඩු පක්ෂයෙන් ඒ නිසා ඒ අයගේ සහයෝගයෙන් උගත් බුද්ධිමත් සමාජ සේවකයෝ මන්ත්‍රීවරු හිටපු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු අද අපේ කණ්ඩායමේ ඉන්නවා. ඒ නිසා මම විශ්වාස කරනවා මීට වඩා හොඳින් අපිට සභාව අරගෙන යන්න පුළුවන් වෙයි කියන විශ්වාසය ඇතුවයි මම අද මේ සභාපති පුටුවෙ වාඩිවෙලා ඉන්නේ. ඒ නිසා අපි වඩා හොඳින් සාකච්ඡා කරලා මේ සීතාවක ප්‍රාදේශීය සභාවේ ජනතාව වෙනුවෙන් ඒ සේවාවන් කරන්නට අපි කටයුතු කරමු. අපි ප්‍රාදේශීය සභාවක් විදියට අපි ලබාගත්තු බොහෝ ජයග්‍රහණ ඉදිරියටත් එලෙසින්ම ආරක්ෂා කරගැනීම මං හිතනවා අපි 43 දෙනාගේ වගකීමක් හා යුතුකමක් විශේෂයෙන් මම සඳහන් කරන්න ඕනෙ අපි ඉන්න කාලේ ඩෙංගු මදුරුවන් වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කළා. අපි හය හත්දෙනෙක් බඳවාගෙන ඉන්න වෙලාවෙ මම එදා ලේකම්තුමාගේ කාලසිමාවේ පළාත් පාලන කොමසාරිස්තුමියගේ ඒ තත්වය වැඩි කරලා හොඳ ප්‍රවණතාවයක් විදියට වැඩසටහන හොඳ එකක් විදියට කල්පනා කරලා සේවකයින් බඳවාගෙන අද ඒ තත්වය වැඩිදියුණු කරගෙන යනවා. විශේෂයෙන්ම අපේ සභාවේ ක්‍රීඩා අංශයේ ඉතින් අපි හිටපු කාලෙන්පස්සෙ ආරම්භ කරපු ක්‍රීඩා වලින් ජයග්‍රහණ මෙවරත් කොළඹ දිස්ත්‍රික්කයේ ජයග්‍රහණ ලබාගෙන ජයග්‍රාහී කණ්ඩායම බවට සීතාවක

ප්‍රාදේශීය සභාව ඒ වගේම සමහර සභාවල සභාපතිවරු පුදුම වෙනවා අපේ නිලධාරීන් සේවකයින් මෙච්චර දක්ෂයිද කියලා. එහෙම අපිට ජයග්‍රහණය කරන්න පුළුවන් වුනා. ඒ හින්දා අපි කොළඹ දිස්ත්‍රික්කයේ පළවෙනියා වුනා. ඊට පස්සෙ පළාත් තරඟ වලට ගියා. කසල ප්‍රතිචක්‍රීකරණය ගරු රවින්ද්‍ර ජයසිංහ මැතිතුමා ආරම්භ කළා.ක අපි පවත්වාගෙන ගියා. වැඩිදියුණු කළා. ඒ වෙනුවෙන් මම උසාවි ගියා. අපිට බෝහෝ කරදර ආවා. කසල ප්‍රතිචක්‍රීකරණයේ කොළඹ දිස්ත්‍රික්කයේ ඉහළ තැනකට අද වෙනකොට ඇවිත් තියෙනවා. අපි ආරම්භ කරපු බොහෝ දේ පවත්වා ගනිමින් එය සංවර්ධනය කරමින් පිළිවෙලට ඉස්සරහට ගමන් කරමින් ඉන්නවා. ඒ කාල සීමාව ඇතුලේ බොහෝ දෙනා කථා කළා ගරු සභාපතිතුමා සැරයි බොහෝදෙනා කැමති නෑ. අපි මේ හැමදේම කළේ ඒ ජයග්‍රහණ සඳහාසභාපතිතුමා හැටියට කවුරු මෙතනට පැමිණියත් ඒ වගකීම ඉටුකළ යුතුයි ඒ නිසා. ඒ නිසයි අපි සමහර වෙලාවට සේවකයින්ට තදින් කථා කරන්නෙ. ඒ හැමදේම කළේ මේ සභාව ඉහළට ඔසවා තබන්නට කාත් එක්කවත් පෞද්ගලික තරහකින්වත් වෛරයකින්වත් නෙවෙයි. සමහරවිට මේ මන්ත්‍රීවරුන්ටත් එහෙම අදහස් ඇවිල්ලා ඇති. ඒ නිසා බොහෝම අපහසුතා මැදයි අපි මේ සභාවෙ කටයුතු කරගෙන ගියේ. ඒ නිසා අද කසල ප්‍රශ්නය ගැන අපේ සමන්ත මන්ත්‍රීතුමාත් කතාකළා. ඕල්ගා මන්ත්‍රීතුමියත් කතා කළා. ඕල්ගා මන්ත්‍රීතුමිය කියනවා කුණු ගේන්න එපා කියලා. අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා කියනවා මේ කුණු තව එකතු කරන්න ඕනෙ කියලා. මේ ප්‍රශ්න දැනගෙන තමයි අපි ඇවිත් තියෙන්නෙ. ඒ නිසා අපි මේවට විසඳුම් හොයමු. අපිට ඉඩම් කොටසක් හොයාගෙන කොම්පෝස්ට් ව්‍යාපෘතියක් හදන්න ඒ වෙනුවෙන් ඉඩමක් හොයාගන්න බැරි වුනොත් අපි මහ ඇමතිතුමා හමුවුණා. හිටපු උප සභාපතිතුමා හිටියා ඒ රැස්වීමේ. ඉතින් මහ ඇමතිතුමාට යෝජනා කළා විශාල ප්‍රශ්නයක් විසඳගන්න ඕනෙ කියලා. එතුමා කිව්වා අපි ඉඩමක් හොයාගෙන ඒක විසඳගමු කියලා. එතකොට අපිට කොම්පෝස්ට් හදන්න ඉඩමක් හොයලා දෙන්න කියලාඑතුමා ප්‍රසිද්ධියේ කිව්වා. ඒ නිසා හංවැල්ල නගරය ගැන අපේ ප්‍රභානි අල්මේදා මන්ත්‍රීතුමිය කතා කළා. අපේ මන්ත්‍රීවරු කථා කළා. අපේ අයෝම මන්ත්‍රීතුමා පාදුක්ක නගරය ගැන කතා කළා. ඒ නිසා මේවා සංවර්ධනය කරන්න ඕනෙ. මේවයේ සංවර්ධන සැලසුම් හැදුවෙ මීට ගොඩක් ඉස්සර අපි ආරම්භ කලා එහි ගොඩක් අඩුපාඩු සහ අතරමග නැවතීම් තියෙනවා. මේ සියල්ල අපි ඉස්සරහට අරගෙන යන්න ඕනෙ. ඒ නිසා රජය පලාත් සභාව සහ අපි හැමෝම එකතුවෙලා ඒ හංවැල්ල නගරයේ අද තියෙන තදබදය ඒ සියල්ල අපි අවසන් කරන්න අපි ගමන් කරන්න ඕනෙ. ඒ නිසා නාගරික සංවර්ධන අධිකාරිය, මහා මාර්ග සංවර්ධන අධිකාරිය ඉදිරි කාලයේදී අපි අපේ කටයුතු ගැන ඒ සංවර්ධන කටයුතු ගැන අපි සඳහන් කරන්නට ඕනෙ. ඒ වගේම හයිලෙවල් මාර්ගය පුළුල් කිරීමේ කටයුතු අලුතින් ආරම්භ වෙලා තියෙනවා. මම යෝජනා කරනවා ඒ වගේම ඉල්ලීමක් කරලා තියෙනවා මහාමාර්ග අධිකාරියත් සමඟ අපේ මේ ඉන්න අයත් සමඟ මේ ප්‍රශ්න ගැන සාකච්ඡා කරන්න. සංවර්ධනය පිළිබඳව නමුත් මහජනතාව සහ මහජන නියෝජිතයන් ඒ ගැන දැනුවත් වෙන්නට ඕනෙ. අපි මැදිහත් වෙන්න ඕනෙ. ඒ වගේම මම දන්න විදියට මම විශ්වාස කරන විදියට ලයනල් කාරියවසම් සභාපතිතුමා ඒ කාලේ ඉඳන් ග්‍රාමීය පරිසරය ආරක්ෂාවෙන් ඒ සංවර්ධනය කරන්නට ඕනෙ කියන මතයේ තමයි අපි හිටියෙ. එය තවදුරටත් අපි ආරක්ෂා කරගන්නට ඕනෙ. ඒ නිසා මන්ත්‍රීවරුන්ගේ අවධානය යොමු වෙන්න ඕනෙ අපි සංවර්ධනය කරන්න ඕනෙ. නමුත් අපේ තියෙන පරිසර පද්ධතිය අපි ඒක ආරක්ෂා වෙන තැනකට අපි ගමන් කරන්න ඕනෙයි කියන එක මම විශ්වාස කරනවා. මම හිතනවා අපේ මන්ත්‍රීවරු බොහෝ මන්ත්‍රීවරු ග්‍රාමීය මන්ත්‍රීවරු ඒ සංවර්ධනය එලෙසින් කරද්දි එය අපේ තියෙන පරිසරයට බාධාවක් නොවන අයුරින් කටයුතු කිරිම අපේ යුතුකම හා වගකීම වන බව ඒ සඳහා ඔබගේ අවධානය යොමුකරාවි. අපේ ජන ජීවිතයට වඩා යහපත් අන්දමින් හානි නොවන විදියට අපේ පරිසර පද්ධතිය රැකෙන විදියට අපි ගමන් කිරීමේ වගකීම හා යුතුකම ඔබට පැවරිලා තියෙනවා. ඒ නිසා ඔබ අපි තමුන්නානේසේලා හැමදෙනාම මේ කටයුත්තට අපිට එකතුවෙන්න අදහස් ඉදිරිපත් කරන්න කියලයි කියන කාරණ අපි මතක් කරන්නට ඕනෙ. ඒ නිසා මැතිවරණ ක්‍රමය ගැන අපිට මීට පස්සේ

කතාකරන්න දෙයක් නෑ. මේ මැතිවරණ ක්‍රමය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට චෝදනා තිබුනා. බැසිල් රාජපක්ෂ මැතිතුමාටත් චෝදනා තිබුනා හැබැයි එය පාර්ලිමේන්තුව අරන් ආපු වෙලාවෙ ඒකමතිකව සම්මත වුනා කියලා මතක තියාගමු. ඒ නිසා ඒ මැතිවරණ ක්‍රමයේ අඩුපාඩු ගැන මන්ත්‍රිවරු කතා කළා. අදහස් ඉදිරිපත් කලා. 2012 දී ඒ කියපු දේ අනුමත වුනේ ඒකච්ඡන්දයෙන් බව ඔබ හැමදෙනාම මතක තියාගන්න ඕනෙ. එදා ඔය කියන මන්ත්‍රීවරු සියලුදෙනාම එදා පාර්ලිමේන්තුවේ හිටියා කියන කාරණාවත් මතක තියාගන්න ඕනෙ. ඒ නිසා මේ ක්‍රමය ගැන යම් ප්‍රශ්නයක් තියෙනවා ඒ තමයි. බෝනස් නැතිවෙන එක. ඒ නිසා මේ මැතිවරණ ක්‍රමයේ අපි එහෙම දේකුත් දකිනවා. ඒ මොනවා උනත් අපේ පවතින මැතිවරණ ක්‍රමයේ පාර්ලිමේන්තුව හරහා වෙන්න ඕනෙ දෙයක්. ඉතින් අපි විශ්වාස කරනවා අනාගතයේ ජනාධිපතිතුමා කියනවා මේක සංශෝධනය විය යුතුයි කියලා. ඒ නිසා මේ සියලු කාරණා මැද අපි ඉස්සරහට ගමන් කරමු. ඒ එන මැතිවරණ ක්‍රමයට මූණදෙමු. අපේ ලැබූ ජයග්‍රහණය තුළින් අපේ බල ප්‍රදේශයේ සංවර්ධනයට අවශ්‍ය කරන කටයුතු කතාබහ කරලා අපි සම්පාදනය කරලා අපි ගමන් කරමු කියන කාරණය තමයි මතක් කරන්නෙ. ඒ නිසා අනෙකුත් සෑම සියලුදෙනාටම මම ස්තුතිවන්ත වෙනවා. අපේ ජයග්‍රහණයටත්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජයග්‍රහණයටත් සීතාවක සුවිශේෂී ජයග්‍රහණයක් උදා කරන්නටත් විවිධ බාධක විවිධ තර්ජන පැමිණියා. ඒ තර්ජන මැඩගෙන අපිට සීතාවක පාලන බලය නැවතත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ප්‍රමුඛ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට පොහොට්ටු ලකුණ ලබාදීම පිළිබඳව මා සියලු දෙනාට සභාවේ සභාපතිවරයා විදියට අපේ ගෞරවයත් ප්‍රණාමයත් පුදකරනවා. මං හිතනවා ඒක මගේ යුතුකම හා වගකීම කියලා. ඒ සඳහා අත්වැල් බැඳගත් සියලු ජනතාවට මගේ ගෞවරනීය ස්තූතියත් මේ අවස්ථාවේ පුදකරනවා. ඒ වගේම තව කරුණු කීපයක් මම මතක් කරන්නට ඕනෙ. අපේ සිරිසේන රාජපක්ෂ හිටපු සභාපතිතුමා 2006 වර්ෂයේදී අපිට කිව්වා විශේෂයෙන් සුදු ඇඳුමක් ඇඳගෙන එන්න පුළුවන්නම් වඩාත් හොඳයි කිව්වා. පිරිමි අපිට කර වැහෙන සුදු ඇඳුමක් ඇඳගෙන කිව්වා. මම මේ අවස්ථාවේ ඔබට මතක් කරනවා. නීතියක් නෙමෙයි. අපේ සම්ප්‍රදාය රකින්න ඕනෙ. අපේ ගෞරවය අපි රැකගන්න ඕනෙ. අපේ ධූරයේ ගෞරවය අපි රැකගන්න ඕනෙ. ඉතින් ඒ නිසා ඇඳුම පිළිබඳව අඩුගානෙ මන්ත්‍රීවරු හැටියට ඔබට ඡන්දය දුන් ජනතාවගේ ගෞරවය රැකෙන්න ඔවුන්ට ආඩම්බරයක් ඇතිවෙන විදියට මම හිතන්නෙ මන්ත්‍රීතුමා මන්ත්‍රීතුමිය සරල ඇඳුම් වාම් ඇඳුමකින් ආවොත් හොඳයි කියන කාරණාව මතක් කරනවා. මම එදා ඉඳන් ඒ විදියට හිටියා. අපි විශ්වාස කරනවා ඒක ඉදිරියටත් හැමෝම එහෙම ඉන්වානම් හොඳයි කියන කාරණය මම මේ අවස්ථාවේදී මතක් කරනවා. ඒ වගේම තමයි අපි ඔබතුමා එදා කිව්ව කතාව සභාව තුළ දුරකතනය පාවිච්චි කරන්න එපැයි කියන කතාව. අද මම කාටවත් මුකුත් කිව්වෙ නෑ පළවෙනි සභාව නිසා. අවශ්‍ය පින්තූරයක් එහෙම ගත්තා කියලා අනික් අයට බාධාවෙන විදියට ජංගම දුරකථන පාවිච්චි කරන්න එපා කියන කාරණය මතක් කරනවා. ඒ විදියට අපි කටයුතු කරමු. එහෙම ඇමතුමක් අවොත් එළියට ගිහිල්ලා ගන්න පුළුවන්. සභාව ඇතුලේ ඒ දේ කරන්න එපාය කියන කාරණය තමයි අපිට මතක් කරන්න තියෙන්නෙ. තව බොහෝ දෙනා බොහෝ කාරණා ප්‍රකාශ කළා. ඒ නිසා ඊළඟ වැඩමුළු වලදී අපිට මේ ගැන. සභාව ආමන්ත්‍රණය කරන්නේ කෙසේද කියන කාරණය ගැන මම උපදෙස් දෙන්නෙ නෑ ඒවා අපිට සභාවේ කාලය ඉතුරු කරගන්න සහ සභාවක කතා කිරීමේ ආමන්ත්‍රණය මොන විදියටද වෙන්න ඕනෙ කියන කාරණාව ඒ නිසා මොවැනි කාරණා බොහෝමයක් ඉදිරියේදී අපිට කතාකරලා හදාගන්න වෙයි. මූලික වශයෙන් අපි මේ කටයුතු වලට ගමන් කරමු. ඒ සම්බන්ධවත් මතක් කරමින් අපේ මීළඟ මහ සභාව පවත්වන දවස සම්බන්ධව මං හිතනවා අපි තීරණයකට එන්න ඕනෙ. මේච්චර කාලයක් අපි සාමාන්‍ය යෙන් 20 ගණන්වල වගේ තමයි අපි හැමදාම පවත්වගෙන ආවේ. අපි උත්සාහ කරනවා ලබන මාසෙ10 දිනට පෙර මුල් සතියේ සභාව පවත්වන්න. ඊට පසු සතියේ කමිටු තියන්න. මේ මාසේ මුදල් කමිටුව අපි 27 වෙනිදා යෝජනා කරනවා. ඒ ගැන මන්ත්‍රීතුමන්ලාගේ ප්‍රශ්නයක් තියෙනවානම් මට කතා කරන්න. නිවාස හා පහසුකම් කමිටුව 23 වෙනිදා සඳුදා. කාර්මික සේවා කමිටුව 24 වෙනිදා. පරිසර කමිටුව 26 වෙනිදා. ඒ දින හතරේ තමයි මේ කමිටු මේ

සතියේ අපි දින යොදාගෙන යෝජනා කරන්නෙ. අපි ලබන මාසේ මහා සභාව 10 වෙනිදට පෙර පවත්වන්න, හැම කමිටුවක්ම උදේ 10.00ට පවත්වනවා. මොනවහරි තියෙනවානම් ආපහු කතාකරන්න. මීට වඩා මම කතාකරන්න යන්නෙ නෑ,. යෝජනා එහෙම තියෙනවා නම් ඒවා මේ දවස් ටිකේ අපිට ලැබෙන්න සලස්වන්න. අපිට පුළුවන් ඒ සඳහා ගමන් කරන්න. ඉතින් අද දවසේ සියලුම මන්ත්‍රීවරු මංගල සභාවට සහභාගී වුණා. හයවෙනි සභාවේ මංගල සභාවාරයට සහභාගී වුණු ඔබ සියලුදෙනාටම අපි ස්තූතිවන්ත වෙනවා. ඔබ සියලු දෙනාටම ඉදිරි වසර 4 ක කාල සීමාව අදින් පටන් අරගෙන ඒ වසර 4 ක් ගමන් කරන්නට තමුන්නාන්සේලා සමඟ සහයෝගයෙන් කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා. ඔබේ සහයෝගයත් එක්ක අපිට ඡන්දෙ දීපු අපිට බදු ගෙවන ජනතාවට හොඳ ප්‍රාදේශීය සභාවක් ඇති කිරීම සඳහා සියලුදෙනාටම එකතුවෙලා වැඩ කරන්න කියන කාරණාව මතක් කරමින් ලැබුවාවූ සිංහල හින්දු අලුත් අවුරුද්ද නැවතත් ඔබ සියලුදෙනාටම වාසනාවන්ත සුබ වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් අද සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් කරනවා බොහෝම ස්තූතියි.

සභාවේ වැඩ කටයුතු ප.ව. 7.00ට නිමාවට පත්විය.

කේ.ඒ. චන්දන පද්මසිරි,
ලේකම්,
සීතාවක ප්‍රාදේශීය සභාව,
හංවැල්ල.

2018.04.17 වන දින
සීතාවක ප්‍රාදේශීය සභාව,
හංවැල්ල.

◌̑